ස්ත්‍රී-පුරුෂ දේශපාලන නියෝජනය සමානද? පංගු ක්‍රම න්‍යාය සහ භාවිතය

කමලා ලියනගේ

ප්‍රකාශනය
ෆ්‍රෙඩ්රිච් ඊබට් ස්ටිෆ්ටුන්
2012

එෆ්.ඊ.එස්. ප්‍රකාශන අංක 93
කර්තෘගේ අවසරය නොමැතිව උපුටා ගැනීම තහනම්.
ලියනගේ කමලා 2012
විද්‍යුත් තැපෑල : imiyakamala@yahoo.com

ශ්‍රී ලංකා ජාතික පුස්තකාල මණ්ඩලය - ප්‍රකාශගත සුචිකරණ දත්ත

ලියනගේ කමලා

- ස්ත්‍රී පුරුෂ දේශපාලන නියෝජනය සමාන ද ?
- දේශපාලන විද්‍යාව
- ස්ත්‍රී අධ්‍යයන

ISBN 978-955-1282-01-1

ප්‍රකාශය :
ෆ්‍රෙඩ්රිච් ඊබට් ස්ටිෆ්ටුන්
නො. 4, ඇඩම්ස් ඇවනියු, කොළඹ 4.
දුරකථන අංකය : 011-2502710

පිටු සැකැස්ම හා කවරය :
ශෂික ගුණතිලක

මුද්‍රණය :
සී/ස කැන්ඩි ඕෆ්සෙට් ප්‍රින්ටර්ස්
947, පේරාදෙණිය පාර, මහනුවර.
081-2389880

පටුන

පිටු අංකය

පෙරවදන iv

හැඳින්වීම vii

1

ස්ත්‍රී දේශපාලන නියෝජනය වර්ධනය සඳහා වූ ජාත්‍යන්තර හා ජාතික අවධානය 01

2

ස්ත්‍රී දේශපාලන නියෝජනයඃ ජාත්‍යන්තර හා ජාතික තත්ත්වය 13

3

පංගු ක්‍රම න්‍යායඃ ස්ත්‍රී-පුරුෂ සමාන දේශපාලන පුරවැසි බව 18

4

ස්ත්‍රී නියෝජනය වර්ධනය සඳහා පංගු ක්‍රම හා වෙනත් උපක්‍රම භාවිතයඃ විදෙස් අත්දැකීම් 65

5

ශ්‍රී ලංකාව සඳහා පංගු ක්‍රමයක අවශ්‍යතාවය 152

ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය 184

පෙරවදන

ශ්‍රී ලංකාවේ ස්ත්‍රීන්ගේ දේශපාලන නියෝජනය වර්ධනය කිරීම සම්බන්ධවූ කතිකාවත, පසුගිය දශක දෙකක පමණ කාලය තිස්සේ ස්ත්‍රී ව්‍යාපාරයේ නායිකාවන්, වෘත්තිකයන්, විද්වතුන්, සමීක්ෂකයින් හා සිවිල් සංවිධාන ක්‍රියාකාරීන් අතර ජනප්‍රියත්වයට පත්වී ඇත. මෑතක සිට එය පොදු ජනතාව අතර සාකච්ඡාවට බඳුන් වන මාතෘකාවක් බවටද පත් වෙමින් තිබේ. එසේම, විවිධ ලාංකික ස්ත්‍රී සංවිධාන ස්ත්‍රී නියෝජනය වර්ධනය කිරීමේ අරමුණෙන් විවිධ ක්‍රියාකාරකම් සංවිධානය කිරීමද සිදුවෙමින් පවතී. සාමය හා යහපාලනය සඳහා වූ කාන්තාවෝ සංවිධානය විසින් 2007 සිට 2011 දක්වා මධ්‍යම පළාත තුළ, අදාළ අරමුණු පෙරදැරි කරගෙන ක්‍රියාකාරකම් රාශියක් සංවිධානය කරන ලදී. එම කාලය තුළදී ශ්‍රී ලංකාවේ විවිධ ප්‍රදේශවල ජනතාව සමඟ මෙම කරුණ සම්බන්ධයෙන් පැවැත්වූ සාකච්ඡාවලදී අවබෝධ වූයේ ලාංකික පොදු ජනතාවත්, ප්‍රාදේශීය දේශපාලන නායකයිනුත් ස්ත්‍රී නියෝජනය වර්ධනයේ වැදගත්කම පෙරට වඩා යම් තරමකින් හෝ වටහා ගෙන ඇති බවයි. එහෙත්, දකුණු ආසියාතික රටවල් භාවිත කරන පංගු ක්‍රම පිළිබඳ සමහර පුද්ගලයන් අසා ඇතත්, පංගු ක්‍රම පිළිබඳ පැහැදිලි අවබෝධයක් බොහෝ පුද්ගලයන්ට තවමත් නොමැති බැව් මෙම කාලය තුළදී අපට වැටහුණි. ස්ත්‍රී නියෝජනය වර්ධනය සඳහා විධිමත් හා උපායශීලි ක්‍රියාමාර්ග අනුගමනය කොට සාර්ථක ප්‍රතිඵල දිනාගැනීමට නම් ඡන්දදායකයාට, ඡන්ද අපේක්ෂකයාට, නියෝජිතයාට මෙන්ම දේශපාලන නායකත්වයටත් අදාළ පරිපාලන නිලධාරින්ටත් ඒ පිළිබඳ පැහැදිලි අවබෝධයක් තිබිය යුතුය. එම දැනුම වර්ධනය කිරීම සාමය හා යහ පාලනය සඳහා වූ කාන්තාවෝ සංවිධානයේ මුඛ්‍ය අරමුණකි.

මෙම අරමුණ සාක්ෂාත් කරගැනීමේ ලා ෆෙඩ්රිච් ඊබට් ස්ටිෆ්ටුන් ආයතනය අපව මෙහෙයවමින් මෙම කෘතිය සම්පාදනය කිරීමට නන් අයුරින් දායක විය. එම නොමසුරු සහයෝගය අතිශයින්ම

අගය කරමි. ෆෙඩ්රිච් ඊබර්ට් ස්ටිෆ්ටුන් ආයතනයේ නේවාසික නියෝජිත නෝරා ලන්ගන්බාහර් මහත්මිය සහ පරිපාලන නිලධාරිනි රෝහිණී පීරිස් මහත්මිය ඇතුලු කාර්ය මණ්ඩලය නිරන්තරයෙන් අපව උනන්දු කරමින්, මිත්‍රශීලිව කටයුතු කිරීම මෙම කෘතිය සම්පාදනයට බෙහෙවින් පහසුවක් විය. ඒ සියලු දෙනාටම මගේ ගෞරවනීය ස්තූතිය පුදකරමි. මෙම කෘතිය ලිවීමට පදනම වැටුනේ මා 2004-05 වර්ෂවල ෆුල්බ්‍රයිට් අධි ශිෂ්‍යත්ව ලාභියකු ලෙස වොෂිංටන් ඩී. සී. හි අමරිකානු විශ්ව විද්‍යාලයේ පශ්චාත් ආචාර්ය උපාධි අධ්‍යයන කටයුතුවල නිරතවන අවධියේදීය. ඒකාකාරී අධ්‍යයන දිවියෙන් මඳකට විරාමයක් ලබාදී, මෙබඳු කර්තව්‍යයකට සිත එකඟ කිරීමට ඉඩප්‍රස්ථා සලසා දුන් කොළඹ ෆුල්බ්‍රයිට් කොමිසමේ අධ්‍යක්ෂක තිස්ස ජයතිලක මහත්මා ඇතුළු කාර්ය මණ්ඩලයටද බෙහෙවින් ස්තූතිවන්ත වෙමි. එම කාලය තුළදී ෆුල්බ්‍රයිට් අධි-ශිෂ්‍යත්වධාරින්ගේ අධ්‍යයන සමීක්ෂණ කටයුතු සම්බන්ධීකරණය කරමින්, අදාළ තොරතුරු සැපයූ මහාචාර්ය කැරොලින් එලියට් වද සෙනෙහසින් සිහිපත් කරමි.

මේ සඳහා අවශ්‍ය තොරතුරු සපයා ගැනීමේදී විවිධ අයුරින් සහාය දැක්වූ නව දිල්ලි ෆෙඩ්රිච් ඊබර්ට් ස්ටිෆ්ටුන් ආයතනයේ දමයන්ති ශ්‍රීධරන් හා මන්ධවී කුල්ශ්‍රේෂ්ත්‍රා, මහත්මීන්ටද, අදාළ ලිපි ලේඛන සපයා දුන් අමරිකානු විශ්ව විද්‍යාලයේ පුස්තකාල කාර්ය මණ්ඩලයටද, පළාත් පාලන ආයතනවල ස්ත්‍රී නියෝජනය වර්ධනය සම්බන්ධයෙන් සමීක්ෂණ කටයුතු වල නිරතව සිටිද්දී නන් අයුරින් උපකාර කළ එම විශ්ව විද්‍යාලයේ මහාචාර්ය විද්‍යාමාලී සමරසිංහට ද බෙහෙවින් ස්තූතිවන්ත වෙමි.

මෙම කෘතියේ මුල් පිටපත කියවා විවිධ සංශෝධන හා අදහස් ඉදිරිපත් කොට සංස්කරණය කරදුන් මහාචාර්ය සිරිමා කිරිබමුණේටද, සෝදුපත් නිවැරදි කරදුන් කාන්ති ගමගේ මහත්මියට ද, මෙහි පරිගණක යතුරු ලියනය කරදුන් හර්ෂණී හලියද්ද මෙනවියටද බෙහෙවින් ස්තූතිවන්ත වෙමි.

මගේ අධ්‍යයන කටයුතුවලදී නන් අයුරින් සහයෝගය දක්වන මැණියන්ද, දියණිවරුන් උසස් අධ්‍යාපනයට යොමුකොට එහෙත් එහි අවසන නොදුටු පියාණන්ද සිහිපත් කරන්නේ හදපිරි ගෞරවයෙනි. අවිවේකී දිවියට විවිධ අයුරින් සහාය දෙන ''නන්දා සෙවන'' හා ''සඳසිරි'' පවුල් වල සොයුරු සොයුරියන්ගේ සැබෑ ලෙන්ගතුකමද අගය කරමි.

මෙබඳු කාර්යයකට කාලය හා ශ්‍රමය කැපකිරීමේදී මගෙන් අතපසුවන පවුලේ වගකීම් භාරගෙන නිබඳව මගේ දිවියට අත්වැලක් වන අශෝකත්, ඒකාකාරී අධ්‍යයන දිවියෙන් මා මුදවා සතුට හා සෙනෙහස රැගෙන එන ජනේත්‍රිත් ආදරයෙන් සිහිපත් කරමි.

කමලා ලියනගේ
ජ්‍යෙෂ්ඨ මහාචාර්ය
දේශපාලන විද්‍යා අංශය
පේරාදෙණිය විශ්වවිද්‍යාලය
පේරාදෙණිය.
imiyakamala@yahoo.com

හැඳින්වීම

පසුගිය දශක කිහිපය තිස්සේ ලොව බොහෝ රටවලත් ශ්‍රී ලංකාවේත් ස්ත්‍රීන් අධ්‍යාපනය, ශ්‍රම බලකායේ සහභාගිත්වය, ප්‍රජා සංවර්ධන ක්‍රියාකාරකම් හා සෞඛ්‍ය තත්වය යනාදි අංශවලින් සැලකිය යුතු ජයග්‍රහණ අත්පත් කරගෙන ඇත. 1890 වනවිට ලොව කිසිදු රටක ස්ත්‍රීන්ට සර්වජන ඡන්ද බලය හිමිවී නොතිබුනද, 1994 වනවිට ලොව රටවල් අතරින් 96% ක ස්ත්‍රීන්ට එම වරම හිමි වී තිබුණි (Ramirez; et.al, 1997). 2000 දශකයේ දී ඉතිරි රටවල් ද ස්ත්‍රීන්ට සර්වජන ඡන්ද බලය හිමි කළහ. 2003 ඕමානය, 2005 කුවේටය, 2006 කටාර් සහ එක්සත් අරාබි එමිරේට්ස් හි ස්ත්‍රීන්ට එම වරම හිමිවිය. මෙම ජයග්‍රහණයත් සමඟ බොහෝ රටවල ස්ත්‍රී ඡන්දදායකයින්ගේ ප්‍රතිශතය එක්කෝ පුරුෂයින්ට වඩා වැඩියෙන් හෝ නැතිනම් පුරුෂයන්ගේ ප්‍රතිශතය තරමටම වර්ධනය වීම පසුගිය දශකය තුළ ප්‍රකාශිත සුවිශේෂී ජයග්‍රහණයකි (http://www.idea.int/vt/survey/by-gender.cfm).

එහෙත් මෙම ජයග්‍රහණ ස්ත්‍රීන්ගේ දේශපාලන නියෝජනය හා නායකත්වය සැලකිය යුතු ආකාරයකින් වර්ධනය කිරීමට දායක වී ඇත්තේ ලොව රටවල් 30 ක් පමණ වූ සුළු සංඛ්‍යාවකදීය. සමහර සංවර්ධිත, අර්ධ සංවර්ධිත මෙන්ම සංවර්ධනය වන්නා වූ රටවලිනුත් ප්‍රකාශ වන්නේ දේශපාලන නියෝජනය සම්බන්ධයෙන් පවතින ස්ත්‍රී-පුරුෂ හිදැස තවමත් ඒ ආකාරයෙන්ම පවතින බවයි. එනිසා ලෝකයේ ජාතික ව්‍යවස්ථාදායකයන්හි ස්ත්‍රී නියෝජනයේ පොදු ප්‍රතිශතය තවමත් 19% ක් වැනි පහළ අගයක පවතී (http://www.ipu.org/wmn-e/world.htm). මෙය නූතන ගෝලීය ප්‍රශ්නයක් බවට පත්ව ඇති අතර, ස්ත්‍රීන්ගේ දේශපාලන නියෝජනය වර්ධනය කිරීම යන කරුණ ලෝක ස්ත්‍රී ව්‍යාපාර ප්‍රමුඛතාවය ලබාදෙන මූලික අරමුණුවලින් එකක් බවටද පත්වී තිබේ. ඒනිසා ස්ත්‍රී-පුරුෂ සමාජභාවය හා දේශපාලනය, ස්ත්‍රී-පුරුෂ සමාජභාවය හා ප්‍රජාතන්ත්‍රවාදය, ස්ත්‍රී-පුරුෂ සමාජභාවය හා පුරවැසිබව සහ ස්ත්‍රී-පුරුෂ සමාජභාවය සහ යහපාලනය වැනි

තේමා වත්මන් ජනප්‍රිය ගෝලීය සංකල්ප බවට පත්වී ඇත. එසේම එම තේමා ස්ත්‍රී අධ්‍යයන, දේශපාලන විද්‍යාව හා සමාජ විද්‍යාව යන විෂයන්හි කේන්ද්‍ර බවට ද පත්වී ඇත.

මෙම පරිසරය තුළ ස්ත්‍රී නියෝජනයේ වර්ධනය සම්බන්ධයෙන්, 1995 බෙයිජිං ජාත්‍යන්තර ස්ත්‍රී සමුළුවේදී ප්‍රකාශයට පත්කළ එක්සත් ජාතීන්ගේ ක්‍රියාකාරී වැඩසැලැස්මෙනුත්, ප්‍රමුඛතාවය ලබා දුනි. මෙම ජාත්‍යන්තර අවධානයේ ප්‍රතිඵලයක් ලෙස බොහෝ රටවල ආණ්ඩු හා දේශපාලන පක්ෂ විසින් ස්ත්‍රී නියෝජනය වර්ධනය සඳහා විවිධ උපක්‍රම භාවිතා කිරීම ආරම්භ කරන ලදී. මීට පෙරදී පවා ස්කැන්ඩිනේවියානු රටවල් බොහොමයක දේශපාලන පක්ෂ විසින් මේ සම්බන්ධයෙන් පෙරමුණ ගෙන ස්වේච්ඡා පංගු ක්‍රම හඳුන්වා දී තිබුණි. 1990 මැද ගණන්වලදී සමහර බටහිර යුරෝපා රටවල් වන ජර්මනිය, ප්‍රංශය, බෙල්ජියම හා බ්‍රිතාන්‍ය වැනි රටවල ඇතැම් දේශපාලන පක්ෂත් ස්කැන්ඩිනේවියානු රටවල් අනුගමනය කළහ.

ව්‍යවස්ථානුකූලව ආසන වෙන්කිරීමේ ක්‍රමය මෙම යුරෝපා රටවලටත් පෙර සිට සමහර ආසියානු රටවල් විසින් ආරම්භ කරන ලදී. 1956 දී පකිස්තානය ස්ත්‍රීන් සඳහා සුළු සංඛ්‍යාවකින් හෝ ආසන වෙන්කළ අතර, 1970 දී බංගලාදේශය එය අනුගමනය කළේය. 1993 දී ඉන්දියානු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයක් මගින් පළාත් පාලන ආයතනවල ආසනවලින් 1/3 ක් ස්ත්‍රීන් සඳහා වෙන් කෙරිණි. නේපාලයේ 2008 භාරකාර ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන්ද ස්ත්‍රීන් සඳහා ආසන වෙන් කෙරිණි. එයට අමතරව, ඉන්දුනීසියාව, ඇෆ්ගනිස්ථානය, පිලිපීනය හා චීනය (පළාත් පාලන ආයතන සඳහා) වැනි රටවල්ද නීත්‍යානුකූලව පංගු ක්‍රම හඳුන්වා දී ස්ත්‍රී නියෝජනය වර්ධනය කෙරේ අවධානය යොමුකර තිබේ.

1990 ගණන් මුල සිට ලතින් අමරිකානු රාජ්‍ය 14 ක ආණ්ඩු විසින් ව්‍යවස්ථානුකූල පංගු ක්‍රම මෙන්ම, එම රටවල සමහර පක්ෂ විසින් ස්වේච්ඡා පංගු ක්‍රමද හඳුන්වා දෙනු ලැබීය. 1900 ගණන්වල

මැද හා 2000 මුල කාලය තුළදී පංගු ක්‍රම හඳුන්වා දීමේ ප්‍රවණතාවය අප්‍රිකානු කලාපයෙන්ද ප්‍රකාශයට පත් විය. විශේෂයෙන්ම පශ්චාත්-යුදකාලීන වාතාවරණ සහිත රටවල් ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන ක්‍රමවලට පරිවර්තනය වීමේදී නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මගින් පංගු ක්‍රම හඳුන්වා දීම මේ රටවල සුවිශේෂී ලක්ෂණයක් විය. දකුණු අප්‍රිකාව, රුවන්ඩාව, උගන්ඩාව හා ඉරාකය වැනි රටවල් ව්‍යවස්ථානුකූල හෝ ස්වේච්ඡා පංගු ක්‍රම මගින් දශකයක් වැනි කෙටිකාලයක් තුලදී ප්‍රමාණාත්මක මෙන්ම ගුණාත්මකවද ස්ත්‍රී නියෝජනය වර්ධනය සම්බන්ධයෙන් යම් යම් ජයග්‍රහණ හිමිකරගත් රටවල් ලෙස සැලකිය හැකිය.

කොසොවෝ, බෙලරුස්, කසකස්තාන් හා කර්ගිස්තාන් වැනි නැගෙනහිර යුරෝපා රටවලුත් ප්‍රජාතන්ත්‍රීයකරණයත් සමඟ ස්ත්‍රීන් නියෝජනය වර්ධනය සඳහා විවිධ උපක්‍රම හඳුන්වා දී තිබේ. නමුත් මේ සෑම රටක්ම අපේක්ෂිත ප්‍රතිඵල ඒ අයුරින්ම දිනාගෙන නොමැත. සමහර රටවල් එම රටවල පවතින දේශපාලන හා සමාජ සන්දර්භයන්ට බෙහෙවින් යෝග්‍ය පරිදි මෙම උපක්‍රම හඳුන්වා දීම නිසා සාර්ථක ප්‍රතිඵල අත්කරගෙන ඇත. උදාහරණ ලෙස ස්කැන්ඩිනේවියානු රටවල පවතින සමාජ ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන පරිසරය මත එම රටවල බොහොමයක් පක්ෂ හඳුන්වා දුන් ස්වේච්ඡා පංගු ක්‍රමවලින් අපේක්ෂිත ප්‍රතිඵල දිනාගෙන ඇත. නමුත් එම රටවලට වෙනස්වූ දේශපාලන ක්‍රම, දේශපාලන සංස්කෘතීන් හා සමාජ සන්දර්භයන් සහිත රටවල් ස්වේච්ඡා පංගු ක්‍රම හඳුන්වා දුන්නත් ඒ අයුරින්ම සාර්ථක වේ යයි අපේක්ෂා කළ නොහැකිය. ස්ත්‍රී නියෝජනයේ වර්ධනය අරමුණු කරගත් පංගුක්‍රම හා වෙනත් උපායමාර්ග භාවිතය සම්බන්ධයෙන් ඒ ඒ රටවල සුවිශේෂී අත්දැකීම් පිළිබඳ තුලනාත්මක විශ්ලේෂණ ප්‍රමාණවත් අයුරින් තවමත් සිදුවී නොමැත. ස්ත්‍රී අධ්‍යයන හා දේශපාලන විද්‍යා විෂයන් තුළදී පවා තවමත් පංගු ක්‍රම න්‍යාය සංකීර්ණ න්‍යායක් ලෙස සැලකේ. ඒ සම්බන්ධ වූ කතිකාවත ගෝලීය වශයෙන් ජනප්‍රිය අයුරින් ව්‍යාප්ත වුවද, එය විවාදයට බඳුන් වූ කතිකාවතක් වී තිබේ. මේ නිසා පංගු ක්‍රම න්‍යාය, පංගු ක්‍රම වර්ගීකරණය, පංගු ක්‍රමවල ඇති වාසි සහ අවාසිසහගත තත්වයන්, විවිධ රටවල් පංගු ක්‍රම දිනා ගැනීමට

භාවිත කළ උපක්‍රම හා ඒවායින් සාර්ථක ප්‍රතිඵල ලබාගත් ආකාරය හෝ එයට බලපෑ හේතු සහ පංගු ක්‍රම සමහර රටවලදී අසාර්ථක වීමට බලපෑ හේතු යනාදිය පිළිබඳව තුලනාත්මකව අධ්‍යයනය කිරීම ගෝලීය අවශ්‍යතාවයක් වී ඇත.

බොහෝ රටවලට සමානව යමින් ශ්‍රී ලාංකික ස්ත්‍රීන්ද සෞඛ්‍ය, අධ්‍යාපනය, රැකියා යන අංශ වලින් හා පොදු කටයුතුවලට සහභාගිවීම සම්බන්ධයෙන්, මෑත දශක දෙකක පමණ කාලය තුළදී විශේෂ ජයග්‍රහණ හිමිකරගෙන ඇත. එහෙත් එම ජයග්‍රහණ ඔවුන්ගේ දේශපාලන නියෝජනයේ වර්ධනය සඳහා සුළු වශයෙන් හෝ දායකත්වයක් දක්වා නොමැති වීම ශ්‍රී ලාංකික ස්ත්‍රීන් මුහුණ දී ඇති විශාල ගැටළුවක් මෙන්ම ප්‍රබල අභියෝගයකි. බ්‍රිතාන්‍ය යටත් විජිතව පැවති රටවල් අතරින් ප්‍රථමයෙන්ම සර්වජන ඡන්ද බලය (1931) දිනාගත් ලාංකික ස්ත්‍රීන්ගේ ජාතික මට්ටමේ දේශපාලන නියෝජනය කිසිදු මැතිවරණයකදී 6% කට වඩා වැඩි වී නැත. පළාත් පාලන ආයතන මට්ටමේදී එම ප්‍රතිශතය 2% ක දක්වාවත් වර්ධනය වී නොමැත. 1970 දශකයේ මැද භාගයේ සිට මෙම ගැටළුව විසඳීම සඳහා ප්‍රධාන ලාංකික ස්ත්‍රී සංවිධාන හා ඒ සම්බන්ධ උනන්දුව දක්වන පුද්ගලයින් ගණනාවක් රාජ්‍යයට හා දේශපාලන පක්ෂ වලට විවිධ අයුරින් බලපෑම් කළද, ඒ කිසිම ප්‍රයත්නයක් මෙතෙක් සාර්ථක වී නොමැත. මැතිවරණ ක්‍රම සංශෝධනය පිළිබඳ සොයා බැලීමට 2003 පත්කළ පාර්ලිමේන්තු තේරීම් කාරක සභාවටද ස්ත්‍රී සංවිධාන, වනිතා කටයුතු අමාත්‍යංශයේද සහායෙන් ස්ත්‍රී නියෝජනයට අදාළ යෝජනා ඉදිරිපත් කළේය. ඉන්පසුව පළාත් පාලන ආයතන ප්‍රතිසංවිධානය පිළිබඳ සොයා බැලීමට පත්කළ පාර්ලිමේන්තු කමිටුවටද අවස්ථා ගණනාවකදී එබඳු යෝජනා හා අදහස් ඉදිරිපත් කළේය. 2011 දී පංගුක්‍රමයක් හඳුන්වා දීම සම්බන්ධ යෝජනාවලියක් ළමා හා කාන්තා අභිවෘද්ධිය පිළිබඳ ඇමතිවරයා විසින් කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කළද, එය ප්‍රතික්ෂේප විය. 2012 ඔක්තෝබර් මසදී ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව විසින් සම්මත කරු ගනු ලැබූ පළාත් පාලන ආයතනවල නියෝජන ක්‍රම සංශෝධන පණතට 25% ක නාම යෝජනා ප්‍රතිශතයක් අන්තර්ගත කරවා ගැනීමට

කළ උත්සාහයන් ද අසාර්ථක විය. එම පණතින් ප්‍රකාශ වී ඇත්තේ පලාත් පාලන මැතිවරණවලට ඉදිරිපත් කරන නාමයෝජනාවලත් 25% ක් තරුණයින් හා කාන්තාවන් විය හැකි බව පමණි.

තවද පසුගිය දශක දෙක තුළදී ස්ත්‍රී සංවිධාන ගණනාවක් විවිධ සාකච්ඡා, සම්මන්ත්‍රණ හා හමුවීම්වලදී මෙම ගැටළුව පිළිබඳ දේශපාලන පක්ෂ නායකයින් දැනුවත් කොට, ස්ත්‍රී නියෝජනය වර්ධනය කිරීමට අදාළ පියවර ගන්නා ලෙස ඉල්ලීම් ඉදිරිපත් කර ඇත. එහෙත් ඒ කිසිදු ඉල්ලීමකට ශ්‍රී ලාංකික රාජ්‍ය හෝ කිසිදු දේශපාලන පක්ෂයක් මෙතෙක් යහපත් ප්‍රතිචාරයක් දක්වා නොමැත.

මෙම පරිසරය තුළ ශ්‍රී ලාංකික ස්ත්‍රී සංවිධානත්, ස්ත්‍රීහුත්, පොදුවේ සිවිල් සමාජයත් මෙරට ප්‍රජාතන්ත්‍රවාදයට, යහපාලනයට, ස්ත්‍රීන්ගේ පුරවැසිභාවයට, තිරසාර සංවර්ධනයට හා තිරසාර සාමයට ඍජුව බලපාන ගැටළුවක් වූ අවම ස්ත්‍රී නියෝජනය පිළිබඳ ගැටළුව විසඳා ගැනීමට දැඩි කැපවීමකින්, විධිමත්ව හා එක්සත්ව කටයුතු කළයුතු කාලය එළඹ ඇත. මෙම කාර්ය සාර්ථක කර ගැනීමට නම් අදාල සියලුම පාර්ශවයන් පංගු ක්‍රම න්‍යාය සමග සමානාත්මතාවය, ප්‍රජාතන්ත්‍රවාදය, නියෝජනය හා යහපාලනය වැනි සංකල්ප බැඳී ඇති ආකාරය පිළිබඳ පැහැදිලි අවබෝධයක් ලබාගැනීම අත්‍යවශ්‍යය. එහෙයින් ස්ත්‍රීන්ට පමණක් නොව සියලුම ඡන්දදායකයින්ට, දේශපාලන නායකයින්ට, ක්‍රියාකාරින්ට, සිවිල් සංවිධාන නායකයින්ට, පරිපාලකයින්ට මෙන්ම පොදු ජනතාවටත් ස්ත්‍රී නියෝජනය වර්ධනය සඳහා භාවිතා කළහැකි පංගුක්‍රම හා වෙනත් උපක්‍රම පිළිබඳ පැහැදිලි අවබෝධයක් ලබාගැනීම කාලීන අවශ්‍යතාවයකි.

එබඳු තොරතුරු රැගත් දේශීය බසින් ලියැවුන පොතපත ශ්‍රී ලංකාව තුළ විරලය. එහෙයින් එම අඩුව පිරවීම සඳහා මෙම කෘතියෙන් යම් දායකත්වයක් ලැබේ යයි විශ්වාස කරමි.

1

ස්ත්‍රී දේශපාලන නියෝජනය වර්ධනය සඳහා වූ ජාත්‍යන්තර හා ජාතික අවධානය

දේශපාලන නියෝජනය ඇතුළු අනෙකුත් සියලුම දේශපාලන කටයුතුවලට සහභාගි වීම සඳහා වන අයිතිවාසිකම් ජාත්‍යන්තර මානව අයිතිවාසිකම් ප්‍රකාශන හා ප්‍රඥප්ති මගින් ස්ත්‍රී-පුරුෂ දෙපක්ෂයටම සමානව හිමිකර දී ඇත. එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් ප්‍රකාශයට පත්කරනු ලැබූ 1948 විශ්ව මානව අයිතිවාසිකම් ප්‍රකාශනයේ 2 වැනි වගන්තියට අනුව එහි අන්තර්ගත සියලුම අයිතිවාසිකම් ස්ත්‍රී-පුරුෂ භාවය මත විශේෂයක් නොමැතිව සෑම පුද්ගලයෙකුටම සමානව උරුම වේ. එම ප්‍රකාශනයේ 21(1) වගන්තියට අනුව

> ''කෙළින්ම හෝ නිදහස්ව තෝරා ගත් නියෝජිතයින් මගින් තම රටේ රජයට සහභාගි වීමට සෑම පුද්ගලයකුටම අයිතිය ඇත. (එක්සත් ජාතීන්ගේ මානව අයිතිවාසිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනය, 1948; 21: 1).

1966, එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් ප්‍රකාශයට පත්කරනු ලැබූ සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ අන්තර්ජාතික සම්මුතියේ 25 වැනි වගන්තියෙන්ද, කිසිදු ප්‍රභේදයකින් තොරව හා අසාධාරණ සීමා කිරීම්වලින් තොරව දේශපාලන නියෝජනයේ අයිතිය ස්ත්‍රීන් හා පුරුෂයන්ට හිමිකර දී ඇත. එයට අනුව

> ''මහජන කටයුතු විෂයෙහි ලා කෙළින්ම හෝ නිදහස්ව තෝරා ගනු ලබන නියෝජිතයින් මගින් සහභාගි වීමට;
> නිදහස් හා සමාන ඡන්දයෙන් සිදුකළ යුතුවූද, තෝරන

තැනැත්තන්ගේ නිදහස් කැමැත්ත ප්‍රකාශ කිරීම සහතික කෙරෙමින් රහස් ඡන්දයෙන් පැවැත්විය යුතුවූද, නිර්ව්‍යාජ වාර මැතිවරණවලදී, ඡන්දය දීමට සහ තෝරා ගනු ලැබීමට;'' සියලුම පුද්ගලයන්ට සමාන අයිතියක් ඇත. (එක්සත් ජාතීන්ගේ සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ අන්තර්ජාතික සම්මුතිය; 1966, 25ඃ අ, ආ)

1981, එක්සත් ජාතීන්ගේ ස්ත්‍රීන්ට එරෙහි සියලුම ආකාර වෙනස්කම් පිටුදැකීමේ සම්මුතියේ II කොටසේ 7 වැනි වගන්තියෙන්ද පහත සඳහන් ආකාරයෙන් නියෝජනය හා වෙනත් දේශපාලන ක්‍රියාකාරකම් සඳහා ස්ත්‍රීන්ට ඇති අයිතිය තහවුරු කර ඇත.

''පුරුෂයන් හා සමානව ස්ත්‍රීන්ටද,

(අ) සියලු ඡන්ද විමසීම්වලදී සහ ජනමත විචාරණවලදී ඡන්දය ප්‍රකාශ කිරීමට සහ ජනතා ඡන්දයෙන් නියෝජිතයින් තෝරා ගන්නා ආයතනවලට තේරී පත්වීමට,

(ආ) රාජ්‍ය ප්‍රතිපත්ති සම්පාදනයෙහි ලා සහභාගි වීමට, රාජ්‍ය නිලතල හෙබවීමට, රාජ්‍ය පාලනයේ සියලු මට්ටම්වල පොදු කාර්යන්හි නිරතවීමට සමාන අයිතිවාසිකම් සහතික කරනු ඇත'' (එක්සත් ජාතීන්ගේ ස්ත්‍රීන්ට එරෙහි සියලු ආකාර වෙනස්කම් දුරු කිරීමේ සම්මුතිය (සීඩෝ සම්මුතිය) 1979, (7ඃ අ, ආ)

1990 මුල සිට පොදු ක්‍රියාකාරකම්වලදී තීරණ ගැනීමට ස්ත්‍රීන් සහභාගි වියයුතුය යන සංවාදය පිළිබඳ ජාත්‍යන්තරය තුළ වැඩි අවධානයක් යොමු විය. එනිසා එම කරුණ එක්සත් ජාතීන්ගේ සංවිධානයේ වැඩි අවධානයට ද යොමුවිය. එහි ප්‍රතිඵලයක් ලෙස, 1995 බෙයිජිං ජාත්‍යන්තර කාන්තා සම්මේලනයේදී සැකසුන බෙයිජිං

ක්‍රියාකාරී වැඩ සැලැස්මටද මෙම කරුණ අන්තර්ගත කෙරිණි. 1995 සැප්තැම්බර් මසදී, එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සාමාජික රටවල් 189 ක් විසින් මෙම වැඩ සැලැස්ම ඒකච්ඡන්දයෙන් අනුමත කරන ලදී. එම සැලැස්මේ G වගන්තියෙන් ප්‍රධාන අරමුණු 2 ක් ප්‍රකාශ වේ. ඒවා නම්

> ''බල ව්‍යූහයන්[1] හා තීරණ ගන්නා මට්ටම්වලදී ස්ත්‍රීන්ගේ පූර්ණ සහභාගීත්වය සහ සමාන ප්‍රවේශය තහවුරු කිරීමත්, තීරණ ගැනීම හා නායකත්වය ගැනීමට ස්ත්‍රීන්ට සහභාගී වීම සඳහා හැකියා වර්ධනයට අදාළ පියවර ගැනීමත්ය'' (United Nations, 1995, Section G).

බෙයිජිං ක්‍රියාකාරී වැඩ සැලැස්මට අනුව

> ''තීරණ ගන්නා මට්ටම්වලදී ස්ත්‍රීන්ගේ සමාන සහභාගිත්වය ප්‍රජාතන්ත්‍රවාදය හෝ සාධාරණත්වය පිළිබඳ ඉල්ලීමක් පමණක් නොවේ. එය ස්ත්‍රීන්ගේ ආශාවන් හා වුවමනාවන්ට නිසි අවධානය යොමු කිරීම සඳහා වන අත්‍යවශ්‍ය කොන්දේසියකි'' (එමඃ 181 වගන්තිය).

තීරණ ගන්නා මට්ටම්වලදී ස්ත්‍රී නියෝජනය සම්බන්ධයෙන් මෙම ක්‍රියාකාරී වැඩ සැලැස්ම ජාත්‍යන්තරයට දැඩිලෙස බලපෑ අතර, රටවල් ගණනාවක ස්ත්‍රී සංවිධාන එය සාර්ථක අයුරින් ක්‍රියාත්මක කළේය (Krook, 2004; Dahlerup, 2006). සමහර ජාත්‍යන්තර හා කලාපීය සංවිධානද මේ සම්බන්ධයෙන් වැඩි අවධානයක් යොමුකළ අතර ස්ත්‍රී දේශපාලන නියෝජනය වර්ධනය සඳහා අදාළ අනුපාත ක්‍රම එම සංවිධාන වල සාමාජික රටවලට නිර්දේශ කළේය.

1. පොදු ආයතනවල, ඉහළ සිට පහළ දක්වා තනතුරු, බලය හා කාර්යන් සංවිධානගත වී ඇති ආකාරය හෝ ආයතනික ව්‍යූහය

එබඳු සංවිධාන අතරින් එක්සත් ජාතීන්ගේ ස්ත්‍රීන් සඳහා වන සංවර්ධන අරමුදල (UN Development Fund for Women - UNIFEM) පොදු රාජ්‍ය මණ්ඩලීය පාර්ලිමේන්තු සංගමය (Commonwealth Parliamentary Association) අන්තර් පාර්ලිමේන්තු සංගමය (Inter-Parliamentary Union - IPU), යුරෝපා සංගමය (European Union - EU), ආරක්ෂාව හා සහයෝගිතාව සඳහා වූ යුරෝපා සංවිධානය (Organization for Security and Co-operation in Europe-OSCE) සහ ප්‍රජාතන්ත්‍රවාදය සහ මැතිවරණ සහාය සඳහා වූ ජාත්‍යන්තර ආයතනය (International Institute for Democracy and Electoral Assistance - IDEA) යන සංවිධාන ප්‍රධාන වේ (Dahlerup, 2003) .

සීඩෝ ප්‍රඥප්තිය අත්සන් කළ රටවල් එම රටවල ස්ත්‍රීන්ගේ තත්ත්වය පිළිබඳ ජාත්‍යන්තර සීඩෝ කමිටුවට නීත්‍යානුකූල වාර්තා ඉදිරිපත් කිරීමේදී, මෙම ජාත්‍යන්තර සංවිධානවලින් ස්ත්‍රී නියෝජනය වර්ධනය කිරීම සම්බන්ධයෙන් ලොව පුරා බෙදා හැරි තොරතුරු බෙහෙවින් ප්‍රයෝජනයට ගත්හ. එසේම, බෙයිජිං ක්‍රියාකාරි වැඩ සැලැස්මේ නිර්දේශ ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන්, නිව්යෝර්ක්හි පැවැත්වූ බෙයිජිං +5 සමුළුවට වාර්තා සැපයීමේදීත් ස්ත්‍රී නියෝජනය වර්ධනය කිරීම සම්බන්ධයෙන් මෙම රටවල් විශේෂ අවධානයක් යොමු කළේය. මෙම වාර්තා සම්පාදනය සූදානම් කිරීම සඳහා මැනිලා හි 2000 දී පැවැත්වූ දේශපාලන නායිකාවන්ගේ ගෝලීය සුමුළුවේදී, ව්‍යවස්ථාපිත අනුපාත ක්‍රමයක් ක්‍රියාත්මක කරන ලෙස ඔවුහු සමස්ත ලෝකයෙන්ම ඉල්ලා සිටියහ.

අන්තර්-පාර්ලිමේන්තු සංගමය (IPU) ද පාර්ලිමේන්තු ස්ත්‍රී නියෝජනය වර්ධනය සඳහා ජාත්‍යන්තර වශයෙන් වැදගත් මෙහෙයක් ඉටු කළේය. 1994 දී එම සංගමය දේශපාලන ක්‍රියාකාරකම් වලදී ස්ත්‍රී-පුරුෂ සහභාගිත්වයේ අසමානත්වය තුරන් කිරීම සඳහා ක්‍රියාකාරි වැඩ සැලැස්මක් සම්පාදනය කළේය. ලෝක පාර්ලිමේන්තුවල ස්ත්‍රී නියෝජනය සම්බන්ධ තොරතුරු මුද්‍රිත හා විද්‍යුත් මාධ්‍ය මගින්

බෙදාහැරීම ආරම්භ කළේය. බෙයිජිං ක්‍රියාකාරී වැඩ සැලැස්මේ හා IPU සැලැස්මේ අදාළ වගන්ති ක්‍රියාත්මක කිරීම සම්බන්ධ තොරතුරු අන්තර් පාර්ලිමේන්තු සංගමයට ඉදිරිපත් කරන ලෙසද එම සංවිධානය ජාතික පාර්ලිමේන්තුවලින් ඉල්ලා සිටියේය.

පොදු රාජ්‍ය මණ්ඩලීය පාර්ලිමේන්තු සංවිධානය (Commonwealth Parliamentary Association) විසින් එහි සාමාජික රටවල පාර්ලිමේන්තු නියෝජිතවරියන්ගේ එකතුවක් ස්ථාපිත කරනු ලැබීය. එයද පොදු රාජ්‍ය මණ්ඩලයේ සාමාජික රාජ්‍යවල හා ලෝකය පුරා තිබෙන පාර්ලිමේන්තුවල ස්ත්‍රී නියෝජනය වර්ධනය කිරීමේ අවශ්‍යතාවය පිළිබඳ අවධානය යොමු කළේය (Sawer, 2000).

මීට අමතරව එක්සත් ජාතීන්ගේ ස්ත්‍රීන් සඳහා වන සංවර්ධන අරමුදල (UNIFEM), ස්කැන්ඩිනේවියානු රටවල්, ඕස්ට්‍රේලියාව හා නවසීලන්තය වැනි රටවල් ස්ත්‍රී නියෝජනය වර්ධනය සඳහා අදාළ ක්‍රියාකාරකම්වලට, විශේෂයෙන්ම ආසියා ෆැසිපික් හා අප්‍රිකානු රටවලට ප්‍රතිපාදන ලබාදීමද, ඒ සම්බන්ධව ජාත්‍යන්තර අවධානය වර්ධනයට බලපෑම් කළේය. මෙහි ප්‍රතිඵලයක් ලෙස කලාපීය සංවිධාන, එනම් ජාතික කාන්තා කවුන්සිලය (National Council of Women), දේශපාලනයේ ස්ත්‍රීන් සම්බන්ධවූ ආසියා-පැසිපික් කේන්ද්‍රය (Centre for Asia-Pacific Women in Politics - CAPWIP), නීතිය හා සංවර්ධනය සම්බන්ධ ආසියා-පැසිපික් කාන්තාවෝ (Asia-Pacific Women, Law and Development - APWLD), මුස්ලිම් රටවල පාර්ලිමේන්තු නියෝජිතවරියන්ගේ සංවිධානය (Organization of Women Parlimentarians from Muslim Countries), ගෝලීය ක්‍රියාකාරකම් සඳහා වූ පාර්ලිමේන්තු නියෝජිතයෝ (Parlimentarians for Global Action) සහ ස්ත්‍රීන්ගේ දේශපාලන බලගැන්වීම සඳහා වූ දකුණු ආසියානු ජාලය (South Asian Network for Political Empowerment of Women) වැනි සංවිධාන බිහි විය (Karam, 1998). මෙම කලාපීය සංවිධාන විවිධ රටවල ජාතික ස්ත්‍රී සංවිධානවලට

අදාළ තොරතුරු ලබාදීම හා එම රටවල ස්ත්‍රී දේශපාලන නියෝජනය වර්ධනය කර ගැනීමට අදාල රාජ්‍යවලට බලපෑම් කරන ලෙස උනන්දු කරවීම මගින් වැදගත් මෙහෙයක් ඉටු කළේය. එහි ප්‍රතිපලයක් ලෙස ස්ත්‍රී දේශපාලන නියෝජනය වර්ධනය කිරීම හා අනුපාත ක්‍රමයක අවශ්‍යතාවය පිළිබඳ කතිකාවත බොහෝ රටවල ජාතික මට්ටමේදී ව්‍යාප්ත විය. මෙම ජාත්‍යන්තර අවධානය හා බලපෑම් නිසා, ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය අනුපාත ක්‍රමය පිළිබඳ බොහෝ රටවල් තුළ පෙරට වඩා වැඩි දැනුවත් බවක් ඇතිවිය. සමහර රටවලදී එයට කිසියම් පිළිග ැනීමක් හා නීත්‍යානුකූල බවක්ද ලැබුණි.

2000 දී එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩලය විසින් සම්මත කරනු ලැබූ 1325 යෝජනාවලිය මගින් ගැටුම් වැළැක්වීම සහ නිරාකරණය කිරීමේදී හා සාමය ගොඩනැගීමේදී, ස්ත්‍රී-පුරුෂ සමාන සහභාගීත්වය හා පූර්ණ වශයෙන් එම කටයුතුවලට සම්බන්ධවීමේ වැදගත්කම අවධාරණය කරනු ලැබිණි. එසේම, එමගින් ගැටුම් වැළැක්වීම සහ සමථයකට පත්කිරීම සම්බන්ධයෙන් තීන්දු ගැනීමේදී ස්ත්‍රීන්ගේ භූමිකාව වර්ධනය කිරීමේ අවශ්‍යතාවයද අවධාරණය කෙරිණි.

1325 යෝජනාවලිය විසින් ආරක්ෂක මණ්ඩලය, එක්සත් ජාතීන්ගේ මහලේකම්, සාමාජික රටවල් හා අනෙකුත් සියලුම පාර්ශවයන්ට එකිනෙකට සම්බන්ධ වූ අංශ 4 ක් පිළිබඳව ක්‍රියාත්මක වීමට නිර්දේශ කරනු ලැබ තිබේ. එයින් පළමු නිර්දේශය වන්නේ

> ''සාම ක්‍රියාදාමයේත්, ඊට අදාළ සියලු අවස්ථාවන්හිදීත්, පාලන තන්ත්‍රයේත් විශේෂයෙන් තීරණ ගන්නා මට්ටම්වලට කාන්තාවන්ගේ සහභාගීත්වය තහවුරු කිරීමයි'' (එක්සත් ජාතීන්ගේ සංවිධානය 1325 යෝජනාවලිය, 2000: 2)

ශ්‍රී ලංකාවේ අවධානය

ශ්‍රී ලංකාවේ 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12 (2) වගන්තියෙන් ස්ත්‍රී-පුරුෂ සමානාත්මතාවය තහවුරු කෙරේ. එයට අනුව ස්ත්‍රී-පුරුෂ ලිංගිකත්වය මත කිසිම පුරවැසියකුට වෙනස්කමක් කළ නොහැකි අතර, සියලුම මූලික අයිතිවාසිකම් ස්ත්‍රී-පුරුෂ භේදයකින් තොරව භුක්ති විඳීමට හැකිය. ස්ත්‍රියටත් පුරුෂයාට මෙන්ම සිතීමේ, අදහස් ප්‍රකාශ කිරීමේ, සාමකාමීව සංවිධානය වීමේ, දේශපාලන පක්ෂ, රාජ්‍ය නොවන සංවිධාන, සමාගම් හා වෘත්තීය සමිතිවලට සම්බන්ධ වීමේ හා එම කටයුතු වල නිරත වීමේ අයිතිය හිමිවේ. තවද, ඡන්දය දීම, නියෝජනය, මැතිවරණ කටයුතු, රාජ්‍ය ප්‍රතිපත්ති සම්පාදනය සහ ඒවා ක්‍රියාත්මක කිරීමට සහභාගී වීම හා නීතිය ඉදිරියේ සමානව සැලකීම ආදී අයිතිවාසිකම්ද ලාංකික ස්ත්‍රී - පුරුෂ දෙපක්ෂයටම හිමිය.

ශ්‍රී ලාංකික ස්ත්‍රීන්, දරුවන් හා වෙනස් වූ හැකියා ඇත්තන්ගේ අභිවෘද්ධිය අරමුණු කරගෙන සම්පාදනය කරනු ලබන කිසිදු විශේෂ නීතියක්, ප්‍රතිපත්තියක්, ප්‍රතිපාදනයක් හෝ විධායක ක්‍රියාකාරකමක්, 12 (2) වගන්තියෙන් දැක්වෙන සමානාත්මතා ප්‍රතිපත්තිය නිසා තහනමට ලක් නොකරෙන බව 12(4) වගන්තියෙන් ප්‍රකාශ කෙරේ (ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව, 1978).

මෙයට අමතරව ජාත්‍යන්තර වශයෙන් එක්සත් ජාතීන්ගේ 1948 විශ්ව මානව හිමිකම් ප්‍රකාශනය, 1966 සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය, 1981 ස්ත්‍රීන්ට එරෙහි වූ සියලුම ආකාරයේ වෙනස්කම් දුරුකිරීමේ සම්මුතිය හා 2002 සංක්‍රමණික සේවකයින් හා ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින්ගේ අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය වැනි සම්මුති රාශියක් රජය පිළිගෙන හෝ අත්සන් කර තිබේ. ඒවා මගින් ද ශ්‍රී ලාංකික ස්ත්‍රියගේ දේශපාලන අයිතිවාසිකම් ඇතුළු අනෙකුත් අයිතිවාසිකම් නීත්‍යානුකූලව තහවුරු කර තිබේ.

දේශපාලන, සමාජ, ආර්ථික හා සංස්කෘතික යන සියලු ක්ෂේත්‍රයන්හිදී ස්ත්‍රීන්ගේ තත්ත්වය වර්ධනය කිරීම පිණිස, පුරුෂයන්ට සමාන අයුරින් ස්ත්‍රීන්ට අයිතිවාසිකම් හා නිදහස හිමිකර දී කටයුතු කිරීම උචිත බව, 1993 කාන්තා ප්‍රඥප්තිය ප්‍රකාශයට පත් කිරීම මගින් ශ්‍රී ලාංකික රජය පිළිගෙන ඇත. කාන්තා ප්‍රඥප්තියේ I කොටසේ 2(1) වගන්තියේ (අ), (ආ) හා (ඇ) වගන්තිවලට අනුව ලාංකික ස්ත්‍රීන්ට සියලුම මැතිවරණවලදී ඡන්දය දීමට මෙන්ම තේරී පත්වීමටත්, ජාතික, පළාත් හා ප්‍රාදේශීය ඡන්ද විමසීම්වල නාමයෝජනා වලදී සාධාරණ නියෝජනයක් ලැබීමටත්, රජයේ ප්‍රතිපත්ති සකස් කිරීමේදී සහ ක්‍රියාත්මක කිරීමේදී සහභාගී වීමටත්, රාජ්‍ය මට්ටමේ සියලු මහජන මෙහෙවර ඉටුකිරීමටත් පුරුෂයන්ට සමාන වූ අයිතිවාසිකම් හිමි වී ඇත. එසේම කාන්තා ප්‍රඥප්තියේ 2 (ii) වගන්තියෙන් වෘත්තීය සමිති සහ දේශපාලන කටයුතුවලට සම්බන්ධ සංවිධාන හා සංගම්වල ස්ත්‍රී සහභාගීත්වය ශ්‍රී ලාංකික රජය විසින් වැඩි දියුණු කළයුතු බවද පිළිගෙන ඇත. තවද, එම කොටසේම 3 වැනි වගන්තියෙන් ජාත්‍යන්තර මට්ටමේදී රජය නියෝජනය කිරීමේ හා ජාත්‍යන්තර සංවිධාන හා කටයුතු වල දී පුරුෂ පක්ෂය හා සමාන පදනමක් මත, කිසිදු වෙනස්කමකින් තොරව සහභාගි වීමේ අවස්ථා ස්ත්‍රීන්ට සහතික කරදෙනු පිණිස රජය උචිත පියවර ගතයුතු බව ප්‍රකාශ කෙරේ (කාන්තා ප්‍රඥප්තිය - ශ්‍රී ලංකා), 1993).[2]

1995 දී වනිතා කටයුතු අමාත්‍යංශය විසින් පිළියෙල කරන ලද ''ශ්‍රී ලංකාවේ කාන්තාවන් පිළිබඳ ජාතික ක්‍රියාකාරී සැලැස්ම ස්ත්‍රී-පුරුෂ සමානාත්මතාවය දෙසට'' යන වැඩ පිළිවෙලටද ස්ත්‍රීන්ගේ දේශපාලන සහභාගීත්වය හා තීරණ ගැනීම පිළිබඳ කරුණ අන්තර්ගත කෙරිණි.

---

2 1993, ශ්‍රී ලංකා කාන්තා ප්‍රඥප්තිය හුදෙක් කැබිනට් ප්‍රතිපත්ති ප්‍රකාශනයක් පමණි. එය කාන්තා හිමිකම් පණත නමින් සංශෝධනය කොට පාර්ලිමේන්තුව මගින් සම්මත කරගැනීමට අවස්ථා තුනකදී උත්සාහ ගත්තද මෙතෙක් එම ප්‍රයත්නය සාර්ථක වී නොමැත.

2008 දී එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (United Nations Development Programme - UNDP) සමඟ වනිතා කටයුතු අමාත්‍යංශය එක්වී ස්ත්‍රීන්ගේ දේශපාලන සහභාගිත්වය හා නියෝජනය වර්ධනය කිරීමේ වැඩසටහනක් දියත් කළේය. දේශපාලන නායකත්වය සඳහා ස්ත්‍රීන්ව දැනුවත් කිරීම, පුහුණුවක් ලබාදීම, මාධ්‍ය වැඩසටහන් පැවැත්වීම, ලංකාවේ දේශපාලන ආයතනවල ස්ත්‍රී නියෝජනය සම්බන්ධයෙන් අධ්‍යයන වාර්තාවක් සම්පාදනය කිරීම හා දේශපාලන ක්‍රියාකාරකම්වල නිරත වීමේදී ස්ත්‍රීන් මුහුණ දෙන අභියෝග හඳුනා ගැනීම වැනි දෑ එම වැඩසටහනට අන්තර්ගත විය.

1990 දශකයේ අගභාගයේ සිට ජාතික කාන්තා කමිටුවත්, ප්‍රධාන ස්ත්‍රී සංවිධාන කිහිපයකුත් ස්ත්‍රී නියෝජනය සඳහා පංගුවක් වෙන්කරවා ගැනීමේ ඉල්ලීම රජයට ඉදිරිපත් කරමින් සිටී. ස්ත්‍රී නියෝජනය සම්බන්ධ කරුණුද ඇතුළත් කාන්තා ප්‍රඥප්තිය කාන්තා හිමිකම් පණතක් ලෙස සම්පාදනය කොට, පාර්ලිමේන්තුවෙන් නීතියක් ලෙස සම්මත කර දෙන ලෙසත්, ජාතික කාන්තා කොමිසම ස්ථාපිත කරන ලෙසත් 1994 සිට මේ දක්වා ඉල්ලා සිටී. 2012 ජූනි මාසයේදී ද වනිතා කටයුතු අමාත්‍යංශය හා ජාතික කාන්තා කමිටුව නැවතත් එම පණත සකසා අදාළ ඇමතිවරයා මගින් කැබිනට් මණ්ඩල රැස්වීමට ඉදිරිපත් කළද, එය නැවතත් ප්‍රතික්ෂේප විය. 2000 දශකයේ මුල සිටම මැතිවරණ ප්‍රතිසංස්කරණ පිළිබඳ පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව ඉදිරියේ අවස්ථා කීපයකදී අදහස් දක්වමින්, මැතිවරණ නාමයෝජනා ලැයිස්තුවලින් ස්ත්‍රීන් සඳහා පංගුවක් වෙන්කරන ලෙසද ඉල්ලා සිටියේය. නමුත් 2011 හා 2012 වසරවලදී පළාත් පාලන ආයතන ආඥා පණත සංශෝධනය කිරීම සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ පණතටද එම කරුණ ඇතුළත් කොට නොතිබිණි.

ශ්‍රී ලාංකික රාජ්‍ය යාන්ත්‍රණය ස්ත්‍රීන්ගේ දේශපාලන නියෝජනය සම්බන්ධයෙන් මෙපමණකින් හෝ කටයුතු කිරීමට අවධානය යොමු කළේ 1990 ගණන්වල සිටය. ඒ සඳහා අනිවාර්යයෙන්ම ජාත්‍යන්තර

අවධානය හා බලපෑම් ඉවහල් විය. එයට අමතරව, ස්ත්‍රීන්ගේ දේශපාලන නියෝජනය සම්බන්ධව ශ්‍රී ලාංකික රාජ්‍ය නොවන සංවිධාන, විද්වතුන් හා සමීක්ෂකයින් විවිධ අධ්‍යයන කිරීම, පොත් හා පත්‍රිකා ප්‍රකාශනය, සම්මන්ත්‍රණ, සංවාද හා වැඩමුළු පැවැත්වීමත් 1970 අග භාගයේ පමණ සිට යම් තරමකින් හෝ ආරම්භ වුණි.

1970 පමණ සිට ස්ත්‍රී අධ්‍යයන හා ක්‍රියාකාරකම් සම්බන්ධ ප්‍රධාන රාජ්‍ය නොවන සංවිධාන කීපයක් එකතුවෙන් මහ මැතිවරණවලට පෙර දේශපාලන පක්ෂවලට බලපෑම් කරමින් ස්ත්‍රීන්ට වැඩි නාම යෝජනා ප්‍රමාණයක් ලබාදෙන ලෙස ඉල්ලා සිටියේය. එහි ප්‍රතිඵලයක් ලෙස ශ්‍රී ලංකා නිදහස් පක්ෂය (ශ්‍රී.ල.නි.ප.) ඇතුළු සමගි පෙරමුණ සභාගය සහ එක්සත් ජාතික පක්ෂය (එ.ජා.ප.) සිය මැතිවරණ ප්‍රකාශනවලින් ස්ත්‍රී-පුරුෂ දෙපක්ෂයටම සමාන අයිතිවාසිකම් හා ඉඩ ප්‍රස්ථා ලබාදෙන බැව් අවධාරණය කළේය.

1977 එම පක්ෂ දෙකත්, එක්සත් වාමාංශික පෙරමුණත් ස්ත්‍රීන්ගේ ප්‍රශ්න පිළිබඳ විශේෂ අවධානයක් යොමුකරන බැව් අවධාරණය කළේය. ඉන්පසු පැවැත්වූ සෑම මහ මැතිවරණ හා ජනාධිපතිවරණයකදීම ශ්‍රී ලංකාවේ ප්‍රධාන දේශපාලන පක්ෂ පමණක් නොව කුඩා පක්‍ෂත් ස්ත්‍රීන්ගේ ප්‍රශ්න කෙරේ විශේෂ අවධානයක් යොමුකරන බවට සිය මැතිවරණ ප්‍රතිපත්ති ප්‍රකාශන මගින් පොරොන්දු විය. 2004 සිට ප්‍රධාන දේශපාලක පක්ෂ දෙක පළාත් පාලන නියෝජනයේදී ස්ත්‍රී ප්‍රතිශතය වැඩි කිරීමට පියවර ගන්නා බවට මැතිවරණ ප්‍රකාශනවලින් පොරොන්දු විය. 2004 මහ මැතිවරණයේදී ඉදිරිපත් කෙරුණු මහින්ද චින්තන ප්‍රතිපත්ති ප්‍රකාශනයෙන් ද පළාත් සභා හා පළාත් පාලන ආයතන සඳහා ඉදිරිපත් කෙරෙන නාමයෝජනා වලින් යටත් පිරිසෙන් 25% ක් ස්ත්‍රීන් වෙනුවෙන් වෙන් කිරීමට පොරොන්දු විය.

විශේෂයෙන්ම පළාත් පාලන මැතිවරණවලට ඉදිරිපත් වීමට අපේක්ෂිත ප්‍රජා නායිකාවන්ගේ දැනුම හා නායකත්ව වර්ධනය සඳහා

වනිතා කටයුතු අමාත්‍යාංශය මෙන්ම ලාංකික සමහර රාජ්‍ය නොවන සංවිධානත් වැඩසටහන් පැවැත්වීමද 1990 මැද ගණන් සිට ඇරඹිණි. මුල් කාලයේදී ස්ත්‍රී අධ්‍යයන කේන්ද්‍රය, ශ්‍රී ලංකා පදනම් ආයතනය, ජාතික සාම මණ්ඩලය, කාන්තාව හා මාධ්‍ය සාමූහිකය, ජනවාර්ගික අධ්‍යයන පිළිබඳ ජාත්‍යන්තර කේන්ද්‍රය, සර්වෝදය, ස්ත්‍රී අධ්‍යයන හා පර්යේෂණ කේන්ද්‍රය, ස්ත්‍රී අධ්‍යයන හා තොරතුරු කේන්ද්‍රය, ඇග්‍රොමාර්ට්, වර්ගවාදයට සහ සකලාකාර වෙනස්කොට සැලකීම් වලට එරෙහි ජාත්‍යන්තර ව්‍යාපාරය (International Movement Against All forms of Discrimination and Racism - IMDAR), සිංහල කාන්තාභිවෘද්ධි සංවිධානය, ලක්බිමේ මව්වරු සහ දියණියෝ සහ ජාතික ප්‍රජාතන්ත්‍රවාදී ආයතනය වැනි ජාතික මට්ටමේ සංවිධාන විසින් ස්ත්‍රී නියෝජනය සම්බන්ධ අධ්‍යයන හා දැනුවත් කිරීමේ වැඩසටහන් සංවිධානය කරනු ලැබීය. 2000 දශකයේ මැද ගණන් වන විට එබඳු ක්‍රියාකාරකම් පළාත් හා ප්‍රාදේශීය මට්ටමට යම් තරමකින් හෝ ව්‍යාප්ත වීමක් ඇරඹිණි. මෙහිදී බදුල්ල - කාන්තා සංවර්ධන මධ්‍යස්ථානය හා සමාජ, ආර්ථික සහ පාරිසරික සංවර්ධන සංවිධානය (Social Economic and Environmental Development Organization - SEEDO), බුත්තල - ඌව වෙල්ලස්ස ගොවි කාන්තා සංවිධානය, කුරුණෑගල - ස්ත්‍රී සම්පත් මධ්‍යස්ථානය, ත්‍රිකුණාමලයේ - විලුතු සංවිධානය, ගාල්ල - දිරියට සවියක් කාන්තා සංවිධානය, මහනුවර - විකල්ප සංවර්ධන කේන්ද්‍රය, සාමය සහ යහපාලනය සඳහා වූ කාන්තාවෝ සහ යුද්ධයෙන් විපතට පත් කාන්තාවෝ වැනි ප්‍රාදේශීය සංවිධාන විසින් ස්ත්‍රී නියෝජනය වර්ධනය කිරීම සම්බන්ධ වැඩසටහන් දිස්ත්‍රික්ක හා ප්‍රාදේශීය සභා මට්ටමින් සංවිධානය කරනු ලැබිණි.

තවද, ස්ත්‍රීන්ගේ දේශපාලන නියෝජනය සම්බන්ධයෙන් උනන්දුවක් දක්වන ප්‍රධාන රාජ්‍ය නොවන සංවිධාන කීපයක් හා විද්වතුන් එක්ව 1990 අවසාන භාගයේ සිටම රාජ්‍ය ප්‍රතිපත්ති සම්පාදකයින්ට බලපෑම් කළේය. ස්ත්‍රී ප්‍රතිපත්ති ප්‍රකාශනයක් සම්පාදනය

කොට එය ප්‍රධාන දේශපාලන පක්ෂ වලට ඉදිරිපත් කිරීමටත්, 2000 සිට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සම්පාදකයින්ට බලපෑම් කිරීම මගින් ස්ත්‍රී නියෝජනය සඳහා කිසියම් අනුපාතයක් ව්‍යවස්ථානුකූලව වෙන් කරවා ගැනීමටත් ඔවුහු උත්සාහ කළහ.

2003 දී මේ සම්බන්ධයෙන් උනන්දුවක් දක්වන ක්‍රියාකාරිනියන් පාර්ලිමේන්තු මැතිවරණ ප්‍රතිසංස්කරණ තේරීම් කමිටුවටද අනුපාත ක්‍රමය පිළිබඳ යෝජනාව ඉදිරිපත් කළේය. 2004 දී ප්‍රාදේශීය සභා සඳහා 33.3% අනුපාතයක් ස්ත්‍රීන්ට ලබාදීම පිළිබඳව අධ්‍යයනය කිරීමට කැබිනට් උප කමිටුවක් පත් කෙරිණි. නමුත් එයින් කිසිදු විධිමත් නිර්දේශයක් ඉදිරිපත් වූයේ නැත. පළාත් පාලන මැතිවරණ සංශෝධනය පිළිබඳ පාර්ලිමේන්තු තේරීම් කමිටුවටද ජාතික කාන්තා කමිටුව, රාජ්‍ය නොවන සංවිධාන හා විද්වතුන් ලිඛිතව මෙන්ම වාචිකවද මෙම අනුපාත ක්‍රමය පිළිබඳ යෝජනාව විවිධ අවස්ථාවලදී ඉදිරිපත් කළේය. සියළුම පාර්ලිමේන්තු මන්ත්‍රීවරිටන්ගෙන් සමන්විත පාර්ලිමේන්තු කාන්තා කෝකසය මගින්ද එම යෝජනාව අදාළ කමිටුවට ඉදිරිපත් කළේය. එහෙත් මේ දක්වා ඒ සම්බන්ධයෙන් කිසිදු ධනාත්මක ප්‍රතිචාරයක් ආණ්ඩුවෙන් ලැබී නැත. පාර්ලිමේන්තු කාන්තා කෝකසය මෙම යෝජනාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට 2012 දී උත්සාහ කළද එයද සාර්ථක නොවීය.

ස්ත්‍රී දේශපාලන නියෝජනය වර්ධනය කිරීම සම්බන්ධයෙන් උනන්දුවක් දක්වන ස්ත්‍රී සංවිධාන හා විද්වතුන් ගණනාවක් විසින් මේ අයුරින් දැනුවත් කිරීම්, පුහුණු කිරීම්, ඡන්ද අපේක්ෂිකාවන්ට සහාය දැක්වීම්, බලපෑම් කිරීම් හා ස්වාධීන අපේක්ෂක කණ්ඩායම් ලෙස මැතිවරණ වලට ඉදිරිපත් වීම් ආදිය කරගෙන යනු ලැබුවද, මෙතෙක් කිසිදු දේශපාලන පක්ෂයක් විසින් ස්වේච්ඡා පංගු ක්‍රමයක් හඳුන්වා දීමට හෝ ශ්‍රී ලාංකික ආණ්ඩුව විසින් නීත්‍යානුකූලව ස්ත්‍රීන් නියෝජනය සඳහා අනුපාතයක් වෙන්කිරීමට හෝ වෙනත් කිසිදු ප්‍රගතිශීලි පියවරක් ගැනීමට කටයුතු කර නොමැත.

2

ස්ත්‍රී දේශපාලන නියෝජනයඃ ජාත්‍යන්තර හා ජාතික තත්ත්වය

අන්තර් පාර්ලිමේන්තු සංගමය විසින් (Inter-Parliamentary Union, March, 2012) රටවල් 189 ක් ඇසුරින් කරන ලද අධ්‍යයනයකට අනුව, සමස්ත ලෝකයේම ව්‍යවස්ථාදායකයන්හි (මණ්ඩල දෙකේම) ස්ත්‍රී නියෝජනයේ ප්‍රතිශතය 2012 වනවිට 19.6% කි. පහළ මණ්ඩල-වල එම ප්‍රතිශතය 19.9% ක් හා ඉහළ මණ්ඩලවල 18.2% ක් වේ. පසු-ගිය දශක කීපය තුළදීම ලෝක පාර්ලිමේන්තු වල ස්ත්‍රී නියෝජනයේ වර්ධනයක් ප්‍රකාශ වුවත් එය ඉතා හෙමින් සිදුවන්නකි. 1945 දී එම ප්‍රතිශතය 2.6% ක් වූ අතර 1965 - 8.7%, 1975 - 10.7%, 1985 - 12.4%, 1995 - 10.4%, 2005 - 15.6%, 2010 - 19.1% ක් හා 2012 - 19.6% කි.

කලාපීය වශයෙන් ගත්විට ස්ත්‍රී නියෝජනයේ විශාල පරතරයක් දැකිය හැකිය. නෝර්ඩික් රටවල එය 42.0% කි. උතුරු හා දකුණු අමරිකානු කලාපයේ 22.7%, නෝර්ඩික් රටවල් හැර අනෙක් යුරෝපා රටවල 20.9%, අප්‍රිකානු රටවල 19.8%, ආසියාවේ 18.8%, පැසිපික් රටවල 12.4% හා අරාබි රටවල 11.7% කි (වගුවඃ 1).

දැනට ලෝකයේ පාර්ලිමේන්තු ස්ත්‍රී නියෝජනයේ ඉහළම ප්‍රතිශතය දිනාගෙන ඇත්තේ රුවන්ඩාව වන අතර එය 56.3% කි. ඇන්ඩෝරා 50.0%, කියුබාව 45.2%, ස්වීඩනය 44.7%, ෂීසෙල්ස් 43.8%, පින්ලන්තය 42.5%, දකුණු අප්‍රිකාව 42.3%, නෙදර්ලන්තය 40.71% හා නිකරගුවා 40.2% යනාදී වශයෙන් එම ප්‍රතිශතය 40% කට වැඩි අගයක් දිනාගෙන ඇති රටවල් නවයකට පමණ සීමා වේ. රටවල් 21 ක් 39% - 30% අතර ප්‍රතිශතයක් දිනාගෙන ඇත. අයිස්ලන්තය 39.7%,

නෝර්වේ 39.6%, මොසැම්බික් 39.2%, ඩෙන්මාර්ක් 39.1%, කොස්ටරිකා 38.6%, ඇන්ගෝලා 38.2% හා බෙල්ජියම 38.0% වන අතර මෙම පරාසයේ පවතින එකම දකුණු ආසියාතික රට නේපාලය පමණි. (33.2% - 2008 අප්‍රියෙල්). "Critical Mass"[3] නමින් හැඳින්වෙන රාජ්‍ය ප්‍රතිපත්ති සම්පාදනය හා ආණ්ඩුකරණ ක්‍රියාවලියේදී ප්‍රමාණවත් බලපෑමක් කිරීමට අවශ්‍ය ප්‍රතිශතය ලෙස සැලකෙන 33.3%, 2012 වන විට දිනාගෙන ඇත්තේ රටවල් 22 ක් පමණි. නමුත් රටවල් 30 ක් 30.5% කට ඉහළ ප්‍රතිශතයක් ලබාගෙන ඇත. ස්ත්‍රී නියෝජනය 29-20% අතර අගයක පවතින රටවල් 46 කි. ඇෆ්ගනිස්ථානය 27.7% සහ පකිස්ථානය 22.5% යන දකුණු ආසියාතික රටවල් දෙකද ඒ අතර වේ. 20% ට වඩා අඩු එහෙත් 10% ට වැඩි ප්‍රතිශතයක් දිනාගෙන ඇති රටවල් 67 කි. බංගලාදේශය 19.7% හා ඉන්දියාව 11.0%, එම පරාසය තුළට අයත් වේ. 10% ට අඩු හා 5% ට වැඩි අගයක් ගන්නා රටවල් 24 කි. එම පරාසයේ අවසාන ප්‍රතිශතය එනම් 5.8% ක අගයක ලංකාව ස්ථානගත වී තිබේ. රටවල් 12 ක පාර්ලිමේන්තුවල ස්ත්‍රීන් නියෝජනය නොවේ (වගුවඃ 2).

දකුණු ආසියාතික කලාපයේ රටවල් අතරින් නේපාලය (රටවල් 189 අතරින්) 20 වැනි ස්ථානයත්, ඇෆ්ගනිස්ථානය 33 වැනි ස්ථානයත්, පකිස්ථානය 53, බංගලාදේශය 65, ඉන්දියාව 106, මාලදිවයින 129 හා ශ්‍රී ලංකාව 130 වැනි ස්ථානයත් හිමිකර ගෙන ඇත. දකුණු ආසියානු රටවල් අතරින් ශ්‍රී ලංකාව සමාජ සංවර්ධන දර්ශකවලින් ඉහළම අගයක් බොහෝ අංශවලදී දිනාගෙන ඇත. ශ්‍රී ලාංකික ස්ත්‍රීන්ගේ සාක්ෂරතාවය (91%), ද්විතීය පාසැල්වල ගැහැණු ළමයි 53%, විශ්ව විද්‍යාල 62%, ශ්‍රම දායකත්වය (36%) හා ස්ත්‍රීන්ගේ සාමාන්‍ය ආයු

3 Critical Mass theory යන න්‍යාය ඩෲඩ ඩලරුප්ගේ අධ්‍යයනවලින් හඳුන්වා දී තිබේ. තීරණ ගන්නා ආයතනයක යම් ජනකොටසක් නිසිලෙස නියෝජනය වීමට නම් අවම වශයෙන් 33% කවත් නියෝජනයක් තිබිය යුතු බැව් එයින් ප්‍රකාශ කෙරේ. ස්කැන්ඩිනේවියානු රටවල් හා තවත් රටවල් රැසක තීරණ ගන්නා ආයතනවල ස්ත්‍රී නියෝජනය එම තීරණවලට බලපාන ආකාරය පිළිබඳ විධිමත් විශ්ලේෂණ කිරීම තුළින් ඩලරුප් මෙම න්‍යාය ඉදිරිපත් කර තිබේ. (Dahrerup, 2006).

කාලය (වසර 73) ආදී වශයෙන් වේ. තවද ලංකාවේ පරිපාලන ක්ෂේත්‍රය තුළද ස්ත්‍රී සහභාගිත්වය වර්ධනය වෙමින් පවතී. දැනට අමාත්‍යංශ ස්ථිර ලේකම්වරියන් 6 දෙනෙකු හා දිස්ත්‍රික් ලේකම්වරියන් 6 දෙනෙකුද සේවයේ නිරත වී සිටී. ප්‍රාදේශීය ලේකම්වරියන්ගෙන් 24% ක් පමණ ස්ත්‍රීහු වෙති. ප්‍රධාන අග්‍ර විනිශ්චයකාර හා නීතිපති ධුර ද ස්ත්‍රීහු හොබවති. ලාංකික ස්ත්‍රිය සමාජ හා ආර්ථික වශයෙන් එබඳු විවිධ ජයග්‍රහණ හිමිකරගෙන තිබුණද ඇගේ, දේශපාලන නියෝජනය ඉතාමත් පහළ අගයක පවතී.

ලොව පළාත් පාලන ආණ්ඩු තුළ ස්ත්‍රී නියෝජනය සම්බන්ධ දත්ත විධිමත් ලෙස එක්රැස් කොට නොමැත. එහෙත් නෝර්ඩික් රටවල හා උතුරු අමරිකාවේ දත්තවලට අනුව පළාත් පාලන ආයතන තුළ 40-30% ක ප්‍රමාණයක් ස්ත්‍රීන් නියෝජනය වේ. මාලදිවයින හා ශ්‍රී ලංකාව හැර අනෙක් සියලුම දකුණු ආසියාතික රටවල පළාත් පාලන ආයතන තුළ ස්ත්‍රීන් 30-35% අතර ප්‍රමාණයක් නියෝජනය වේ (Raman, 2006).

ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තුව තුළ ස්ත්‍රීන්ගේ දේශපාලන නියෝජනය 1948 නිදහස ලැබීමේ සිට මේ දක්වාම කිසිදු අවස්ථාවක 6.5% ඉක්මවා ගොස් නැත. 1977 දී එය 6.5% වූ අතර, එතැන් සිට 2012 දක්වාම එම ප්‍රතිශතය 5.8% හා 4.0% අතර පරාසයක පවතී.

දකුණු ආසියාවේ රටවල් අතුරින් ප්‍රථමයෙන්ම සර්වජන ඡන්ද බලය දිනාගැනීමට 1931 දී ශ්‍රී ලාංකික ස්ත්‍රීන් සමත් විය. එසේම ලොවට ප්‍රථම අගමැතිනිය බිහිකිරීමේ ගෞරවයද ලංකාවට හිමි වේ. එහෙත් 1931 දී රාජ්‍ය මන්ත්‍රණ සභාවට නියෝජනය වූයේ එක් ස්ත්‍රියකි. 1936 දී තවත් ස්ත්‍රියක් රාජ්‍ය මන්ත්‍රණ සභාවට තේරී පත්විය. එවකට පැවති රාජ්‍ය මන්ත්‍රණ සභාවේ ස්ත්‍රී නියෝජනයේ ප්‍රතිශතය 3.7% කි. 1931 සිට වසර 80 ක දිගුකලක් ගතවී, විවිධ අංශවලින් ස්ත්‍රීන්ගේ තත්ත්වයේ වර්ධනයක් සිදුවෙමින් තිබුණද, 2012 දීත් එම ප්‍රතිශතය

5.8% ක පැවතීම උභතෝකෝටික ප්‍රශ්නයකි (වගුව: 3).

ශ්‍රී ලංකාවේ පළාත් පාලන ආයතනවල ස්ත්‍රී නියෝජනය මෙයටත් වඩා අඩු අගයක පවතී. 2008/2009 මැතිවරණයේ ප්‍රතිඵලවලට අනුව පළාත් සභාවල ස්ත්‍රී නියෝජනය 4.8% කි (වගුව: 4). 2006 පළාත් පාලන මැතිවරණවල ප්‍රතිඵල අනුව මහනගර සභාවල ස්ත්‍රී නියෝජනය 3.0% ක්, නගර සභා 3.4% ක් හා ප්‍රාදේශීය සභා 1.6% ක් වේ. 2011 මැතිවරණ ප්‍රතිඵල අනුව සමස්ත පළාත් පාලන ආයතනවල ස්ත්‍රී නියෝජනයේ ප්‍රතිශතය 1.93% කි (වගුව: 5).

මේ අයුරින් ශ්‍රී ලංකාවේ ස්ත්‍රීන්ගේ දේශපාලන නියෝජනය අවම මට්ටමක පැවතීමට විවිධ සමාජ, සංස්කෘතික, ආර්ථික, මනෝ භාවාත්මක මෙන්ම දේශපාලන සාධකද බලපෑම් කරයි. පීතෘ මූලික සමාජ ආකල්ප, ස්ත්‍රීන්ට සමාජයෙන් පවරා දී ඇති සම්ප්‍රදායික ගෘහස්ථ භූමිකා, ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය සමාජානුයෝජන ක්‍රියාවලිය, ස්ත්‍රීන්ට ඇති අඩු නිදහස හා සමහර ආගමික අර්ථකතන හා තහංචි ආදියත් සමාජ හා සංස්කෘතික බාධක අතරින් මූලික වේ. පුරුෂයන්ට සාපේක්ෂව බොහෝ ස්ත්‍රීන් ආර්ථික වශයෙන් අඩු ස්වාධීනත්වයක් දැරීම, නූතන ශ්‍රී ලාංකික මැතිවරණවලට වියදම් කිරීම සඳහා අවශ්‍යවන ආකාරයේ මුදල් සම්භාරයක් එකතු කරගැනීමට පොදුවේ ස්ත්‍රීන්ට අපහසු වීම හා යම් යම් වත්කම් ඇති ස්ත්‍රීන්ට පවා පවුලේ වැඩිමහල් පුරුෂයන්ගේ අවසරයකින් තොරව ඒවා මැතිවරණ ව්‍යාපාරවලට යෙදවීමට නොහැකිවීම ආදියද ස්ත්‍රීන්ගේ අවම දේශපාලන නියෝජනය කෙරෙහි බලපාන බාධක වේ. තවද, බොහෝ අවස්ථාවලදී ස්ත්‍රීන් පොදු කටයුතුවල යෙදීම නුසුදුසුය, ඔවුන්ට නායකත්ව හැකියා නොමැත, ඔවුන් පවුලේ වගකීම්වලට වැඩි ප්‍රමුඛතාවයක් දියයුතුය යනාදී මතිමතාන්තරද ස්ත්‍රීන්ගේ සිත්සතන් තුළමත් පැළපදියම් වී ඇත. එබඳු මනෝමූලික බාධකත් ඔවුන්ගේ දේශපාලන නියෝජනය අවම කිරීමට ප්‍රධාන බාධාවක් වී තිබේ. මෑතකදී කරන ලද අධ්‍යයන ගණනාවකට අනුව ස්ත්‍රීන්ගේ අඩු දේශපාලන නියෝජනයට බලපාන

මූලිකම හේතුව වී ඇත්තේ මැතිවරණ නාමයෝජනා ලබා දීමේදී දේශපාලන පක්ෂ පුරුෂයන්ට සමාන අයුරින් ස්ත්‍රීන්ට නොසැලකීමයි. නූතන ශ්‍රී ලාංකික දේශපාලන ක්‍රමය තුළ දේශපාලන නියෝජිතයකු වීම යන්න ඉතා කෙටි කලකින් පොහොසත් වීම සඳහා ඇති හොඳම උපාය මාර්ගයක් ලෙස සැලකේ. ශ්‍රී ලාංකික සමාජ හා ආර්ථික ක්ෂේත්‍රවලදී මෙන්ම දේශපාලන ක්ෂේත්‍රයේදීත් පුරුෂ මූලික පරිසරයක් තුළ එම ආදායම් ඉපයීමේ මාර්ගයට අවතීර්ණ වීමේ වරම හිමිකර ගන්නේ පුරුෂයන්ය. විශේෂ අවස්ථාවකදී හැරුණු විට පුරුෂයන් ඔවුන්ගේ ඥාති, හිතවත් හෝ වෙනත් සමාජ සබඳතා භාවිත කොට නාමයෝජනා ලබාගැනීමේදී වැඩි වාසි අත්කර ගනී. ස්ත්‍රීන් තීරණ ගන්නා මට්ටම්වල නියෝජනය වීමේ වැදගත්කම හා අවශ්‍යතාවය පිළිබඳව පක්ෂවල තීරණ ගන්නා අයවලුන්ට මෙන්ම ඡන්දදායකයින් බොහෝ දෙනාටත් පැහැදිලි අවබෝධයක් නොවීමත්, පක්ෂවල අභ්‍යන්තර ප්‍රජාතන්ත්‍රවාදයක් නොවීමත්, ඡන්ද කොට්ඨාශ මට්ටමේ පක්ෂ සංවිධායකයින්ගේ අනිසි බලපෑමත් එබඳු තත්වයක් ඇති වීමට මූලික වශයෙන් බලපා තිබේ (Kiribamune, 1994, 1999; Kodikara, 2009; ලියනගේ, 1998; 2011; Liyanage, 1996, 1999).

3

පංගු ක්‍රම න්‍යාය: ස්ත්‍රී-පුරුෂ සමාන දේශපාලන පුරවැසි බව

ස්ත්‍රී-පුරුෂ සමාන දේශපාලන නියෝජනයක් සඳහා පංගු ක්‍රම හඳුන්වා දීම මෑත කාලයේදී සුලභව දක්නට ලැබේ. නමුත් මූලික කරුණු දෙකක් නිසා එය සංකීර්ණ මෙන්ම විවාදාත්මක සංවාදයක් බවට පත්වී තිබේ. පංගු ක්‍රමය දෙස සමහරුන් බලන්නේ ව්‍යූහාත්මක බාධක නිසා සාධාරණ බල තරඟයකට ඉදිරිපත් වීමට ඓතිහාසිකවම සමාන ඉඩ ප්‍රස්ථා නොලැබුණු, නැතිනම් එම තරඟයෙන් කොන් කෙරුණු සමාජ කණ්ඩායමකට සාධාරණත්වය සඳහා ලබාදෙන වන්දියක් වශයෙනි. තවත් අය පංගු ක්‍රමය සලකනු ලබන්නේ සමානාත්මතාවය හා සාධාරණත්වය යන ප්‍රජාතන්ත්‍රවාදී සංකල්ප උල්ලංඝනය කිරීමක් හා එක් සමාජ කණ්ඩායමකට වෙනස්ව හෝ විශේෂකොට සැලකීමක් ලෙසිනි.

විවිධ රටවල පංගු ක්‍රම හඳුන්වා දීම සහ එනිසා ලැබුණු ප්‍රතිඵල පිළිබඳ යම් ප්‍රමාණයකින් හෝ අධ්‍යයන කෙරී ඇත්තේ ඉතාමත් අල්ප වශයෙනි. එනිසා පංගු ක්‍රම න්‍යාය ප්‍රජාතන්ත්‍රවාදය, පුරවැසිබව, නියෝජන ක්‍රම, සමානාත්මතාවය, සාධාරණත්වය, යහපාලනය හා තිරසාර සංවර්ධනය වැනි සංකල්ප සමඟ ඍජුවම බැඳී ඇති බව සමාජයේ බහුතරයක් අවබෝධ කරගෙන නොමැත. විශේෂයෙන්ම ශ්‍රී ලංකාව වැනි රටවල දේශපාලන පක්ෂ නායකයින්, ජනතා නියෝජිතයින්, රාජ්‍ය ප්‍රතිපත්ති සම්පාදනය කරන්නන් හා ක්‍රියාත්මක කරන්නන්, සිවිල් සමාජ ක්‍රියාකාරීන් හා ඡන්ද දායකයින්ගෙන් බහුතරයකට තවමත් ඒ පිළිබඳ පැහැදිලි හෝ ප්‍රමාණවත් අවබෝධයක් නොමැත. එයට මූලික හේතුව වන්නේ පංගු ක්‍රම පිළිබඳ සාකච්ඡාවේදී

ප්‍රජාතන්ත්‍රවාදය, ස්ත්‍රී-පුරුෂ සමානාත්මතාවය, මානව අයිතිවාසිකම් හා දේශපාලන පංගු ක්‍රම අතර ඇති න්‍යායාත්මක සබඳතාවය පිළිබඳ සමාජය අවම අවධානයක් යොමුකර තිබීමයි.

පංගු ක්‍රමයක් යනු කුමක්ද?

පංගු ක්‍රමයක් හෝ අනුපාත ක්‍රමයක් යනු කිසියම් දේශපාලන ආයතනයක, කමිටුවක හෝ රැකියා ක්ෂේත්‍රයක, අඩුවෙන් නියෝජනය වන ජන කණ්ඩායමකට වැඩි නියෝජනයක් ලබා ගැනීම සඳහා වෙන් කරදෙනු ලබන පංගුවකි. නැතිනම් ප්‍රතිශතයකි. ස්ත්‍රීන්ගේ දේශපාලන නියෝජනය වර්ධනය කිරීම සඳහා යොදාගන්නා උපක්‍රමයක් ලෙස ව්‍යවස්ථානුකූලව හෝ මැතිවරණ නීති මගින් හෝ දේශපාලන පක්ෂ ස්වේච්ඡාවෙන් වෙන් කරන පංගු ක්‍රම පිළිබඳ කතිකාවක නූතන දේශපාලන විද්‍යා හා ස්ත්‍රී අධ්‍යයනවල වැදගත් මාතෘකාවක් වී තිබේ. නමුත් පංගු ක්‍රමය ස්ත්‍රී නියෝජනය වර්ධනය සඳහා පමණක් නොව තරුණ නියෝජනය, පහත් යයි සම්මත කුල, සුළු ජන වර්ග නියෝජනය ආදියටද භාවිත කෙරේ. එසේම ගුරු, හෙදි වැනි රැකියා ක්ෂේත්‍රවලට පුරුෂයන් කිසියම් අනුපාතයක් බඳවා ගතයුතු යයි අනුපාතයක් නියම කරන අවස්ථාද තිබේ.

දේශපාලන ආයතනවලට හෝ රැකියාවලට තෝරා ගැනීමේදී නියම කරන අනුපාත / පංගු ක්‍රමයෙන් බර තබන්නේ තේරී පත්වන පුද්ගලයාට නොව බඳවා ගැනීමේ ක්‍රියාවලිය හසුරුවන පුද්ගලයන්ටය. ස්ත්‍රී දේශපාලන නියෝජනය වර්ධනය කිරීම සඳහා භාවිත කරන පංගු ක්‍රමයේ මූලික අරමුණු වන්නේ දේශපාලන ආයතනවලට වැඩියෙන් ස්ත්‍රීන් බඳවා ගැනීම සහ දේශපාලන ක්ෂේත්‍රයේදී ස්ත්‍රීන් හුදකලා නොවේය යන්න අවධාරණය කිරීමයි. ස්ත්‍රීන් දේශපාලන ආයතනවලට නියෝජනය වීමේදී බලපාන ගැටළු අවම වනතාක්, තාවකාලික පියවරක් වශයෙන් පංගු ක්‍රමය භාවිතා කෙරේ.

සමහර නූතන රටවල ස්ත්‍රී-පුරුෂ මධ්‍යස්ථ පංගු ක්‍රමද භාවිත කෙරේ. එහිදී ස්ත්‍රී-පුරුෂ දෙපක්ෂයේම අඩු නියෝජනය නිවැරදි කිරීම මූලික අරමුණ වේ. උදාහරණයක් වශයෙන් ස්ත්‍රීන් හෝ පුරුෂයන් ගෙන් අවම වශයෙන් 40% ක් වත් නියෝජනය වීම අත්‍යවශ්‍යය බැව් මෙම ක්‍රමයේදී අවධාරණය කෙරේ.

පුරුෂ නියෝජනය අවම වන රැකියා ක්ෂේත්‍රවල අනිවාර්යෙන් පුරුෂයන් සඳහා අනුපාතයක් වෙන් කිරීමද සිදුකෙරේ. උදාහරණයක් ලෙස ප්‍රාථමික පාසැල්වල ගුරුවරුන්, හෙදියන්, ඇඟළුම් කම්හල් සේවකයින් හා ඉලෙක්ට්‍රොනික් භාණ්ඩ හා පරිසනක අමතර කොටස් නිපදවන්නන් අතර ස්ත්‍රීන්ගේ ප්‍රතිශතය ඉතා ඉහළ අගයක් ගන්නා අවස්ථාවල පුරුෂයන් බඳවා ගැනීමට පංගුවක් භාවිතා කරයි. දේශපාලන නියෝජනයේදී පුරුෂයන්ගේ ප්‍රතිශතය වර්ධනය කිරීම සඳහා පංගු ක්‍රමය භාවිතා කරන අවස්ථා ඉතා විරලය. උදාහරණ වශයෙන් ඩෙන්මාර්කයේ සමාජවාදී ජනතා පක්ෂය පුරුෂයන් සඳහා පංගුවක් නියම කර තිබේ (Dahlerup, 1998).

පංගු ක්‍රම: න්‍යායාත්මක විශ්ලේෂණය

ප්‍රජාතන්ත්‍රවාදය, නිදහස, සමානාත්මතාවය (equality), සමසාධාරණත්වය (equity), මානව අයිතිවාසිකම්, පුරවැසිබව, දේශපාලන නියෝජනය, යහපාලනය, තිරසාර සාමය හා තිරසාර සංවර්ධනය යන සෑම දේශපාලන හා සමාජ සංකල්පයක්ම ස්ත්‍රීන්ගේ දේශපාලන අයිතිවාසිකම් විශේෂයෙන්ම තීරණ ගැනීමේදී නියෝජනය සඳහා ඇයට ඇති අයිතියට ඍජුවම සම්බන්ධය. මේවා න්‍යායාත්මක වශයෙන් ඉදිරිපත් වී ඇත්තේ ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය මධ්‍යස්ථ (Gender neutral) සංකල්ප ලෙසය. නමුත් ප්‍රායෝගික වශයෙන් එම සංකල්ප පුරුෂ කේන්ද්‍රීය නැතිනම් පුරුෂයන්ට පක්ෂපාතී ඒවා බවට පත් වී ඇත. එසේ නැතිනම් එම සංකල්ප පුරුෂ අර්ථකතනවලට අනුව විස්තර කිරීම නිසා ස්ත්‍රී-පුරුෂ සමානාත්මතාවය යන්නට

අවධානය යොමු කර නැත. එක්කෝ එයට අඩු අවධානයක් යොමුකර ඇත.

ප්‍රජාතන්ත්‍රවාදය

දේශපාලන ක්‍රමයක් ලෙස සැලකූ විට ප්‍රජාතන්ත්‍රවාදය යන්නෙන් ''ජනතාවගේ පාලනය'' යන අදහස අර්ථ ගැන්වේ. මෙහි ''ජනතාව'' යන්නෙන් හැඟෙන්නේ පුරුෂයන් පමණක් නොවේ. ස්ත්‍රීන්ද අනිවාර්යයෙන්ම ජනතාවගෙන් නැතිනම් රටක ජනගහණයෙන් අඩක් හෝ එයට වඩා වැඩි වේ. ජෝන් සීලි (John Seeley) ට අනුව ''ප්‍රජාතන්ත්‍රවාදය'' යනු සියලුම දෙනාට පංගුකාරකමක් ඇති ආණ්ඩුවකි. එම පංගුකාරයින් සියලුම දෙනාට සමාන පුරවැසිබව, සමාන අයිතිවාසිකම්, සමාන නිදහස, සමාන අනන්‍යතාවය, සමාන සම්පත් හා ඉඩප්‍රස්ථා ලැබීම ප්‍රජාතන්ත්‍රවාදයේ මූලික අංග ලක්ෂණයකි. ඒවා සම්බන්ධයෙන් ස්ත්‍රී-පුරුෂ ලිංගිකත්වය, ජන වර්ගය, වර්ණය, ආගම හෝ භාෂාව ආදී දෑ මත වෙනස්කමක් කළ නොහැකි වීම ප්‍රජාතන්ත්‍රවාදය සම්බන්ධ න්‍යායේ අත්‍යවශ්‍ය සිද්ධාන්තයකි (Johari, 1999). එහෙයින් සැබෑ ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩු ක්‍රමයක දී එහි පංගුකරුවන් වන සියලුම ස්ත්‍රීන් හා පුරුෂයන්ට සමාන අයුරින් එහි පාලනයට සහභාගී වීමේ හැකියාව තිබිය යුතුය. ස්ත්‍රී-පුරුෂ දෙපාර්ශවයටම එබඳු සමාන පංගුකාරකමක් නොලැබේ නම් එය අසම්පූර්ණ ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුක්‍රමයකි.

රාජ්‍ය

රාජ්‍ය පිළිබඳ අර්ථකතනයේදී ආණ්ඩුව, භූමිය මෙන්ම ස්වාධිපත්‍ය හා ජනගහණයත් එහි අත්‍යවශ්‍ය අංග ලෙස සැලකේ. සියලුම ප්‍රජාතන්ත්‍රවාදී රටවල ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව ස්වාධිපත්‍ය හිමි වන්නේ එරට ජනතාවටයි. ජනගහණය යනු යම් රටක ස්ථිරව (පාරම්පරිකව හෝ ලියාපදිංචි වීමෙන්) පදිංචි වී සිටින

ජනතාවයි. එම ''ජනතාව'' යන කණ්ඩායමටද අනිවාර්යයෙන්ම ස්ත්‍රී-පුරුෂ දෙපාර්ශවයම අයත් වේ. නූතන නියෝජන ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩු ක්‍රමවල ජනතා ස්වාධිපත්‍ය සර්ව ජන ඡන්දය මගින්, නිදහස් හා ස්වාධීන වූ මැතිවරණයකදී තෝරා ගන්නා මහජන නියෝජිතයින්ට පැවරේ. එම නියෝජිතයින් ඔවුන්ට පැවරූ ස්වාධිපත්‍ය භාවිත කොට ජනතාව වෙනුවෙන් කිසියම් නිශ්චිත කාල සීමාවකට රට පාලනය කරයි. මෙම න්‍යායන්ට අනුව ස්වාධිපත්‍ය ස්ත්‍රී-පුරුෂ දෙපක්ෂයටම හිමිය. එසේ තම ස්වාධිපත්‍ය භාවිත කොට මහජන නියෝජිතයින් තෝරා ගැනීමට මෙන්ම, නියෝජනය වීමටත් ස්ත්‍රී-පුරුෂ දෙපාර්ශවයටම සමාන අයිතියක් හිමිවේ.

නූතන සමාජ හා දේශපාලන න්‍යායන්හිදී **පුරවැසියා** යන්නෙන් සරල අරුතින් හැඟෙන්නේ නීත්‍යානුකූලව කිසියම් රාජ්‍යයක සාමාජිකයකු වීම යන්නයි. මෙම නීතිමය සාමාජිකත්වය ස්ත්‍රී හෝ පුරුෂ වශයෙන් බෙදීමකට ලක්කොට නැත. ලොව ජීවත් වන සියලුම ස්ත්‍රීන් හා පුරුෂයන්ට මෙම පුරවැසිභාවය යම්කිසි රාජ්‍යයක් තුළ ලැබී තිබේ (සරණාගතයින්, මිනිස් වෙළඳාමට බඳුන් වන්නන් හා නීත්‍යානුකූල නොවන සංක්‍රමණිකයින් ආදීන් හැර). එහෙයින් සියලුම පුරවැසියන්ට ලිංග භේදයකින් තොරව, අදාළ රටේ සිවිල්, ආර්ථික, දේශපාලන හා සමාජ අයිතිවාසිකම් භුක්ති විඳීමට නීතියෙන් වරමක් ලැබේ. එසේම එම රටේ දේශපාලන ප්‍රජාවේ සක්‍රීය ක්‍රියාකරුවෙක් වීමටද, ස්ත්‍රී-පුරුෂ දෙපක්ෂයටම සමාන අයිතියක් හිමිවේ. දේශපාලන පක්ෂ, මැතිවරණ කටයුතු, ඡන්දය දීම, නියෝජනය වීම, ආණ්ඩුවට බලපෑම් කිරීම හා විවේචනය කිරීම ආදී ක්‍රියාකාරකම්වලට සක්‍රීයව සහභාගී වීමටද එම දෙපක්ෂයටම අයිතිය ලැබේ (උයන්ගොඩ, 2010).

''දේශපාලන නියෝජනය'' යන්නට එක් සරල අරුතක් දිය නොහැකි වුවත් පොදුවේ එයින් අදහස් වන්නේ ''සමස්ත පුරවැසියන්ගේ හෝ එයින් කොටසකගේ නැතිනම් බහුතරයකගේ ආකල්ප, ප්‍රමුඛතාවයන්, ආශාවන් හා වුවමනාවන් පොදු අනුමැතියකින්,

පුරවැසියන් වෙනුවෙන් ඉදිරිපත් වන කුඩා කණ්ඩායමක් විසින් ආණ්ඩුවේ ක්‍රියාකාරකම් බවට පත් කිරීමය''(Encyclopedia of Democracy, 1995). ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී මතයට අනුව සියලුම පුරවැසියන්ට ස්ත්‍රී-පුරුෂ භේදයකින් තොරව සර්වජන ඡන්ද බලය හිමිවේ. ඔවුන්ට නිදහස් හා සාධාරණ මැතිවරණයකදී කැමති ස්ත්‍රී හෝ පුරුෂ නියෝජිතයකු තමන් වෙනුවෙන් තෝරා ගැනීමට අයිතියක් තිබේ (Ball, 1993).

සමානාත්මතාවය ඍණාත්මක හා ධනාත්මක සමානාත්මතාවය ලෙස වර්ගීකරණයකට ලක් කෙරේ. ඍණාත්මක සමානාත්මතාවය යන්නෙන් අර්ථකතනය වන්නේ ''ලිංගිකත්වය, ආගම, මානව වර්ණය, වර්ගය, භාෂාව, කුලය, පංතිය හා වෙනත් එබඳු බේදීමක් මත, කිසිඳු ආකාරයක වෙනස්කමක් කළ නොහැකිය'' යන්නයි (Laski, 1951). නමුත් එහි ධනාත්මක අර්ථකතනයට අනුව ''සියලුම මිනිසුන්ට සමාන නිදහස හා ඉඩ ප්‍රස්ථාවන් හිමිය. එහෙත් එකිනෙකාගේ පුද්ගල අවශ්‍යතා හෝ සංවර්ධනය සඳහා වෙනස් වූ වුවමනාවන් පවතින නිසා, ඒ අනුව වෙනස් වූ ඉඩ ප්‍රස්ථා ලබාදීම ද සමානාත්මතාවය'' ලෙස සැලකේ (Benn and Peters, 1965). උදාහරණ ලෙස පුරුෂයන්ගේ හා ස්ත්‍රීන්ගේ සංවර්ධනය සඳහා අවශ්‍ය සෑම නිදහසක් හා ඉඩ ප්‍රස්ථාවක්ම සමාන නොවේ. ඔවුන්ගේ ශාරීරික හෝ සමාජීය අවශ්‍යතා මත ඒවා වෙනස් විය හැකිය. එබඳු අවස්ථාවලදී එම වෙනස් වූ අවශ්‍යතාවය සැලකිල්ලට ගෙන ඉඩ ප්‍රස්ථා හා සම්පත් ආදිය ලබාදිය යුතුය. මෙය **සම සාධාරණත්වය** නමින් ද හැඳින්වේ. ස්ත්‍රීන් හා පුරුෂයන්ට සමසාධාරණ අයුරින් නොසලකා සමානාත්මතාවය දිනාගත නොහැකිය. එබඳු සමානාත්මතාවය හා සම සාධාරණත්වයෙන් තොර සමාජ ප්‍රජාතන්ත්‍රවාදී නොවේ.

මානව අයිතිවාසිකම් න්‍යායට අනුව සියලුම ස්ත්‍රීන් හා පුරුෂයින්ට සමාජ, සංස්කෘතික, ආර්ථික හා දේශපාලන අයිතිවාසිකම් සමානව හිමිවේ. ඕනෑම මිනිස් ජීවියකුට සිය පැවැත්ම, පුද්ගල

සංවර්ධනය, අනන්‍යතාවය ආරක්ෂා කර ගැනීම හා නිදහස භුක්ති විඳීම සඳහා මානව අයිතිවාසිකම් අත්‍යවශ්‍ය වේ (Cranston, 1973). බොහෝ රටවල ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථා මගින් මෙම මානව අයිතිවාසිකම් තහවුරු කර ඇත. සියලුම සමාජ, දේශපාලන හා ආර්ථික අයිතිවාසිකම් පොදු හා විශ්වීය වන අතර, එක් අයිතිවාසිකමක් තවෙකක් වෙනුවෙන් නොසලකා හැරීමට හෝ උල්ලංඝනය කිරීමට නොහැකිය. උදාහරණ ලෙස ස්ත්‍රීන් වීම නිසා ඡන්දය දීමේ අයිතිය හිමිකොට, නියෝජනය සඳහා ඇති අයිතිය නොසලකා හැරීම මානව අයිතිවාසිකම් න්‍යායට අනුව කළ හැක්කක් නොවේ. යම් සමාජයක එසේ කටයුතු කරන්නේ නම් එම සමාජ වල ප්‍රජාතන්ත්‍රවාදය අසම්පූර්ණය.

යහ පාලනය යන සංකල්පයද ස්ත්‍රී-පුරුෂ සමානාත්මතාවය, මානව අයිතිවාසිකම් හා සක්‍රීය සහභාගීත්වය සමඟ ඍජුවම සම්බන්ධ වේ. පාලනය යන්නෙන් සරලව අදහස් වන්නේ රාජ්‍ය කටයුතු නිසිලෙස කළමනාකරණය කිරීමයි. නීති හා ප්‍රතිපත්ති සම්පාදනයත්, ඒවා ක්‍රියාත්මක කිරීමත් එයට අයත් වේ. මිනිසාගේ සමාජ, ආර්ථික හා දේශපාලන ජීවිතය ගුණාත්මක අතින් වඩාත් වර්ධනය කිරීමට අවශ්‍ය, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් තහවුරු කරන ලද මානව හිමිකම් හා අනෙකුත් කොන්දේසි ජනතාවට ලබාදීම පාලනය යන්නෙන් හැඟෙන පුළුල් අර්ථය වේ. ඒ අනුව යහ පාලනය යන්නෙන් අදහස් වන්නේ රාජ්‍ය කටයුතු ඉතා හොඳින් කළමනාකරණය කිරීම වන අතර, විධිමත්ව සංවිධානය කළ පාලන ආයතන හරහා, ඉතා සඵල අයුරින් ජනතාවගේ භෞතික, සමාජ මෙන්ම මානසික යහපත සැලසීමයි (Panandiker, 2000). ''යහ පාලනය'' යන සංකල්පයේ අත්‍යවශ්‍ය අංග ලක්ෂණ අතර, සමානාත්මතාවය, මානව අයිතිවාසිකම් ආරක්ෂාව හා සහභාගිත්ව ක්‍රමවේදය විශේෂ වේ. රටක් යහ පාලනය දිනා ගැනීමට නම් අනිවාර්යයෙන්ම ස්ත්‍රී-පුරුෂ දෙපක්ෂයට සමානව සැලකීම, සමාන අයිතිවාසිකම් භුක්ති විඳීමට ඉඩ ප්‍රස්ථා ලබාදීම හා රාජ්‍ය මෙන්ම සිවිල් සමාජ ක්‍රියාකාරකම් සඳහා සමානව සහභාගි වීමේ හැකියාව ලබාදීම අත්‍යවශ්‍ය වේ. කිසියම් රටක් ඡන්දය ප්‍රකාශ

කිරීම වැනි ප්‍රාථමික දේශපාලන කර්තව්‍යයකට ස්ත්‍රීන්ට ඉඩකඩ ලබා දී, නියෝජනය සඳහා ඉඩ ප්‍රස්ථා සලසා නොදෙන්නේ නම් එම රටට යහ පාලනය දිනා ගැනීමට නොහැකි වේ.

තිරසාර සංවර්ධනය සඳහා ස්ත්‍රී-පුරුෂ දෙපක්ෂයේම සක්‍රිය සහභාගීත්වය අත්‍යවශ්‍ය වන අතර, සමාජ හා ආර්ථික සංවර්ධනයේ ඉලක්ක දිනා ගැනීමේදී එමගින් පරිවර්තනීය වෙනසකට මඟ පෑදේ (Karl, 1995). මෙම සහභාගීත්වය යන්නෙන් අරුත් ගැන්වෙන්නේ සංවර්ධන අවශ්‍යතා හඳුනා ගැනීම, ප්‍රමුඛතා පෙළ ගැස්වීම, අදාළ සැලසුම් සම්පාදනය, ක්‍රියාත්මක කිරීම, නිරීක්ෂණය, ඇගයීම හා ප්‍රතිලාභ භුක්ති විඳීම යන සියලුම මට්ටම්වලදී ස්ත්‍රී-පුරුෂ දෙපක්ෂයේම සහභාගීත්වයයි. සංවර්ධන ක්‍රියාදාමයේදී වැදගත් තීරණ බොහොමයක් ගනු ලබන්නේත්, විශේෂයෙන්ම සම්පත් බෙදා දෙනු ලබන්නේත් දේශපාලන නායකත්වය විසිනි. එහෙයින් ජනගහණයෙන් අඩක් වූ ස්ත්‍රීන් දේශපාලන ආයතන තුළ නියෝජනය වීමෙන් සමස්ත සමාජයේම සංවර්ධනයක් සිදුවේ. සංවර්ධන ක්‍රියාවලියෙන් 50% ක් වූ ස්ත්‍රීන් ඈත් කර තැබීම ජාතික ශ්‍රමය අපතේ යැවීමක්ද වේ. ස්ත්‍රීන්ගේ ජීවිතවල වර්ධනය සඳහා අදාළ තීරණ ගන්නා මට්ටම්වලදී වැඩි ස්ත්‍රීන් ප්‍රමාණයක් නියෝජනය වීමෙන් සමතුලිත සංවර්ධනයකටද මඟ පෑදේ (Moser, 1993; Young 1993).

1995, බෙයිජිං ජාත්‍යන්තර ස්ත්‍රී සමුළුවේදී ස්ත්‍රී-පුරුෂ සමාන නියෝජනය පිළිබඳ අදහස පිළිගනිමින් ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය මූලප්‍රවාහකරණය (Gender Mainstreaming) පිළිබඳ එකඟතාවය ප්‍රකාශයට පත්විය. ඒ අනුව ඕනෑම නීතියක්, ප්‍රතිපත්තියක් හෝ වැඩ පිළිවෙලක් සැලසුම් කිරීමේදීත්, ක්‍රියාත්මක කිරීමේදීත්, නිරීක්ෂණය කිරීම හා ඇගයීමේදීත් ස්ත්‍රී-පුරුෂ දෙපක්ෂයම සියලුම මට්ටම්වලදී සහභාගි කර ගැනීම බෙයිජිං ක්‍රියාකාරී වැඩ සැලැස්මෙන් තවදුරටත් අවධාරණය කළේය. ජාතික පමණක් නොව, ජාත්‍යන්තර තීරණ ගැනීම්වලදීත් ස්ත්‍රී-පුරුෂ සමාජභාවය පිළිබඳ අවධානය යොමු කිරීම එක්සත් ජාතීන්ගේ ආර්ථික හා සමාජ කවුන්සිලය විසින්ද 1997 දී පිළිගනු ලැබීය. සමාජයේ සියලුම මිනිසුන්ගේ අවශ්‍යතා සැලකිල්ලට

ගැනීම හා එමගින් ස්ත්‍රීන්ගේ අදහස්, අත්දැකීම්, වුවමනාවන් හා ප්‍රමුඛතාවන්ටද අවධානය යොමු කොට ඔවුන්ගේ ජීවන තත්ත්වයේ වර්ධනයක් කළහැකි බව මෙහිදී අවධාරණය කෙරිණි (King, 2001).

ගැටුම් කළමණාකරනය හා සාමය ස්ථාපිත කිරීමේදීත් ස්ත්‍රී-පුරුෂ සමාජභාවය පිළිබඳ සැලකිලිමත්වීම හා අදාළ ක්‍රියාකාරකම්වලට සහභාගි වීමට ස්ත්‍රීන්ට ඇති අයිතිය ජාත්‍යන්තරව පිළිගෙන තිබේ. එක්සත් ජාතීන්ගේ ස්ත්‍රීන්ගේ සම වර්ධනය සඳහා වූ ඒකකයේ විශේෂඥ වාර්තාව සහ 2000 එ.ජා. 1325 යෝජනාවලිය මගින්ද එම අයිතිය තහවුරු කර තිබේ (UNDAW and PRIO, 1996; UN 1325 Resolution, 2000).

මේ අයුරින් ප්‍රජාතන්ත්‍රවාදයට සම්බන්ධ සියලුම සංකල්ප වලින් තීරණ ගැනීමේදී ස්ත්‍රී-පුරුෂ සහභාගිත්වය අවධාරණය කෙරෙන අතර, ඒවා ශ්‍රී ලංකාව ඇතුළු බොහෝ රටවල් ජාත්‍යන්තර මෙන්ම ජාතික නීති මගින්ද තහවුරු කර තිබේ. ස්ත්‍රීන් තීරණ ගන්නා මට්ටම්වලදී ප්‍රමාණවත්ව නියෝජනය වීම යන්න සැබෑ ප්‍රජාතන්ත්‍රවාදය, සමානාත්මතාවය, සම සාධාරණත්වය, යහ පාලනය, තිරසාර සංවර්ධනය හා සාමය යන දෑ දිනාගැනීමේදීත් අත්‍යවශ්‍ය සාධකයන් වන බැව් මෙයින් පැහැදිලි වේ. තීරණ ගැනීමේ ක්‍රියාවලියට හා නීති සහ ප්‍රතිපත්ති වලට දැනෙන බලපෑමක් කිරීමට ඕනෑම ජන කණ්ඩායමක් අවම වශයෙන් 33% - 35% අතර ප්‍රමාණයක නියෝජනයක් වියයුතු බවට 'Critical Mass Theory'' න්‍යායෙන් පෙන්වා දී ඇත. ස්ත්‍රී-පුරුෂ සමානාත්මතාවය දිනාගත් රටවල් අතරින් ඉහළින්ම සිටින ස්වීඩනය, නෝර්වේ, නෙදර්ලන්තය හා පින්ලන්තය වැනි ස්කැන්ඩිනේවියානු රටවල්, එබඳු ප්‍රමාණවත් ස්ත්‍රී නියෝජනයක් මගින් ස්ත්‍රීන්ගේ ජීවන තත්වයේ විශාල වර්ධනයක් ලැබූ රටවලට හොඳම උදාහරණ වේ (Dahlerup, 1988). 1995 දී රටවල් 174 ක ස්ත්‍රී-පුරුෂ සමාජභාවය සහ සංවර්ධනය පිළිබඳ විශ්ලේෂණයක් කළ එක්සත් ජාතීන්ගේ ප්‍රගති වාර්තාවට අනුව

''දේශපාලන ක්‍රියාවලියේදී ස්ත්‍රීන්ගේ බලපෑම අර්ථවත්ය

යන්න තහවුරු කිරීමට නම්, දේශපාලන ආයතනවල ස්ත්‍රී නියෝජනය 30% ක් වත් වියයුතුය යන්න තීරණාත්මක සාධකයක් ලෙස සැලකිය හැකිය'' (උපුටා ගත්තේ Chusnul: 2003).

පංගු ක්‍රමයක් අවශ්‍ය වන්නේ ඇයි?

ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය පංගු ක්‍රමයක් අවශ්‍ය වන්නේ ඇයි? යන සාකච්ඡාවේදී වැදගත් කරුණු කීපයක් කෙරේ අවධානය යොමු කළ හැකිය. සමානාත්මතා ප්‍රතිපත්ති (equal policies) යන්නෙහි අර්ථය ''සමාන ඉඩ ප්‍රස්ථා'' (equal opportunities) යන්නෙන් ''සමාන ප්‍රතිඵල'' (equality of results) හෝ ''ප්‍රතිඵල වල සමාන බව'' යන වෙනසට ලක් කිරීම පංගු ක්‍රමයෙන් අර්ථ ගැන්වෙන බව ෆිලිප්ස් හා යංගේ අදහසයි (කියවන්න, Phillips, 1995 සහ Young, 1990). ''සමාන නියෝජනය'' (equal representation) සහ ''සාධාරණ නියෝජනය'' (fair representation) ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන ක්‍රමයක අත්‍යවශ්‍ය අංග ලක්ෂණ ලෙස සැලකේ. නමුත් ''සමාන නියෝජනය'' යන සිද්ධාන්තයේ සමාන බව හා සාධාරණ බව පිළිගන්නා හෝ අගය කරන ප්‍රජාතන්ත්‍රවාදීන්, ස්ත්‍රී හා පුරුෂ සමාන නියෝජනය පිළිබඳ ඉල්ලීම් ඉදිරිපත් වෙද්දී එයට විරුද්ධ වේ. එයින් හැඟෙන්නේ සමාන නියෝජනය යන සිද්ධාන්තය ඔවුන් පිළිගත්තද, සම්ප්‍රදායික ආකල්ප මත පදනම්ව ස්ත්‍රීන් දේශපාලනය වැනි පොදු කටයුත්තකට සුදුසු නොවේය යන මතයට අනුව පුරුෂයින් කටයුතු කරන බවයි. ඒ නිසා ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය පංගු ක්‍රමය ස්ත්‍රීවාදී න්‍යායන්හිදී පමණක් නොව, ප්‍රජාතන්ත්‍රවාදී න්‍යායේදී ද මූලික වන කරුණකි. ස්ත්‍රී නියෝජනය වැදගත් වන්නේ මන්ද යන්න සාකච්ඡා කළයුතු වන්නේ මෙම පසුබිම තුළයි.

1990 ගණන්වල සිට, තීරණ ගන්නා සියලුම මට්ටම්වලදී ස්ත්‍රීන් නියෝජනය වියයුතුය යන සංවාදය දේශපාලනීකරණය වීම

ඇරඹිනි. ඒ සමග ස්ත්‍රී නියෝජනයේ වැදගත්කම පිළිබඳ තර්ක ගණනාවක් ස්ත්‍රීවාදී දේශපාලන හා සමාජ විද්‍යාඥයින් විසින් ඉදිරිපත් කරනු ලැබිණි. ඈන් ෆිලිප්ස්ට (Ann Phillips) අනුව ස්ත්‍රී-පුරුෂ දෙපක්ෂයටම හිමි **සමාන අයිතිවාසිකම් පිළිබඳ තර්කය** නැතිනම් **සාධාරණත්වය පිළිබඳ තර්කය** මේවා අතරින් ප්‍රමුඛ වේ (Phillips, 1995). දේශපාලන නියෝජනයට ඇති සමාන අයිතිය එක්සත් ජාතීන්ගේ සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ සම්මුතියේ 25 වැනි වගන්තියෙනුත්, ස්ත්‍රීන්ට එරෙහි සියලුම ආකාරයේ වෙනස්කම් දුරු කිරීමේ සම්මුතියේ 7 වැනි වගන්තියෙනුත් තහවුරු කර තිබේ. මෙම තර්කයෙන් අවධාරණය කරන්නේ පොදු කටයුතු වලට ස්ත්‍රීන් සහභාගී කර ගැනීමෙන් ඒවායේ වෙනසක් සිදුවේය යන අදහස නොවේ. එයින් අවධාරණය කරන්නේ ස්ත්‍රී-පුරුෂ දෙපක්ෂයටම සමාන අයිතීන්, සමාන හැකියා හා දක්ෂතා ඇති අතර ඔවුන්ට සමාන ඉඩප්‍රස්ථා හා සම්පත් හිමිවිය යුතුය යන්නයි. එහෙයින් ස්ත්‍රීන් දේශපාලන ආයතන තුළ නියෝජනය නොවීම ඍජු හෝ වක්‍ර අයුරින් ඔවුන්ව වෙනසකට ලක් කිරීමේ ප්‍රතිඵලයකි යන අදහස එයින් ප්‍රකාශ කෙරේ (Sawer, 2000). සෑම රටකම ජනගහණයෙන් අඩක් ස්ත්‍රීන් වන අතර, නියෝජන ප්‍රජාතන්ත්‍රවාදයේදී එම අඩ නොසලකා හැරිය නොහැකිය. ස්ත්‍රීන් වුවද, පුරුෂයන් වුවද, ජනගහණයෙන් 50% ක් නියෝජනය නොවන තැනක සැබෑ ප්‍රජාතන්ත්‍රවාදයක් තිබිය නොහැකි බැව් මෙම තර්කයෙන් අවධාරණය කෙරේ.

උපයෝගිතාවය පිළිබඳ තර්කයෙන් අවධාරණය කරන්නේ තීරණ ගැනීමේ හැකියාව ඇති, විවිධ අත්දැකීම් ඇති, විවිධ දෘෂ්ටීන්ට අනුව යම් කරුණක විවිධ පැතිකඩයන් දැකිය හැකි ස්ත්‍රී-පුරුෂ දෙපක්ෂයම එම ක්‍රියාවලියට සහභාගී වීමෙන් වඩාත් ඵලදායී තීරණ ගත හැකි බවයි. දේශපාලන පක්ෂවල සාමාජිකයින්ගේ පමණක් නොව, සාමාජිකාවන්ගේද සහභාගීත්වය තුළින් පක්ෂයට මෙන්ම රටට ම නව පෙනුමක්, නව දැක්මක්, නව ව්‍යාපෘති හා නව ප්‍රතිපත්ති ආදිය නිර්මාණය කිරීමේ හැකියාව ඇති බව මෙහිදී තර්ක කෙරේ (Sawer, 1999).

සංකේතාත්මක තර්කය හරහාද ස්ත්‍රී නියෝජනයට පක්ෂ අදහස් කීපයක් අවධාරණය කෙරේ. ස්ත්‍රීන් තීරණ ගන්නා මට්ටම්වල නියෝජනය වීම එම නියෝජිතවරියන්ගේද, වෙනත් පොදු ස්ත්‍රීන්ගේ ද තත්වය වර්ධනය වීමට බලපායි. ජන කණ්ඩායමක් ලෙස ස්ත්‍රීන්ගේ පිළිගැනීම, අනන්‍යතාවය හා තත්ත්වය වර්ධනය කිරීම සඳහා ඔවුන්ගේ නියෝජනය අවශ්‍ය බැව් මෙයින් අවධාරණය කෙරේ. ස්ත්‍රීන්ගේ අපේක්ෂාවන්, ප්‍රතිපත්ති හෝ ව්‍යාපෘතිවලට පරිවර්තනය කිරීමටද එමගින් ඉඩ ලැබේ. තවද, ස්ත්‍රීන් දේශපාලන ආයතන තුළ නියෝජනය වීමෙන් එම ආයතනවල නීත්‍යානුකූල බව නැතිනම් සුජාත බව ප්‍රකාශ කෙරේ. එසේම සම්ප්‍රදායිකව දේශපාලන ක්‍රියාකාරකම් වල ඇති රළු, ප්‍රචණ්ඩකාරී, තරඟකාරී හා දූෂිත ස්වභාවය ස්ත්‍රීන් ප්‍රමාණවත් සංඛ්‍යාවක් එයට ඇතුළත් කර ගැනීමෙන් යම් පරිවර්තනයකට ලක් වේ (Mansbridge, 1999). විශේෂයෙන් බටහිර යුරෝපා රටවල දේශපාලන නියෝජිත ආයතනවල පැවති පුරුෂ මූලික ව්‍යූහය, නීතිරීති, පහසුකම්, හැසිරීම් හා ආකල්ප යම් තරමකින් වෙනසකට ලක් කිරීමට ස්ත්‍රී නියෝජිතයින්ට හැකි වී තිබේ (Lovenduski and Karam, 2002).

පෙළඹවීමේ තර්කය හෝ **ආදර්ශ ආකෘති සැපයීම** පිළිබඳ තර්කයද සංකේතාත්මක තර්කය හා සම්බන්ධ වේ. සම්ප්‍රදායිකව ස්ත්‍රීන්ට ගෘහාශ්‍රිත වසමේත්, පුරුෂයන්ට පොදු වසමේත් කටයුතු පවරා දී තිබුණ තත්ත්වයකදී, ස්ත්‍රීන් දේශපාලන කටයුතුවල නියැලීම තුළින් ''ස්ත්‍රීන්ටත් පොදු කටයුතු කළ හැකිය'' යන ආදර්ශය සමාජයට ලබා දිය හැකිය. ඒ මගින් ඊළඟ පරපුරේ ස්ත්‍රීන්ට ආදර්ශ ආකෘති මෙන්ම ගුරුහරුකම් හා උපදෙස් දෙන්නන්ද (Mentors) නිර්මාණය වේ. ස්ත්‍රීන්ගේ දේශපාලන නියෝජනයෙන් ලැබෙන වඩා වැදගත්ම ප්‍රතිඵලය මෙය බැව් බරෙල්ගේ අදහසයි (Burrell, 1994). තවද, ස්ත්‍රීන් පුරුෂයන්ට වඩා සහයෝගීව හා ඒකමතිකව දේශපාලන තීරණ ගැනීමට පෙළඹීම මගින් වඩාත් ප්‍රජාතන්ත්‍රවාදී නායකත්ව ආකෘති

සමාජයට හඳුන්වා දියහැකිය යන කරුණද මෙම තර්කයට සම්බන්ධ කෙරේ. ''ඒකමතිකත්වය සඳහා ස්ත්‍රීන් දක්වන උනන්දුව හා කැමැත්ත ඔවුන්ගේ දේශපාලන දිවියෙන් දියහැකි වැදගත්ම ආදර්ශය සහ විශාලම දායකත්වය'' බැව් බ්ලැක් හා ෆිලිප්ස් (Black and Phillips, 2000) බටහිර ඕස්ට්‍රේලියාවේ මන්ත්‍රීවරියන් 39 දෙනෙක් ඇසුරින් කරන ලද අධ්‍යයනයකින් පෙන්වා දී තිබේ.

නියෝජනය හෝ ආශාවන් පිළිබඳ තර්කය ද මේ සම්බන්ධයෙන් ඉදිරිපත් වී ඇති වඩාත් ප්‍රමුඛ තර්කයකි. ස්ත්‍රීන්ට බලපාන කරුණු පිළිබඳ වැඩි අවධානයක් යොමු කිරීමටත්, ස්ත්‍රීන්ගේ තත්ත්වය වර්ධනය කිරීම සඳහා අදාළ නීති, ප්‍රතිපත්ති හා වැඩ පිළිවෙලවල් සම්පාදනයටත් ස්ත්‍රී නියෝජිතයින්ට වැඩි හැකියාවක් ඇති බව අධ්‍යයන රාශියකින් පෙන්වා දී ඇත (Dodson and Carroll, 1991; Carrol, 1994; Thomas, 1994; Tamerius, 1995 and Flammang, 1997).

ස්කැන්ඩිනේවියානු රටවල පාර්ලිමේන්තුවල ස්ත්‍රී නියෝජනය වර්ධනය වීම නිසා ස්ත්‍රීන්ගේ ජීවිතවලට ඍජුව සම්බන්ධ කරුණු පිළිබඳ නීති හා ප්‍රතිපත්ති සම්පාදනයටත්, එම ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමට අදාළ ආයතන නිර්මාණයටත්, තව තවත් ස්ත්‍රීන් දේශපාලනයට බඳවා ගැනීමටත් වැඩි හැකියාවත් ලැබුණු බැව් ඩලරුප් ගේ අධ්‍යයන වලින් පෙන්වා දී තිබේ (Dahlerup, 1988). මෙම දේශපාලන ආයතන තුළ නියෝජිතවරියන්ගේ ප්‍රමාණය සංඛ්‍යාවෙන් වැඩිවත්ම, දේශපාලන භූමිකා පිළිබඳ ඔවුන් තුළ පැවති සම්ප්‍රදායික ආකල්ප වෙනසකට ලක්වූ බවත්, එනිසා දේශපාලන කටයුතු වල නියැලීම පෙරට වඩා පහසු වූ බවත් කැරොල්ගේ අධ්‍යයන වලින් පෙන්වා දෙයි (Carroll, 2000). තවද, ස්ත්‍රී දේශපාලකයින් පිළිබඳ සමාජයේ පැවති ආකල්ප වල යම් ආකාර ධනාත්මක වෙනසක් සිදු වූ බැව් තවත් අධ්‍යයනයකින් පෙන්වා දෙයි (Karvonen and Selle, 1995).

ජීව විද්‍යාත්මකව මෙන්ම සමාජ විද්‍යාත්මකවත් ස්ත්‍රීන් හා පුරුෂයන්ගේ සමහර වුවමනාවන් හා ආශාවන් වෙනස්වන නිසා ස්ත්‍රී-පුරුෂ දෙපක්ෂයම තීරණ ගන්නා මට්ටම් වලදී නියෝජනය වියයුතු බැව් මෙම තර්කයෙන් කියැවේ. ඕස්ට්‍රේලියානු සෙනෙට් මණ්ඩලය ඇසුරින් කරන ලද අධ්‍යයනයකින් පෙන්වා දී ඇත්තේ, ස්ත්‍රීන්ට වඩාත් ඍජුව සම්බන්ධ කරුණු (සමාන වැටුප්, ප්‍රසූති නිවාඩු, ගෘහස්ථ ප්‍රචණ්ඩත්වයට එරෙහි වීම) පිළිබඳ එහි නියෝජිතවරුන්ට වඩා පස් ගුණයකින් නියෝජිතවරියන් කරුණු දැක්වීමට ඉදිරිපත් වන බවයි (Williamson, 2000). එසේම ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය සමාජානුයෝජනය නිසාත්, ඇය රඟපාන ස්වභාවික භූමිකා නිසාත් ස්ත්‍රීන්ගේ අත්දැකීම් ද පුරුෂයන්ට වඩා වෙනස්ය. එහෙයින් අදාළ කරුණු පිළිබඳ ස්ත්‍රී-පුරුෂ දෙපක්ෂය බලන්නේ දෘෂ්ඨි කෝණ දෙකකිනි. මේ අසමාන ආශාවන්, අපේක්ෂාවන් හා අත්දැකීම් ආදිය තීරණ ගන්නා සියලුම මට්ටම්වලදී නියෝජනය වීම සැබෑ නියෝජන ප්‍රජාතන්ත්‍රවාදයකට අත්‍යවශ්‍යය.

දේශපාලන ආයතනවල ස්ත්‍රී නියෝජනයේ ප්‍රමාණය අනුව එහි බලපෑම රඳා පවතින බව සාමාන්‍ය මතයයි. නමුත් ඩෘඩ ඩලරූප් (1988) වැනි ස්ත්‍රීවාදී දේශපාලන විද්‍යාඥයින් පවසන්නේ "Critical Mass" නැතිනම් තීරණ ගැනීමට බලපෑම් කළ හැකි තරම් ප්‍රමාණයක් (30-35%) ස්ත්‍රීන් නියෝජනය වුවහොත් පමණක් ස්ත්‍රීන්ගේ ජීවන තත්වයෙහි වේගවත් වර්ධනයක් සිදුවන බවයි. නමුත් සාමාන්‍යයෙන් එක් ස්ත්‍රියක් යම් ආයතනයක් තුළ නියෝජනය වුවත්, එහිදීත් පුරුෂයන්ගේ හැසිරීම යම් වෙනසකට ලක්වෙන බවද ඇය පෙන්වා දෙයි.

සංවර්ධනය පිළිබඳ වන නූතන සංවාදයේදී, සංවර්ධනයත් සමඟ ස්ත්‍රී-පුරුෂ සමානාත්මතාවය නිර්මාණය වේය යන අදහස පිළිනොගනී. නමුත් සමාජ, ආර්ථික හා දේශපාලන සංවර්ධනය සඳහා ස්ත්‍රීන්ට නිදහස ලබාදීම නැතිනම් ස්ත්‍රීන්ගේ විමුක්තිය සහ ස්ත්‍රීන්

සියලුම මට්ටම්වල පොදු කටයුතුවලදී සක්‍රීයව සහභාගි වීම අත්‍යවශ්‍ය සාධක ලෙස සලකයි. පොදු කටයුතු වලින් ස්ත්‍රීන්ව ඈත් කිරීම, අරාබි රටවල දේශපාලන සංවර්ධනයක් සිදු නොවීමට බලපාන එක් මූලික හේතුවක් ලෙස එක්සත් ජාතීන්ගේ සංවර්ධන ව්‍යාපෘතියේ මානව සංවර්ධන වාර්තාවෙන් පෙන්වා දෙයි (UNDP, 2003). පශ්චාත්-යුධ වාතාවරණයන් පවතින රටවල හෝ ප්‍රජාතන්ත්‍රවාදය කරා පරිවර්තනය වන සමහර අරාබි රටවල පමණක් නොව වෙනත් කලාප වල සංවර්ධනය වන්නා වූ රටවලත් තීරණ ගන්නා මට්ටම්වලට ස්ත්‍රීන්ව සහභාගි කර ගැනීමෙන් ප්‍රජාතන්ත්‍රවාදයේ වර්ධනයක් වියහැකි බව ජෝශප් සහ ස්ලිමෝවික්ස් (Joseph and Slymovics, 2001) පෙන්වා දෙයි.

පංගු ක්‍රමයට පක්ෂ හා විපක්ෂ තර්ක

ප්‍රජාතන්ත්‍රවාදය, සමානාත්මතාවය, සම සාධාරණත්වය හා කාර්යක්‍ෂම බව යන ප්‍රවේශ හරහා පංගු ක්‍රමය ඇගයීමකට ලක් කළ හැකිය. න්‍යායාත්මකව එයට පක්ෂව තර්ක ඉදිරිපත් කරන්නන් අදහස් කීපයක් ඉදිරිපත් කර තිබේ. ඒවා නම්

- පංගු ක්‍රමයෙන් කිසිම ජන කණ්ඩායමක් වෙනසකට ලක් කිරීමක් හෝ වැඩි වාසි සහගත තත්වයකට පත් කිරීමක් සිදු නොවේ. පරම්පරා ගණනාවක් දේශපාලන ක්ෂේත්‍රයෙන් ඈත් කරන ලද ස්ත්‍රීන් වැනි ජන කණ්ඩායමක් ඉදිරියේ ඇති බාධක ඉවත් කිරීමක් එයින් සිදුවේ. එමගින් ප්‍රමාණාත්මකව මෙන්ම ගුණාත්මකව පෙරට වඩා වැඩි ස්ත්‍රී නියෝජනයක් සිදුවේ.

- දේශපාලන ආයතනයක් හෝ තීරණ ගන්නා කමිටුවක එක් ස්ත්‍රියක් සිටීමෙන් ඇය හුදෙක් සංකේතයක් බවට පත්වේ. පුරුෂ කේන්ද්‍රීය ආයතන තුළ පුරුෂයන් ගණනාවක් ඉදිරියේ ස්ත්‍රීන්ගේ අවශ්‍යතා වලට අනුව කරුණු ඉදිරිපත් කිරීමට තරම්

ඉඩකඩක් ඇයට නොලැබේ. නමුත් පංගුවක් අනුමත කිරීමෙන් වැඩි සංඛ්‍යාවක් ස්ත්‍රීන් නියෝජනය වුවහොත් එසේ හුදකලා නොවී, මානසිකව පීඩාවට පත් නොවී අදාළ කරුණු ඉදිරිපත් කිරීමේ හැකියාවක් ඔවුන්ට ලැබේ.

- නියෝජන ප්‍රජාතන්ත්‍රවාදයේ මූලික අංගයක් වූ දේශපාලන නියෝජනයට ඇති සම අයිතිය මේ මගින් තහවුරු වේ. එහි ප්‍රතිඵලයක් ලෙස අදාළ දේශපාලන ක්‍රමයට නීත්‍යානුකූල බවක් ලැබේ. රාජ්‍යයක නීත්‍යානුකූල පුරවැසියෙක් ලෙස ස්ත්‍රියට ඇති සාමාජිකතත්වය ද එයින් තහවුරු වේ. එසේම එය ස්ත්‍රී-පුරුෂ දෙපක්‍ෂයේම ප්‍රසාදයටද ලක් වේ.

- සහභාගී ප්‍රජාතන්ත්‍රවාදයේදී ''සැබෑ සහභාගිත්වය'' යන්න න්‍යායාත්මකව පුරුෂයින්ට පමණක් සීමා කර නොමැත. රටක තීරණ ගැනීම හා ඒවා ක්‍රියාත්මක කිරීමේදී, සියලුම මට්ටම්වලදී ජනගහණයෙන් අඩක් වන ස්ත්‍රීන් අනිවාර්යෙන්ම ඔවුන්ගේ වුවමනාවන්, අපේක්ෂාවන් හා ආශාවන් නියෝජනය කළ යුතුය.

- සාර්ථක ප්‍රජාතන්ත්‍රවාදයක් සඳහා ස්ත්‍රී-පුරුෂ දෙපක්ෂයම එය තමන් විසින්, තමන් සඳහා කරනු ලබන පාලනයක් (ownership - තමන්ගේ හිමිකම) යන හැඟීමෙන් කටයුතු කළ යුතුය. පාලනයට ඇති හිමිකම තුළින් බිහිවන තෘප්තිමත් පුරවැසියන් සිටීම එබඳු ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක සාර්ථකත්වයට බලපාන මූලික අංගයකි. පුරුෂයන් පමණක් නිර්මාණය කරන නීති, ප්‍රතිපත්ති හා වැඩ සටහන් හරහා ස්ත්‍රීන්ට එබඳු තෘප්තියක් හෝ ''තමන්ගේ පාලනයක්ය'' යන හැඟීම ඇති නොවේ. දෙපක්ෂයම එක් වී තීරණ ගතහොත් තෘප්තිය පමණක් නොව, දෙපක්ෂයම ඒවා ක්‍රියාත්මක කිරීමේදී සමාන උද්‍යෝගයකින්, වගකීමකින් හා කැපවීමකින් කටයුතු කිරීමටද පෙළඹේ. එවිට වෙනත් පාර්ශව වෙත වරද නොපටවා, ඒවායේ ප්‍රතිලාභ හෝ

ප්‍රතිවිපාක භුක්ති විඳීමට ද දෙපක්ෂයටම හැකිවේ.

- විවිධ ආයතනවල තීරණ ගැනීම සඳහා අවශ්‍ය වන පුහුණුව, අත්දැකීම්, අධ්‍යාපන සුදුසුකම්, තීරණ ගැනීමේ හැකියාව, දක්ෂතා මෙන්ම නායකත්ව ලක්ෂණද සමහර පුරුෂයන්ට මෙන්ම ස්ත්‍රීන්ටද තිබේ. නමුත් පුරුෂ කේන්ද්‍රීය දේශපාලන ආයතනවලින් එබඳු දක්ෂතා ඇති ස්ත්‍රීන් බැහැර කර තිබීමෙන් ජනගහණයෙන් 50% ක නියෝජිතයින්ගේ දායකත්වය ජාතික සංවර්ධනයට නොලැබී යයි. ඒ නිසා තිරසාර සංවර්ධනයක් සඳහා නම් ස්ත්‍රී-පුරුෂ දෙපක්ෂයම තීරණ ගැනීමේදී දායක කරගත යුතුය.

- ස්ත්‍රීන් හා පුරුෂයන් අතර ජීවවිද්‍යාත්මකව මෙන්ම, ඔවුන් ලක්වන වෙනස් වූ සමාජානුයෝජන ක්‍රියාවලීන් නිසා සමාජ විද්‍යාත්මකවද වෙනස්කම් තිබේ. ඒ අනුව චරිත ලක්ෂණ, හැසිරීම් රටා හා ආකල්ප ආදිය පවා මේ දෙපක්ෂය තුළ අභ්‍යන්තරීකරණය කෙරෙන්නේ අසමාන අයුරිනි. එහෙයින් ඔවුන්ගේ සමහර අත්දැකීම්ද වෙනස්ය. ස්ත්‍රී-පුරුෂ දෙපක්ෂයේම මෙම අසමාන අත්දැකීම්, ආකල්ප හා අදහස් ආදිය තීරණ ගැනීමේදී නියෝජනය වීමෙන් වඩාත් සමතුලිත තීරණයකට එළඹිය හැකිය.

- දේශපාලන ආයතන තුළ ස්ත්‍රී-පුරුෂ දෙපක්ෂයම නියෝජනය වීම නිසා දේශපාලනය වැනි පුරුෂ මූලික ක්ෂේත්‍රයක පවතින රළු, තරගකාරී, ප්‍රචණ්ඩකාරී හා දූෂිත ස්වභාවය වෙනසකට ලක්වීමටද ඉඩ තිබේ. ''පිළිකුල් සහගත දේශපාලනය'' යන්න ස්කැන්ඩිනේවියානු රටවලදී ''සුහසාධන දේශපාලනය'' නැතිනම් ''ජනතාවට හිතවත්'' (people friendly) දේශපාලනය බවට පරිවර්තනය වීමට 30% කට වඩා ස්ත්‍රීන් නියෝජනය වීම බලපා තිබේ (Dahlerup, 1998). එබඳු තත්වයකදී

දේශපාලනය කෙරේ ජනතාව තුළ ඇති සෘණාත්මක ආකල්පද යම් තරමකින් හෝ වෙනසකට ලක්වේ.

- සම්ප්‍රදායික සමාජවල පැවති සමාජ හා ආර්ථික පරිසරයන් මත ගෘහාශ්‍රිත හෝ පෞද්ගලික වසමේ සියලු කාර්යන් ස්ත්‍රියගේ වගකීම් ලෙසත්, පොදු වසමේ කාර්යන් පුරුෂයාගේ වගකීම් ලෙසත් දැඩි බෙදීමකට ලක් කර තිබුණි (Millett, 1972). එහෙයින්, ස්ත්‍රිය හිතාමතාම දේශපාලනයෙන් ඈත්කර තිබුණි (Pateman, 1988). නමුත් නූතන සමාජවල එම දෘඪ බෙදුම විශාල වෙනසකට ලක් වී ඇත. නූතන සමාජයේ ස්ත්‍රීන් පොදු ක්ෂේත්‍රය තුළ, විශේෂයෙන්ම ආර්ථික හා සමාජ කටයුතු වලදී වැදගත් භූමිකාවක් රඟපායි. එසේ නම් පොදු ක්ෂේත්‍රයට අයත් දේශපාලන කටයුතුවලටද සක්‍රීයව සහභාගී වීමේ අයිතිය, හැකියාව මෙන්ම අවශ්‍යතාවයද කාලීන අවශ්‍යතාවයක් බවට පත්වී ඇත. ස්ත්‍රියගේ දායකත්වය පවුලෙන් පිට සමාජ, ආර්ථික හා සංස්කෘතික යන පොදු ක්ෂේත්‍රවල වර්ධනයට විශාල බලපෑමක් කරන නූතන තත්වය තුළ, දේශපාලන ක්ෂේත්‍රයෙන් පමණක් ඇය බැහැර කර තැබීම ප්‍රජාතන්ත්‍රවාදයේ වර්ධනයට පමණක් නොව, රටේ සමස්ත සංවර්ධනයටද විශාල බාධාවක් වේ.

- දේශපාලන පක්ෂයක හෝ ව්‍යාපාරයක නායකත්වය ගත් පුරුෂයෙකුගේ හදිසි අභාවය හෝ එයින් ඉවත් වීම වැනි කරුණකදී, එම හිදැස පිරවීමට එම පුරුෂයාගේ පවුලේ ස්ත්‍රියක තෝරා ගැනීම බොහෝ විට සිදුවේ. විශේෂයෙන්ම මෙය දකුණු ආසියාවට පොදු කරුණකි. මෙම ස්ත්‍රියට එම දේශපාලන ව්‍යාපාරය කඩා නොවැටී ඉදිරියට ගෙන යාමේ විශාල වගකීමක් පැවරේ. එබඳු විශේෂ අවස්ථාවලදී පමණක් නොව, සාමාන්‍ය අවස්ථාවලදීත් සමහර පුරුෂයන්ට සමානව

හෝ පුරුෂයන්ටත් වඩා දක්ෂ ආකාරයෙන් දේශපාලන ව්‍යාපාර ඉදිරියට ගෙනයාමේ හැකියාව සමහර ස්ත්‍රීන්ටද ඇත. නායකත්ව ගුණාංග හා හැකියා පුරුෂයාට පමණක් සීමා නොවේ (Bond, 2007). දෙපක්ෂයටම අයත් පුද්ගලයන් අතරින් නායකයින් නිර්මාණය වේ. ඉස්මතු වේ. නමුත් නායකයින් ලෙස ඉස්මතු වූ ස්ත්‍රීන් මැතිවරණවලට නාමයෝජනා ඉල්ලූ විට දේශපාලන පක්ෂ වල ආසන සංවිධායකයින්ගේ සම්ප්‍රදායික ආකල්ප නිසා හෝ එබඳු ස්ත්‍රීන් පුරුෂයින්ට වඩා ජනප්‍රිය වේයැයි ඔවුන් තුළ ඇති බිය නිසා බොහෝ විට එම අවස්ථාව ස්ත්‍රීන්ට ලබා නොදේ. මෙම ගැටලුව විසඳීමට නම් අනිවාර්යෙන්ම ස්ත්‍රීන් හා පුරුෂයන් සඳහා නීත්‍යානුකූලව පංගුවක් වෙන් කිරීම අත්‍යවශ්‍යය.

- පුරුෂයන්ට සාපේක්ෂව ස්ත්‍රීන්ට දේශපාලන කටයුතු පිළිබඳ ඇති අත්දැකීම්, දේශපාලන නායකත්වය සමඟ ඇති සබඳතා හා දේශපාලන ප්‍රචාරක ව්‍යාපාර වැනි කටයුතු සංවිධානයට ඇති හැකියාවන් ආදිය අඩු හෝ වෙනස් විය හැකිය. පරම්පරා ගණනාවක් තිස්සේ ඔවුන්ව ගෘහාශ්‍රිත ක්ෂේත්‍රයට කොටුකර තිබීම හා පුරුෂයන්ට වඩා වෙනස් අයුරින් සමාජානුයෝජනයට ලක්කිරීම එයට මූලික හේතුවයි. නමුත් තාවකාලික පියවරක් ලෙස පංගු ක්‍රමයක් හඳුන්වා දී ස්ත්‍රීන්ට දේශපාලනයට ඇතුල්වීමේ වරම ලබා දුනහොත් කිසියම් කාලපරිච්ඡේදයක් තුළදී, ඔවුන්ටද අදාළ අත්දැකීම් හා දක්ෂතා වර්ධනය කර ගැනීමටත් දේශපාලන සබඳතා ගොඩනගා ගැනීමටත් හැකිවේ. එහි ප්‍රතිඵලයක් ලෙස ප්‍රමාණාත්මකව පමණක් නොව ගුණාත්මකවද ස්ත්‍රී-පුරුෂ සමතුලිත නියෝජනයකට මඟ පෑදේ.

- නූතන පරපුරේ ස්ත්‍රීන් එබඳු නායකත්වයකින් කටයුතු කළහොත් ඊළඟ පරපුරේ දියණිවරුන්ගේ නායකත්ව වර්ධනය කෙරෙහි

එම ආදර්ශය විශාල වශයෙන් ධනාත්මක බලපෑමක් කරයි. එය ස්ත්‍රීන් පිළිබඳව සමාජය තුළ පැවති සම්ප්‍රදායික ආකල්ප හා අගතිගාමී හැඟීම්වල (stereotypes) වෙනසක් සඳහාද බලපායි. ඒ මගින් ස්ත්‍රීන්ගේ සිත් සතන් තුළම තමන් පිළිබඳව පැළපදියම් වී පැවති ඍණාත්මක ආකල්පද වෙනසකට ලක්වේ. එසේම නූතන පරපුරේ දේශපාලන නායිකාවන්ට සිය අත්දැකීම් හරහා අනාගත පරපුර සඳහා කණිෂ්ඨයින්ව පෙළඹවීමටත්, ඔවුන්ට ගුරු හරුකම් හා උපදෙස් ලබාදීමටත් හැකියාව ලැබේ.

පංගු ක්‍රමයකට එරෙහිවද තර්ක ගණනාවක් ඉදිරිපත් වේ.

- ප්‍රජාතන්ත්‍රවාදී න්‍යායේ ප්‍රධාන මූලධර්මයක් වූ සමානාත්මතාවය යන සිද්ධාන්තයට පංගු ක්‍රමයක් හඳුන්වා දීමෙන් හානි සිදුවේ. එය ස්ත්‍රීන්ට ලබාදෙන විශේෂ වරප්‍රසාදයක් නිසා ''සමාන ඉඩප්‍රස්ථා හා සමාන තරඟය'' යන අදහසට පංගු ක්‍රමය පටහැනි වේ.

- ප්‍රජාතන්ත්‍රවාදයට අනුව සියලුම ඡන්දදායකයින්ට ස්වාධීනව තම ඡන්දය පාවිච්චි කිරීමේ අයිතිය හිමිවේ. නමුත් මැතිවරණයකදී ස්ත්‍රීන්ට ආසන වෙන් කිරීම මගින් ස්ත්‍රියකට ඡන්දය ලබා දෙන්නැයි ඡන්දදායකයා වෙත වක්‍ර බලපෑමක් එල්ල වේ. එය සමාන නියෝජනය යන සිද්ධාන්තයට පටහැනි වේ.

- බොහෝ ඡන්දදායකයින් මැතිවරණයකදී ඡන්ද අපේක්ෂකයාගේ ස්ත්‍රී-පුරුෂ බවට වඩා, නායකත්ව ලක්ෂණ, දක්ෂතා, සමාජ සබඳතා හා හැකියාවන් පිළිබඳ වැඩි අවධානයක් යොමු කරයි. එබඳු තත්වයකදී, පංගු ක්‍රමයකින් ස්ත්‍රී-පුරුෂ ලිංගිකත්වයට ප්‍රමුඛත්වය දීම මගින් අනෙකුත් සාධක නොසලකා හැරීමක්

සිදුවේ. එවිට වඩාත් හොඳම අපේක්ෂකයා තෝරා ගැනීමේ ක්‍රියාවලියට බාධාවක් සිදුවේ. එක්කෝ එහිදී වඩාත්ම සුදුසු අපේක්ෂකයා පසෙකට තල්ලු වී යාමට ඉඩ තිබේ.

- ස්ත්‍රී ලිංගිකත්වය නිසා යම් තීරණ ගන්නා ආයතනයකට නියෝජනය වීමේ වරමක් නීත්‍යානුකූලව ලබාදුනහොත්, එයින් එම නියෝජිතයා අවතක්සේරුවකට නැතිනම් තීරණ ගන්නා ප්‍රධාන ප්‍රවාහයෙන් (main steram) පසෙකට තල්ලු වී යාමේ ප්‍රවණතාවයක් ඇති වීමට ඉඩ තිබේ. එක් පැත්තකින් අනෙක් නියෝජිතයින්ට සාපේක්ෂව එබඳු නියෝජිතයින්ට තීරණ ගැනීමේ කාර්යට සක්‍රීය අයුරින් සහභාගී වීමේ හැකියාව හෝ දක්ෂතාවය නොමැති වීමට ඉඩ ඇත. අනෙක් පැත්තෙන් පංගු ක්‍රමයක් නිසා තේරී පත්වුන නියෝජිතයින් දක්ෂතා හා හැකියාවන් මත තේරී පත් නොවීය යන ආකල්පය අදාළ ආයතන වල අනෙක් නියෝජිතයින් තුළ ඉස්මතුවීම නිසා ප්‍රධාන තීරණ ගන්නා මට්ටම්වලින් ඔවුන්ව කොන්වීමේ ඉඩකඩක්ද ඇත.

- පක්ෂ ඇතුළු වෙනත් දේශපාලන ආයතන තුළ පාරම්පරිකවම පුරුෂයන් මූලිකත්වය ගැනීම නිසා ඔවුන් වරප්‍රසාද භුක්ති විඳින තත්වයක සිටී. නමුත් ඒවාට ප්‍රවේශ වීමට ස්ත්‍රීන්ට නීත්‍යානුකූල වරමක් ලබාදීමෙන් පුරුෂයන් තුළ ස්ත්‍රීන් කෙරේ අමනාපයක් ඇතිවීමේ සම්භාවිතාවය ඇතිවේ. පුරුෂයන්ට හිමිවී තිබූ ඉඩප්‍රස්ථා, සම්පත් හා වරප්‍රසාද අහිමි වේය යන බිය හෝ තර්ජනය ඇතිවීමෙන් දෙපක්ෂය අතර ගැටුම් ඇතිවීමට පවා ඉඩකඩ තිබේ. විශේෂයෙන් පංගු ක්‍රමයක් යටතේ ස්ත්‍රීන්ට මැතිවරණ නාමයෝජනා ලබාදීමේදී, ඒ වෙනුවෙන් මෙතෙක් පුරුෂයන්ට ලබාදුන් නාමයෝජනා ප්‍රමාණයෙන් යම් කොටසක් කපා හැරීමට හෝ ප්‍රතික්ෂේප කිරීමට සිදු වේ. එබඳු තත්වයකදී පක්ෂ අභ්‍යන්තර ගැටුම් පවා උද්ගත වීමට

ඉඩ තිබේ.

නමුත් මෙම තර්කවලට ස්ත්‍රීවාදී දේශපාලන හා සමාජ විද්‍යාඥයින් විසින් විවිධ ප්‍රතිතර්ක ඉදිරිපත් කරනු ලැබ තිබේ. සමානාත්මතාවය යන සංකල්පයට අනුව සියලුම පුද්ගලයින් හා ජන කණ්ඩායම්වලට සමාන නිදහස හා අයිතිය නීත්‍යානුකූලව පමණක් ලබා දීමෙන් සමාන ප්‍රතිඵල ලබාගැනීමට නොහැකි බැව් ඔවුන්ගේ මතයයි. සැබෑ සමානාත්මතාවය දිනා ගැනීම සඳහා ප්‍රායෝගික වශයෙන් සමාන ඉඩප්‍රස්ථා හා සම්පත් ද ලබාදිය යුතුය. සමාජය විසින් පාරම්පරිකවම ස්ත්‍රීන්ව ගෘහස්ථ ක්ෂේත්‍රයට සීමාකර තැබීමෙන් ඔවුන්ව අසමාන තත්වයකට පත්කරනු ලැබ තිබේ. එනිසා ඔවුන්ට පුරුෂයන් සමඟ සමාන දේශපාලන තරඟයකට ප්‍රවේශ වීම සඳහා සමාන ඉඩප්‍රස්ථා හිමි නොවේ. එසේම සමාන සම්පත් හා හැකියාවන් ද ඔවුන්ට නොමැත. ප්‍රතිඵලවල සැබෑ සමානාත්මතාවයක් ඇතිකර ගැනීමට නම් මේ සෑම අංශයකින්ම ස්ත්‍රී-පුරුෂ දෙපක්ෂය සමාන තත්වයකට ගෙන ආ යුතුය. ඒ සඳහා ප්‍රවේශයක් ලෙස දිගුකලක් අවාසි සහගතව සිටි කණ්ඩායමට, එනම් ස්ත්‍රීන්ට තාවකාලික වශයෙන් කිසියම් තල්ලුවක් ලබා දිය යුතුය. දීර්ඝ කාලයක් තිස්සේ ප්‍රධාන ප්‍රවාහයෙන් පසෙකට තල්ලු වී සිටි කණ්ඩායමක් සඳහා තාවකාලිකව කරනු ලබන එම පෙළඹවීම ස්ත්‍රීන්ට විශේෂ වරප්‍රසාදයක් හෝ පුරුෂයින්ගේ අයිතීන් උදුරා ගැනීමක් වන්නේ නැත. ස්ත්‍රීන්ව දේශපාලන ක්ෂේත්‍රයෙන් ඉවත්කර දමා, පුරුෂයින් සහමුලින්ම එය ඔවුන්ට පමණක් අයිති ක්ෂේත්‍රයක් බවට පත්කරගෙන තිබීමෙන් ඉතිහාසය පුරාම ස්ත්‍රීන්ගේ අයිතිවාසිකම් විශේෂයෙන් නියෝජනයට ඇති අයිතිය පුරුෂයින් විසින් උදුරා ගැනීමක් කරනු ලැබුණි. එම ඓතිහාසික වැරැද්ද, වැඩවසම් සමාජ රටාවෙන් ඔබ්බට ගිය නූතන ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී සමාජ රටාවන් තුළ තවදුරටත් පවත්වා ගෙන යාමට අවශ්‍ය නොවේ. ස්ත්‍රී-පුරුෂ බෙදුමකින් තොරව පෞද්ගලික - පොදු ක්ෂේත්‍ර දෙකේම කාර්යයන්ට ක්‍රියාශීලිව සහභාගිවන ජනතාවට, ලිංගිකව හෝ වෙනත් භේදයකින් තොරව සියලුම දේශපාලන

ක්‍රියාකාරකම්වලට සහභාගි වීමේදීත් සමාන ඉඩ ප්‍රස්ථා අනිවාර්යයෙන්ම ලබාදිය යුතුය.

දේශපාලන නියෝජනයේදී ස්ත්‍රීන් සඳහා ආසන වෙන්කර දීම බොහෝ රටවලදී, මැතිවරණයෙන් මැතිවරණයට ඡන්ද කොට්ඨාශ මාරුවන ආකාරයෙන් සිදුකෙරේ. උදාහරණ ලෙස ඉන්දියාවේ පංචායති පළාත් පාලන ආයතනවල 33.3% ක් ස්ත්‍රීන්ට ආසන වෙන් කිරීම එක් ඡන්ද කොට්ඨාශයකට සීමා නොවේ. මැතිවරණයෙන් මැතිවරණයට ස්ත්‍රී ඡන්ද කොට්ඨාශ මාරු වේ. එවිට වරක් ස්ත්‍රීන්ට වෙන්වූ ආසනය ඊලඟ මැතිවරණයේදී පොදු ආසනයක් නැතිනම් ස්ත්‍රී-පුරුෂ දෙපක්ෂයටම ඉදිරිපත් වියහැකි ආසනයක් බවට නම් කෙරේ. මෙහිදී ස්ත්‍රියක් නියෝජනය වූ කොට්ඨාශයෙන් ඊලඟ මැතිවරණයේදී පුරුෂයෙක් නියෝජනය වීමට අනිවාර්යයෙන්ම ඉඩක් ලැබේ. ජනගහණයෙන් අඩක් වන ස්ත්‍රී-පුරුෂ දෙපක්ෂයටම එවිට සැබෑ නියෝජනයකට ඉඩකඩ ලැබේ. එසේම පුරුෂයින් අතරින් හොඳම අපේක්ෂකයා තේරීමට මේතාක් කල් ඡන්දදායකයාට හිමිව තිබූ අවස්ථාව ඒ අයුරින්ම ස්ත්‍රීන් අතරින් වඩාත් හොඳම අපේක්ෂිකාව තෝරා ගැනීමට භාවිත කිරීමට ඉඩ ලැබේ. එය ස්ත්‍රියක් තෝරා ගැනීම සඳහා ඡන්දදායකයකුගේ කැමැත්ත බලහත්කාරයෙන් උදුරා ගැනීමක් ලෙස සැලකිය නොහැකිය. ස්ත්‍රීන් ප්‍රමාණවත් සංඛ්‍යාවකට නාමයෝජනා ලබා නොදී, ඔවුන් හිතාමතාම තරඟයෙන් ඉවත් කොට, පුරුෂ අපේක්ෂකයින් පමණක් මැතිවරණයට ඉදිරිපත් කිරීමෙන් අද බොහෝ රටවලදී සිදුවන්නේද පුරුෂයකුට ඡන්දය දීම සඳහා ඡන්දදායකයාට බලකිරීමකි.

ස්ත්‍රීන්ට පෙරට වඩා නාමයෝජනා ලබාදීමෙන් දේශපාලන පක්ෂ තුළ ගැටුම් ඇතිවිය හැක්කේ ඒවායේ අභ්‍යන්තර ප්‍රජාතන්ත්‍රවාදයක් නොතිබීමත්, ස්ත්‍රී-පුරුෂ සමානාත්මතාවය හා දෙපක්ෂයේම අවශ්‍යතා පිළිබඳ ප්‍රමාණවත් අවබෝධයක් පක්ෂ ක්‍රියාකාරීන්ට නොතිබීමත් නිසාය. පුරුෂයන්ගෙන් පමණක් සමන්විත වූ, ඔවුන් පමණක්

දායකත්වය දක්වන පක්ෂ ලොව කිසිදු සමාජයක නොමැත. සියලුම දේශපාලන පක්ෂවල සාමාජිකයින්, ක්‍රියාකාරීන්, ආධාරකරුවන් හා ඡන්දදායකයින් අතර අනිවාර්යෙන්ම ස්ත්‍රීහුද වෙති. බිම් මට්ටමේ සිට ඉහළ මට්ටම් දක්වා සියලුම තීරණ ගැනීම්වලදි එම ස්ත්‍රීනුත් සහභාගි කරවා ගැනීම සඳහා නව ප්‍රතිපත්ති හඳුන්වා දීමට සිදුවේ නම් එය පක්ෂ ව්‍යුහයේ ඇති දුර්වලතාවයකි. සැබෑ ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයක් නම් ස්ත්‍රී-පුරුෂ සාමාජිකයින් සැමගේම නියෝජිතයින් තීරණ ගැනීමේදී සහභාගි කරගත යුතු බවත්, එය පක්ෂයක අත්‍යවශ්‍ය අංග ලක්ෂණයක් බවත් පාක්ෂිකයින්ට අවබෝධ කර දිය යුතුය. විවිධ හේතු නිසා පක්ෂ තුළ එබඳු අංග ලක්ෂණ ආරම්භයේ සිට නොවූයේ නම්, එම පක්ෂ නූතන ලිබරල් සමාජයට ගැලපෙන පරිදි සංශෝධනය කර ගැනීම පක්ෂ නායකත්වය මෙන්ම, සාමාජිකත්වයේද භාරදූර වගකීමකි. එහෙයින් පක්ෂයේ අභ්‍යන්තර ප්‍රතිපත්ති මගින් ස්ත්‍රී-පුරුෂ දෙපක්ෂයටම තීරණ ගැනීමට සහභාගි වියහැකි වන අයුරින් එහි ව්‍යූහය වෙනස් කළ යුතුය. ඒ සඳහා පක්ෂය තුළ සමානාත්මතා ප්‍රතිපත්ති හඳුන්වා දීම අත්‍යවශ්‍ය වේ. එසේ ප්‍රජාතන්ත්‍රවාදී ප්‍රතිපත්ති අනුගමනය කිරීමෙන්, පක්ෂ පෙරට වඩා ජනතාවට සමීප, ජනතා ප්‍රසාදය දිනාගත්, ස්ත්‍රී-පුරුෂ හිතෛෂී (gender - friendly) තත්වයට පත්වීමට ඇති ඉඩකඩ වැඩිය. අනිවාර්යෙන්ම මැතිවරණ තරගවලදී, එබඳු පක්ෂවලට වැඩි වාසි අත්කර ගැනීමේ හැකියාවද ඇත.

පංගු ක්‍රම භාවිතා කොට තෝරා ගන්නා ස්ත්‍රීන් දේශපාලනයේ ප්‍රධාන ප්‍රවේශයෙන් ඉවත් වීමේ හැකියාව ඇත්තේ මූලික කරුණු දෙකක් නිසාය. පළමුවැන්න, එම නියෝජිතවරියන්ට තීරණ ගන්නා මට්ටමේදී සක්‍රීයව කටයුතු කිරීමට ප්‍රමාණවත් හැකියාවක් නොතිබීමයි. දෙවැන්න, ඔවුන් සමඟ එකට කටයුතු කරන පුරුෂයින් ඒ සඳහා අවශ්‍ය පරිසරය ඇයට ලබා නොදීමයි. සැබෑ නියෝජනයක් සඳහා මෙම බාධක දෙකම මඟහරවා ගැනීම අත්‍යවශ්‍ය වේ. පංගු ක්‍රමය හුදෙක් නීතියක් ලෙස භාවිත කළයුතු නිසා ඕනෑම ස්ත්‍රියක නියෝජනය සඳහා ඉදිරිපත් කිරීමෙන් එහි මූලික අරමුණ ඉටුනොවේ. තීරණ

ගන්නා මට්ටම්වලදී ඵලදායී අයුරින් කටයුතු කළ හැකි ස්ත්‍රීන් ඒ සඳහා තෝරා ගැනීමෙන් ඉහත සඳහන් කරන ලද බාධක මඟ හරවා ගත හැකිය. එසේම සමහර අවස්ථාවලදී පුරුෂයන්ට සාපේක්ෂව, වෙනස්වූ ආකාරයකින් ක්‍රියාකරන ස්ත්‍රියක් දෙස, ස්ත්‍රී-පුරුෂ සමාජභාවය කෙරේ සංවේදී ප්‍රවේශයකින් බලා දෙපක්ෂයම සහයෝගයෙන් කටයුතු කිරීමද පංගු ක්‍රමයක් සාර්ථක කරගැනීමට අත්‍යවශ්‍ය සාධකයක් වේ. මෙහිදී එසේ කටයුතු කිරීමේ වැදගත්කම පිළිබඳ පුරුෂයන්ට දැනුවත් බවක් හා හොඳ අවබෝධයක් තිබිය යුතුය. ඔවුන් නවීන වියයුතුය. එසේ වුවහොත් මෙම බාධක මඟ හරවා ගෙන පංගු ක්‍රමයක් මගින් සැබෑ සහ සමතුලිත නියෝජනයක් දිනාගත හැකිය.

ස්ත්‍රී නියෝජනය වර්ධනය සඳහා වන පංගු ක්‍රමය විසින් සමානාත්මතාවය යන්න එක් සංකල්පයකින් තවත් සංකල්පයකට මාරු කිරීමක් කරනු ලබයි. නැතිනම් සම්භාව්‍ය සංකල්පයකින් නවීන සංකල්පයකට මාරු කරයි. සම්භාව්‍ය ලිබරල්වාදයට අනුව ''සමානාත්මතාවය'' යනු ''සමාන ඉඩ ප්‍රස්ථා'' හෝ ''තරඟකාරී සමානාත්මතාවය'' යන අදහස් ගැබ්වූ සංකල්පයකි. ස්ත්‍රීන් සඳහා වූ බාධා විධිමත්ව දුරු කිරීම, නැතිනම් ඔවුන්ට සර්වජන ඡන්ද බලය ලබා දීම, මෙම සමානාත්මතාවය දිනා ගැනීම සඳහා ප්‍රමාණවත් බවත්, එය දිනා ගැනීමේ කාර්ය පුද්ගලිකව ස්ත්‍රියට පැවරෙන බවත් ලිබරල්වාදීන්ගේ මතය විය.

නමුත් පසුගිය දශක කිහිපය තිස්සේ ස්ත්‍රීවාදීන් තර්ක කරන්නේ මෙසේ විධිමත්ව බාධක දුරු කිරීමෙන් පමණක් සැබෑ සමානාත්මතාවය දිනාගත නොහැකි බවයි. ස්ත්‍රීන්ව ඍජුවම වෙනස්කම් වලට ලක්වීමත්, සංකීර්ණ වූ හා සැඟවුණු බාධක ද සක බලපෑමක් නිසා ස්ත්‍රියට සමාන දේශපාලන නියෝජනයක් දිනාගැනීමට නොහැකි වී ඇති බව ඔවුන්ගේ අදහසයි. එනිසා පංගු ක්‍රමය හෝ වෙනත් සාධනීය ක්‍රියාකාරකම් (positive actions) මගින් ''ප්‍රතිඵලවල සමානාත්මතාවය'' (equality of results) දිනා ගතයුතු

බව ස්ත්‍රීවාදීන්ගේ තර්කයයි. සමානාත්මතාවය සම්බන්ධ දෙවැනි සංකල්පය ලෙස සැලකෙන මෙම ස්ත්‍රීවාදී අර්ථකතනය, පසුගිය දශක කීපය තුළදී. සැබෑ සමානාත්මතාවය සඳහා වඩාත් අදාළ එකක් ලෙස ජනප්‍රිය වෙමින් පවතී. මෙම සංකල්පයෙන් සරලව ප්‍රකාශ වන්නේ හුදෙක් විධිමත් සමානාත්මතා ප්‍රතිපත්ති මගින් පමණක් සැබෑ සමානාත්මතාවය දිනා ගත නොහැකිය. සමාන ප්‍රතිඵල දිනා ගැනීම සඳහා නම් පංගු ක්‍රමය වැනි වන්දි ගෙවීමේ උපක්‍රම හඳුන්වා දිය යුතුය යන්නයි (Dahlerup, 1988). එනම් පරම්පරා ගණනක් තිස්සේ දේශපාලන කටයුතුවලදී වෙනසකට ලක්වුන ස්ත්‍රීන්, ඒ සඳහා තල්ලු කිරීමට තාවකාලික විශේෂ පියවර හඳුන්වා දිය යුතු බවයි.

පංගු ක්‍රම වර්ගීකරණය

ලොව රටවල් 97 ක් පමණ ස්ත්‍රී දේශපාලන නියෝජනයේ වර්ධනය සඳහා වූ පංගු ක්‍රම භාවිත කිරීම මෑත දශක කිහිපය තුළදී ආරම්භ කර ඇත. එම පංගු ක්‍රම තුන් ආකාර වර්ගීකරණයකට යටත් කළ හැකිය. ඒවා නම්

i. පාර්ලිමේන්තුව හෝ පළාත් පාලන ආයතනයේ ආසන වලින් කිසියම් අනුපාතයක් නීත්‍යානුකූලව ස්ත්‍රීන් සඳහා වෙන් කිරීමේ ක්‍රමය (System of Reserved Seats)

මේ යටතේ නිශ්චිත ඡන්ද කොට්ඨාශ සංඛ්‍යාවක් නැතිනම් ආසනවලින් කිසියම් අනුපාතයක් මැතිවරණ නීති හෝ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් ස්ත්‍රීන් සඳහා වෙන් කරයි. එම අනුපාතයෙන් ප්‍රකාශිත නියෝජිතවරියන් සංඛ්‍යාව ඡන්දයෙන් තෝරා ගැනීම හෝ පත් කිරීම සිදුකෙරේ.

ii. ව්‍යවස්ථාපිත පංගු ක්‍රමය (Legislative quotas)

මැතිවරණයට ඉදිරිපත් වන සියලුම දේශපාලන පක්ෂවල නාමයෝජනා ලැයිස්තුවලින් හෝ යම් දේශපාලන ආයතනයකට තේරී පත්වන නියෝජිතයින්ගෙන් කිසියම් ප්‍රතිශතයක් ස්ත්‍රීන් සඳහා

වෙන්කිරීම මේ යටතේ සිදුවේ. මැතිවරණ නීති හෝ රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා නීතියෙන් මෙම ප්‍රතිශතය ස්ථාපිත කළ හැකිය.

iii. ස්වේච්ඡා පංගු ක්‍රමය හෝ දේශපාලන පක්ෂ පංගු ක්‍රමය (Voluntary quotas or Political party quotas)

දේශපාලන පක්ෂවල ව්‍යවස්ථා මගින් හෝ පක්ෂ නීති මගින් හෝ පක්ෂවලට බඳවා ගැනීම සඳහා වන ක්‍රියාපිළිවෙත් මගින් මැතිවරණ නාමයෝජනා ලැයිස්තුවලට සහ පක්ෂ නිලධාරී මඬුල්ලට කිසියම් ස්ත්‍රී-පුරුෂ අනුපාතයක් ඇතුළත් වියයුතු යයි නියම කිරීම මෙහිදී සිදුවේ (Norris: n.d).

i. ව්‍යවස්ථානුකූලව ආසන වෙන්කිරීමේ ක්‍රමය

දැනට ලොව රටවල් 13 ක් ජාතික පාර්ලිමේන්තුවේ පහළ මණ්ඩලය සඳහා ව්‍යවස්ථානුකූලව ආසන වෙන් කිරීමේ ක්‍රමය අනුගමනය කරයි. මොරොක්කෝව, ජෝර්දානය, බංගලාදේශය, පකිස්ථානය, බොස්ට්වානා, තායිවාන්, ලෙසෝතෝ සහ ටැංසානියාව ඒ අතර වේ. පළාත් පාලන ආයතනවලින් ඉන්දියාවේ 33.3%, එරිත්‍රියා 30%, ලෙසෝතෝ 30%, රුවන්ඩා 30%, දකුණු අප්‍රිකාව 50%, ටැංසානියා 25%, උගන්ඩා 33%, පකිස්ථානය 17.6% හා පිලිපීනය 33% ක ආසන ස්ත්‍රීන් සඳහා වෙන් කිරීමක් එම රටවල ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් හෝ මැතිවරණ නීති මගින් හඳුන්වා දී ඇත (වගු අංකඃ 6).

මෙම ප්‍රතිපත්තිය මගින් දේශපාලන නියෝජිත ආයතනයට තේරී පත්විය යුතු ස්ත්‍රීන්ගේ අවම සංඛ්‍යාවක් නීත්‍යානුකූලව සහතික කෙරේ. මෙහිදී ස්ත්‍රීන් සඳහා කිසියම් ප්‍රතිශතයක් වෙන්කරන ඡන්ද කොට්ඨාශ, මැතිවරණයෙන් මැතිවරණයට මාරු කෙරේ. මෙසේ ස්ත්‍රීන් සඳහා වෙන් නොකළ ආසන පොදු ආසන ලෙස සැලකෙන අතර, ඒවායින් ස්ත්‍රී-පුරුෂ දෙපක්ෂයටම මැතිවරණයට ඉදිරිපත් විය හැකිය.

මෙම ක්‍රමය යටතේ සමහර රටවල වක්‍ර ඡන්ද ක්‍රමයකින් මහජන නියෝජිතවරියන් තෝරයි. උදාහරණ වශයෙන් පාර්ලිමේන්තුවට ඡන්දයෙන් තෝරාගත් පොදු නියෝජිතයින් විසින් වෙන්කළ ආසන සඳහා ස්ත්‍රීන්ව තෝරා ගනු ලැබේ. තවත් රටවල වෙනත් මහජන නියෝජිතයින් තෝරා ගන්නා අයුරින්ම මෙම ආසන සඳහාත් සාමාන්‍ය මැතිවරණයකදී ස්ත්‍රීන්ව තෝරා ගනී. තවත් රටවල අගමැති විසින් හෝ අගමැතිගේ උපදෙස් පිට නාමික විධායකය විසින් හෝ අදාළ පක්ෂයේ නායකයා විසින් වෙන් කළ ආසන සඳහා නියෝජිතවරියන් තෝරා පත්කරනු ලබයි.

නියෝජිත ආයතනයක සිටිය යුතු ස්ත්‍රීන්ගේ අවම ප්‍රතිශතය මෙම ක්‍රමය යටතේ නීත්‍යානුකූල පිළිගැනීමකට ලක්වීම එහි ඇති විශාලම වාසියයි. එහෙත් යම් දේශපාලන පක්ෂයක නායකයා හෝ අගමැතිවරයා පත් කරන නියෝජිතවරියක් ප්‍රජාතන්ත්‍රවාදීව තෝරා ගැනුනේ නැත යන අවතක්සේරුවට හෝ චෝදනාවට ලක්වීමටද මෙහිදී ඉඩ තිබේ. එසේම අදාළ නියෝජිතවරිය ජනතාව නියෝජනය කිරීම වෙනුවට තමන් පත්කළ නායකයාගේ අවශ්‍යතා අනුව කටයුතු කිරීමේ සම්භාවිතාවයද මෙහිදී ඉස්මතු වීමට ඉඩ තිබේ. තවද, ආණ්ඩු පක්ෂයේ ශක්තිය තහවුරු කර ගැනීමට මෙසේ තෝරා පත්කරන නියෝජිතවරියන් භාවිත කිරීමේ ඉඩකඩද තිබේ. මානව අයිතීන් නිසිලෙස භුක්ති විඳීමේ ඉඩකඩ අඩු, විධායකය වෙත බලතල කේන්ද්‍රගත කරගන්නා දේශපාලන ක්‍රමවල විධායකයේ අවශ්‍යතා සඳහා මෙම නියෝජිතවරියන් යොදා ගැනීමේ ඉඩකඩ වැඩිය. එහෙයින් වෙන්කළ ආසන සඳහා නියෝජිතවරියන් පත් කිරීමේදී, යම් මට්ටමකට ස්වාධීනව කටයුතු කළ හැකි, පක්ෂ නායකයාගේ අතකොළුවක් වී හුදෙක් ඒ වෙනුවෙන් පමණක් පෙනී නොසිටින ස්ත්‍රීන්ව තෝරා ගැනීම අත්‍යවශ්‍ය වේ. එසේ නොවුවහොත් මෙම පංගු ක්‍රමයෙන් අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීම අසීරු වේ.

ii. ව්‍යවස්ථාපිත පංගු ක්‍රමය

පාර්ලිමේන්තු හෝ පළාත් පාලන මැතිවරණයකට ඉදිරිපත් වන අපේක්ෂක ලැයිස්තුවලින් හෝ එම ආයතනවලට තේරී පත්වන නියෝජිතයින් අතුරින් ස්ත්‍රීන් සඳහා අවම අනුපාතයක් නීතියෙන් නිශ්චය කිරීම මෙම ක්‍රමයෙන් සිදුවේ. මෙම අනුපාතය වෙන් කිරීමද පාර්ලිමේන්තු නීතියක් හෝ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් සිදුකෙරේ. ස්ත්‍රීන් සඳහා පමණක් නොව සුළු ජන කණ්ඩායම්, තරුණයින් හා පහත් යයි සම්මත කුල ආදිය නියෝජනය සඳහාද මෙම පංගු ක්‍රමය භාවිත වේ. බෙල්ජියම, ප්‍රංශය හා ඉතාලිය වැනි සමහර යුරෝපා රටවලත් පේරු, ආර්ජන්ටිනාව, මෙක්සිකෝව, වෙනිසියුලාව, බොලිවියා හා බ්‍රසීලය වැනි ලතින් ඇමරිකානු රටවල් රැසකත් ස්ත්‍රී නියෝජනය වර්ධනය සඳහා මෙම ක්‍රමය භාවිතා කෙරේ (වගු අංකඃ 7). පාර්ලිමේන්තු කමිටු හා උපදේශක කමිටුවල ස්ත්‍රී නියෝජනය වර්ධනය සඳහාද පින්ලන්තය හා නෝර්වේ වැනි රටවල් මෙම පංගු ක්‍රමය යොදා ගනී.

මෙම උපක්‍රමයේ සාර්ථකත්වයට බලපාන කරුණු කීපයකි. ඒවා නම් දේශපාලන පක්ෂ ඉදිරිපත් කරන නාමයෝජනා ලැයිස්තු විවෘත ද නැතිනම් ආවෘත ද, මැතිවරණ අපේක්ෂක අපේක්ෂිකාවන් සමාන ආකාරයෙන් නාමයෝජනා ලැයිස්තුව තුළ පෙළගස්වයිද, නැතිනම් ලැයිස්තුවේ පහළ නොවැදගත් ස්ථානයක අපේක්ෂිකාවන් ස්ථානගත කරයිද, යම් පක්ෂයක් පංගු ක්‍රම නීතියට අනුව නාමයෝජනා ලැයිස්තු සකස් නොකළහොත් ඒ සඳහා ලැබෙන දඬුවම කුමක්ද? යනාදිය ඒ අතරින් මූලික වේ.

iii. ස්වේච්ඡා පංගු ක්‍රමය

දේශපාලන පක්ෂ වල ව්‍යවස්ථාව මගින් හෝ පක්ෂ නීතිරීති මගින් හෝ සම්ප්‍රදායක් ලෙස මැතිවරණ නාමයෝජනා ලැයිස්තු වලින් කිසියම් ප්‍රතිශතයක් ස්ත්‍රීන් සඳහා වෙන් කිරීම මෙම ක්‍රමයෙන් සිදුවේ. ප්‍රජාතන්ත්‍රවාදය හා මැතිවරණ සහාය සඳහා ජාත්‍යන්තර ආයතනය

(International Institute for Democracy and Electoral Assiistance) විසින් සම්පාදනය කරන ලද ස්ත්‍රීන් සඳහා වන පංගු ක්‍රමවල ලෝක දත්ත එකතුවට (Global Database of Quotas for Women) අනුව දැනට රටවල් 73 ක දේශපාලන පක්ෂ 163 ක් විසින් මෙම ස්වේච්ඡා පංගු ක්‍රමය භාවිත කරනු ලැබේ (http://www.idea.int/gender/updated_quota.cfm). ස්කැන්ඩිනේවියානු රටවල්, බටහිර යුරෝපය හා සමහර ලතින් ඇමරිකානු රටවල ස්වේච්ඡා පංගු ක්‍රම භාවිත කරයි. නමුත් ඒවා ක්‍රියාත්මක වන්නේ විවිධ අයුරිනි. නාමයෝජනා ලැයිස්තුවල පුරුෂයෙක්, ස්ත්‍රියක් වශයෙන් සමානව ස්ත්‍රී/පුරුෂ අපේක්ෂකයින් අනුපිළිවෙලින් ස්ථානගත කරන ක්‍රමය Zip ක්‍රමය (Zipper System) ලෙස හඳුන්වයි. මෙම ක්‍රමයේදී මැතිවරණයෙන් පසුව නාමයෝජනා ලැයිස්තුවේ අපේක්ෂකයින් ස්ථාන ගතකළ අනුපිළිවෙල වෙනස් කිරීම තහනම් වේ. ස්කැන්ඩිනේවියානු රටවල පක්ෂ රැසක් විසින් භාවිතා කරනු ලබන මෙම ක්‍රමය වඩාත් ඵලදායි ක්‍රමයක් ලෙස සැලකේ. නාමයෝජනා ලැයිස්තු වල පහළ ස්ථානයක ස්ත්‍රීන් ස්ථානගත කිරීමෙන් සිදුවන අවාසිය මෙහිදී මඟ හැරේ. එසේම මෙම ක්‍රමය භාවිතයේදී යම් අපේක්ෂකයකුට නාමයෝජනා ලැයිස්තුවේ ලබාදී තිබූ ස්ථානය මැතිවරණයෙන් පසුව පක්ෂ නායකත්වයේ කැමැත්ත මත මාරු කළ නොහැකිවේ. තවද, ස්ත්‍රී-පුරුෂ දෙපක්ෂයම මැතිවරණයට ඉදිරිපත් වී ජනතා ඡන්දයෙන් තේරී පත්වන නිසා එම නියෝජිතවරියන් අවතක්සේරුවට ලක්වීමේ ඉඩකඩ හා පක්ෂ නායකයාගේ අතකොළුවක් බවට පත් වීමේ සම්භාවිතාවයද අඩුය. එක් ඡන්ද කොට්ඨාශයකින් පුරුෂයෙක් හා ස්ත්‍රියක් වශයෙන් නියෝජිතයින් දෙදෙනෙක් තෝරා ගැනීමේ නිවුන් ක්‍රමයද (Twinned System) සමහර රටවල භාවිත වේ. තවත් සමහර රටවල පක්ෂ (පින්ලන්තය, නෝර්වේ) නාමයෝජනා ලැයිස්තුවේ 60% කට වඩා පුරුෂයන් ඇතුළත් නොවිය යුතුය යනුවෙන් නියම කර ඇත. එවිට අනිවාර්යෙන්ම ඉතිරි 40% ස්ත්‍රීන් වියයුතුය. තවත් රටවල පක්ෂ විසින්, ස්ත්‍රී-පුරුෂ දෙපක්ෂයෙන් කවර පක්ෂයක්වත් නාමයෝජනා ලැයිස්තුවෙන් 60% නොඉක්මවිය යුතු බවට තීරණය කර තිබේ. එය

ස්ත්‍රී-පුරුෂ මධ්‍යස්ථ පංගු ක්‍රමය (Gender-neutral quotas) ලෙස හඳුන්වයි.

ඉහත සඳහන් කළ තුන් ආකාර පංගු ක්‍රමවලින් ක්‍රම දෙකක් සමහර රටවල් භාවිතා කරයි. තවත් සමහරක් එක් ක්‍රමයක් භාවිතා කරයි. ස්ත්‍රීන් සඳහා වන පංගු ක්‍රමයේ ලෝක දත්ත එකතුවට අනුව ලොව රටවල් 97 ක මෙම පංගු ක්‍රම එකක් හෝ දෙකක් භාවිතා වේ. එයින් රටවල් 13 ක, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන්ම නියෝජිත ආයතනවල ආසනවලින් කිසියම් පංගුවක් ස්ත්‍රීන් සඳහා වෙන්කර ඇත. රටවල් 37 ක් මැතිවරණ නීති මගින් ව්‍යවස්ථාපිත පංගු ක්‍රම හඳුන්වා දී තිබේ. රටවල් 73 ක පක්ෂ ව්‍යවස්ථා හෝ මැතිවරණ නීති මගින් පංගු ක්‍රමය ස්ථාපිත කොට ඇත. මෙම රටවල් 97 න් 20% ක ස්ත්‍රීන් සඳහා නීතියෙන් ආසන වෙන්කර තිබේ. 38% ක තේරී පත්වන නියෝජිතයින් හෝ නාමයෝජනා ලැයිස්තුවලින් පංගුවක් ස්ත්‍රීන්ට වෙන්කර තිබේ. 61% ක නාමයෝජනා ලැයිස්තුවලින් පංගුවක් පක්ෂ ව්‍යවස්ථා හෝ ප්‍රතිපත්ති මගින් ස්ත්‍රීන්ට වෙන්කර දී තිබේ (Pande and Ford, 2011) (සටහන:1 බලන්න).

සටහන: 1

ලොව භාවිතා වන පංගු ක්‍රම

පංගු ක්‍රම වර්ගීකරණය	විස්තරය	හඳුන්වා දුන් පදනම (ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව, මැතිවරණ නීති, පක්ෂ ප්‍රතිපත්ති හෝ නීති)	අපේක්ෂිත ප්‍රතිඵල/අභියෝග
• දේශපාලන නියෝජිත ආයතනයේ ආසන වෙන්කිරීම: යම් ආසන ප්‍රතිශතයක් ස්ත්‍රීන් සඳහා වෙන් කිරීම	• මැතිවරණයේදී සියලු ආසනවලින් කිසියම් ප්‍රතිශතයක් ස්ත්‍රී අපේක්ෂකයින් සඳහා පමණක් වෙන් කිරීම. එම ආසනවලින් ස්ත්‍රීන් පමණක් නියෝජිතයින් ලෙස අදාළ ආයතනයට තේරී පත්වේ. එවිට එම ආසනවල ඡන්දදායකයින්ට ඡන්දය දිය හැක්කේ ස්ත්‍රීන්ට පමණි. • නමුත් මෙම ආසන මැතිවරණයෙන් මැතිවරණයට වෙනස් කළ හැක.	• මෙම පංගුව වෙන් කිරීම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හෝ මැතිවරණ නීති මඟින් සිදු කෙරේ. සියලුම පක්ෂ ස්ත්‍රීන් සඳහා වෙන්කළ ආසනවලට ස්ත්‍රී අපේක්ෂකයින්ගේ නම් පමණක් ඇතුළත් නාම යෝජනා ඉදිරිපත් කළ යුතුය.	• මෙම නීතිය සියලු පක්ෂවලට පොදු වේ. එය නිසි ලෙස ක්‍රියාත්මක කළහොත් ස්ත්‍රී නියෝජනයේ සංඛ්‍යාත්මක වර්ධනයක් සිදුවේ. නමුත් ස්ත්‍රීන්ට පමණක් ඡන්දය දෙන ලෙස ඡන්දදායකයාට බලකිරීමක් මේ ක්‍රමය මඟින් සිදුවේ යයි එයට එරෙහිව චෝදනා නැඟේ, ස්ත්‍රීන්ට වෙන්කළ ආසනයට, පුරුෂයන්ට ඡන්ද

			අපේක්ෂකයින් ලෙස ඉදිරිපත්වීම තහනම් කිරීම සමාන අයිතිවාසිකම් උල්ලංඝනයක් ලෙසද සැලකේ. නමුත් අනෙක් ආසනවලින් නියෝජනය වන බහුතරය නිසැකවම පුරුෂයන් වීම නිසා යම් ආයතනයක සමස්ත නියෝජනයේදී එය පුරුෂයන්ට අවාසි සහගතව බල නොපායි. ස්ත්‍රීන්ට වරක් වෙන් කළ ආසනය ඊලඟ මැතිවරණයේදී ස්ත්‍රී-පුරුෂ දෙපක්ෂයට පොදු ආසනයක් කිරීමෙන් මෙම අවාසිය මඟ හැරේ.

• ආසන වෙන් කිරීම - කිසියම් ආසන සංඛ්‍යාවකින් ස්ත්‍රී-පුරුෂ නියෝජිතයින් දෙදෙනෙක් ඡන්දයෙන් තෝරා ගැනීම	• මෙහිදී ඡන්දදායකයාට ඡන්ද 2 ක් හිමිවේ. ඒවා එක් අපේක්ෂකයකු හා අපේක්ෂිකාවක වෙනුවෙන් පාවිච්චි කළ යුතුය. මෙහිදී වැඩිම ඡන්ද ලබා ගත් පුරුෂයා හා ස්ත්‍රිය නියෝජිතයින් ලෙස තෝරා පත් කෙරේ.	• මැතිවරණ නීතියෙන් මෙම ආසන වෙන් කෙරේ.	• වෙන්කරන ලද ආසනවල ස්ත්‍රී-පුරුෂ සමාන නියෝජනයක් ඇති වීමෙන් සමස්ත නියෝජනයට බලපෑමක් සිදුවේ. එහෙයින් නියෝජනයට ඇති සම අයිතිය තහුවරු වේ. නමුත් යම් ආසනයක ස්ත්‍රීන් අතරින් වැඩිම ඡන්ද ලබාගත් අපේක්ෂිකාවට වඩා වැඩි ඡන්ද ලබා ගත් අපේක්ෂකයෙකු සිටියහොත් එය බහුතර කැමැත්ත යන සංකල්පයට පටහැනි යයි සමහරු තර්ක කරති. එහෙත් ස්ත්‍රීන් පාරම්පරිකවම අවාසිසහගත තත්වයකට පත් වී සිටීම නිසා ඔවුන්ව එයින් මුදවා ගැනීමට මෙබඳු තාවකාලික නීති අවශ්‍ය වේ.

• නිශ්චිත ආසන සංඛ්‍යාවක් වෙන් කිරීම: පරාජිතයන් අතරින් හෝ වැඩිම ඡන්ද ලැබූ අපේක්ෂිකාවන් සංඛ්‍යාව තෝරා ගැනීම	• දේශපාලන නියෝජිත ආයතනයේ ආසන 20 ක් ස්ත්‍රීන්ට වෙන් කළේ නම් එම සංඛ්‍යාව පුරුෂයන්ට වඩා වැඩි ඡන්ද ලැබූ හෝ නොලැබූ අපේක්ෂකයින් අතරින් තේරීම. මෙහිදී ස්ත්‍රීන් සඳහා ආසන වෙන් නෙකෙරෙන අතර දේශපාලන ආයතන තුළ නියෝජිතවරියන් මෙපමණ සංඛ්‍යාවක් සිටිය යුතුය යන අවමය නියම කෙරේ. මෙහිදී සියලුම ආසනවලින් වැඩිම ඡන්ද ලැබූ ස්ත්‍රීන් අතුරින් 20 තෝරා ගැනේ. සමහර විට එසේ තේරී පත්වුන ස්ත්‍රීන්ට වඩා වැඩි ඡන්ද ලබා ගත් පුරුෂයන් යම් යම් ආසනවල සිටියද ඔවුන්ව තෝරා නොගැනේ.	• ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හෝ මැතිවරණ නීතියෙන් ස්ථාපිත කෙරේ.	• මෙම ක්‍රමයෙන් ස්ත්‍රී නියෝජනයේ සංඛ්‍යාත්මක වර්ධනයක් සිදුවේ. නමුත් බහුතර කැමැත්ත නොසලකා හැරේ යන චෝදනාව එයට එරෙහිවද නැගේ.

• ආසන වෙන් කිරීම: නියෝජිතවරිය න් වක්‍ර ඡන්දයක් මගින් තෝරා ගැනීම හෝ පත් කිරීම	• යම් දේශපාලන ආයතනයක නියෝජනයෙන් නිශ්චිත ප්‍රතිශතයක් ස්ත්‍රීන් සඳහා වෙන් කර ඔවුන්ව වක්‍ර ඡන්ද ක්‍රමයකින් තේරීම. උදා: ව්‍යවස්ථාදායකයට ඡන්දයෙන් තෝරා ගන්නා නියෝජිතයින්ගේ වැඩි ඡන්දයෙන් තේරීම, නැතිනම් ස්ත්‍රීන්ගේ නම් ඇතුළත්, කලින් සම්පාදිත විශේෂ කෙටි ලැයිස්තුවකින් ජනාධිපතිවරයා හෝ නාමික විධායකය විසින් නියෝජිතවරියන් තෝරා පත් කරගනු ලැබීම	• ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හෝ මැතිවරණ නීති මඟින් ස්ථාපිත කෙරේ. නියෝජිතවරියන් සංඛ්‍යාව හා ඔවුන් තෝරා ගන්නා හෝ පත්කරන ආකාරයත්, පත් කිරීමේ බලය හිමි පුද්ගලයා හෝ මණ්ඩලය පිළිබඳවත් නීතියෙන් නිශ්චිතව ප්‍රකාශ කෙරේ.	• මෙම ක්‍රමයෙන් ස්ත්‍රී නියෝජනයේ වර්ධනයක් අනිවාර්යෙන්ම සිදුවේ. නමුත් මෙම නියෝජිතවරියන් සැබවින්ම ස්ත්‍රීන්ගේ අවශ්‍යතා නියෝජනය කරයිද, නැතිනම් පක්ෂය හෝ ඔවුන්ව පත් කරන පුද්ගලයාගේ අතකොළු බවට පත්වේද යන ගැටලුව මෙහිදී මතුවේ. තවද, පක්ෂය හෝ අදාළ පුද්ගලයාට සම්බන්ධ ප්‍රභූ ස්ත්‍රීන් පත්වීමට ඇති ඉඩකඩ ද මෙහිදී වැඩිය. එසේම වක්‍ර අයුරින් තෝරා ගත් හෝ පත්කළ ස්ත්‍රීන් නිසා මෙම නියෝජිතවරියන්ව අවතක්සේරුවට ලක්වීමටද ඉඩ තිබේ

• මැතිවරණ නාමයෝජනා ලැයිස්තුවලින් කිසියම් අනුපාතයක් ස්ත්‍රීන් සඳහා වෙන්කිරීම/නම් ඇතුළත් කිරීමේ අනුපිළිවෙලක් නියම නොකිරීම	• සෑම දේශපාලන පක්ෂයකින්ම මැතිවරණයට ඉදිරිපත් කරන නාමයෝජනා ලැයිස්තුවලට ස්ත්‍රීන් නිශ්චිත අනුපාතයක් ඇතුළත් කළයුතු යයි නියම කිරීම. නමුත් එම ස්ත්‍රීන්ගේ නම් නාමයෝජනා ලැයිස්තුවේ කවර අයුරින් ස්ථානගත කළ යුතුද, හෝ එම ස්ථානගත කිරීමේ අනුපිළිවෙල පිළිබඳව හෝ කිසිදු නියමයක් එම නීතියෙන් ප්‍රකාශ නොවේ. මෙහිදී විවෘත නාමයෝජනා ලැයිස්තු ක්‍රමය භාවිත කෙරේ.	• මැතිවරණ නීති මගින් සියලුම පක්ෂවලට බලපාන නීතියක් ලෙස මෙම නියමය ස්ථාපිත කළ හැකිය. එසේම පක්ෂ අභ්‍යන්තර ප්‍රතිපත්ති මගින්ද අදාළ පක්ෂය සඳහා එබඳු නියමයක් පැනවිය හැකිය. තවද, පක්ෂ තීරණයක් මත සම්ප්‍රදායක් ලෙසද මෙම ක්‍රමය අනුගමනය කළ හැකිය.	• මෙම ක්‍රමයට අනුව මැතිවරණයේදී එකම ආසනයට ස්ත්‍රී-පුරුෂ දෙපක්ෂයටම ඉදිරිපත් විය හැකිය. එහිදී සම්ප්‍රදායික හේතු නිසා පුරුෂයන්ට සාපේක්ෂව, ස්ත්‍රීන් අවාසි සහගත තත්වයක සිටින හෙයින් ස්ත්‍රීන්ගේ ජයගැනීමේ සම්භාවිතාවය අඩුවිය හැකිය. එහෙයින් ස්ත්‍රීන්ගේ නියෝජනය වර්ධනය සඳහා මෙම ක්‍රමයෙන් සිදුවන බලපෑම අඩුය. නමුත් අඩු වශයෙන් මැතිවරණයට ඉදිරිපත් වීමේ අවස්ථාව හෝ ස්ත්‍රීන්ට ලැබීම නිසා ඔවුන්ට ලැබෙන දේශපාලන අත්දැකීම් දිගුකාලීනව ඵලදායී විය හැකිය.

• මැතිවරණ නාමයෝජනා ලැයිස්තුවලින් කිසියම් අනුපාතයක් ස්ත්‍රීන් සඳහා වෙන් කිරීම - ස්ත්‍රී-පුරුෂ නම් ඇතුළත් වියයුතු අනුපිළිවෙල පිළිබඳ නීතියෙන් ප්‍රකාශ වීම	• දේශපාලන පක්ෂ විසින් ඉදිරිපත් කරනු ලබන නාමයෝජනා ලැයිස්තුවල පුරුෂයෙක්-ස්ත්‍රියක්-පුරුෂයෙක් යන අනුපිළිවෙලට 50% බැගින් ස්ත්‍රී-පුරුෂ දෙපක්ෂයටම බෙදෙන අයුරින් මෙහිදී නම් ඇතුළත් කෙරේ. මෙය zipper හා zebra ක්‍රම ලෙසද හඳුන්වයි. තවද, නාම යෝජනා ලැයිස්තුවලින් 30% ක් වෙන් කිරීමද කළ හැකිය. එහිදී ලැයිස්තුවේ තුන්වැන්නා, හයවැන්නා, නවවැන්නා ස්ත්‍රියක් වියයුතුයි නියම කෙරෙන අවස්ථාද තිබේ. නාමයෝජනා ලැයිස්තුවේ නම් ස්ථානගත කළ අනුපිළිවෙල මැතිවරණයෙන් පසුව වෙනස් කළ නොහැකිය. මෙය ආවෘත නාමයෝජනා ලැයිස්තු ලෙස හැඳින්වේ.	• මැතිවරණ නීති හෝ පක්ෂ අභ්‍යන්තර ප්‍රතිපත්ති මඟින් මෙම ක්‍රමය හඳුන්වා දිය හැකිය. පක්ෂ සම්ප්‍රදායක් ලෙසද මෙම ක්‍රමය භාවිත කළ හැකිය.	• ආසන වෙන් කිරීම හා සසඳද්දී මෙම ක්‍රමය සංකීර්ණ බවින් අඩුය. ස්ත්‍රී-පුරුෂ දෙපක්ෂයටම සමාන ඉඩප්‍රස්ථාවක් නාමයෝජනාවලින් ලැබෙන නිසා එකිනෙකාගේ හැකියා අනුව ඡන්ද දිනා ගැනීමට ඉඩ ලැබේ. නාමයෝජනා ලැයිස්තුවේ නම් මැතිවරණයෙන් පසුව වෙනස් කිරීමේ හැකියාව නොමැති නිසා විවෘත ලැයිස්තු ක්‍රමයට වඩා ස්ත්‍රීන් නියෝජනය වීමේ සම්භාවිතාවය වැඩිය.

ස්ත්‍රී නියෝජනය වඩාත් ඵලදායී වීමට බලපාන සාධක

පංගු ක්‍රමයක් හඳුන්වා දීමෙන් පමණක් ඵලදායී ස්ත්‍රී නියෝජනයක් වේ යයි අපේක්ෂා කළ නොහැකිය. ස්ත්‍රී නියෝජනය හරහා, ස්ත්‍රීන්ගේ තත්වය වර්ධනය වන අයුරින් සැබෑ වෙනසක් ඇති කිරීම සඳහා පංගු ක්‍රමයට අමතර වෙනත් සාධක ගණනාවක්ද බලපායි. දේශපාලන නියෝජිත ආයතනය ක්‍රියාත්මක වන දේශපාලන සන්දර්භය, තේරී පත්වන ස්ත්‍රීන් සංඛ්‍යාව, එම ස්ත්‍රීන්ගේ ස්වභාවය සහ දේශපාලන බල තරඟයට අදාළ නීතිරීති, සම්ප්‍රදායන්, ව්‍යවහාරයන්, අවිධිමත් ක්‍රියාකාරකම්, එම ආයතන ක්‍රියාත්මක වන ආකාරය සහ දේශපාලන ක්‍රමය පිළිබඳ සමාජයේ පවතින ආකල්ප, අපේක්ෂා, සාරධර්ම හා විශ්වාස ආදිය මේ අතරින් ප්‍රධාන වේ. තවද, නියෝජිත ආයතන තුළ නීති හා ප්‍රතිපත්ති සම්පාදනය කරන ක්‍රියාවලිය, ශ්‍රමය බෙදෙන ආකාරය, ආයතන ව්‍යුහය හා ධූරාවලීන්, විනය, අභ්‍යන්තර සබඳතා, පවතින සම්පත් හා ස්ත්‍රීන් සඳහා වන පහසුකම් ආදියද ස්ත්‍රී නියෝජනය ඵලදායී වීමට බලපායි.

ස්ත්‍රී නියෝජනය මගින් ස්ත්‍රීන්ගේත්, දේශපාලන ආයතනවලත්, රටේත් පවතින තත්වයේ වෙනසක් අපේක්ෂා කරන්නේ නම් නියෝජිතවරියන් මෙම සාධක සියල්ලම පිළිබඳ මනාව අධ්‍යයනය කොට ඒවා පිළිබඳ හොඳින් දැනුවත් විය යුතුය. එසේම එම ආයතනවලට අදාළ නීති, ප්‍රතිපත්ති, ව්‍යවහාරයන් හා සම්ප්‍රදායන් ආදිය නිසි අයුරින් භාවිත කළ යුතුය. එසේම අවශ්‍ය අවස්ථාවලදී ඒවා වෙනස් කළ යුතුය. එබඳු වෙනසක් ඇති කිරීම සඳහා සතර ආකාරයක උපක්‍රම භාවිත කළ හැකිය.

පංගු ක්‍රමයක් මගින් ස්ත්‍රීන් ප්‍රමාණවත් සංඛ්‍යාවක් තීරණ ගන්නා ආයතනවලට නියෝජනය වීමෙන් ප්‍රමාණාත්මක වෙනසක් සිදුවී ආයතනයේ ව්‍යුහාත්මක වෙනසක් පමණක් සිදුවේ. එය ගුණාත්මක වෙනසක් බවට පත් කිරීමට අවශ්‍ය නම් මේ සතරාකාර

උපක්‍රමද අනිවාර්යයෙන්ම භාවිතා කළ යුතුය. (Lovenduski and Karam, 1998)[4]

i. ආයතනාත්මක / ක්‍රියාපටිපාටීන්හි වෙනස්කම්

නියෝජිත ආයතනය තුළ වඩාත් ස්ත්‍රී හිතෛෂී (women-friendly) ස්වභාවයක්, නැතිනම් එබඳු පරිසරයක් නිර්මාණය කිරීමට අදාළ පියවර ගැනීම මෙහිදී කළ යුතුවේ. පොදුවේ දේශපාලන ආයතනවල ස්වභාවය පුරුෂ කේන්ද්‍රීය වේ. එය වෙනස් කිරීම අත්‍යවශ්‍යය. ආයතනයේ විවිධ ක්‍රියාපටිපාටීන්ට ස්ත්‍රීන්ව අන්තර් ග්‍රහණය කරගැනීම සඳහා විවිධ විධිමත් මෙන්ම අවිධිමත් උපක්‍රමද භාවිත කළ යුතුය. ස්ත්‍රී-පුරුෂ සමාජභාවය කෙරේ ආයතනයේ සියලුම නියෝජිතයින් තුළ සංවේදී බවක් ඇති කිරීම සඳහා වන පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීමද අත්‍යවශ්‍යය. විශ්වීය වශයෙන් ස්ත්‍රීන් එක් පොදු කණ්ඩායමක් නොවන බවත්, ජන වර්ගය, වර්ණය, කුලය, ආගම, වයස, පංතිය හා ශාරීරික හැකියාවන් මත ඔවුන් අතරද පුරුෂයන්ට සමාන අයුරින් වෙනස්කම් පවතින බවත්, අදාළ ආයතනයේ නියෝජිතයින්ට අවබෝධ වීමට තරම් ප්‍රමාණවත් සංවේදී බවක් ඔවුන් තුළ ජනිත කළ යුතුය.

ii. නියෝජනයේ වෙනස

පංගු ක්‍රමයෙන් නියෝජනය සඳහා ප්‍රවේශය ලද ස්ත්‍රීන්ව උනන්දු කිරීම, ජ්‍යෝෂ්ඨ නියෝජිතයින් මගින් ගුරුහරුකම් හා උපදෙස් ලබාදීම, මැතිවරණ නීති වෙනස් කොට තරගයේදී සමාන ඉඩකඩ ලබාදීමේ තත්වයන් නිර්මාණය කිරීම හා නියෝජිත ආයතන තුළට ස්ත්‍රී-පුරුෂ සමානාත්මතාවය අරමුණු කරගත් නීති රෙගුලාසි හඳුන්වා දීම ආදිය හරහා ස්ත්‍රී නියෝජනය ආරක්ෂා කිරීමට, තහවුරු කිරීමට හා ව්‍යාප්ත කිරීමට අදාළ කටයුතු කළ යුතුය. තවද, පාර්ලිමේන්තු ස්ථාවර කමිටු හා උප කමිටු සහ පක්ෂවල කෘත්‍යාධිකාරී මණ්ඩල,

4 මෙම පරිච්ඡේදයේ අන්තර්ගත කරුණුවලට මූලික වශයෙන් පදනම් වූයේ Lovenduski හා Karam, (1998) ගේ අදහස්ය.

පක්ෂ ක්‍රියාකාරි කමිටු නැතිනම් පක්‍ෂ කෝකස (caucus) වැනි දෑ සඳහා ස්ත්‍රීන්ව තෝරා ගැනීමෙන්ද මෙම වෙනසට මඟ පැදේ. පාර්ලිමේන්තුව හෝ වෙනත් නියෝජිත ආයතනයකට තේරුණු ස්ත්‍රීන් වෙනම සංසදයක් පිහිටුවා, එමගින් ස්ත්‍රීන්ගේ තත්වය වර්ධනයට හා නියෝජනය වැඩි කිරීමට අදාළ කටයුතු කිරීමත්, අන්‍යොන්‍ය වශයෙන් උපකාර කරමින් ඔවුන්ගේ කටයුතු සාර්ථක කරගැනීමට විවිධ උපක්‍රම භාවිතා කිරීමත් මෙහිදී වැදගත් වේ.

iii. නිමැවුම් සඳහා බලපෑම

මෙයින් අදහස් වන්නේ නියෝජිත ආයතනවලින් සම්පාදනය කරන නීති හා ප්‍රතිපත්ති ස්ත්‍රීකරණයකට ලක් කිරීමයි. උදාහරණ වශයෙන් ව්‍යවස්ථාදායකයෙන් සෞඛ්‍ය ප්‍රතිපත්තියක් සම්පාදනය කරන්නේ නම් ස්ත්‍රී-පුරුෂ අවශ්‍යතා මත එය සැකසීම, එහි ප්‍රතිලාභ දෙපාර්ශවයටම ලැබෙන ආකාරයෙන් සැලසුම් කිරීම හා එය ක්‍රියාත්මක කිරීමට දෙපාර්ශවයම සහභාගි කරවා ගැනීම වැනි දෑ සඳහා නියෝජිතවරියන් බලපෑම් කළ යුතුය. ඔවුන් ස්ත්‍රී-පුරුෂ සමාජභාවය කෙරේ වඩා සංවේදීව වෙනත් නියෝජිතයින්ද පොළඹවා ගෙන ස්ත්‍රී-පුරුෂ සමානාත්මතා ප්‍රතිපත්ති ආරම්භ කිරීමට, අන් අය ඉදිරිපත් කරන පණත්වලට ස්ත්‍රී-පුරුෂ සමාජභාවය අන්තර්ගත කිරීමට හා පුරුෂ මූලික ප්‍රතිපත්ති වෙනස් කිරීමට මූලිකත්වය ගත යුතුය. අදාළ ආයතනවල න්‍යාය පත්‍ර, හා වැඩ සැලසුම් තුළට ස්ත්‍රීන්ට සම්බන්ධ කරුණු ඇතුලත් කිරීමට, ස්ත්‍රී-පුරුෂ දෙපක්ෂයේම අවශ්‍යතා අනුව අයවැය සම්පාදනයට හා සම්පත් සමබරව වෙන් කිරීමට මෙම නියෝජිතවරියන් බලපෑම් කළ යුතුය. එම නීති හා ප්‍රතිපත්ති ආදිය නිසිලෙස ක්‍රියාත්මක වේදැයි නිරීක්ෂණය කිරීමටත්, ඒවා ඇගයීමකට ලක්කොට දුර්වලතා මඟ හරවා ගැනීමටත් නියෝජිතවරියන් මූලිකත්වය ගත යුතුය. නීති සම්පාදනය, අයවැය කරණය හා පරිපාලනය යනාදිය ස්ත්‍රී-හිතෛෂී වියයුතු බව ඔවුන් අවධාරණය කළ යුතුය. පංගු ක්‍රමයක් යටතේ තෝරා ගන්නා නියෝජිතවරියන් එසේ කටයුතු නොකළහොත් අපේක්ෂිත ගුණාත්මක වෙනස සිදුනොවේ.

iv. කතිකාවතේ වෙනස

දේශපාලනය පිළිබඳ කතිකාවත, නියෝජිත ආයතනය හෝ පක්ෂය තුළ මෙන්ම එයින් පිටතත් වෙනසකට ලක්කළ යුතුය. ඒ සඳහා නියෝජිතවරියන්ට විශාල වගකීමක් පැවරේ. නියෝජිත ආයතනයේ විනය, සන්නිවේදනය, භාවිතා කරන භාෂාව හා හැසිරෙන ආකාරය ආදියෙහි පුරුෂ කේන්ද්‍රීය තත්වයන් වෙනස් කිරීමට නියෝජිතවරියන් කටයුතු කළයුතුය. තර්ජනය, ප්‍රචණ්ඩත්වය, දූෂණය වැනි දේශපාලනයට ඍජුව සම්බන්ධ දෑ වෙනුවට ස්ත්‍රීන්, ළමුන්, පීඩාවට පත්වූවන් ආදීන්ගේ අවශ්‍යතා, සුභසාධනය හා වෙනත් කාලීන සමාජ හා ආර්ථික ප්‍රශ්න පිළිබඳ අවධානය යොමු කරමින් දේශපාලනය පිළිබඳ ජනතාව තුළ ඇති ඍණාත්මක ආකල්ප වෙනසකට ලක් කිරීමට නියෝජිතවරියන් කටයුතු කළ යුතුවේ. පාර්ලිමේන්තු සැසිවාරවල අදහස් දැක්වීම, පණත් ඉදිරිපත් කිරීම, අයවැය, විවාදයට සහභාගී වීම හා කාරක සභා කමිටුවලට දායක වීම වැනි කටයුතුවලදී ස්ත්‍රීන්ගේ ප්‍රශ්න හා අවශ්‍යතා පිළිබඳ සමස්ත ආයතනයේම අවධානය දිනා ගැනීමටද ඔවුන් කටයුතු කළ යුතුය. නියෝජිත ආයතනයෙන් පරිබාහිර ප්‍රසිද්ධ දේශන, සාකච්ඡා, ආරාධිත උත්සව හා මාධ්‍ය වැඩසටහන් ආදියේදීත් ස්ත්‍රීන්ගේ ප්‍රශ්න විසඳීම සඳහා දේශපාලනය තුළ ස්ත්‍රීන්ම නියෝජනය වීමේ වැදගත්කම අවධාරණය කිරීම අත්‍යවශ්‍යය. ස්ත්‍රීන්ගේ දේශපාලන නායකත්වය හා හැකියා පිළිබඳ ජනතාව දැනුවත් කරවීමට මෙන්ම ස්ත්‍රී සහභාගිත්වයෙන් දේශපාලනයේ කිසියම් ධනාත්මක වෙනසක් සිදුවේ යයි සාක්ෂි සහිතව පෙන්වා දීමට නියෝජිතවරියන් පියවර ගත යුතුය. ඒ හරහා ''දේශපාලනය'' මෙන්ම ''ස්ත්‍රී සහභාගිත්වය'' පිළිබඳ වන සංවාද හෝ කතිකාවල ක්‍රමික වෙනසකට මඟ පෑදේ. එය යම් සමාජයක ස්ත්‍රීන්ගේ තත්වය වර්ධනයට පමණක් නොව දේශපාලනය පිළිබඳ ජනතාව තුළ ඇති ඍණාත්මක ආකල්ප හා පක්ෂ දේශපාලනයේ දූෂිත, තරඟකාරී සහ ''පිළිකුල් සහගත'' ස්වභාවය යම් වෙනසකට ලක් කිරීමටද නිසැකවම හේතුභූත වනු ඇත (සටහන: 2 හා 3 බලන්න).

සටහන: 2

ස්ත්‍රීන්ගේ සැබෑ නියෝජනයට බලපාන සාධක

i.	ආයතනාත්මක හා ක්‍රියාපටිපාටීන්ගේ වෙනස	ස්ත්‍රී-පුරුෂ සමාජභාවය පිළිබඳ දැනුවත් කිරීම් හරහා නියෝජිත ආයතනය වඩාත් ස්ත්‍රී-හිතෛෂී තත්වයකට පත් කිරීම.
ii.	නියෝජනයේ වෙනස	නියෝජිතවරියන්ගේ ප්‍රවේශය වඩාත් තහවුරු කිරීම හා ව්‍යාප්ත කිරීම - නියෝජිතවරියන් උනන්දු කිරීම, තනතුරු ලබා දීම, මැතිවරණ ප්‍රචාරණයට උපකාර කිරීම, සාධාරණ මැතිවරණ නීති හඳුන්වා දීම, ස්ත්‍රී-පුරුෂ සමානාත්මතා නීති හා ප්‍රතිපත්ති හඳුන්වා දීම
iii.	නිමැවුම සඳහා බලපෑම	නීති හා ප්‍රතිපත්ති සම්පාදනය ස්ත්‍රීකරණය කිරීම-ස්ත්‍රීන්ගේ ප්‍රශ්න හා අවශ්‍යතා පිළිබඳ අවධානය යොමු කිරීම
iv.	කතිකාව / සංවාදය	ස්ත්‍රී ප්‍රවේශයකින් දේශපාලනය දෙස බැලීම - ස්ත්‍රී සහභාගීත්වය පිළිබඳ ජනතා ආකල්ප වෙනසකට ලක් කිරීම්ට කටයුතු කිරීම

මූලාශ්‍රය: Lovenduski and Karam, 1998

සටහන: 3

නියෝජනය හරහා ස්ත්‍රීන්ට කළහැකි බලපෑම

	ආයතනාත්මක/ක්‍රියාපටිපාටින් හා නියෝජනයේ වෙනස	නිමැවුම් සඳහා බලපෑම සහ කතිකාවත
නීති රෙගුලාසි සම්ප්‍රදායන් ආදී දෑ ඉගෙන ගැනීම / ඒවා පිළිබඳ හොඳ අවබෝධයක් ලබා ගැනීම	• පෙරහුරු හා පුහුණු වැඩසටහන්වලට සහභාගි වීම (නියෝජිත ආයතනයේ නීති රෙගුලාසි, සම්ප්‍රදායන්, පණත් ඉදිරිපත් කිරීම, සාකච්ඡාවලට සහභාගි වීම ආදි දෑ) • ප්‍රසිද්ධ දේශන, එලදායී සන්නිවේදනය, තීරණ ගන්නන්ට බලපෑම් කිරීම, දැනුවත් කිරීම ආදිය පිළිබඳ ඉගෙනීම • ස්ත්‍රී සංවිධාන සමඟ සබඳතා / ජාලගත වීම • ජ්‍යෙෂ්ඨයින්ගෙන් උපදෙස්, ගුරුහරුකම් ලබා ගැනීම • මාධ්‍ය හැසිරවීමේ අවබෝධය ලබා ගැනීම	• ස්ත්‍රීන් යමක් දෙස බලන ආකාරය හා ස්ත්‍රීන්ගේ ප්‍රශ්න හා පොදු ප්‍රශ්න අතර ඇති වෙනස හැඳින ගැනීම • මාධ්‍ය, ජාතික හා ජාත්‍යන්තර සංවිධාන සමඟ සබඳතා • දේශපාලන කතිකාවලට ලිංගභේදය හා ස්ත්‍රී-පුරුෂ සමාජභාවය සම්බන්ධ කරුණු අන්තර්ගත කිරීම • විවිධ කමිටු තුළ (අයවැය, ආරක්ෂක ආදී) ස්ත්‍රී නියෝජනය • දේශපාලන වශයෙන් එතරම් වැදගත් නොවේ යයි සමහරු සලකන කමිටුවල (කාන්තා කටයුතු, ළමා, ග්‍රාම සංවර්ධන ආදී) ඇති සමාජීය වැදගත්කම අවධාරණය කිරීම

නීති රෙගුලාසි භාවිතය	• නියෝජිත ආයතන හෝ පක්ෂ තුළට ස්ත්‍රීන්ද තෝරා පත්කිරීම, ස්ත්‍රියකට ඡන්දය දීමේ වැදගත්කම අවධාරණය කිරීම • ප්‍රධාන තනතුරුවල ස්ත්‍රීන් නොසිටීම පිළිබඳ අවධානය යොමු කිරීම • කමිටුවල කාර්යන්ට වැඩි දායකත්වය • ස්ත්‍රී කටයුතු පිළිබඳ අමාත්‍යංශ, හා ජාතික කමිටු වැනි ආයතන පිහිටුවීමට බලපෑම් කිරීම - ස්ත්‍රී-පුරුෂ සමානාත්මතාවය දිනා ගැනීමට අදාළ තනතුරු හඳුන්වා දීම • යම් යම් ආයතනවල ව්‍යුහයන් වෙනස් කිරීම මගින් ස්ත්‍රීන් ඒවාට ඇතුලත් කර ගැනීම • සාකච්ඡා, වාද විවාදවලදී සතුරු විලාශයකින් නොව, ප්‍රජාතන්ත්‍රවාදීව හා තර්කානුකූලව අදාළ කරුණ වඩාත් ඒත්තු ගැන්විය හැකි අයුරින් ඉදිරිපත් කිරීමේ පුහුණුව / හැකියාව ලබා ගැනීම	• ආයතනයේ න්‍යාය පත්‍ර, වැඩ පිළිවෙල් හා පහසුකම් ආදිය ස්ත්‍රී-පුරුෂ දෙපක්ෂයේම අවශ්‍යතාවලට ගැලපෙන අයුරින් සැකසීමට බලපෑම් කිරීම. (උදා: රැස්වීම පවත්වන කාලය, ස්ත්‍රීන්ට අවශ්‍ය පහසුකම්, සම්පත් ආදිය) • ස්ත්‍රීන්ගේ ප්‍රශ්න පිළිබඳ ජනතා අදහස් විමසීම - ආණ්ඩුව හෝ වෙනත් තීරණ ගන්නා මට්ටම්වලදී එම අදහස් ඉදිරිපත් කරමින් ස්ත්‍රීන්ගේ ප්‍රශ්න විසඳීමට අදාළ නීති/ප්‍රතිපත්ති හඳුන්වා දීමට මූලිකත්වය ගැනීම. • ස්ත්‍රීන් අනුග්‍රහ දක්වන පණත් වෙනුවෙන් කරුණු ඉදිරිපත් කිරීම හා එම සාකච්ඡාවලට සක්‍රීය ලෙස සහභාගි වීම. • එබඳු පණත් ඉදිරිපත් කරද්දී ඒවාට අදාළ තොරතුරු නියෝජිතවරුන්ටද ඉදිරිපත් කර ඔවුන් සමඟ සබඳතා ගොඩනැගීම/පණත් සම්මත කර ගැනීමේදී ඔවුන්ගේ සහාය ලබාගැනීම • ස්ත්‍රීන් මුහුණු දෙන පොදු ප්‍රශ්න (ලිංගික

		අතවර, ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය) හා නියෝජිත ආයතන තුළ ස්ත්‍රීන්ට මුහුණ දීමට සිදුවන ප්‍රශ්න ආදිය පිළිබඳ මාධ්‍ය හරහා පොදු ජනතාව දැනුවත් කිරීම
නීති රෙගුලාසි වෙනස් කිරීම	• පක්ෂයේ තීරණ ගන්නා මට්ටම්වලට පුද්ගලයන් තේරීමේ හා මැතිවරණ නාමයෝජනා ලබාදීමේ නීති රෙගුලාසි/සම්ප්‍රදායන් වෙනස් කිරීම • පක්ෂය/නියෝජිත ආයතනය තුළ විවිධ කමිටු නියෝජනය සඳහා ස්ත්‍රී-පුරුෂ ප්‍රතිශතයක් නියම කර ගැනීම • ආයතනය තුළ ස්ත්‍රීන්ගේ සංසදයක් පිහිටුවීම (පක්ෂ, ජනවර්ග ආදී භේද නොතකා ස්ත්‍රීන්ට පොදු කරුණුවලදී කටයුතු කිරීම සඳහා) • ස්ත්‍රී-පුරුෂ සමානාත්මතාවය අරමුණු කොටගෙන සම්පාදිත නීති/ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමට හා නිරීක්ෂණයට ජාතික යාන්ත්‍රණයක් පිහිටුවීම - ඒ මගින් රාජ්‍යයට/පක්ෂයට ඇති වගකීම තහවුරු කිරීම - ඒවායේ ප්‍රගතිය/දුර්වලතා සම්බන්ධයෙන් වන වාර්තා ආයතනයට ඉදිරිපත් කිරීම -	• තීරණ ගන්නා මට්ටම්වලදී වඩාත් සක්‍රිය හා ඵලදායී දායකත්වයක් ස්ත්‍රීන්ගෙන් ලබා ගැනීමට අදාළ පුහුණු වැඩසටහන් සඳහා සම්පත් ලබා දීම (උදා: නායකත්ව පුහුණු ඇකඩමි, මැතිවරණවලදී නවක ස්ත්‍රීන්ට ආධාර, වැඩිපුර ස්ත්‍රීන්ට නාමයෝජනා දී ඇති පක්ෂවලට විවිධ සහායන් ලබා දීම) - පක්ෂය හෝ ආයතනය තුළ එබඳු ක්‍රියාකාරකම් සඳහා වාර්ෂික අයවැයෙන් යම් ප්‍රතිශතයක් වෙන් කිරීම • ස්ත්‍රී සංවිධාන හා ස්ත්‍රී ව්‍යාපාර වල සහායද ලබාගෙන, ස්ත්‍රීන් පිළිබඳ ඇති සෘණාත්මක ආකල්ප වෙනස් කිරීමට කටයුතු කිරීම (උදා: ස්ත්‍රීන් හුදෙක් ගෘහණියන් පමණක් නොව, කාර්යක්ෂම හා ඵලදායී දේශපාලනඥයින් හා නායකයින්ද

	විවාදයට ගැනීම - ඒ සඳහා ආයතන න්‍යාය පත්‍රයේ ඉඩක් වෙන් කරවා ගැනීම • ආයතනයේ සාකච්ඡා, වාද විවාදවලදී කරුණු ඉදිරිපත් කිරීමට නියෝජිතවරියන්ට ඉඩප්‍රස්ථා (කාලය වෙන් කර දීම) ලබා දීම හා ඒ සඳහා පෙළඹවීම	වන බව පෙන්වා දීම) - එමගින් ස්ත්‍රීන් සම්බන්ධයෙන් වන ඒකාකෘති හා ප්‍රතිරූප වෙනස් කිරීම • ස්ත්‍රී ලිංගිකත්වය ''පහත්'' යයි සැලකීම හෝ ප්‍රතික්ෂේප කිරීම වෙනුවට ''තමා ස්ත්‍රියක වීම සතුටට/ආඩම්බරයට'' කරුණක් බැව් අවධාරණය කිරීම - පුරුෂයෙකු ලෙස හැසිරීමට නැතිනම් පුරුෂයන් අනුකරණයට උත්සාහ නොකිරීම - ස්ත්‍රියක ලෙස කටයුතු කිරීම • ස්ත්‍රීන්ගේ තත්වය වර්ධනයට අදාළ දැවෙන ප්‍රශ්න (දිළිඳුකම, විරැකියාව, අවතැන් වූවන් සහ මැදපෙරදිග සේවිකාවන් මුහුණ දෙන ප්‍රශ්න ආදිය) විසඳීමට අදාළ නීති/ප්‍රතිපත්ති සම්පාදනයට වැඩි අවධානය යොමු කිරීම

මූලාශ්‍රයඃ Lovenduski and Karam, 1998

4

ස්ත්‍රී නියෝජනය වර්ධනය සඳහා පංගු ක්‍රම හා වෙනත් උපක්‍රම භාවිතය: විදෙස් අත්දැකීම්

දැනට ලොව රටවල් 97 ක් පමණ ස්ත්‍රී නියෝජනය වර්ධනය සඳහා පංගු ක්‍රම හා වෙනත් උපක්‍රම භාවිතා කරයි. එහි ප්‍රතිඵලයක් ලෙස බොහොමයක් රටවල ස්ත්‍රී දේශපාලන නියෝජනයේ ප්‍රමාණාත්මක වෙනසක් සිදු වී තිබේ. මෙම පරිච්ඡේදයේදී යුරෝපාව හා සමහර සංවර්ධිත රටවල්, ආසියා පැසිපික් රටවල්, ලතින් අමරිකානු, අප්‍රිකානු හා අරාබි රටවල් පංගු ක්‍රම සහ වෙනත් උපක්‍රම භාවිත කරන ආකාරය හා ඒවායේ බලපෑම, අපේක්ෂිත අරමුණු කරා යාමේදී මුහුණ දෙන ගැටළු, අභියෝග සහ විශේෂයෙන් පංගු ක්‍රම දිනා ගැනීම සඳහා භාවිත කළ විවිධ උපක්‍රම පිළිබඳව සාකච්ඡා කෙරේ.

පංගු ක්‍රම හා වෙනත් උපක්‍රම භාවිතය සම්බන්ධ අත්දැකීම් රටින් රටට වෙනස්ය. නමුත් භූගෝලීය කලාප අනුව, බහුතරයක් රටවල් භාවිතා කරන පංගු ක්‍රමවල යම් ආකාර සමාන බවක් දිස්වේ. කලාප අනුව දේශපාලන ක්‍රමවල ඉතිහාසයේ පවතින සමානකම්, දේශපාලන ක්‍රමවල පවතින සමාන ලක්ෂණ හා එම කලාපයේ එක් රටක් පංගු ක්‍රමයක් හඳුන්වා දුන් පසු එය තවත් රටක් අනුකරණය කිරීම වැනි දෑ එයට හේතු විය හැකිය.

පංගු ක්‍රමය හඳුන්වා දීමේ පුරෝගාමීන් ලෙස සැලකෙන්නේ නෝර්ඩික් රටවල්ය. 1975 දී නෝර්වේහි සමාජවාදී වමේ පක්ෂය (Scocialist Left Party), නාමයෝජනා ලැයිස්තුවලින් 40% ක්වත් ස්ත්‍රීන් සඳහා වෙන්කළ යුතුය යන අභ්‍යන්තර ප්‍රතිපත්තිය හඳුන්වා දීම එහි ආරම්භයයි. එයින් පසු නෝර්වේහි වෙනත් පක්ෂත්, ඩෙන්මාර්ක්

හා ස්වීඩනයේ සමහර පක්ෂත් මෙම ප්‍රතිපත්තියම අනුගමනය කළේය. නමුත් එහි ප්‍රතිඵලයක් ලෙස මෙම රටවල ස්ත්‍රී නියෝජනයේ රැඩිකල් වෙනසක් සැණෙකින් සිදු නොවීය. ස්ත්‍රී නියෝජනය ක්‍රමිකව 25% පමණ දක්වා වර්ධනය වූ පසු සමහර නොර්ඩික් රටවල් ස්ත්‍රී නියෝජනය වර්ධනය සඳහා පංගු ක්‍රම ප්‍රතිපත්ති නීතියෙන් තහවුරු කළේය (Ballington and Binda, 2005).

බොහොමයක් බටහිර යුරෝපා රටවල්, කැනඩාව හා ඕස්ට්‍රේලියාව පක්ෂ ප්‍රතිපත්ති මගින් ස්වේච්ඡා පංගු ක්‍රම හඳුන්වා දී තිබේ. නැගෙනහිර යුරෝපා රටවල් පංගු ක්‍රම භාවිත කරන්නේ අඩුවෙනි. නමුත් චෙක් ජනරජය හා හංගේරියාවද ස්වේච්ඡා පංගු ක්‍රම භාවිතා කරයි.

ලතින් අමරිකානු රටවල් 1990 ගණන් මුල සිට පංගු ක්‍රම පිළිබඳ වැඩි අවධානයක් යොමු කරයි. බහුතරයක් ලතින් අමරිකානු රටවල් හඳුන්වා දී ඇත්තේ නීත්‍යානුකූලව නාමයෝජනා ලැයිස්තු වලින් ස්ත්‍රීන් සඳහා පංගුවක් වෙන් කිරීමේ ක්‍රමයයි. 1991 දී ආර්ජන්ටිනාව මෙම ක්‍රමය ප්‍රථමයෙන්ම හඳුන්වා දුනි. ඉන්පසු මෙක්සිකෝව (1996), පේරු (1997), පැනමා (1997), බොලීවියා (1997), බ්‍රසීලය (1997) හා වෙනිසියුලා (1998) ආදී වශයෙන් රටවල් 10 ක් පමණ පංගු ක්‍රම හඳුන්වා දුනි. මෙම රටවල් බොහොමයක 1980 ගණන්වලදී ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන ක්‍රම ස්ථාපිත වීම, එම දේශපාලන ව්‍යාපාර හරහා ස්ත්‍රී සංවිධාන / ව්‍යාපාර ඉස්මතු වීම සහ ඒවාට වෙනත් සිවිල් අයිතිවාසිකම් ව්‍යාපාර වල සහාය ලැබීම, පංගු ක්‍රමය දිනා ගැනීමේ ක්‍රියාවලියට වැඩි පහසුකමක් සැපයීය (Ballington, 2003).

පසුගිය දශකය තුළ අප්‍රිකානු රටවල් ගණනාවක්ද විවිධ පංගු ක්‍රම හඳුන්වා දුනි. දකුණු අප්‍රිකාවේ, අප්‍රිකානු ජාතික කොංග්‍රසය, එරට ප්‍රථම පශ්චාත්-ඇපාර්තීඩ් ප්‍රජාතන්ත්‍රවාදී මැතිවරණයේදී, නාමයෝජනා ලැයිස්තුවලින් පංගුවක් ස්ත්‍රීන් සඳහා වෙන් කළේය.

එමගින් ස්වේච්ඡා පංගු ක්‍රමය හඳුන්වා දීමේ කලාපීය පුරෝගාමීයා බවට දකුණු අප්‍රිකාව පත් විය (Ballington, 2004). උගන්ඩාව 1986 දී ව්‍යවස්ථානුකූලව ස්ත්‍රීන් සඳහා පාර්ලිමේන්තු ආසන වෙන්කිරීම හඳුන්වා දීමෙන් එම කලාපය තුළදී ප්‍රමුඛත්වය ගත්තේය. ඉන්පසු සමහර නැගෙනහිර අප්‍රිකානු රටවල්ද (ඩිජිබූටි, එරිත්‍රියා, සෝමාලියා සහ සූඩාන්) එම ප්‍රතිපත්තිය අනුගමනය කළේය.

මැදපෙරදිග රටවල ස්ත්‍රී නියෝජනය පිළිබඳ අවධානය වෙනත් කලාපවලට සාපේක්ෂව අඩු වුවත්, ඊජිප්තුව හා ජෝර්දානය ස්ත්‍රීන් සඳහා පාර්ලිමේන්තු ආසන වලින් පංගුවක් වෙන්කර දී ඇත. ඊශ්‍රායලයේ දේශපාලන පක්ෂ ස්වේච්ඡා පංගු ක්‍රමය භාවිතා කරයි (International IDEA Reports, 2007).

ආසියානු කලාපය තුළ, විශේෂයෙන්ම දකුණු ආසියාතික රටවල පළාත් පාලන ආයතනවල ආසනවලින් ස්ත්‍රීන්ට පංගුවක් වෙන් කිරීම පොදු දෙයක් වී ඇත. ඉන්දියාව, පකිස්ථානය, නේපාලය, බංගලාදේශය හා ඇෆ්ගනිස්ථානය එයට නිදසුන් වේ. ජාතික මැතිවරණ සඳහා වන නාමයෝජනා ලැයිස්තුවලින් ස්ත්‍රීන්ට පංගුවක් වෙන්කිරීම ඉන්දුනීසියාව, පිලිපීනය හා නේපාලය වැනි රටවල ක්‍රියාත්මක වේ (International IDEA, 2002).

යුරෝපා හා බටහිර සංවර්ධිත රටවල අත්දැකීම්

ස්ත්‍රීන්ගේ දේශපාලන නියෝජනයේදී ලොව ඉහළම ප්‍රතිශතය දිනාගෙන ඇත්තේ ස්කැන්ඩිනේවියානු රටවල්ය. ඒ අතරිනුත් **ස්වීඩනය** මෑතක් වනතුරුම ලොව වැඩිම ප්‍රමාණයක් ස්ත්‍රීන් පාර්ලිමේන්තුව තුළ නියෝජනය කරන රට බවට පත් වී තිබිණි. ස්කැන්ඩිනේවියානු රටවල් මෙම තත්වය දිනාගෙන ඇත්තේ පංගු ක්‍රමය නිසා බවට පොදු මතයක් තිබේ (Phillips, 1995). නමුත් කිසිදු පංගු ක්‍රමයක් හඳුන්වා දීමට පෙර 1970 ගණන්වල සිට එම රටවල ස්ත්‍රී නියෝජනයේ වර්ධනයක් සිදුවූ

අතර, එය 1980 දශකයේ මුල වෙද්දී 20-30% අතර ප්‍රතිශතයක පැවති බවත්, ඉන් පසුව ස්කැන්ඩිනේවියානු රටවල සමහර දේශපාලන පක්ෂ ස්වේච්ඡා පංගු ක්‍රම හඳුන්වා දුන් බවත්, තවත් මතයකින් ප්‍රකාශ වේ (Dahlerup, 1988, 1998, 2003 and 2006; Dahlerup and Friedenvall, 2003). ස්වීඩනයේ ස්ත්‍රී නියෝජනය වර්ධනය වූයේ පංගු ක්‍රම නිසා නොව වෙනත් සාධනීය ප්‍රතිපත්ති හා ක්‍රියාකාරකම් (Affirmative actions) නිසා බව තවත් මතයකින් ප්‍රකාශ වේ (Caul, 2001).

එහෙයින් 1970 ගණන්වල සිට **ස්වීඩනය** අනුගමනය කළ එම ක්‍රියාකාරකම් පිළිබඳ සාකච්ඡා කිරීම වඩාත් ප්‍රයෝජනවත්ය. 1970 දී ස්වීඩන් පාර්ලිමේන්තුවේ ස්ත්‍රී නියෝජනය 14% ක් වූ අතර, එහි වර්ධනය ආරම්භ වූයේ 1970 ගණන්වල සිටය. 1988 දී එම ප්‍රතිශතය 38% කටත්, 2000 ගණන්වලදී 43% කටත්, 2012 දී 48% කටත් ක්‍රමිකව වර්ධනය වී තිබේ. එයට බලපෑ හේතු ගණනාවක් වන අතර, ආයතනාත්මක, සමාජ-ආර්ථික හා සංස්කෘතික සාධක ලෙස ඒවා වර්ග කෙරේ. මැතිවරණ ක්‍රමය, ඡන්ද කොට්ඨාශවල භූමි ප්‍රමාණය, පක්ෂ නාමයෝජනා ලැයිස්තුවල විශේෂ ලක්ෂණ, පක්ෂ විඥානය හා පක්ෂ නීති රෙගුලාසි මෙයින් පළමු ගණයට ගැනේ. ස්ත්‍රීන්ගේ ශ්‍රම දායකත්වය, අධ්‍යාපන මට්ටම් ඉහළ යාම සහ සමාජ සුභසාධන ක්‍රමය යන දෑ සමාජ-ආර්ථික සාධක අතරින් මූලික වේ. තෙවැනි ගණයට අයත් වන්නේ අනාගමික දේශපාලන පක්ෂ, ආගමික බලපෑම් නිසා ස්ත්‍රීන් හා පුරුෂයන්ට සමානව සැලකීම හා ස්ත්‍රීන් සම්බන්ධයෙන් ස්වීඩන් සමාජයේ පවතින ආකල්ප හා සාරධර්මයි. ස්ත්‍රී නියෝජනය සඳහා දේශපාලන පක්ෂ දක්වන කැමැත්ත හා ප්‍රතිපත්ති මෙම සාධක අතරින් ප්‍රමුඛ වේ (Fridenvall, 2003).

ස්වීඩන් දේශපාලන පක්ෂ 1970 ගණන්වල සිටම, ස්ත්‍රීන්ගේ නියෝජනයේ අවශ්‍යතාවය අවබෝධ කරගත් අතර, ස්ත්‍රී නියෝජනය අවම වීම සමාජ හා දේශපාලන ගැටළුවක් බවත්, එය විසඳීමට පියවර ගතයුතු බවත් පිළිගති. 1980 ගණන් වනතුරු ස්වීඩන් පක්ෂ පංගු ක්‍රම

භාවිතා කළේ නැත. නමුත් ස්ත්‍රී නියෝජනයේ ඉලක්ක හඳුනා ගෙන, ඒවා ප්‍රකාශ කොට ස්ත්‍රීන්ට වැඩි නාමයෝජනා දීමේ ප්‍රතිපත්තිය අනුගමනය කළේය. විශේෂයෙන්ම දක්ෂිණාංශික හා මධ්‍යස්ථ පක්ෂවල අරමුණු හා ඉලක්ක ස්ත්‍රී නියෝජනය වර්ධනයට විශාල බලපෑමක් කළේය. 1972 දී ලිබරල් පක්ෂය, එහි අභ්‍යන්තර කමිටුවල ස්ත්‍රීන් සහ පුරුෂයන් අවම වශයෙන් 40% ක්වත් නියෝජනය වියයුතුය යන ප්‍රතිපත්තිය හඳුන්වා දුනි. 1974 දී, එක් මැතිවරණ නාමයෝජනා ලැයිස්තුවකට, අවම වශයෙන් එක් ස්ත්‍රියක්වත් (ඡන්දය ජය ගැනීමේ සම්භාවිතාවය ඇති ආසනයකට) අන්තර්ගත වියයුතුය යන තීරණයට එළඹිණි. 1988 දී ලිබරල් පක්ෂය පක්ෂ ප්‍රතිපත්තියක් ලෙස zipper ක්‍රමය[5] හඳුන්වා දුන් අතර නාමයෝජනා ලැයිස්තුවේ පළමුවැන්නා පුරුෂයෙක් හා දෙවැන්නා ස්ත්‍රියක වශයෙන් ලැයිස්තුවෙන් අඩක් පුරුෂයන්ටත් ඉතිරි අඩ ස්ත්‍රීන්ටත් වෙන් කිරීම ආරම්භ කළේය.

1987 ක්‍රිස්තියානි ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂය නාමයෝජනා ලැයිස්තුවලට අවම වශයෙන් 40% ක්වත් ස්ත්‍රීන් හා පුරුෂයන් අන්තර්ගත කළ යුතුය යන ප්‍රතිපත්තිය හඳුන්වා දුනි.

සමාජ ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂය, 1970 ගණන්වලදී ස්ත්‍රී නියෝජනයේ අරමුණු හා අභිප්‍රායන්ද, 1980 ගණන්වලදී එහි ඉලක්කද ප්‍රකාශයට පත් කළේය. 1994 දී එම පක්ෂය zipper ක්‍රමය නැතිනම් සීබ්‍රා (zebra) ක්‍රමය[6] හඳුන්වා දුනි. ඒ අනුව සෑම නාමයෝජනා ලැයිස්තුවකම පළමු නමට පුරුෂයෙක් හා දෙවැනි නමට ස්ත්‍රියක් වශයෙන් අන්තර්ගත වියයුතු අතර නාමයෝජනා ලැයිස්තුවල ''ස්ත්‍රී-පුරුෂ සමාන නියෝජනය'' යන ප්‍රතිපත්තිය ප්‍රකාශයට පත් කළේය.

5 zipper ක්‍රමය ලෙස හැඳින්වෙන්නේ ඇඳුම් හා බෑග් ආදියට යොදන ෂිප් එකේ (ගාංචුව) එකක් හැර එකක් ලෙස යොදා ඇති අනු කොටස්වලට සමාන ආකාරයකින් නාමයෝජනා ලැයිස්තුවට ස්ත්‍රියක් හා පුරුෂයෙක් වශයෙන් නම් ඇතුළත් කිරීමේ ක්‍රමයයි.

6 zebra ක්‍රමය ලෙස හැඳින්වෙන්නේ සීබ්‍රාගේ සමෙහි ඇති කලු හා කහ ඉරිවලට සමාන අයුරින් නාමයෝජනා ලැයිස්තුවලට ස්ත්‍රියක් හා පුරුෂයෙක් වශයෙන් එක් නමක් හැර අනික් නම ඇතුළත් කිරීමේ ක්‍රමයයි.

1981 දී ග්‍රීන් පක්ෂයත් (Green Party) 1987 දී වාමාංශික පක්ෂයත් (Left Party) පක්ෂ අභ්‍යන්තර කමිටු සඳහා අවම වශයෙන් 40% ක්වත් ස්ත්‍රීන් නියෝජනය වියයුතුය යන ප්‍රතිපත්තිය හඳුන්වා දුනි. 1987 දී ග්‍රීන් පක්ෂය මැතිවරණ නාමයෝජනා ලැයිස්තු සඳහාද එම ක්‍රමය භාවිත කළේය. 1989 දී ග්‍රීන් පක්ෂයත්, 1997 දී වාමාංශික පක්ෂයත් එම ප්‍රතිශතය 50% දක්වා වැඩි කළේය.

ස්වීඩන් දේශපාලන පක්ෂ හඳුන්වා දුන් මෙම අභ්‍යන්තර ප්‍රතිපත්ති වලට අමතරව, ස්ත්‍රී නියෝජනය වර්ධනය සඳහා අරමුණු කරගත් ඉලක්ක කරා යාමට වෙනත් ආකාරයේ උපක්‍රමද භාවිතා කළේය. උදාහරණ වශයෙන් සමාජ ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂය, ස්ත්‍රීන්ට වෙනස් කොට සැලකීමේ හේතුව නිසා පක්ෂ තුළත්, ජාතික හා පළාත් පාලන නියෝජිත ආයතන තුළත් ප්‍රමාණවත් ස්ත්‍රී නියෝජනයක් නොමැත යන ගැටළුව වැදගත් සමාජ හා දේශපාලන ගැටළුවක්ය යන කරුණ 1970 මුල ගණන්වලදී අවබෝධ කර ගත්තේය. ඉන්පසු 1972 දී එම ගැටළුවට පිළියම් සෙවීමේ කාර්ය ආරම්භ කළේය. පක්ෂ කවුන්සිලය මෙහිදී ප්‍රකාශ කළේ ස්ත්‍රී-පුරුෂ නියෝජනයේ වෙනසට මූලික හේතුව ''සම්ප්‍රදායික ආකල්ප හා සාරධර්ම'' වන බවයි. ඒ නිසා නාමයෝජනා මණ්ඩල හා අදාළ ක්‍රියාපිළිවෙත් සම්බන්ධයෙන් ස්ත්‍රී-පුරුෂ මධ්‍යස්ථ (Gender-neutral) ප්‍රතිපත්ති අනුගමනය කිරීම පක්ෂය විසින් ආරම්භ කරන ලදී. මෙම කරුණ සම්බන්ධයෙන් විවිධ අධ්‍යයන සමීක්ෂණ කිරීමට සමාජ ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂය විශේෂයෙන්ම ස්ත්‍රීවාදීන්ව පෙළඹ වූ අතර, ඔවුන් 1970-80 දශකවලදී එම අධ්‍යයන මගින් ස්ත්‍රී නියෝජනය වර්ධනයට අදාළ විවිධ නිර්දේශ ඉදිරිපත් කළේය. ඒ අනුව සමාජ ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂය, ජාතික මෙන්ම ජාත්‍යන්තර ජනප්‍රියතාවයද අරමුණු කරගෙන, පක්ෂ ප්‍රතිපත්ති හා මැතිවරණ ප්‍රකාශන හරහා ස්ත්‍රීන්ගේ ප්‍රශ්න කෙරේ වැඩි අවධානයක් යොමු කළේය.

1993 දී සමාජ ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂය මේ සම්බන්ධයෙන් ඉක්මණින් කටයුතු කළයුතු අංශ 3 ක් ප්‍රකාශයට පත් කළේය. ඒවා නම් ස්ත්‍රී-පුරුෂ වැටුප් අසමානතා තුරන් කිරීම, ස්ත්‍රීන්ට එරෙහි ලිංගික ප්‍රචණ්ඩත්වය තුරන් කිරීම හා පක්ෂය තුළ ස්ත්‍රී නියෝජනය වර්ධනය කිරීමයි. ඒ සම්බන්ධයෙන් ඉදිරිපත් කළ වාර්තාවේදී පක්‍ෂය ප්‍රකාශ කළේ ''පවුල, වැඩකරන ස්ථානය හා දේශපාලනය ආදී සියලුම සමාජ ක්‍ෂේත්‍රවලදී පුරුෂයන්ට සාපේක්ෂව ස්ත්‍රීන් අව ප්‍රධාන තත්වයක සිටී. මෙය අහම්බෙන් සිදුවූවක් නොවේ. පුරුෂ මූලික සමාජය නිර්මාණය කිරීමට ප්‍රධාන වශයෙන් දායක වී ඇත්තේ ස්ත්‍රීන් හා පුරුෂයන් අතර අසමාන ලෙස බලය බෙදී තිබීමයි''යනුවෙනි (උපුටා ගත්තේ Fridenvall, 2003). ස්ත්‍රී-පුරුෂ දෙපක්ෂයට සමාන දේශපාලන අයිතිවාසිකම් හිමි වුවත්, දේශපාලනයට ඇති කැමැත්ත, උනන්දුව, හැකියාවන්, අත්දැකීම්, ඉඩ ප්‍රස්ථා හා සම්පත් ආදිය අතින් ස්ත්‍රීන් හා පුරුෂයින් අතර විශාල වෙනසක් ඇති බැව්ද, ඒ කෙරෙහි පක්ෂයේ අවධානය යොමුවිය යුතු බැව්ද, එම වාර්තාවෙන් තවදුරටත් අවධාරණය කෙරිණි.

මෙයට සමකාලීනව ස්ත්‍රී පක්ෂයක් පිහිටුවා බලපෑම් කිරීමේ තර්ජනයටද සමාජ ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයට මුහුණ දීමට සිදුවිය. ස්වීඩනයේ ස්ත්‍රීවාදී සංවිධාන ජාලයක් වූ ස්ටොකින් ව්‍යාපාරයට උදව් කිරීමේ ව්‍යාපාරය (support stockings movement) මේ අවස්ථාවේදී පෙරමුණ ගති. ස්වීඩන් පක්ෂ 1994 පාර්ලිමේන්තු මැතිවරණයේදී ස්ත්‍රී නියෝජනය වර්ධනය සඳහා නිසි පියවර නොගතහොත් වෙනම ස්ත්‍රී පක්ෂයක් පිහිටුවා එම මැතිවරණයට ඉදිරිපත් වන බවට එම ව්‍යාපාරය තර්ජනය කළේය. විශේෂයෙන්ම මෙය සමාජ ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂය පිළිබඳව ස්ත්‍රීන් තුළ පැවති විශ්වාසය බිඳ වැටීමක් ලෙස හඳුනා ගත් අතර, ස්ත්‍රීන්ගේ දායකත්වයෙන් තොරව පක්ෂයට ජයග්‍රහණය කළ නොහැකි බවද පක්ෂය අවබෝධ කර ගති. මේ වනවිට ග්‍රීන් පක්ෂය හා ලිබරල් පක්ෂය zipper ක්‍රමය හඳුන්වා දී තිබූ අතර, ස්ත්‍රී ව්‍යාපාරය නොනවත්වාම එබඳු ප්‍රතිපත්තියක් සඳහා බලපෑම් කළේය. මෙම

පරිසරය තුළ ''ස්ත්‍රීන්ගේ දායකත්වය අහිමිවීම යන තර්ජනය හා බිය'' නිසා සමාජ ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයේ කොංග්‍රසයට zipper ක්‍රමය යන ප්‍රතිපත්තිය හඳුන්වා දීමට සිදුවිය. නමුත් මූලික කරුණු 3ක් නිසා ''පංගු ක්‍රමය'' යන පදය භාවිත කිරීමෙන් පක්ෂය සිතා මතාම වැළකුනි. පළමු හේතුව වූයේ ස්ත්‍රීන්ව අවතක්සේරුවට ලක්වේ යයි උපකල්පනය කිරීමයි. දෙවැනි කරුණ වූයේ ප්‍රජාතන්ත්‍රවාදයේ මූලික ලක්ෂණයක් වූ සහ සමාජ ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයේ ප්‍රධාන ප්‍රතිපත්තියක් වූ ස්ත්‍රී-පුරුෂ සමානාත්මතාවය යන්න කෙරේ මෙතෙක් පක්ෂය අවධානය යොමු නොකළේය යන අපවාදයෙන් ගැලවීමට තිබූ අවශ්‍යතාවයයි. තෙවැන්න වූයේ නාමයෝජනා වලින් ''පංගුවක්'' ස්ත්‍රීන්ට වෙන් කිරීම සඳහා නව ප්‍රතිපත්තියක් හඳුන්වා දීමෙන්, පුරුෂයින්ට වෙනස් ලෙස හෝ අසමාන ලෙස සැලකීය යන මතය ව්‍යාප්ත වීම වැළැක්වීමේ අභිප්‍රායයි. මෙහිදී සමාජ ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂය අවධාරණය කළේ, සම්ප්‍රදායික හේතු නිසා මැතිවරණ තරඟයේදී ස්ත්‍රීන්ට මුහුණු දීමට වියහැකි බාධා තුරන් කිරීමට ව්‍යුහාත්මක/ආයතනාත්මක වන්දියක් වශයෙන් zipper ක්‍රමය හඳුන්වා දෙන බවයි. මේ අනුව ස්වීඩනයේ සමාජ ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයත්, ග්‍රීන් පක්ෂය හා ක්‍රිස්තියානි ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයත් පාර්ලිමේන්තු, ප්‍රාදේශීය හා පළාත් පාලන මෙන්ම යුරෝපා පාර්ලිමේන්තු, මැතිවරණය සඳහාත් zipper ක්‍රමය හඳුන්වා දී තිබේ.

ස්වීඩන් කොන්සර්වෙටිව් පක්ෂයේ ස්ත්‍රී ෆෙඩරේෂනය 1970 ගණන්වල මුල සිට දේශපාලනයේදී ස්ත්‍රී නියෝජනයේ වැදගත්කම පිළිබඳ අවධානය යොමු කළේය. පක්ෂයේ ස්ත්‍රී-පුරුෂ සමානාත්මතා ප්‍රතිපත්තිය පිළිබඳවද මෙම ෆෙඩරේෂනය විසින් ප්‍රශ්න කරන ලද අතර, එය දිනා ගැනීමට බලපාන විශාලම බාධකය දේශපාලන ආයතනවල ස්ත්‍රීන් ප්‍රමාණවත් අයුරින් නියෝජනය නොවීම බැව් පෙන්වා දුනි. මෙම කරුණ සම්බන්ධයෙන් ස්ත්‍රී ෆෙඩරේෂනය අවස්ථා ගණනාවකදී විවිධ යෝජනාද පක්ෂයට ඉදිරිපත් කළේය. 1975 දී එබඳු යෝජනාවක් ඉදිරිපත් කරමින්, පක්ෂයේ ස්ත්‍රීන්ට නාමයෝජනා ලබා

ගැනීමට උපකාර කිරීමේ සහ නාමයෝජනා ලබාගත් ස්ත්‍රීන්ව පුහුණු කිරීමේ මධ්‍යස්ථානයක් ලෙස කටයුතු කිරීමට මෙම ස්ත්‍රී ෆෙඩරේෂනය අවසර ඉල්ලා සිටියේය. නමුත් ඒ සඳහා තවමත් නිසි කාලය පැමිණ නැති බව පවසමින් පක්ෂය එම යෝජනාව ප්‍රතික්ෂේප කළේය. මේ අයුරින් පක්ෂය හා ස්ත්‍රී ෆෙඩරේෂනය අතර හටගත් අරගලය, 1990 ගණන් දක්වාම නොකඩවා පැවතුනි. මෙම තත්වය, පක්ෂයේ ස්ත්‍රීන් හා පුරුෂයන් වෙනම න්‍යාය පත්‍ර මත වැඩ කිරීමටත්, පක්ෂයේ ජනප්‍රිය බව හා ස්ත්‍රී ඡන්ද අඩුවීමටත්, පක්ෂය පිළිබඳව ඡන්දදායකයින් තුළ පැවති ප්‍රතිරූපය යම් මට්ටමකින් බිඳ වැටීමටත් බලපෑම් කළේය (Dahlerup, 1986). මෙම පරිසරය තුළ, කොන්සර්වෙටිව් පක්ෂයට නවීන හා ප්‍රගතිශීලි පක්ෂයක් බව ප්‍රදර්ශනය කිරීමේ සහ ඡන්දදායක ආකර්ෂණය දිනා ගැනීමේ අවශ්‍යතාවය පැන නැගුණි. මේ නිසා පංගු ක්‍රමයක් හඳුන්වා දීම වෙනුවට, පක්ෂය විශේෂයෙන්ම පළාත් පාලන මට්ටමේදී ස්ත්‍රීන්ට පෙරට වඩා වැඩියෙන් නාමයෝජනා ලබාදීමටත්, පක්ෂ හා පාර්ලිමේන්තු කමිටුවල ස්ත්‍රී නියෝජනය වැඩිකිරීමටත්, දේශපාලන පුහුණුව හා මැතිවරණ ආධාර වැනි දෑ ස්ත්‍රීන්ට ලබාදීමටත් තීරණය කළේය. කොන්සර්වෙටිව් පක්ෂය නියෝජනය කරන පාර්ලිමේන්තු මන්ත්‍රීවරියන්ගේ ප්‍රතිශතය ස්විඩන්හි අනෙක් පක්ෂවලට සාපේක්ෂව පහළ මට්ටමක පැවතියත්, එහි පළාත් පාලන ආයතන තුළ හා පක්ෂ අභ්‍යන්තර කමිටුවල ස්ත්‍රී නියෝජනය ඉහළ මට්ටමක පවතී (Ingelhart and Norris, 2003).

ජර්මනියේ පහළ මණ්ඩලයට නියෝජිතයින් තෝරා ගන්නේ මිශ්‍ර නියෝජන ක්‍රමයකින් වන අතර, එයින් අඩක් ඡන්දදායක කොට්ඨාශ ක්‍රමයක් පදනම් කරගෙනද, ඉතිරි අඩ ලැයිස්තු ක්‍රමයට අනුවද තෝරා ගනී. මෙම මිශ්‍ර ඡන්ද ක්‍රමය ස්ත්‍රී නියෝජනයේ වර්ධනයට ඍජුව බලපාන බැව් පොදු මතයයි (Norris, n.d). ජර්මනියේ ප්‍රධාන පක්ෂ පහෙන් තුනක්, ඒවායේ අභ්‍යන්තර ප්‍රතිපත්තිවලට අනුව නාමයෝජනා වලින් 40-50% අතර ප්‍රමාණයක් ස්ත්‍රීන් සඳහා වෙන්කර තිබේ. සමාජ ව්‍යාපාරයක් ලෙස පැවති පරිසර ව්‍යාපාරය, 1980 දී ග්‍රීන් පක්ෂය ලෙස

ස්ථාපිත වීමේදී zipper ක්‍රමය මගින් ස්ත්‍රී-පුරුෂ දෙපක්ෂයටම 50% බැගින් නාමයෝජනා දීමේ ප්‍රතිපත්තිය හඳුන්වා දුනි. 1988 දී සමාජ ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂය සියලුම පක්ෂ අභ්‍යන්තර තනතුරුවලින් 1/3 ක් ස්ත්‍රීන් වියයුතු බැව් තීරණය කළේය. 1994 සිට, පක්ෂයේ සියලුම තනතුරුවලින් 40% ක් ස්ත්‍රීන් සඳහා වෙන්කළ යුතු බැව් තීරණය කළේය.

1996 දී ක්‍රිස්තියානි ඩිමොක්‍රටික් පක්ෂය quorum ක්‍රමය හෙවත් සියලුම පක්ෂ තනතුරු හා නාමයෝජනා ලැයිස්තුවලින් 30% ස්ත්‍රීන්ට වෙන් කිරීමේ ප්‍රතිපත්තිය හඳුන්වා දුනි. බටහිර හා නැගෙනහිර ජර්මනිය එක්සත් වූ පසුව නැගෙනහිර ජර්මන් කොමියුනිස්ට් පක්ෂය zipper ක්‍රමය හරහා ස්ත්‍රී-පුරුෂ දෙපක්ෂයටම 50% බැගින් නාමයෝජනා වෙන්කිරීමේ ප්‍රතිපත්තිය හඳුන්වා දුනි. නමුත් බැවේරියානු සොයුරියන්ගේ පක්ෂය (Bavarian Sister's Party) හා දක්ෂිණාංශික පක්ෂය මෙම ප්‍රතිපත්ති ප්‍රතික්ෂේප කරයි. 2009 මැතිවරණ ප්‍රතිඵල වලට අනුව ජර්මන් ජාතික ව්‍යවස්ථාදායකයේ ස්ත්‍රී නියෝජනය 32.9% කි.

දැනට ජර්මනියේ වැඩිම ස්ත්‍රීන් ප්‍රමාණයක් ව්‍යවස්ථාදායකය තුළ නියෝජනය කරන්නේ ග්‍රීන් පක්ෂයයි (57%). ක්‍රිස්තියානි ඩිමොක්‍රටික් පක්ෂයේ ජාතික නියෝජනය 19.5% කි. සමාජ ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයේ 35% කි. ජර්මනියේ ප්‍රධාන පක්ෂ නාමයෝජනා ලැයිස්තුවලින් 40-50% අතර ප්‍රමාණයක් ස්ත්‍රීන්ට ලබාදීමට තීරණය කළද, බොහෝ පක්ෂ එම මූලික ඉලක්ක කරා තවමත් ළඟා වී නොමැත. ව්‍යුහාත්මක වෙනස්කම් කරනු ලැබුවද, සමාජීය වෙනස්කම් ඒ හා සමාන්තරව සිදු නොවීම එයට මූලික හේතුවයි (IPU, 1997).

බ්‍රිතාන්‍යයේ ලේබර් පක්ෂය 1980 දී, පක්ෂ තනතුරුවලින් පංගුවක් ස්ත්‍රීන්ට වෙන් කිරීමට එකඟ විය. පාර්ලිමේන්තු මැතිවරණයේදී ඉතා සුළු ප්‍රතිශතයක්, එනම් අවම වශයෙන් නාම යෝජනා ලැයිස්තුවකට

එක් ස්ත්‍රියකගේ නමක් ඇතුළත් වියයුතු යැයි තීරණය කළේය. 1993 දී විශ්‍රාම යන මන්ත්‍රීවරුන්ගේ අසුන්වලින් අඩක් ස්ත්‍රීන්ට වෙන්කිරීමටත්, ලේබර් පාක්ෂික අපේක්ෂිකාවන් සමස්ථය අතුරින් තෝරාගනු ලැබූ ස්ත්‍රීන්ගෙන් සමන්විත කෙටි ලැයිස්තුවක් (short list) ඇසුරින් නාම යෝජනා ලැයිස්තු සැකසීමටත් තීරණය කෙරිණි. මෙහි ප්‍රතිඵලයක් ලෙස, 1992-97 අතර කාලයේදී බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තුවේ ලේබර් මන්ත්‍රීවරියන්ගේ සංඛ්‍යාව දෙගුණයක් විය. එහෙත් මෙම ප්‍රතිපත්තියට එරෙහිව ආ නීතිමය අභියෝග නිසා පසුව එය අත්හිටුවීමට සිදුවිය (Norris and Lovenduski, 1995).

ස්කොට්ලන්ත පාර්ලිමේන්තුව හා **වේල්ස්** ඇසෙම්බ්ලිය සඳහා වූ ප්‍රථම මැතිවරණයේදී ලේබර් පක්ෂය ''නිවුන් ක්‍රමය'' (twinned system) හඳුන්වා දුනි. ඒ අනුව එක් ආසනයකට සමීප තවත් ආසනයක් සමඟ ආසන දෙකක් බද්ධ කෙරේ. එහිදී ඡන්දදායකයාට ඡන්ද දෙකක් හිමිවන අතර වැඩිම ඡන්ද ලැබූ අපේක්ෂකයා හා අපේක්ෂිකාව නියෝජිතයින් ලෙස තෝරා ගැනේ. මෙම ආයතන දෙකම අලුතින් පිහිටවූ නිසා ප්‍රථම ව්‍යවස්ථාවෙන්ම එසේ ස්ත්‍රී-පුරුෂ සමාන ප්‍රතිපත්තියක් හඳුන්වා දීම බෙහෙවින් පහසුවක් විය. මෙම ක්‍රමයේ ප්‍රතිඵලයක් ලෙස, ස්කොට්ලන්ත පාර්ලිමේන්තුවට ලේබර් පක්ෂ නියෝජිතයින් අතුරින් ස්ත්‍රීන් 48% ක්ද, වේල්ස් ඇසෙම්බ්ලියට 54% ක්ද තේරී පත්වුනි. 2000 මැයි මසදී ලන්ඩන් නගර සභා මැතිවරණයේදී ද මෙම ක්‍රමය භාවිත කළ අතර, එහිදී 44% නියෝජිතවරියන් තේරී පත්විය.

බ්‍රිතාන්‍යය ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයද නාමයෝජනා ලැයිස්තුවලින් අවම වශයෙන් 1/3 ක බැගින් ස්ත්‍රීන් හා පුරුෂයන්ට වෙන්කර තිබේ. ඉතිරිය පොදු නාමයෝජනා ලෙස සැලකේ.

ප්‍රංශයේ 1982 දී පැවති සමාජවාදී ආණ්ඩුව පළාත් පාලන මැතිවරණ නාමයෝජනා ලැයිස්තුවලින් 25% ස්ත්‍රීන්ට වෙන් කෙරෙන නීතියක් සම්මත කළේය. නමුත් එමගින් සමානාත්මතාවය තහවුරු

කිරීම සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ස්ථාපිත මූලික අයිතිවාසිකම් පිළිබඳ වගන්තිය උල්ලංඝනය වේ යයි ප්‍රකාශ කරමින්. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කවුන්සිලයට පෙත්සමක් ඉදිරිපත් කෙරිනි. ඉන්පසු එය අවලංගු කෙරිනි.

නමුත් 1999 දී මැතිවරණ නීති සංශෝධනය කරමින්, නියෝජනය සඳහා ස්ත්‍රීන් හා පුරුෂයන්ට ඇති සම අයිතිය තහවුරු කෙරෙන ආකාරයේ නීතියක් සම්මත කළේය. 2007 මැතිවරණ ප්‍රතිඵල වලට අනුව ප්‍රංශ ව්‍යවස්ථාදායකයේ පහළ මණ්ඩලයේ ස්ත්‍රී නියෝජනය 18.9% කි. දෙවැනි මණ්ඩලයේ 22.2% කි. 1999 නීතියට අනුව ප්‍රාදේශීය, පළාත් පාලන මෙන්ම යුරෝපා පාර්ලිමේන්තු මැතිවරණය සඳහාත් ස්ත්‍රී-පුරුෂ සමානාත්මතාවය තහවුරු වන අයුරින් නාමයෝජනා ලැයිස්තු සැකසීමට තීරණය කෙරිනි. මෙම නීතියට අනුව සම්පාදනය නොකළ නාම යෝජනා ලැයිස්තු ප්‍රතික්ෂේප වේ. යම් පක්ෂයක් නීතියට පිටුපා ජාතික මැතිවරණවලට එබඳු නාම යෝජනා ඉදිරිපත් කළහොත්, එම පක්ෂයට මුදලින් වන්දියක් ගෙවීමේ දඬුවමට යටත්වීමට සිදුවේ. ස්ත්‍රී-පුරුෂ නාමයෝජනා සංඛ්‍යාවන් අතර පරතරය විශාල නම්, එම පරතරයෙන් අඩකට සමාන ප්‍රමාණයක් රජය මගින් පක්ෂයට ලබාදෙන ප්‍රතිපාදනවලින් කපා හැරේ. මෙම ක්‍රමයේ ප්‍රතිඵලයක් ලෙස, 2001 මාර්තු පළාත් පාලන මැතිවරණයෙන් 25% ක පැවති ස්ත්‍රී නියෝජනය 47% දක්වා වර්ධනය විය. නමුත් 2002 ජූනි ජාතික මැතිවරණයේදී ස්ත්‍රී නියෝජනයේ ප්‍රතිශතය වර්ධනය වූයේ 1.4% කින් පමණි. එයට මූලික හේතුව වූයේ තනි මන්ත්‍රී ආසන සඳහා අපේක්ෂිකාවන් තේරීමේදී, ජයගැනීමේ සම්භාවිතය අඩු ආසන වලට ස්ත්‍රීන් ඉදිරිපත් කිරීමයි. එසේම, ස්ත්‍රී-පුරුෂ නාමයෝජනා සමාන නැති නාමයෝජනා ලැයිස්තු ඉදිරිපත් කළ පක්ෂ වලට නීතියෙන් නියම කළ ආකාරයට දඬුවම් ලබා නොදීම ද එම එයට බලපෑවේය. නීතියට අනුව ස්ත්‍රී-පුරුෂ අසමානත්වය 100% වේ නම්, නැතිනම් නාමයෝජනා ලැයිස්තුවේ පුරුෂයින් පමණක් ඇතුළත් නම් පක්ෂයට ලැබෙන රාජ්‍ය ප්‍රතිපාදනවලින් 50% ක් කපා හැරේ. නමුත්

ප්‍රායෝගික වශයෙන් එම දඬුවම ප්‍රමාණවත් නොවීය. මන්ද, එක් ස්ත්‍රියකටවත් නාමයෝජනා ලබා නොදුන් පක්ෂවලටද 50% කින් රාජ්‍ය ආධාර හිමිවීම නිසයි.

1985 දී **කැනඩාවේ** නව ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂය, ෆෙඩරල් මැතිවරණවලදී නාමයෝජනාවලින් 50% ක් ස්ත්‍රීන්ට ලබාදීමට තීරණය කළේය. පක්ෂයේ සියලුම විධායක තනතුරුවලින් හා පක්ෂ කමිටු වල සාමාජිකත්වයෙන්ද 50% ක් ස්ත්‍රීන් වියයුතු බව අභ්‍යන්තර ප්‍රතිපත්ති මගින් තීන්දු කළේය. පක්ෂයේ සභාපති හා උප සභාපති තනතුරුද ස්ත්‍රියක් හා පුරුෂයෙක් අතර බෙදිය යුතු බවට තීරණය විය.

බෙල්ජියම, 1994 මැයි මැතිවරණ පණත සම්මත කරමින් කිසිම මැතිවරණ නාමයෝජනා ලැයිස්තුවක 2/3 කට වඩා පුරුෂයන් හෝ ස්ත්‍රීන් ඇතුළත් නොවිය යුතු බැව් තීරණය කළේය. එම නීතියෙන් ස්ත්‍රී-පුරුෂ දෙපක්ෂය සඳහාම නාම යෝජනාවලින් ලැබියයුතු අවම ප්‍රතිශතය නියම කෙරිණි. 1999 යුරෝපා පාර්ලිමේන්තු මැතිවරණයේදී ද, බෙල්ජියම මෙම නීතිය භාවිත කළ අතර එහි ප්‍රතිඵලයක් ලෙස 18.5% ක්ව පැවති ස්ත්‍රී නියෝජනය 23.3% දක්වා වර්ධනය විය.

ඕස්ට්‍රේලියාවේද වාමාංශික පක්ෂ ස්ත්‍රීන් සඳහා පංගු ක්‍රම හඳුන්වා දුනී. නමුත්, දක්ෂිණාංශික පක්ෂ එයට වෙනස්ව යමින් නායකත්ව පුහුණුව හා මැතිවරණ උපදෙස් දීම වැනි ස්ත්‍රීන්ගේ පුද්ගලිකත්වය හා බැඳුනු ගැටළු විසඳීම අරමුණු කරගත් උපක්‍රම භාවිතා කරයි. වාමාංශික මතවාද අගයන පක්ෂ ස්ත්‍රී නියෝජනය පිළිබඳ ගැටළුව පක්ෂ සංවිධාන ව්‍යූහයේ ප්‍රශ්නයක් ලෙස සලකන අතර එයට නීතිමය හෝ ප්‍රතිපත්තිමය වශයෙන් විසඳුම් දීමට වැඩියෙන් පෙළඹේ. 1994 දී ඕස්ට්‍රේලියානු කම්කරු පක්ෂය, එහි පාර්ලිමේන්තු ස්ත්‍රී නියෝජනය 2002 වන විට 35% වියයුතු යයි ඉලක්ක කර ගති. කම්කරු පක්ෂ නායිකාවක් වූ කාමන් ලෝරන්ස් ප්‍රමුඛ ක්‍රියාකාරී ස්ත්‍රීන්, සමානාත්මතා හා උපයෝගීතා තර්ක ඉදිරිපත් කරමින්, ස්ත්‍රීන් නියෝජනය සඳහා ස්ත්‍රීන්වම තෝරා පත්කර ගතයුතු බවට මෙහිදී අවධාරණය කළේය.

1995 දී කම්කරු පක්ෂයේ ක්වීන්ස්ලන්ත ශාඛාවේ ක්‍රියාකාරිනියන් කණ්ඩායමක් ඕස්ට්‍රේලියානු ස්ත්‍රී පක්ෂය (Australian Women's Party) පිහිටුවා ඒ හරහා මෙම කරුණ සම්බන්ධයෙන් පක්ෂයට බලපෑම් කළේය. කම්කරු පක්ෂයේ හිටපු ප්‍රාන්ත අගමැතිවරියන් දෙදෙනෙක් අමරිකාවේ එමිලි ලැයිස්තුවට (EMILY's List) සමාන ආයතනයක් පිහිටුවා, එමගින් ප්‍රජාතන්ත්‍රවාදයට පක්ෂ අපේක්ෂිකාවන්ට මැතිවරණ කටයුතු සඳහා ප්‍රතිපාදන හා වෙනත් ආධාර ලබාදීම ආරම්භ කළේය. එම අපේක්ෂිකාවන් ජයගතහොත්, ස්ත්‍රීන්ගේ ප්‍රශ්න විසඳීම සඳහා කටයුතු කරන බවට පොරොන්දු වූ ප්‍රකාශනද ඔවුන්ගෙන් ලබා ගති. එසේම, මෙම එමිලි ආයතනය ජයගත් ස්ත්‍රීන් සමග නිරන්තර සබඳතා පවත්වමින්, ස්ත්‍රීන්ගේ තත්වය වර්ධනය සඳහා අදාළ නීති හා ප්‍රතිපත්ති සම්පාදනයට ද ඔවුන් පොළඹවයි.

තවද, 1981 දී පිහිටවූ ඕස්ට්‍රේලියානු ෆෙඩරල් පාර්ලිමේන්තුවේ කම්කරු පක්ෂ ස්ත්‍රීන්ගේ තත්වය පිළිබඳ කමිටුව (Federal Parliamentary Labour Party Status of Women Committee) විසින් ස්ත්‍රීන්ට අදාළ නීති හා ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම නිරීක්ෂණය කළේය. පාර්ලිමේන්තු ස්ත්‍රී ක්‍රියාකාරි කමිටුවද (කෝකසය) ඒ හා සමාන භූමිකාවක් රඟ පාමින්, පක්ෂ භේදයකින් තොරව එම ප්‍රතිපත්ති වලින් සාර්ථක ප්‍රතිඵල දිනා ගැනීමට විවිධ අයුරින් බලපෑම් කළේය. ඕස්ට්‍රේලියානු ස්ත්‍රී ව්‍යාපාර, ස්ත්‍රී නියෝජනය වර්ධනය සඳහා භාවිත කළ උපක්‍රම රාශියකි. ඒවා අතරින්, ස්ත්‍රී නියෝජනය වර්ධනයට අදාළ විශේෂිත ආයතන පිහිටුවීම, එමගින් මෙම ගැටලුව පිළිබඳ ජනතාව දැනුවත් කිරීම, ප්‍රථම පෙළ පුරවැසියන් වශයෙන් ස්ත්‍රීන්ට ඇති දේශපාලන වගකීම් පිළිබඳ අවබෝධ කරදීම, ඒ සඳහා ඔවුන්ව පෙළඹවීම, මෙම ගැටළුව විසඳීම සඳහා පක්ෂ නායකයින්ට බලපෑම් කිරීම, අධ්‍යයන සමීක්ෂණ කර වාර්තා හා නිර්දේශ පක්ෂයට ඉදිරිපත් කිරීම, ස්ත්‍රීන්ට දේශපාලන නායකත්ව පුහුණුව ලබාදීම, මැතිවරණ ප්‍රචාරණය සඳහා මුදල් හා වෙනත් සම්පත් මගින් උපකාර කිරීම, සහ ඔවුන් ජයගත් පසු ස්ත්‍රීවාදී අදහස් අගය කරන නායිකාවන් හා ජාලගත

කොට ස්ත්‍රීන්ගේ තත්වය වර්ධනය කිරීමේ අරමුණු මත සැකසුණු න්‍යාය පත්‍ර හා වැඩපිළිවෙලවල් ඔවුන් ලවා ක්‍රියාත්මක කරවීම ආදිය වඩාත් සඵල උපක්‍රම වශයෙන් සැලකිය හැකිය.

කම්කරු පක්ෂයේ මූලිකත්වයෙන් පමණක් නොව ඕස්ට්‍රේලියානු ස්ත්‍රීවාදී ව්‍යාපාරය පදනම් කොටගෙනද, මෙබඳු බලපෑම් කණ්ඩායම් ගොඩ නැගුණි. ස්ත්‍රී මැතිවරණ උද්දේශන (බලපෑම්) කණ්ඩායම (Women's Electoral Lobby) එයට හොඳම උදාහරණයකි. මෙම කණ්ඩායම ස්ත්‍රී-පුරුෂ නියෝජනයේ අසමාන බව යන ගැටළුව පිළිබඳ, ඕස්ට්‍රේලියානු දේශපාලන පක්ෂවල නායකත්වයට ඇති දැනුම හා එය විසඳීමට ඔවුන් තුළ ඇති කැමැත්ත හා උනන්දුව පිළිබඳව තුලනාත්මකව අධ්‍යයන කොට අදාළ වාර්තා පක්ෂ වලට සැපයීය. එමගින් කම්කරු පක්ෂය වැනි පක්ෂ මෙම ප්‍රශ්නය විසඳීමට සාපේක්ෂව වැඩි උනන්දුවක් දක්වන බැව් දත්ත සහිතව පෙන්වා දුනි. ඕස්ට්‍රේලියානු ප්‍රධාන පක්ෂ අතරින් කම්කරු පක්ෂයේ ස්ත්‍රී නියෝජනය ඉහළ ප්‍රතිශතයක් දිනා ගැනීම විශේෂත්වයක් ලෙස අවධාරණය කළ මෙම කණ්ඩායම ඒ සම්බන්ධයෙන් තවදුරටත් ප්‍රගතිශීලී පියවර ගන්නා ලෙස ඉල්ලමින් පක්ෂයට බලපෑම් කළේය. එක් පැත්තකින් එය පක්ෂයේ වාසියට හේතු විය. අනික් පැත්තෙන් පක්ෂය ඒ නිසා ස්ත්‍රීන්ගේ ගැටළුවට වැඩි අවධානයක් යොමු කිරීමටද පෙළඹුණි. 1972 ඕස්ට්‍රේලියානු ජාතික මැතිවරණයේදී මෙම උද්දේශන කණ්ඩායම ඉදිරිපත් කළ ''ස්ත්‍රී ප්‍රතිපත්ති පිළිබඳ න්‍යාය පත්‍රය'', එරට පක්ෂවලට විශේෂයෙන්ම කම්කරු පක්ෂයට විශාල බලපෑමක් එල්ල කළ අතර, එයින් බොහොමයක් ප්‍රතිපත්ති, මැතිවරණයෙන් පසුව ක්‍රියාත්මක කිරීමටද සමහර පක්ෂ පෙළඹුණි. ඕස්ට්‍රේලියානු මන්ත්‍රීවරියන් බොහොමයක්ද ස්ත්‍රීන් හා සම්බන්ධ ප්‍රශ්න පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරමින්, ඒවා පිළිබඳ හඬක් නඟමින්, අදාළ නීති හා ප්‍රතිපත්ති සම්පාදනය ආරම්භ කළේය. එසේම ඔවුන් මන්ත්‍රීවරුන්ව දැනුවත් කොට, යම් යම් අවස්ථාවලදී ඔවුන්ගේ සහයෝගයද අදාළ පණත් සම්මත කිරීම සඳහා ලබාගති (Sawer, 2000; Bean, 1991).

ඕස්ට්‍රේලියානු මන්ත්‍රීවරියන් අතුරින් ස්ත්‍රීන්ගේ ප්‍රශ්න විසඳීමට වැඩිම දායකත්වයක් දැක්වූවන්ට ''අර්නි සම්මානය'' (Ernie Award) වැනි දෑ, වාර්ෂිකව සංවිධානය කෙරෙන සම්මාන උළෙලකදී ප්‍රදානය කිරීම මගින්ද ඔවුන්ගේ වැඩි සහාය ලබාගැනීමට පෙළඹවීමක් කළේය (Sawer and Simms, 1993; Whip, 1991).

මේ ආකාරයෙන් ක්‍රියාත්මක වූ විවිධ ක්‍රියාකාරකම් හා බලපෑම්වල ප්‍රතිඵලයක් ලෙස ඕස්ට්‍රේලියාවේ ස්ත්‍රී නියෝජනය යම් ප්‍රමාණයකින් වර්ධනය වී තිබේ. 2010 අගෝස්තු මස වන විට ජාතික පාර්ලිමේන්තුවේ ප්‍රථම මණ්ඩලය තුළ ස්ත්‍රීන් 24.7% ක ද, දෙවැනි මණ්ඩලය තුළ 37.9% ක ද ප්‍රතිශතයක් නියෝජනය විය (www.ipu.org/wmn-e/c/assif.htm) .

ආසියා පැසිෆික් රටවල අත්දැකීම්

ආසියා පැසිෆික් කලාපය තුළ ස්ත්‍රීහු ජාතික දේශපාලනයට වඩා පළාත් පාලන දේශපාලනයේදී සක්‍රිය භූමිකාවක් රඟපාති. (UNICEF, 2006). ආසියානු කලාපය තුළ පංගු ක්‍රමය මගින් ස්ත්‍රීන්ගේ නියෝජනයේ, විශේෂයෙන්ම පළාත් පාලන මට්ටමේදී ප්‍රමාණාත්මක මෙන්ම ගුණාත්මක වර්ධනය වැඩියෙන්ම දිනාගෙන ඇති රට ලෙස **ඉන්දියාව** සැලකේ (Pande and Ford, 2011; Singh, 2005). පංගු ක්‍රමය පිළිබඳ ඉන්දියානු කතිකාවතේ ඉතිහාසය 1920 ගණන් දක්වා දිවයයි. බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදීන්ට එරෙහිව සංවිධානය වූ ඉන්දියානු ජාතික ව්‍යාපාරය තුළින්, ඉන්දියානු ස්ත්‍රීන්ට දේශපාලන නියෝජනයේදී පංගුවක් අවශ්‍යයයි යන අදහස ප්‍රථමයෙන්ම ඉදිරිපත් විය. නමුත් සර්වජන ඡන්දය හා නියෝජනයේ සම අයිතිය දිනාගැනීම සඳහා ස්ත්‍රීන් ප්‍රමුඛත්වය දුන් නිසා පංගු ක්‍රමය පිළිබඳ යෝජනාව පසෙකට තල්ලු විය. තවද පහත් යයි සම්මත ගෝත්‍ර හා කුලවලට පාර්ලිමේන්තු නියෝජනයෙන් පංගුවක් වෙන්කළ යුතුය යන සාකච්ඡාවද නිදහසින් පසු ව්‍යාප්ත විය. එහි ප්‍රතිඵලයක් ලෙස, 1950 ඉන්දියානු ආණ්ඩුක්‍රම

ව්‍යවස්ථාව මගින් එම ජන කණ්ඩායම් සඳහා පාර්ලිමේන්තු ආසනවලින් පංගුවක් නියම කිරීමේ කාර්යයට ප්‍රමුඛත්වය දුනි (Raman, 2002).

ස්ත්‍රී නියෝජනය සඳහා පංගු ක්‍රමයක අවශ්‍යතාවය පිළිබඳ කතිකාවත නැවත ඉස්මතු වන්නේ 1974 ඉන්දියානු ස්ත්‍රීන්ගේ තත්වය පිළිබඳ සොයා බැලීමට පත්කළ කමිටුවේ වාර්තාව ඉදිරිපත් වීමත් සමඟය. ඉන්දියානු ප්‍රාන්ත ආණ්ඩුවල සහ මධ්‍යම ආණ්ඩු පාර්ලිමේන්තුවේ ස්ත්‍රී නියෝජනයේ අඩු වීමක්, පසුගිය 25 වසර තුළ සිදුවී ඇති බව මෙම වාර්තාවෙන් පෙන්වා දුනි. ස්ත්‍රීන්ගේ තත්වය වර්ධනය කිරීම මෙන්ම, ග්‍රාමීය ප්‍රදේශවල සංවර්ධනය ද අරමුණු කරගෙන, දේශපාලන නියෝජිත ආයතනවල අවම වශයෙන් 1/3 ක්වත් ස්ත්‍රී නියෝජනයක් ඇති කිරීම සඳහා ඉන්දියානු රජය පියවර ගතයුතු බව මෙම වාර්තාවෙන් නිර්දේශ කළේය. එම නිර්දේශයත් සමඟ ඉන්දියානු ස්ත්‍රී ව්‍යාපාරය හා සිවිල් සංවිධාන, අවම වශයෙන් පළාත් පාලන මට්ටමේදීවත් ස්ත්‍රී නියෝජනය වර්ධනය සඳහා පංගුවක් වෙන් කරවා ගැනීම අත්‍යවශ්‍ය යන මතය දැඩිව අවධාරණය කිරීමට පටන් ගත්හ. ස්ත්‍රී නියෝජනයේ අඩු බව යන ප්‍රශ්නය පිළිබඳව පක්ෂ නායකයින්, පාර්ලිමේන්තු නියෝජිතයින් හා ජනතාව දැනුවත් කිරීමට ස්ත්‍රී සංවිධාන විසින් විවිධ ක්‍රියාමාර්ග අනුගමනය කරන ලදී. රැස්වීම්, සාකච්ඡා, විශේෂ දේශන, අධ්‍යයන වාර්තා ඉදිරිපත් කිරීම, රැළි හා පෙළපාලි පැවැත්වීම, කාටුන් හා චිත්‍ර ප්‍රදර්ශන සංවිධානය කිරීම නාට්‍ය හා සිංදු ආදිය මගින් ජනතාව දැනුවත් කිරීම හා තීරණ ගන්නන්ට බලපෑම් කිරීම සඳහා ලිපි, පෙත්සම් හා සංදේශ යැවීම ආදිය එම ක්‍රියාමාර්ග අතුරින් වඩාත් ආකර්ෂණීය විය. උදාහරණ වශයෙන් කේරළ ස්ත්‍රීන්, එකම වේලාවකදී කළු සාරිවලින් සැරසී, කුඩා කණ්ඩායම් ලෙස විවිධ නගර හා ගම්වල පෙළපාලි හා රැස්වීම් පවත්වා බලපෑම් කිරීම වැනි දෑ බෙහෙවින් ඵලදායී ක්‍රියාකාරකම් විය (Agrawal, 2006; Subramanian and Thomas, 2001).

මෙම බලපෑම්වල ප්‍රතිඵලයක් ලෙස, 1993 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයකින් ස්ත්‍රීන් සඳහා පංගු ක්‍රමයක් ස්ථාපිත කෙරිණි. නමුත් එයට පෙරද, ඉන්දියාවේ ප්‍රාන්ත දෙකක පළාත් පාලන ආයතනවල පංගු ක්‍රමය භාවිත කෙරිණි. 1984 දී මහා රාෂ්ට්‍ර ප්‍රාන්තය පළාත් පාලන ආයතනවල නියෝජනයෙන් 30% ක් ස්ත්‍රීන්ට වෙන් කළේය. ඉන්පසුව කර්නාටක ප්‍රාන්තය විසින්ද 25% ක් වෙන් කරන ලදී. එය සමස්ත ඉන්දියාවේ ස්ත්‍රී නියෝජනයේ වර්ධනයට ප්‍රමාණවත් බලපෑමක් නොකළද, පංගු ක්‍රමයක් ඉල්ලීම සඳහා වෙනත් ප්‍රාන්ත වල ස්ත්‍රීන්ට එයින් යම් පෙළඹවීමක් සිදුවිය. විශේෂයෙන් පළාත් පාලන ආයතන මට්ටමේදී ස්ත්‍රී නියෝජනයේ වර්ධනය අත්‍යවශ්‍ය බවත්, ඒ සඳහා 30% ක පංගුවක් වෙන්කළ යුතු බවටත්, 1974 ස්ත්‍රීන් පිළිබඳ කමිටු වාර්තාවෙන් නිර්දේශ කර තිබිණි. 1988-2000, ස්ත්‍රීන් සඳහා වූ ජාතික සැලැස්මෙන්ද, සියලුම මහජන නියෝජිත ආයතනවල නියෝජනයෙන් 30% ක් ස්ත්‍රීන් සඳහා වෙන් කළයුතු බව ප්‍රකාශ විය. නමුත් ස්ත්‍රී සංවිධාන පළාත් පාලන මට්ටමේ ස්ත්‍රී නියෝජනයට ප්‍රමුඛත්වය දියයුතු බව අවධාරණය කළහ (CWDS, 1995).

1970 මැද භාගයේ සිට 1990 ගණන් දක්වාම, ඉන්දියානු ස්ත්‍රී සංවිධාන නොකඩවා පක්ෂ නායකයින් හා පාර්ලිමේන්තු නියෝජිතවරුන්ට බලපෑම් කළේය. එවකට අගමැතිව සිටි රජීව් ගාන්ධි හා කොංග්‍රස් පක්ෂයත්, පාර්ලිමේන්තු මන්ත්‍රීවරියන් බහුතරයකුත් මෙම කරුණ කෙරේ විශේෂ අවධානයක් දැක්වීම 1993 දී පංගු ක්‍රමයක් දිනා ගැනීමට බලපෑ මූලික හේතුවක් විය (Rai, 1995). 1992 දී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට 73 වැනි සංශෝධනය ඉදිරිපත් කොට, එමගින් පංචායතිරාජ් පළාත් පාලන ආයතනවලින් 1/3 ක් ස්ත්‍රීන් සඳහා වෙන් කිරීම, ඉන්දියානු ස්ත්‍රීන් දිනාගත් විශාල ජයග්‍රහණයක් විය. නමුත් 1995, 97 හා 2011 යන අවස්ථා තුනකදී, පාර්ලිමේන්තු නියෝජනයෙන් ස්ත්‍රීන් සඳහා පංගුවක් වෙන්කරවා ගැනීමට අදාළ පණත් ව්‍යවස්ථාදායකයට ඉදිරිපත් කළද, මෙතෙක් එය සාර්ථක වී නොමැත.

ඉන්දියානු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 73 වැනි සංශෝධනය (1992) මගින් හඳුන්වා දුන් බලය විමධ්‍යගත කිරීම පිළිබඳ වූ නීති 1993 දී ක්‍රියාත්මක වීම ආරම්භ විය. වඩාත් ශක්තිමත්ව හා වේගවත්ව ඉදිරියට යන ගම් මට්ටමේ ප්‍රජාතන්ත්‍රවාදයක් ඉන්දියාව තුළ නිර්මාණය කිරීම මෙම සංශෝධනයේ මූලික අරමුණක් විය. ප්‍රාදේශීය ජනතාවට, තමන්ගේ ගම් සංවර්ධනය කරගැනීමට වැඩි බලයක් ලබාදීම, ගමේ සංවර්ධන කටයුතු වලදී ඔවුන්ගේ සක්‍රීය සහභාගිත්වය ලබා ගැනීම සහ පරිපාලනය ගම දක්වා විමධ්‍යගත කිරීම වැනි අරමුණුද ඒ පිටුපස තිබිණි. සමස්ථයක් ලෙස ගත් කළ දේශපාලන තීරණ ගැනීම්වලදී, ග්‍රාමීය ජනතාවගේ සහභාගිත්වය ලබා නොගැනීම යන දුර්වලතාවය මඟ හරිමින්, ගම් මට්ටමේ පරිපාලන ක්‍රියාවලියට ස්ත්‍රීන් හා පහත් යයි සම්මත ජන කණ්ඩායම්වල සහභාගීත්වය ලබාගැනීම මෙම සංශෝධනයේ මූලිකම අරමුණ විය (Jain, 1996). මෙම 73 වැනි සංශෝධනයේ ප්‍රධාන අන්තර්ගතයන් වූයේ:

i. සියලුම පංචායතී රාජ් ආයතනවල (දිස්ත්‍රික්, තලූක් (Taluk) හා ගම් මට්ටමේ ග්‍රාම පංචායති, පංචායති සමිති හා දිස්ත්‍රික් පංචායති (Zilla Panchayati) ආසනවලින් 1/3 ක් (33.3%) ස්ත්‍රීන් සඳහා වෙන් කිරීම
ii. පහත් යයි සම්මත කුල හා ගෝත්‍ර සඳහා වෙන් කළ ආසන 1/3 න්ද, ස්ත්‍රීන්ට 1/3 ආසන වෙන් කිරීම
iii. සියලුම මට්ටමේ පංචායති රාජ් ආයතනවල සභාපතිවරුන්ගෙන් 1/3 ක් ස්ත්‍රීන් සඳහා වෙන් කිරීම

යන දැයි.

සමස්ථ ස්ත්‍රීන්ගෙන් පමණක් නොව, පහත් යයි සම්මත කුල හා ගෝත්‍ර වල ස්ත්‍රීන්ගෙන්ද 1/3 කට නොඅඩු නියෝජනයක් පළාත් පාලන ආයතනවල තිබිය යුතු බැව් මෙම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් පැහැදිලිවම ප්‍රකාශ කළේය. නමුත් පළාත් පාලන ආයතනවල සභාපති තනතුරුවලින් අඩුම වශයෙන් 1/3 ක් පොදුවේ

සමස්ථ ස්ත්‍රීන්ගෙන් නියෝජනය වියයුතු බැව් ව්‍යවස්ථාවේ 243 D(4) වගන්තියෙන් ප්‍රකාශ කෙරිනි. සභාපති තනතුරු සඳහා පහත් යයි සම්මත කුල හෝ ගෝත්‍ර වල ස්ත්‍රීන්ට පංගුවක් වෙන්කර නොතිබිණි. පළාත් පාලන ආයතනයක ස්ත්‍රීන් වෙනුවෙන් වෙන් කරන ආසන මැතිවරණයෙන් මැතිවරණයට මාරු කළයුතු වේ. ඒ අනුව වරක් ස්ත්‍රීන්ට වෙන්කළ ආසනයක් ඊලඟ මැතිවරණයේදී පොදු ආසනයක් ලෙස නම් කෙරේ. සභාපති තනතුරු ස්ත්‍රීන්ට වෙන්කිරීම පංචායති රාජ් ආයතනයෙන් ආයතනයට වරින් වර මාරු වේ. විශේෂයෙන්ම ස්ත්‍රීන් සඳහා වෙන්කළ ආසන මාරු කිරීමෙන් අපේක්ෂා කළේ, එම වෙන්කළ ආසනයෙන් ආධුනික අපේක්ෂිකාවකට මැතිවරණයට ඉදිරිපත් වීමට අවස්ථාව ලබාදීමයි. එක් වෙන් කළ ආසනයකින් ප්‍රථම වරට තේරී පත්වන ස්ත්‍රියක් හෝ ස්ත්‍රීන් ඊලඟ මැතිවරණයේදී පොදු ආසනයකින් මැතිවරණයට ඉදිරිපත් වීම සඳහා පසුබිම එයින් සැකසේ. එවිට එම ස්ත්‍රියට නොකඩවා මැතිවරණයට ඉදිරිපත් වීමේ ඉඩ ප්‍රස්ථාව ලැබේවි යයි මෙයින් අපේක්ෂා කෙරිණි. ස්ත්‍රීන්ට වෙන්කරන ආසනය ඊලඟ මැතිවරණයේදී වෙනත් ආසනයකට මාරුවීමෙන්, එම ඉඩ ප්‍රස්ථාව වෙනත් ආසනයක නවක ස්ත්‍රියක හෝ ස්ත්‍රීන්ට ලැබේ. මේ අයුරින් එකම ආසනයකින් නොව, ස්ත්‍රීන් සඳහා වරින් වර වෙන් කරන ආසන ගණනාවක් මගින් ස්ත්‍රීන් විශාල සංඛ්‍යාවකට මැතිවරණයෙන් තේරී පත්වීමට දිගුකාලීනව ඉඩ ලැබේ (Buch, 2001).

ඉන්දියාවේ මෙම ආසන වෙන්කිරීමේ ක්‍රමයේ යම් යම් දුර්වලතා ඇතත්, ස්ත්‍රීන්ගේ පළාත් පාලන නියෝජනයේ ප්‍රමාණාත්මක හා ගුණාත්මක වර්ධනයකට එය මග පාදා ඇත. ව්‍යවස්ථා සංශෝධනයෙන් පසුව, 2000 දී පැවැත්වූ දෙවැනි පළාත් පාලන මැතිවරණයේ ප්‍රතිඵල වලට අනුව, 2001 වන විට ග්‍රාම පංචායත්හි 31.37%, පංචායත් සමිති 20.71% හා දිස්ත්‍රික් පංචායත්හි 31.80% ක් ස්ත්‍රීන් නියෝජනය විය. නමුත් මෙම තත්වය ප්‍රාන්ත අනුව වෙනස් විය. කර්නාටක ප්‍රාන්තයේ ග්‍රාම පංචායත් වල ස්ත්‍රී නියෝජනය 43.79%, කේරළ 37.81%, මනිපූර් 37.2%, ගෝවා 36.53% හා ඔරිස්සාහි 35.27% ක් විය. පංචායති සමිති වල ස්ත්‍රී

නියෝජනයෙන්ද කර්නාටක (41.21%), ආන්ද්‍රා ප්‍රදේශ (37.01%), කේරළ (36.39%), ඔරිස්සා (35.5%) හා මධ්‍ය ප්‍රදේශ (34.84%) ඉහළ ප්‍රතිශතයක් දිනාගති. දිස්ත්‍රික් පංචායත් ආයතනවලින් වැඩිම ප්‍රතිශතයක් දිනා ගත්තේ මානිපූර් (36.7%) ද, කර්නාටක (36.45%), තමිල්නාඩු (34.72%), කේරළ (34.67%), ත්‍රිපුර (34.29%) හා බටහිර බෙංගාලය (34.19%) යන ප්‍රාන්තයි.

2000 අග වන විට ඉන්දීය පළාත් පාලන ආයතනවල ස්ත්‍රී නියෝජනය සංඛ්‍යාත්මකව තවදුරටත් වර්ධනය විය. මිලියන 5 ක පමණ ස්ත්‍රීන් පළාත් පාලන මැතිවරණයට 2010-2011 අතරදී ඉදිරිපත් වූ අතර දැනට මිලියන 1.3 ක් පමණ (මුලු නියෝජිතයින් මිලියන 3.3 ක් පමණ) නියෝජිතවරියන් ලෙස තේරී පත් වී සිටී. 1993 ව්‍යවස්ථා සංශෝධනයට පෙර ඉන්දියානු පළාත් පාලන ආයතනවල ස්ත්‍රී නියෝජනයේ ප්‍රතිශතය 4.5% ක් විය. එය 2010 වන විට 33-48% අතර ප්‍රමාණයකට වර්ධනය වී තිබේ (Singh, 2001).

ඉන්දියානු පළාත් පාලන ආයතනවල ස්ත්‍රී නියෝජනය වර්ධනය වීමෙන් ගම් මට්ටමේ දේශපාලනයත්, ස්ත්‍රීන්ගේ ජීවිතත්, විශේෂයෙන්ම ග්‍රාමීය ප්‍රදේශත්, යම් ගුණාත්මක වෙනසකට ලක්වූ බැව් විවිධ අධ්‍යයන මගින් පෙන්වා දි තිබේ. දේශපාලන නියෝජනය සඳහා ස්ත්‍රීන්ට ඇති අයිතිය පෙරට වඩා වැඩියෙන් තහවුරු වීම, ස්ත්‍රීන් දේශපාලන වශයෙන් බලගැන්වීම, ගම් මට්ටමේදී පෙරට වඩා ස්ත්‍රීන්ට ගෞරවනීය තත්වයක් හිමිවීම හා ස්ත්‍රී-පුරුෂ සමානාත්මතාවය හා නිදහස මත පදනම් වූ සමාජ සාධාරණත්වය යම් ප්‍රමාණයකින් දිනා ගැනීම ගැමි ස්ත්‍රීන් ලද විශාල ජයග්‍රහණ ලෙස සැලකේ (Gaur, Rana and Gaur, 2005).

1993 පළාත් පාලන ව්‍යවස්ථා සංශෝධනයේ ප්‍රතිඵලයක් ලෙස, බොහෝ ස්ත්‍රීන් විශේෂයෙන්ම රාජ්‍ය නොවන සංවිධාන වලද ආධාරයෙන් දේශපාලන නායකත්ව පුහුණුව ලැබීම හා දේශපාලනයට

අවතීර්ණ වීම නිසා මෙතෙක් ගම් මට්ටමේ දේශපාලනයේ පැවති පුරුෂ කේන්ද්‍රීය බල ව්‍යූහයේ යම්කිසි වෙනසක් කිරීමට ඔවුන්ට හැකිවී තිබේ. පංචායතී රාජ් නියෝජිතවරියන්, එම ආයතනවල ක්‍රියාකාරිත්වයට වැදගත් බලපෑමක් කළ බවත්, වැසිකිළි, ළිං, ග්‍රාමීය පාරවල් සැදීම, ප්‍රාථමික පාසැල්වලට ගුරුවරුන් පත් කිරීම, සුරාසැල් වැසීම, ස්ත්‍රීන්ට ඉඩම් පවරා දීම හා ග්‍රාමීය සනීපාරක්ෂක සේවා සැපයීම වැනි කටයුතුවලට ඔවුන් ප්‍රමුඛත්වය දුන් බවත් කෞෂික්ගේ අධ්‍යයනවලින් පෙන්වා දෙයි (Kaushik, 2006). පළාත් පාලන ආයතනවල සභාපතිවරියන් පානීය ජල ප්‍රශ්නය, ප්‍රාථමික අධ්‍යාපනය, දර පිළිබඳ ගැටළුව, සනීපාරක්ෂක ගැටළු, දරුවන්ගේ පෝෂණය, අඩු ආදායම් ලාභීන්ගේ නිවාස ප්‍රශ්නය, මත්ද්‍රව්‍ය නිවාරණය හා ලිංගික අතවර වැනි කරුණු පිළිබඳ වැඩි අවධානයක් යොමු කිරීමට පටන් ගත් බැව් අග්‍රවාල්ගේ අධ්‍යයනවලින් ද පෙන්වා දි තිබේ. මෙම ප්‍රශ්න විසඳීමට සභාපතිවරියන් කටයුතු කිරීමේදී එම ආයතනවල අනෙක් නියෝජිතවරියන් ඔවුන්ට දැක්වූ සහාය ග්‍රාමීය ප්‍රදේශවල සංවර්ධනයට පමණක් නොව පක්ෂ දේශපාලනයේ පැවති සෘණාත්මක ගති ලක්ෂණ වල යම් වෙනසක් සඳහාද බලපෑම් කළ බැව් අග්‍රවාල්ගේ අදහසයි (Agrawal, 2005).

ස්ත්‍රීන් විශාල සංඛ්‍යාවකට ගම් මට්ටමේ දේශපාලන තීරණ ගැනීමේ ඉඩප්‍රස්ථාව ලබා දීමෙන්, ගමේ පාලනයේ ගුණාත්මක වෙනසක් සිදුවීම, 1993 ව්‍යවස්ථා සංශෝධනයේ වැදගත්ම ප්‍රතිඵලය ලෙස තවත් අධ්‍යයනයකින් හුවා දැක්වේ (Singh, 2005). ගම් මට්ටමේ පැවති පුරුෂ මූලික බල ව්‍යූහය හා බල සබඳතා නිසා ස්ත්‍රීන් මත පැවති සමාජ, ආර්ථික හා මානසික පීඩනය යම් තරමකින් වෙනසකට ලක් කිරීමටද මෙම සංශෝධන නිසා හැකි විය (Agrawal, Mayank and Agrawal, 2005). ස්ත්‍රීන්ට සමාජයෙන් හිමිකර දී තිබෙන පවුලට සම්බන්ධ භූමිකා වෙනසකට ලක් කළ හැකි බව ඉන්දියානු පංචායති රාජ් නියෝජිතවරියන් පෙන්වා දී ඇති අතර, ඔවුන්ගෙන් බොහොමයක් ස්ත්‍රීන් පුරුෂ මූලික දේශපාලන ක්ෂේත්‍රයට රිංගා ඇති

බව සහ සාර්ථක තීරණ ගන්නන් හා පරිපාලකයින් වී ඇති බවද, ඉන්දියානු අධ්‍යයනවලින් පෙන්වා දී තිබේ (Saxena, 2005). සාර්ථක හා ඵලදායී නායිකාවන්, පෙරට වඩා වැඩි ආත්ම විශ්වාසයක් සහිතව නිර්මාණශීලිව හා ධෛර්යමත්ව, ආදර්ශමත් ලෙස අනෙක් ස්ත්‍රීන්ට ඉදිරියට ඒමට මඟ පාදා ඇති බවත්, ස්ත්‍රීන්ට ඔවුන්ගේ ශක්තීන් හා හැකියාවන් අවබෝධ කරගැනීමේ අවස්ථාව මේ නිසා ලැබී ඇති බවත්, තවදුරටත් එම අධ්‍යයනයෙන් පෙන්වා දුනි. පංචායති රාජ් ආයතනවලට තේරී පත්වුන නියෝජිතවරියන් ඉන්දියාවේ තරුණ පරපුරේ ගැහැණු දරුවන්ට ආදර්ශ ආකෘති සපයා ඇති බව තවත් අධ්‍යයනයකින් පෙන්වා දී තිබේ (Manju Devi, 2005). බොහෝ නියෝජිතවරියන්ගේ නායකත්වය, සාර්ථකත්වය හා ශක්තිය ඉන්දියාවේ ගැහැණු දරුවන්ව අධ්‍යාපන කටයුතුවලට යොමුකිරීමේදී හා ඔවුන්ගේ නායකත්වය වර්ධනය කරගැනීමේදී වැඩි පෙළඹවීමක් ඇති කිරීමට හේතු වී ඇති බවත් එයින් පෙන්වා දෙයි.

මෙම ධනාත්මක ප්‍රතිඵල දිනාගැනීමේදී, විශේෂයෙන්ම ඉන්දියානු රාජ්‍ය නොවන සංවිධානවලින් ඉටුකළ මෙහෙය විශාල බලපෑමක් කළේය. 1993 ව්‍යවස්ථා සංශෝධනයෙන් පසුව ස්ත්‍රීන්ට නායකත්ව පුහුණුව හා දේශපාලන දැනුම ලබාදීම, පක්ෂ නායකයින් හා මහජන නියෝජිතවරුන් සමඟ සාකච්ඡා පැවැත්වීම සහ ඔවුන්ට බලපෑම් කිරීම, ඡන්දදායකයින් දැනුවත් කිරීම, ස්ත්‍රීන්ව උනන්දු කොට අපේක්ෂිකාවන් ලෙස ඉදිරිපත් කරවීම, මැතිවරණ ප්‍රචාරක කටයුතුවලට උපදෙස් හා ආධාර දීම සහ ඔවුන් පංචායති රාජ් ආයතනවලට තේරී පත්වුනු පසු එම ආයතනවල පරිපාලනය පිළිබඳ දැනුවත් කිරීම හා එම කටයුතු කරගෙන යාමේදී උපදෙස් ලබා දීම වැනි මෙහෙයන් ඒවා අතරින් වඩාත් වැදගත් වේ (Agrawal, 2006).

ස්ත්‍රීන්ගේ නියෝජනය වර්ධනය වීම නිසා මෙබඳු සාර්ථකත්වයන් ප්‍රකාශ වුවද, ඉන්දියානු පංචායති රාජ් ආයතනවලින් හා ස්ත්‍රීන් නියෝජනය වර්ධනය කිරීමෙන් අපේක්ෂිත සියලු අරමුණු

ඉටුවූවා යයි යමෙකුට කිව නොහැකිය. විශේෂයෙන්ම ග්‍රාමීය ස්ත්‍රීන්ගේ නොදැනුවත්කම, විධිමත් අධ්‍යාපනයක් නොලැබීම, අඩු ආත්ම විශ්වාසය, ප්‍රචණ්ඩකාරී දේශපාලන සංස්කෘතිය, ස්ත්‍රීන් මුහුණු දෙන අනාරක්ෂිත තත්වය, ආර්ථික දුෂ්කරතා හා තවදුරටත් මුල් බැස ගෙන ඇති පුරුෂ කේන්ද්‍රීය ආයතන ව්‍යූහය ආදී කරුණු එයට හේතු වී තිබේ. බොහොමයක් පංචායති රාජ් නියෝජිතවරියන්, තවමත් ඔවුන්ගේ පවුල්වල හෝ පක්ෂවල පුරුෂයන්ගේ අවශ්‍යතාවලට අනුව කටයුතු කිරීම සහ ඔවුන්ගේ පාලනයට නතුවීම, අපේක්ෂිත ගුණාත්මක වෙනස දිනාගැනීමට ඇති විශාලම බාධකය බැව් අග්‍රවාල්ගේ අදහසයි. (Agrawal, 2005).

පංගු ක්‍රමය **පකිස්තානයට** අලුත් දෙයක් නොවේ. එරට 1956, 1962, 1970, 1973 සහ 1985 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවලින් ප්‍රාන්ත මෙන්ම ජාතික මට්ටමේ දේශපාලන ආයතනවල ආසනවලින් ද ස්ත්‍රීන්ට පංගුවක් වෙන්කර තිබුණි. නමුත් එය ඉතා සුළු ප්‍රතිශතයක් වූ අතර 5% සිට 10% දක්වා ප්‍රමාණයක් විය. වෙන් කළ ආසනවලින් නියෝජිතවරියන් තෝරන ලද්දේ, එම නියෝජිත ආයතනවලට මැතිවරණයෙන් තෝරා ගත් මන්ත්‍රීවරුන් විසිනි. එහෙයින් එය වක්‍ර ඡන්ද ක්‍රමයක් විය. 1985 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් නියම කරන ලද ආසන වෙන්කිරීම 1988 දී නවතා දැමිණි. 1997 මැතිවරණයේදී ස්ත්‍රීන්ගේ නියෝජනය අවම වූ අතර පළාත් සභාවල ප්‍රතිශතය 4%, සෙනෙට් මණ්ඩලය 2% හා ජාතික ඇසෙම්බ්ලිය (මණ්ඩලය) 4% වශයෙන් විය. පළාත් පාලන ආයතනවලින් වෙන්කළ ප්‍රතිශතය එකිනෙකට වෙනස් වූ අතර එය 5% සිට 12% දක්වා පරාසයක පැවතුණි. 1993 මැතිවරණයේ ප්‍රතිඵල අනුව පළාත් පාලන ආයතනවල ස්ත්‍රී නියෝජනය 10% ක් විය. මේ නිසා ස්ත්‍රීන්ගේ ජාතික ව්‍යාපාරයක් ආරම්භ කොට ප්‍රමාණවත් සංඛ්‍යාවකින් ආසන වෙන් කරවා ගැනීමට බලපෑම් කිරීම පකිස්තානු ස්ත්‍රීන් විසින් ආරම්භ කරන ලදී.

මෙම පරිසරය තුළ, පකිස්තාන රජය, සමාන, නිදහස් හා සක්‍රීය දේශපාලන සහභාගීත්වයක් දිනා ගැනීම සඳහා ස්ත්‍රීන් දරන

උත්සාහය හා කැපවීම පිළිබඳ ජාතික වාර්තා කීපයකදීම අවධාරණය කළේය. 1997 දී ස්ත්‍රීන් පිළිබඳ සොයා බැලීම සඳහා පත්කරන ලද කොමිෂන් වාර්තාවේත් (Report of the Commission of Inquiry for Women), 1998 ක්‍රියාකාරකම් සඳහා වූ ජාතික සැලැස්මේත් (National Plan for Action), 2002 ස්ත්‍රීන්ගේ වර්ධනය හා බලගැන්වීම සඳහා වූ ජාතික ප්‍රතිපත්තියේත් (National Policy for Development and Empowerment of Women) ඒ පිළිබඳව සඳහන් විය. 2001 සම්මත කරන ලද බලය බෙදීම පිළිබඳ ජාතික ප්‍රතිපත්තියෙන් ජාතික හා පළාත් පාලන නියෝජිත ආයතනවල ආසනවලින් 33% ක් ස්ත්‍රීන් සඳහා වෙන් කොට, ඔවුන්ව ඒකාබද්ධ ආසනවලින් ඍජු ඡන්දයෙන් තෝරා ගැනීම ආරම්භ කළේය (NRB, 2006; Anjum, 2001; Bari, 2001).

2000 දී පකිස්තාන මිලිටරි ආණ්ඩුව බලය විමධ්‍යගත කිරීමේ සැලැස්මක් ක්‍රියාත්මක කළේය. මෙම සැලැස්මෙන් දිස්ත්‍රික්ක, තෙසිල් (Tesil) හා යුනියන් (Union) කවුන්සිලවල නියෝජනයෙන් 33% ක් ස්ත්‍රීන්ට වෙන් කළේය. යුනියන් කවුන්සිලය හැර අනෙක් කවුන්සිල දෙකේ වෙන්කළ ආසනවලට ස්ත්‍රීන් තෝරා ගත්තේ වක්‍ර ඡන්ද ක්‍රමයකිනි. යුනියන් කවුන්සිලයට මැතිවරණයෙන් තෝරා ගත් නියෝජිතයින්ගෙන් සමන්විත ඡන්දදායක විද්‍යාලයක් මගින් මෙම නියෝජිතවරියන් තෝරා ගැනේ.

ස්ත්‍රීන් සඳහා වෙන් කළ ආසනවලින් පමණක් නොව පොදු ආසනවලින්ද ඔවුන්ට මැතිවරණයට ඉදිරිපත් විය හැකිය. බටහිර ප්‍රාන්තයේ අන්තවාදී ආගමික කණ්ඩායම්වල බලපෑම නිසා එම ප්‍රාන්තයේදී 2002 දී පැවැත්වූ මැතිවරණයට ඉදිරිපත් වීමට ස්ත්‍රීන්ට නොහැකි විය. එනිසා ආසන 650 කට ස්ත්‍රීන් තේරී පත් නොවුනි. නමුත් ස්ත්‍රීන්ට වෙන්කළ සමස්ත ආසනවලින් ආසන 40,049 න් 36,187 කට නියෝජිතවරියන් තේරී පත්වුනි.

මෙම පංගු ක්‍රමය නිසා ස්ත්‍රීන් විශාල සංඛ්‍යාවකට පළාත් පාලන ආයතනවල දේශපාලනයට සහභාගි වීමට හැකිවිය. මුදල්, වෙනත් සම්පත් හා ප්‍රචණ්ඩත්වය මත පදනම් වූ දේශපාලන නියෝජනය, පකිස්තානය තුළ සමස්තයක් වශයෙන්, දේශපාලනයට සම්බන්ධ ප්‍රභූ පවුල්වල පුරුෂයන්ට සීමා වී තිබිණි. නමුත් එබඳු පදනමක් නැති ගැමි, නූගත් හා පහත් යයි සම්මත ජන කොටස්වල ස්ත්‍රීන්ට පවා නියෝජනය වීමට හැකියාවක් ලැබීම මෙම පංගු ක්‍රමයේ වැදගත්ම ප්‍රතිඵලය විය. එසේම, තරුණ ස්ත්‍රීන් ප්‍රජාතන්ත්‍රවාදය හා පළාත් පාලන දේශපාලනය කෙරේ විශ්වාසයකින් එයට අවතීර්ණ වීමද මෙයින් ලද තවත් ප්‍රතිඵලයකි. තේරී පත්වුන නියෝජිතවරියන්ගෙන් 57% ක් වයස අවු: 45 ට අඩුවීම නිසා තරුණ ස්ත්‍රීන්, විශේෂයෙන්ම ග්‍රාමීය හා ප්‍රාදේශීය දේශපාලනයේ වෙනසක් කිරීමට ඉදිරිපත් වීම වැදගත් කරුණකි. එසේම එම නියෝජිතවරියන්ගෙන් 73.7% ක් ගෘහණියන් වීමෙන් ප්‍රකාශ වූයේ ස්ත්‍රියට පැවරී තිබුන ප්‍රජනන කාර්ය හා ගෘහස්ථ භූමිකාවෙන් ඇය යම් තරමකට හෝ ඈත් වී පොදු ක්ෂේත්‍රයේ කටයුතුවලට ඉදිරිපත් වීමට දක්වන ලැදියාවයි. සමාජ වෙනසක් සඳහා ඒජන්තවරුන් වශයෙන් ඉදිරිපත්වීමට ගැමි ස්ත්‍රීන් තුළ ඇති කැමැත්තද එයින් ප්‍රකාශ විය.

නමුත් මෙම නියෝජිතවරියන්ගෙන් 53% ක් සාක්ෂරතාවය නොමැති අය වීම නිසා ස්ත්‍රී නියෝජනය වර්ධනයෙන් අපේක්ෂිත අරමුණු ප්‍රායෝගික වශයෙන් ඉටුකර ගැනීමේදී අභියෝග එල්ල විය. ඔවුන්ට දේශපාලන දැනුම හා අත්දැකීම් නොමැති වීමද එයට බලපෑ තවත් බාධාවක් විය. පළාත් පාලන ආයතනවලට ප්‍රමාණවත් ප්‍රතිපාදන නොමැතිවීම නිසා මෙම නියෝජිතවරියන්ට මඟ වියදම් හා කාර්යාල හෝ වෙනත් පහසුකම් කිසිවක්ද නොලැබිණි. ඔවුන්ට අවශ්‍ය පුහුණු කිරීම් පිළිබඳව සොයා බැලීමට පකිස්තාන ආණ්ඩුව අධ්‍යයන සමීක්ෂණ හා සාකච්ඡා පැවැත්වුවද, ඔවුන්ට ප්‍රමාණවත් පුහුණුවක් ද නොලැබිණි. බොහෝ නියෝජිතවරියන් ඉදිරිපත් කළ සංවර්ධන ව්‍යාපෘති සඳහා ප්‍රතිපාදන වෙන් නොකළ නිසා ඒවාද

හරිහැටි ක්‍රියාත්මක කළ නොහැකි විය (Reyes, 2003) .

ආසන වෙන්කිරීමට බලපෑම් කළ ස්ත්‍රී ජාතික ව්‍යාපාරය, 2001 දී නැවත උද්ඝෝෂණ ව්‍යාපාරයක් අරඹා ජාතික මට්ටමේ නියෝජිත ආයතනවලින්ද 33% ක් ස්ත්‍රීන් සඳහා වෙන් කරන ලෙස ඉල්ලා සිටියේය (Aurat Foundation, 2001). මෙහි ප්‍රතිඵලයක් ලෙස, පකිස්තාන් දේශපාලන පක්ෂ 11 ක් ප්‍රාන්ත හා ජාතික මැතිවරණවලදී නාමයෝජනාවලින් 30% ක් ස්ත්‍රීන් සඳහා වෙන්කිරීමට කැමැත්ත පළ කළහ. දීර්ඝ සාකච්ඡා හා වාද විවාදවලින් පසුව, පකිස්තානයේ ජාතික නැවත ගොඩ නැඟීමේ බියුරෝව (National Reconstruction Bureau) සෙනෙට් මණ්ඩලයේ ආසන 100 න් 17 ක් (17%) සහ ජාතික ඇසෙම්බිලියේ ආසන 342 න් 60 ක් (18%) ස්ත්‍රීන් සඳහා වෙන් කළේය. නමුත් 1998 සිට ස්ත්‍රීන් සඳහා ආසන වෙන්කිරීමේ ජාතික ව්‍යාපාරය, 33% ක පංගුවක් පිළිබඳව කරන ලද ඉල්ලීම හා 2001 දී ස්ත්‍රීන් හා සංවර්ධනය පිළිබඳ අමාත්‍යංශය සමග ස්ත්‍රී සංවිධාන විසින් කරන ලද සාකච්ඡා යනාදිය ජාතික නැවත ගොඩනැඟීමේ බියුරෝව නොසලකා හැර ඇති බවට විවිධ චෝදනා එල්ල විය.

වත්මන් පකිස්තානයේ ජාතික ඇසෙම්බිලියට නියෝජිතවරියන් 60 ක් තෝරා ගන්නේ සමානුපාතික මැතිවරණ ක්‍රමය මතය. එක් එක් පක්ෂයට ලැබුණු ඡන්ද ප්‍රමාණය අනුව ස්ත්‍රීන් සඳහා වෙන්කළ ආසන බෙදා හැරේ. නමුත් පකිස්තාන ස්ත්‍රී සංවිධානවලින් බොහොමයක් මෙම ක්‍රමය අනුමත නොකරයි. එරට දේශපාලන පක්ෂ පුරුෂ මූලික ව්‍යූහයක් මත කටයුතු කරන නිසා මෙසේ තෝරන නියෝජිතවරියන් හුදෙක් පක්ෂයේ අතකොළු වන බවත්, ඔවුන්ට ස්ත්‍රීන්ව නියෝජනය කිරීමේ නිදහස හා ඉඩප්‍රස්ථාව හිමි නොවන බවත් මෙම සංවිධානවල මතයයි. තවද, දේශපාලන ආයතන තුළදී දෙවැනි ගණයේ නියෝජිතයින් ලෙස ස්ත්‍රීන්ව සැලකෙන නිසා ඔවුන්ට තීරණ ගැනීම සඳහා ඇති බලයද සාපේක්ෂව අඩු බව මෙම සංවිධාන පෙන්වා දෙයි. පකිස්තානයේ විශාල ඡන්ද කොට්ඨාශ හෝ සාමාන්‍ය ප්‍රමාණයේ ඡන්ද කොට්ඨාශ

දෙකක් එක්කොට, විශේෂ ඡන්ද කොට්ඨාශ නිර්මාණය කරජ් මගින් ස්ත්‍රීන් සඳහා ආසන වෙන් කරන ලෙස මෙම සංවිධාන ඉල්ලා සිටී. එම ආසනවලට නාමයෝජනා ඉදිරිපත් කිරීමේදී ස්ත්‍රීන්ගේ ලැයිස්තුවක් හා පොදු අපේක්ෂක ලැයිස්තුවක් ඉදිරිපත් වියයුතු බවද, එයින් අපේක්ෂිකාවක හා අපේක්ෂකයකු තෝරා ගැනීමට ඡන්දදායකයාට හැකිවන අයුරින් මැතිවරණ නීති සංශෝධනය කළ යුතු බවද, ස්ත්‍රී සංවිධාන වල අදහසයි. එම ආසනවල ඡන්දදායකයින්ට ඡන්ද 2 ක් හිමිකොට ඒවායින් එක් ඡන්දයක් ස්ත්‍රීන් සඳහා වෙන්කළ ආසනයේ අපේක්ෂිකාවක හා අනෙක පොදු ලැයිස්තුවේ අපේක්ෂකයකු වෙනුවෙන් භාවිතා කිරීම යෝග්‍ය බව ඔවුන් පෙන්වා දෙයි. (Bari, 2002).

පකිස්තානයේ 2008 මැතිවරණයෙන් පසු ජාතික ව්‍යවස්ථාදායකයේ ප්‍රථම මණ්ඩලයේ ස්ත්‍රී නියෝජනය 22.5% කි. දෙවැනි මණ්ඩලයේ එම ප්‍රතිශතය 16.3% ක් වේ. පළාත් පාලන ආයතනවල එය 27-32% අතර ප්‍රමාණයකට වර්ධනය විය (www.ipu.org/wmn-c/classif.htm). පංගු ක්‍රමයෙන් ආසන 39,964 ක් ස්ත්‍රීන්ට වෙන්කළ අතර එයින් 36,105 කින් ස්ත්‍රීන් තෝරා පත්කර ගැණුනි (Alam, 2004; Yazdani, 2003). පංගු ක්‍රමය නිසා එරට සෑම මට්ටමකම දේශපාලන ආයතනවල නියෝජනය සංඛ්‍යාත්මකව වර්ධනයක් සිදු වූ බව අධ්‍යයන රැසකින් පෙන්වා දී තිබේ (Reyes, 2002; Naz, 2001; Alam, 2004; Yazdani, 2002, 2003; CIET, 2004).

2002 දී ප්‍රජාතන්ත්‍රවාදය සහ මැතිවරණ ආධාර සඳහා වූ ජාත්‍යන්තර ආයතනයේ (IDEA) මූලිකත්වයෙන් කරන ලද අධ්‍යයනයකින් පෙන්වා දුන්නේ පකිස්තානය තුළ සැබෑ සහ පූර්ණ ස්ත්‍රී හා පුරුෂ සමානාත්මතාවයක් දේශපාලන නියෝජනයේදී ඇති කිරීමට නම් පංගු ක්‍රමය හඳුන්වා දීම පමණක් ප්‍රමාණවත් නොවන බවයි. ව්‍යූහාත්මක වෙනස්කම් මගින් අර්ථවත් හා සැබෑ වෙනසක් කිරීමට නම් ආකල්පමය වෙනසක් මෙන්ම, ස්ත්‍රීන්ගේ ධාරිතා වර්ධනයද

ඒ හා සමගාමීව සිදුවිය යුතු බව එම අධ්‍යයනයෙන් පෙන්වා දෙයි. ස්ත්‍රී නියෝජනයේ වැදගත්කම, අවම වශයෙන් 33% ක්වත් ස්ත්‍රීන් නියෝජනය වුවහොත් එමගින් දේශපාලන ආයතනවල හා ඒවායේදී ගන්නා තීරණවල වෙනසක් කළ හැකි බව සහ නියෝජනය හා වෙනත් දේශපාලන ක්‍රියාකාරකම්වලට සක්‍රීයව සහභාගිවීම සඳහා ස්ත්‍රීන්ටද අයිතිවාසිකම් හිමිවන බව යනාදිය පිළිබඳව ජනතාව දැනුවත් කිරීමට ජාතික වශයෙන් පුළුල් දැනුවත් කිරීමේ ව්‍යාපාරයක් ආරම්භ කළයුතු බව මෙම අධ්‍යයනයෙන් නිර්දේශ කරයි. එමෙන්ම අදියර තුනකදී ස්ත්‍රීන්ගේ ධාරිතා වර්ධනය කළයුතු බවද එයින් පෙන්වා දෙයි. ප්‍රථම පෙළ පුරවැසියන් ලෙස ස්ත්‍රීන්ගේ ඡන්දය භාවිත කිරීම පිළිබඳවත්, ඡන්ද අපේක්ෂිකාවන් ලෙස මැතිවරණවලට ඉදිරිපත් වීම පිළිබඳවත්, තේරී පත්වුන නියෝජිතවරියන් ලෙස සාර්ථකව කටයුතු කිරීමටත් අදාළ පුහුණුව ස්ත්‍රීන්ට ලබාදිය යුතු බවත් එයින් යෝජනා කෙරේ. විශේෂයෙන්ම තරුණ ස්ත්‍රීන්ට මෙම පුහුණුව ලබාදීම වඩාත් ඵලදායී බැව් මෙම අධ්‍යයනයෙන් පෙන්වා දෙයි.

ස්ත්‍රී නියෝජනයේ සංඛ්‍යාත්මක වර්ධනය නිසා ස්ත්‍රීන්ගේ ජීවිතවල සිදුවන ගුණාත්මක වර්ධනය පිළිබඳව සහ දේශපාලන ආයතනවල ස්වභාවය, ව්‍යූහයන්, තනතුරු, තීරණ, සම්ප්‍රදායන් හා ඒවාට අදාළ නීතිරීති හා න්‍යාය පත්‍ර ආදිය සමාජ හිතකාමී සහ ස්ත්‍රී හිතකාමී අයුරින් වෙනස්වන ආකාරය පිළිබඳව තවදුරටත් අධ්‍යයනය කොට අදාළ තොරතුරු සමාජයේ විවිධ කොට්ඨාශ අතර බෙදාහැරීමෙන් වඩාත් හොඳ ගුණාත්මක ප්‍රතිඵල අත්පත් කරගත හැකිබවද එම අධ්‍යයනයෙන් පෙන්වා දෙයි (Reyes, 2003).

අපේක්ෂිත ගුණාත්මක ප්‍රතිඵල ඒ අයුරින්ම ලැබී නැතත් පකිස්තානයේ ස්ත්‍රී නියෝජනය ප්‍රමාණාත්මකව වර්ධනය වීමට විශේෂයෙන්ම එරට ස්ත්‍රී සංවිධානවල බලපෑම බෙහෙවින් හේතු විය. එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සංවර්ධන ව්‍යාපෘතිය (UNDP), ආසියානු සංවර්ධන බැංකුව (ADB) සහ කැනේඩියානු ජාත්‍යන්තර

සංවර්ධන ආධාර (CIDA) වැනි ජාත්‍යන්තර ආයතනවල පෙළඹවීම හා ආධාර ජාතික සිවිල් හා ස්ත්‍රී සංවිධානවල ක්‍රියාකාරිත්වයට සෘජුව බලපා තිබේ (Jabeen and Jadoon, 2009). පකිස්තාන පළාත් පාලන ආයතනවලට තේරී පත්වුන නියෝජිතවරියන් අපේක්ෂිත ආකාරයේ පුහුණුවක් ඔවුන්ට නොලැබුණත්, රාජ්‍ය ආයතන, සමහර දේශපාලන පක්ෂ හා සිවිල් සංවිධාන විසින් සංවිධානය කරන ලද ජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් හා පුහුණු වැඩමුළුද යම් ප්‍රමාණයකට මෙම වර්ධනයට බලපෑම් කළේය (CIET, 2004; Aurat Foundation, 2001). එහෙත් වත්මන් (2012) පකිස්තාන ආණ්ඩුව පළාත් පාලන ආයතන විසුරුවා හැර, අදාළ මැතිවරණ අවිනිශ්චිත ලෙස කල්දමා තිබීම නිසා, පැවති පංගු ක්‍රමය පවා දැනට අක්‍රීය වී තිබේ.

බංගලාදේශයේ (1972) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ජාතික පාර්ලිමේන්තුවේ ආසන 315 න් 15 ක් ස්ත්‍රීන්ට වෙන්කර දී තිබිණි. 1976 ව්‍යවස්ථා සංශෝධනයකින් එය ආසන 30 දක්වා වැඩිකර වසර 10 ක කාලයකට පමණක් එම නීතිය සීමා කෙරිණි. මෙම ආසන 30 ට, නියෝජිතවරියන්ව තෝරා ගැනුනේ වක්‍ර ඡන්ද ක්‍රමයකිනි. මැතිවරණයේදී පොදු ආසනවලින් සෘජු ඡන්දයෙන් තෝරා ගත් නියෝජිතයින්ගෙන් සැදි ඡන්දදායක විද්‍යාලයක් මගින්, මෙම වෙන් කළ ආසන සඳහා නියෝජිතවරියන් තෝරා ගැණිනි. මෙම ආසන වෙන්කිරීමේ නීතිය ක්‍රියාත්මක වීම 1987 දී අවසන් විය.

මෙම පරිසරය තුළ ස්ත්‍රී සංවිධානත්, ස්ත්‍රී නියෝජනය පිළිබඳ උනන්දුවක් දක්වන ස්ත්‍රීහුත් සාකච්ඡා, සම්මන්ත්‍රණ, ලිපි හා පෙත්සම් ආදිය මගින් ආණ්ඩුවට බලපෑම් කරමින් බංගලාදේශයේ පරිපාලන ඒකක 64 ට එක් නියෝජිතවරිය බැගින් පත්කිරීම සඳහා ආසන වෙන්කරන ලෙස ඉල්ලා සිටියහ. තවද, එම නියෝජිතවරියන් සෘජු ඡන්දයෙන් තෝරා ගන්නා ලෙසද, එමගින් දේශපාලනයේ ප්‍රධාන ප්‍රවාහයට ප්‍රවේශ වීමට ස්ත්‍රීන්ට ඉඩප්‍රස්ථා සලසා දෙන ලෙසද ඔවුහු ඉල්ලා සිටියහ. සමහර ස්ත්‍රී සංවිධාන දේශපාලන පක්ෂවලින් ඉල්ලා

සිටියේ මැතිවරණවල නාමයෝජනා වලින් 10-20% අතර ප්‍රමාණයක් ස්ත්‍රීන්ට ලබාදෙන ලෙසයි. එම බලපෑම්වල ප්‍රතිඵලයක් ලෙස, 1990 ව්‍යවස්ථා සංශෝධනයක් මගින් නැවත ආසන වෙන්කිරීම වසර 10 ක් සඳහා දීර්ඝ කෙරිණි. 1991 හා 2001 මැතිවරණ අතරතුර කාලයේදී බංගලාදේශයේ ප්‍රධාන ස්ත්‍රී සංවිධාන 20 ක් පමණ මහිලා පර්ෂද් සංවිධානයේ මූලිකත්වයෙන් පංගු ක්‍රමයක් දිනා ගැනීම සඳහා වඩාත් විධිමත්ව හා ශක්තිමත්ව බලපෑම් කළහ. ස්ත්‍රී නියෝජනයේ අවශ්‍යතාවය පිළිබඳ සාකච්ඡා, දේශන, ප්‍රසිද්ධ විවාද හා සම්මන්ත්‍රණ ආදිය මගින් ඔවුහු ජනතාව දැනුවත් කළහ. එසේම, ආණ්ඩුවට, දේශපාලන පක්ෂ වලට හා මෙම ප්‍රශ්නය පිළිබඳ සංවේදී පාර්ලිමේන්තු නියෝජිතවරුන්ට නොකඩවා බලපෑම් කිරීමද ඔවුහු කරගෙන ගියහ. තවද, විරෝධතා ව්‍යාපාර, මහජන රැළි හා මිනිස් දම්වැල් සංවිධානය කරමින් ප්‍රධාන මාර්ග අබියසදී ඔවුහු විවිධ ක්‍රියාකාරකම් සංවිධානය කළහ (Chowdhury, 2001).

නමුත් වෙන් කරන ලද ආසනවලින් තේරී පත්වුන නියෝජිතවරියන්ගෙන් බොහොමයක් දෙනා ඍජු ඡන්ද ක්‍රමය ඉල්ලා සිටීමට එකඟ නොවූහ. ඔවුන් ප්‍රකාශ කළේ මැතිවරණයක් පැවැත්වීමේදී ස්ත්‍රීන් අතරම පවා අනවශ්‍ය ගැටුම් හා ප්‍රචණ්ඩකාරී ක්‍රියා සිදුවීමට ඉඩකඩ ඇති බවත්, මැතිවරණ සඳහා විශාල වියදමක් දැරීමට ස්ත්‍රීන්ට හැකියාවක් නොමැති බවත්ය. එහෙයින් වක්‍ර ඡන්ද ක්‍රමයකින් නියෝජිතවරියන් තේරීම වඩාත් සුදුසු බව ඔවුන්ගේ අදහස විය.

බංගලාදේශයේ ප්‍රථම මැතිවරණයේදීම (1973) ස්ත්‍රීන්ට ආසන වෙන් කර තිබීම නිසා, ස්ත්‍රීන්ව නියෝජිතයින් ලෙස තේරී පත්වීමට නම් එබඳු ව්‍යවස්ථානුකූල ප්‍රතිපත්තියක් අත්‍යවශ්‍යයෙන්ම තිබිය යුතුය යන ආකල්පය එරට සමාජය තුළ ස්ථාපිත විය. ඒ නිසා, පොදු ආසන වලින් ස්ත්‍රී-පුරුෂ දෙපක්ෂයේම අපේක්ෂකයින්ට මැතිවරණයට ඉදිරිපත් වීමේ නීත්‍යානුකූල අයිතිය ඇතත්, ඒවා තවදුරටත්

පුරුෂයන්ගේ ඒකාධිකාරයක් හෝ පුරුෂයන්ට අයත් දෙයක් පමණක් ලෙස සලකනු ලැබිනි. එහි ප්‍රතිඵලයක් ලෙස, එම ආසනවලින් ස්ත්‍රීන්ට නාමයෝජනා ලබා නොදුනි. තවද, තේරී පත්වුන නියෝජිතවරියන් සඳහා බංගලාදේශ පාර්ලිමෙන්තුවේ වෙනම ආසන පැණවීම නිසා ඔවුන් හුදකලා තත්වයකටද පත්විය (Chowdhury, 1994).

නමුත් මෙම ආසන වෙන්කිරීම නිසා දශක 3 ක කාලය තුළදී, ඉතා හෙමින් වුවත් 2.5% ක් පැවති පාර්ලිමේන්තු ස්ත්‍රී නියෝජනය 19.7% (2008) දක්වා වර්ධනය වී තිබේ (www.ipu.org/wmn-c/classif.htm). එසේම තේරී පත්වුණු නියෝජිතවරියන් වැඩිදෙනා පාර්ලිමේන්තුව තුළ නායකත්ව තනතුරු ලබාගැනීම, කාරක සභාවල සාමාජිකයින් ලෙස කටයුතු කිරීම හා ඔවුන්ගේ ඡන්ද කොට්ඨාශවල සංවර්ධනයට විශේෂයෙන්ම ස්ත්‍රීන්ගේ තත්වය වර්ධනයට අදාළ ව්‍යාපෘති සඳහා ප්‍රතිපාදන ලබා ගැනීම වැනි දෑ හරහා කිසියම් ගුණාත්මක වර්ධනයකටද දායක වී තිබේ. මෙම නියෝජිතවරියන් අතුරින් ටික දෙනෙකු ජාතික මට්ටමේ දේශපාලනයේදී වැදගත් භූමිකා රඟපාන තත්වයකටද පත්විය. උදාහරණ වශයෙන් එක් මන්ත්‍රීවරියක් පුද්ගලික මන්ත්‍රී පණතක් ඉදිරිපත් කොට, පාර්ලිමේන්තු ආසනවලින්, කැබිනට් අමාත්‍ය ධූරවලින්, පක්ෂ නාමයෝජනා වලින්, ව්‍යවස්ථාදායක කාරක සභා සාමාජිකත්වයෙන්, ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චය කරුවන්ගෙන්, මැතිවරණ කොමිසමේ සහ රාජ්‍ය සේවා කොමිසමේ සාමාජිකයින් ගෙන් 1/3 ක් ස්ත්‍රීන් සඳහා වෙන්කරන ලෙස ඉල්ලා සිටියේය (Chowdhury, 2002). මේ පණතින් ව්‍යවස්ථා සංශෝධනයක් ඉල්ලා සිටියත් පාර්ලිමේන්තුවේ බහුතර අනුමැතිය එයට නොලැබුණි. එහෙත් එය ඉදිරිපත් කිරීමෙන් පාර්ලිමේන්තුව තුළත්, එයින් පිටතත් මෙම ප්‍රශ්නය පිළිබඳ යම් දැනුවත් බවක් වර්ධනය වීමට මග පැදුණි. පාර්ලිමේන්තු නියෝජිතවරියන් වීමට පෙර සමාජ කටයුතුවල නිරතවී නායකත්වය ගොඩනගා ගත් ස්ත්‍රීන් සුලු සංඛ්‍යාවක් කැබිනට් ඇමති ධූර හිමිකර ගැනීමද එබඳු තවත් ධනාත්මක ප්‍රතිඵලයකි.

1993 දී බංගලාදේශ පාර්ලිමේන්තුව විශේෂ පණතක් සම්මත කොට, පළාත් පාලන ආයතනවල ආසන වලින් 25% ක් ස්ත්‍රීන් සඳහා වෙන් කළේය. ඒ සඳහා ඍජු ඡන්ද ක්‍රමයෙන් නියෝජිතවරියන් තෝරා ගැනීමට තීරණය කෙරිණි. එම ප්‍රතිපත්තියට අනුව ප්‍රථම මැතිවරණය 1997 දී පැවැත්වූ අතර, වෙන්කළ ආසනවලින් ස්ත්‍රීන් 12,828 දෙනෙක් තේරී පත්විය.

බංගලාදේශයේ ජාතික මට්ටමේ දේශපාලන ආයතනවල ස්ත්‍රී නියෝජනය යම් තරමකින් සංඛ්‍යාත්මකව වර්ධනය වුවත්, එයින් අපේක්ෂිත ප්‍රතිඵල ඒ අයුරින්ම ලැබී නොමැති බැව් අධ්‍යයන කීපයකින් පෙන්වා දී තිබේ. දේශපාලන බලය හා ස්ත්‍රී-පුරුෂ සමාජභාවය අතර ඇති සබඳතාවය පිළිබඳ මනා අවබෝධයකින් යුක්තව, ස්ත්‍රීන් සඳහා ආසන වෙන් කිරීමේ ප්‍රතිපත්තිය හඳුන්වා දී නොමැති බවත්, ''ස්ත්‍රී නියෝජනය'' යන්න හුදෙක් සංකේතාත්මක නියෝජනයකට සීමා වී ඇති බවත් එම අධ්‍යයනවලින් පෙන්වා දෙයි. තවද, එම ප්‍රතිපත්තිය යටතේ තේරුණු ස්ත්‍රීන්ව ජාතික දේශපාලනයේ ප්‍රධාන ප්‍රවේශයට ඇතුළත් කර ගැනීමට අදාළ පියවර නොගැනීම නිසා ඔවුන් හුදකලා තත්වයකට පත්විය. එහි ප්‍රතිඵලයක් ලෙස, ඡන්දදායකයා ඔවුන්ගෙන් අපේක්ෂා කළ භූමිකා දේශපාලන තීරණ ගන්නා ආයතනවලදී නිසිලෙස රඟ දැක්වීමට නොහැකි විය. එසේම, බංගලාදේශ ස්ත්‍රී ව්‍යාපාරයට මෙම ප්‍රශ්නය සම්බන්ධයෙන් කටයුතු කිරීමට පාර්ලිමේන්තු නියෝජිතවරියන්, දේශපාලන පක්ෂ හා වෙනත් සිවිල් සංවිධාන සමඟ සමීප සබඳතා හෝ පෙරමුණක් ගොඩනගා ගැනීමට හැකි නොවීමත් දුර්වලතාවයක් විය. ඒ නිසා බංගලාදේශ පංගු ක්‍රමය ජාතික මට්ටමේදී ක්‍රියාත්මක කිරීමෙන් අපේක්ෂා කළ අරමුණු ඉටු නොවූ බැව් චෞද්රිගේ අධ්‍යයනවලින් පෙන්වා දෙයි (Chowdhary, 2002; 2001).

නමුත් බංගලාදේශයේ පළාත් පාලන ආයතවල ස්ත්‍රීන්ගේ නියෝජනය වර්ධනය වීම නිසා ස්ත්‍රීන්ගේ තත්වයෙහි යම් ගුණාත්මක වර්ධනයක් සිදුවූ බැව් එම අධ්‍යයනවලින් පෙන්වා දෙයි. පළාත් පාලන

මට්ටමේදී, දේශපාලන බලය හා සම්පත් ලබා ගැනීමේදී ස්ත්‍රීන්ට යම් ප්‍රවේශයක් ලැබුනු බවත්, දේශපාලනයේ පීතෘමූලික ස්වභාවය යම් තරමකින් වෙනස් කිරීමට හැකි වූ බවත්, දේශපාලනය යනු ස්ත්‍රී ජීවිත වලට ඍජුව සම්බන්ධ වූ ක්‍රියාකාරකමක් ලෙස සැලකිය යුතුය යන ආකල්ප වෙනසකට මුල පිරුන බවත් එම අධ්‍යයනවලින් පෙන්වා දෙයි. තවද, ස්ත්‍රීන්ගේ සම්ප්‍රදායික ගෘහස්ථ භූමිකා හා ඒවා පිළිබඳ දැරූ ආකල්පවල යම් වෙනසකට මුල පිරීමක් හා ස්ත්‍රීන්ටද පොදු කටයුතුවලදී නායකත්වය ගත හැකිය යන ආත්ම විශ්වාසය ගොඩ නැගීමක් එයින් සිදුවූ බැව්ද මෙම අධ්‍යයනවලින් පෙන්වා දෙයි. පාරම්පරිකවම වෙනස්කම්වලට හා පීඩාවලට ලක්වූ ජන කණ්ඩායමක නියෝජිතයින්ට හුදෙක් ව්‍යවස්ථාදායකයට ප්‍රවේශ වීමට ඉඩ ලබාදීම යන අරමුණට වඩා, ස්ත්‍රීන්ට සැබෑ ප්‍රජාතන්ත්‍රවාදී නියෝජනයක් ලබාදීම, එමගින් සමාන පුරවැසිබව හා මානව අයිතිවාසිකම් භුක්ති විඳීමට ඉඩප්‍රස්ථා ලබාදීම හා යහ පාලනය ස්ථාපිත කිරීම යන අරමුණු පෙරදැරි කරගෙන මෙම ප්‍රතිපත්ති ක්‍රියාත්මක කළයුතු බැව් එම අධ්‍යයනවලින් නිර්දේශ කෙරේ (Chowdhury, 2002; 2001).

නේපාල ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව 1990 සිට සියලුම පක්ෂ ජාතික මැතිවරණවලට ඉදිරිපත් කරන නාමයෝජනාවලින් 5% ක පංගුවක් ස්ත්‍රීන් සඳහා වෙන් කළයුතු විය. නමුත් නේපාලයේත් 2000 දශකය දක්වාම ජාතික දේශපාලන ආයතනවල ස්ත්‍රී නියෝජනය ඉතා අවම මට්ටමක පැවතිනි. 1995 දී එම ප්‍රතිශතය 3.41% හා 1999 දී 5.08% ක් විය. නමුත් 1997 පළාත් පාලන ස්වයං පාලන පණත මගින් ස්ත්‍රී නියෝජනය වර්ධනයට පියවරක් ගැණුනි. එයට අනුව සෑම ග්‍රාම සංවර්ධන කමිටුවකම එක් අසුනක් ස්ත්‍රීන් සඳහා වෙන් කෙරිණි. එහි ප්‍රතිඵලයක් ලෙස, 1997 පළාත් පාලන මැතිවරණයේදී ස්ත්‍රීන් 40,000 ක් එනම් 30% ක පමණ ප්‍රතිශතයක් පළාත් පාලන ආයතනවලට තේරී පත්වුනි. 2000 දශකයේ මුල සිට නේපාලයේ මාඕවාදීන් රාජ්‍යයත්වයට එරෙහිවීම හා සන්නද්ධ කැරළි ව්‍යාප්ත කිරීම නිසා මැතිවරණ විධිමත්ව නොපැවැත්විණි. නේපාල රජය කැරළිකරුවන්

හා එකඟතාවයකට පැමිණ 2007 භාරකාර ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් හඳුන්වා දුනි. එම ව්‍යවස්ථාවට ස්ත්‍රී-පුරුෂ සමාන නියෝජනයක් සඳහා වන පංගු ක්‍රමයක් අන්තර්ගත කළයුතු බවට සමාජයේ විවිධ පුද්ගලයින් හා සංවිධානවලින් ඉල්ලීම් ඉදිරිපත් විය. මෙයට අනුව, නේපාල ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සම්පාදක මණ්ඩලයට අවම වශයෙන් 1/3 ක් ස්ත්‍රීන් නියෝජනය වියයුතු යයි තීරණය විය. (2008 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සම්පාදක මණ්ඩලයට තෝරාගත් නියෝජිතයින් 575 න් 191 ක් ස්ත්‍රීන් විය. තවත් ස්ත්‍රීන් 6 දෙනෙක් ජාතික ලැයිස්තුවේ නියෝජිතයින් 25 දෙනා අතරින්, කැබිනට් මණ්ඩලය විසින් පත් කරන ලදී.) 2007 භාරකාර ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් සරල බහුතර ක්‍රමය හා සමානුපාතික නියෝජන ක්‍රමය මිශ්‍ර ඡන්ද ක්‍රමයක් නේපාලයට හඳුන්වා දුනි. නේපාලය භූගෝලීය වශයෙන් කොට්ඨාශ 240 කට බෙදා සෑම කොට්ඨාශයකින්ම එක් නියෝජිතයෙකු සරල බහුතර ක්‍රමයට අනුවත්, තවත් නියෝජිතයින් 335 දෙනෙකු සමානුපාතික නියෝජන ක්‍රමයට අනුවත් තෝරා ගැනීමට තීරණය කෙරිණි (IDEA, 2008). 2007 මැතිවරණ පණතේ වගන්ති 7(4) ට අනුව භාරකාර ආණ්ඩුවේ පාර්ලිමේන්තුව නියෝජිතයින් 601 කින් සමන්විත වියයුතු බවත්, එයින් 240 ක් භූගෝලීය කලාප අනුව සරල බහුතර ඡන්දයෙනුත්, 335 ක් සමානුපාතික නියෝජන ක්‍රමයට අනුවත්, තවත් 26 ක් ජාතික ලැයිස්තුවෙන් කැබිනට් මණ්ඩලය පත් කිරීම මගිනුත් නියෝජනය වීමට නියම විය. එහි වගන්ති 7(3) න් නියම වූයේ, සියලුම පක්ෂ ඉදිරිපත් කරන සමානුපාතික මැතිවරණ නාමයෝජනා ආවෘත ලැයිස්තු වියයුතු බවත්, එම ලැයිස්තුවලින් 50% ක් ස්ත්‍රීන් සඳහා වෙන්කළ යුතු බවත්ය. යම් පක්ෂයක් මෙම විධිවිධානය අනුගමනය නොකළහොත් 50% ට වඩා වැඩි වන පුරුෂයින් හෝ ස්ත්‍රීන්ගේ නම් ලැයිස්තුවෙන් ඉවත් කොට අදාළ නීතියට අනුව එය සකස් කිරීමට මැතිවරණ කොමිසමට බලය ලැබේ.

නේපාල භාරකාර ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ, මිශ්‍ර නියෝජන ක්‍රමයට අනුව ප්‍රථම මැතිවරණය 2008 අප්‍රියෙල් මස දී

පැවැත්විය. මෙම මැතිවරණයේදී තෝරා ගැණුන ව්‍යවස්ථාදායකය, නේපාලයට නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සම්පාදනය කිරීම සඳහා ව්‍යවස්ථා සම්පාදක මණ්ඩලයක් ලෙස කටයුතු කිරීමට නියම විය. එහිදී සරල බහුතර ක්‍රමය භාවිතා කළ ආසන 240 න් 30 (12.5%) ක් ස්ත්‍රීන් දිනා ගති. සමානුපාතික නියෝජන ක්‍රමය භාවිත කළ ආසන 335 න් 161 (48.05%) කින් ස්ත්‍රීන් තේරී පත්විය. කැබිනට් මණ්ඩලය විසින් ජාතික ලැයිස්තුවෙන් පත්කරන ලද නියෝජිතයින් 26 දෙනා අතරින් ස්ත්‍රීන් 6 දෙනෙකු පත් කෙරිණි. ඒ අනුව ව්‍යවස්ථාදායකයේ නැතිනම් ව්‍යවස්ථා සම්පාදක මණ්ඩලයේ සමස්ත නියෝජිතයින් සංඛ්‍යාව වූ 601 න්, ස්ත්‍රීන් 197 ක් නියෝජනය වේ. එහි ප්‍රතිශතය 32.8% ක් වූ අතර එම නියෝජිතවරියන් විවිධ පංති, කුල හා ප්‍රදේශ නියෝජනය කිරීම විශේෂත්වයකි. මෙම ප්‍රතිඵල නේපාල මැතිවරණ ඉතිහාසයේ සමාන නියෝජනය සළකුණු කිරීමේ ආරම්භයක් විය. මෙම මැතිවරණයේදී, ස්ත්‍රීන්ට නාමයෝජනා ලබාදීමට වාමාංශික පක්ෂ වැඩි උනන්දුවක් දැක්වූ අතර, සමහර ස්ත්‍රීන් පුරුෂ අපේක්ෂකයින්ට වඩා විශාල ඡන්ද බහුතරයකින් ජය ගැනීම සුවිශේෂී විය. උදාහරණ වශයෙන් නේපාල මාඕවාදීන්ගේ එක්සත් කොමියුනිස්ට් පක්ෂය (Unified Communist Party of Nepal Maoist) සහ නේපාල කොංග්‍රසයෙන් (Nepali Congress) ගොර්කා (Gorkha) ඡන්ද කොට්ඨාශයට ඉදිරිපත් වුනු අපේක්ෂිකාවන්ට වැඩිම ඡන්ද ප්‍රමාණය දිනාගත හැකිවිය. දෙවනුවට වැඩි ඡන්ද ලබාගත් අපේක්ෂකයාට වඩා 30,000 ක් පමණ වැඩියෙන් මෙම අපේක්ෂිකාවන්ට ඡන්ද හිමිවීම විශේෂත්වයක් විය. ප්‍රජාතන්ත්‍රවාදය ස්ථාපිත කිරීමේ මූලික අඩිතාලම ලෙස සම්පාදනය කෙරුණු නේපාල භාරකාර ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ස්ත්‍රීන් සඳහා පංගු ක්‍රමයක් වෙන්කර දීමෙන් නේපාල ජාතික මැතිවරණ ඉතිහාසයේ ප්‍රථම වරට ස්ත්‍රී නියෝජනය 32.8% දක්වා වර්ධනය වීම සුවිශේෂී කරුණකි. නමුත් නේපාලයේ සම්ප්‍රදායික දේශපාලන පක්ෂවල නායකත්වයේ ආකල්ප, පීතෘමූලික සමාජ හා සංස්කෘතික සාධක, ගෘහස්ථ ක්ෂේත්‍රය තුළ ස්ත්‍රීන්ට පැවරෙන භූමිකා සහ දේශපාලන තීරණ ගැනීම් සඳහා ස්ත්‍රීන්ට ඇති අඩු අත්දැකීම් ආදිය නිසා මෙම

තෝරා ගත් නියෝජිතවරියන් වැඩි දෙනාට ඔවුන් අපේක්ෂා කළ භූමිකා රඟපෑමට ඇති හැකියාව සීමිත වී තිබේ. එම නියෝජිතවරියන් දෙදෙනෙක් මෑතකදී ප්‍රකාශ කළේ ''ස්ත්‍රීන් හුදෙක් සංකේතාත්මක නියෝජනයකට සීමා වී ඇති බවත්, සම්ප්‍රදායික පුරුෂ දේශපාලන නායකත්වය ස්ත්‍රීන්ට ස්වාධීනව අදහස් ප්‍රකාශ කිරීමට ඉඩකඩ ලබා නොදෙන බවත්, දේශපාලන නියෝජිත ආයතන තුළ පවා මෙම පුරුෂයන්ගේ ආධිපත්‍යයට ඔවුන් නතු වී ඇති බවත්ය''. ස්ත්‍රී නියෝජනය ප්‍රමාණාත්මකව වර්ධනය වූ පමණින් ගුණාත්මක වෙනසක් සිදු වීම අපේක්ෂා කළ නොහැකි බවත්, සම්ප්‍රදායික ආකල්පවල හා පුරුෂ මූලික දේශපාලන සංස්කෘතියේ වෙනසක් වීමට, නීති සම්මත කරන කාලයට වඩා දිගු කාලයක් ගතවන බවත් ඔවුහු පෙන්වා දුන්හ.[7]

ඇෆ්ගනිස්ථානයද පශ්චාත්-යුධ වාතාවරණය තුළ සම්පාදනය කළ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ස්ත්‍රී නියෝජනය වර්ධනය කිරීම සඳහා වන පංගු ක්‍රමයක් හඳුන්වා දුනි. එක්සත් ජාතීන්ගේ 1325 යෝජනාවලිය (2000) ප්‍රකාශයට පත් කිරීමෙන් පසුව, තීරණ ගන්නා මට්ටම්වලදී ස්ත්‍රී නියෝජනය වර්ධනය සඳහා වන විශේෂ විධිවිධාන නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවලට අන්තර්ගත කරන ලෙස, විශේෂයෙන්ම පශ්චාත්-යුදකාලීන වාතාවරණය සහිත රටවලින් ජාත්‍යන්තර සංවිධාන හා ප්‍රජාව ඉල්ලා සිටියහ. ස්ත්‍රී නියෝජනය වර්ධනය සඳහා ඉල්ලා සිටින දේශීය ස්ත්‍රී සංවිධානවලට සහයෝගය දැක්වීමට හෝ භාරකාර ආණ්ඩුවලට බලපෑම් කිරීමට මේ නිසා එක්සත් ජාතීන්ගේ සංවිධානය ඇතුළු ජාත්‍යන්තර සංවිධානද පෙළඹුණි. ඇෆ්ගනිස්ථානයටත් මෙම බලපෑම එල්ල වුනි. තලිබාන් ගැටුම්කරුවන් සමඟ සාම ගිවිසුම් අත්සන් කිරීමෙන් පසුව ඇෆ්ගනිස්ථානය තුළ එක්සත් ජාතීන්ගේ විශේෂ මෙහෙයුම් කොමිසමක් ස්ථාපිත කෙරිණි. 2001 දී එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මූලිකත්වයෙන් ඇෆ්ගනිස්ථානයේ ප්‍රජාතන්ත්‍රවාදී

7 2012, සැප්තැම්බර් 6-10 දිනවලදී, ෆෙඩ්රිච් ඊබර්ට් ස්ටිෆ්ටුන් ආයතනය විසින් සංවිධානය කරන ලද දකුණු ආසියානු ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය සම්මන්ත්‍රණයේදී, නේපාල පාර්ලිමේන්තු මන්ත්‍රීවරියන් දෙදෙනෙක් සමග කරන ලද සාකච්ඡාවක් ඇසුරිනි. (මීගමුව: ශ්‍රී ලංකාව).

ආණ්ඩුක්‍රමයක් ස්ථාපිත කිරීම සඳහා වන මූලික පියවර ලෙස පීටර්ස්බර්ග් සමුළුව කැඳවනු ලැබීය. තලිබාන් යුධ ගැටුම් පරිසරය තුළදී ස්ත්‍රීන්ගේ අයිතිවාසිකම් දැඩි ලෙස උල්ලංඝනය කිරීම හා ඔවුන්ව පීඩාවට පත් කිරීම පිළිබඳ, මෙම සමුළුවේදී විශේෂයෙන් සාකච්ඡාවට ලක්විය. එහි ප්‍රතිඵලයක් ලෙස, ඇෆ්ගනිස්ථාන් භාරකාර ආණ්ඩුව තුළ මෙන්ම නව පාර්ලිමේන්තුව තුළත් ස්ත්‍රී නියෝජනය තහවුරු කරන බවට පීටර්ස්බර්ග් ගිවිසුමෙන් පොරොන්දු විය. එක්සත් ජාතීන්ගේ සංවිධානය, අමරිකා එක්සත් ජනපදය සහ ඇෆ්ගනිස්ථානයේ එක්සත් ජාතීන්ගේ විශේෂ මෙහෙයුම් කමිටුව කළ දැඩි බලපෑම්වල ප්‍රතිඵලයක් ලෙස භාරකාර ආණ්ඩුවේ අමාත්‍ය ධූර දෙකකට සහ ලෝයා ජිර්ගා කොමිසමේ (Loya Jirga Commission) නියෝජිත තනතුරු තුනකට ස්ත්‍රීන්ව තෝරා ගැණුනි (Kaufman, 2003).

2004 ජනවාරි ස්ථාපිත කරන ලද ඇෆ්ගනිස්ථාන නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව සෑම පළාතකින්ම අවම වශයෙන් එක් ස්ත්‍රියක්වත් ලෝයා ජිර්ගා කොමිසම (ව්‍යවස්ථාදායකය) තුළ නියෝජනය වියයුතුය. ඒ නිසා නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින්, පාර්ලිමේන්තුවේ පහළ මණ්ඩල නියෝජනයෙන් 25% ක පංගුවක් ස්ත්‍රීන් සඳහා වෙන් කෙරිණි. දෙවැනි මණ්ඩලය සඳහා ජනාධිපති විසින් පත්කරනු ලබන නියෝජිතයින් අතරින් අඩක් ස්ත්‍රීන් වියයුතු බවද ව්‍යවස්ථාවෙන් ප්‍රකාශ විය. ඒ අනුව දෙවැනි මණ්ඩල නියෝජනයෙන් 17% ක පංගුවක් ස්ත්‍රීන් සඳහා වෙන් කෙරිණි. ස්ත්‍රී නියෝජනය වර්ධනය සඳහා පංගු ක්‍රමයක් හඳුන්වා දීම විශ්වාස සහගත නොවන පියවරක් ලෙස සමහර ස්ත්‍රීන් පෙන්වා දුන්නද, බොහොමයක් ස්ත්‍රීන්, ස්ත්‍රී සංවිධාන හා විශේෂයෙන්ම ඇෆ්ගනිස්ථානය තුළ සිරගතව සිටි ස්ත්‍රීන් පංගු ක්‍රමයක් වෙනුවෙන් සටන් කළහ (Krook, 2004). පංගු ක්‍රම නීතිය හඳුන්වා දීමේ ප්‍රතිඵලයක් ලෙස, ඇෆ්ගනිස්ථානයේ 2010 සැප්තැම්බර් මස පැවැත්වූ මහ මැතිවරණයේදී ස්ත්‍රීන් 69 දෙනෙකු (මුලු මන්ත්‍රී සංඛ්‍යාව, 249) තේරී පත්විය. ඒ අනුව පාර්ලිමේන්තුවේ පහළ මණ්ඩලයේ ස්ත්‍රී නියෝජනයේ ප්‍රතිශතය 27.7% කි. 2011 ජනවාරි

මස පැවැත්වූ දෙවැනි මණ්ඩල මැතිවරණයේදී, නියෝජිතයින් 102 ත් තෝරාගත් අතර, එයින් 28 ක් (27.5%) ස්ත්‍රීන් වේ (www.ipu.org/wmnw/classif.htm).

ලතින් අමෙරිකානු රටවල අත්දැකීම්

1990 දශකය මුල් භාගයේදී, ප්‍රජාත්නත්‍රවාදී ආණ්ඩුක්‍රමවල ව්‍යාප්තියත් සමඟ ලතින් අමෙරිකානු රටවල් බොහොමයක ව්‍යවස්ථානුකූල පංගු ක්‍රමය හඳුන්වා දීම ජනප්‍රිය විය. දැනට ලතින් අමෙරිකානු රටවල් 14 ක් ස්ත්‍රී නියෝජනය වර්ධනය සඳහා වන පංගු ක්‍රම හඳුන්වා දී තිබේ. මේ අතරින් ආර්ජන්ටිනාව (1991) පංගු ක්‍රමය හඳුන්වා දුන් ප්‍රථම රටයි. ඒ සඳහා ආර්ජන්ටිනා ස්ත්‍රීන් පෙළඹවූ මූලික කරුණු 2 කි. එනම් ස්පාඤ්ඤ සමාජවාදී පක්ෂය (Spanish Socialist Party) සමඟ වූ සබඳතා සහ කොස්ටරිකාහි ''ස්ත්‍රීන් හා පුරුෂයන් අතර සත්‍ය සමානාත්මතාවයක් සඳහා වූ පණත'' සම්මත කරවා ගැනීමට එරට ස්ත්‍රී ව්‍යාපාරය කළ උද්ඝෝෂණ හා පෙළඹවීම්වල බලපෑමයි. ආර්ජන්ටිනා ස්ත්‍රී ව්‍යාපාරයේ බලපෑම, පක්ෂ වල කැමැත්ත හා රාජ්‍යයේ නම්‍යශීලි බව නිසා 1991 දී 30% පංගු ක්‍රමයක් ව්‍යවස්ථානුකූලව හඳුන්වා දුනි (Htun & Jones, 2002). ආර්ජන්ටිනා නීතියට අනුව ජාතික මැතිවරණවලට ඉදිරිපත් වන සියලුම පක්ෂ නාම යෝජනා ලැයිස්තුවලින් අවම වශයෙන් 30% ක් ස්ත්‍රීන්ට ලබාදිය යුතු වේ. නාමයෝජනා ලැයිස්තුවේ අගට ස්ත්‍රීන්ගේ නම් ඇතුළත් කිරීම තහනම් වන අතර, ජයගැනීමේ සම්භාවිතාවය ඇති ආකාරයට පක්ෂ නාමයෝජනා ලැයිස්තුව පුරා සමතුලිතව ස්ත්‍රීන්ගේ නම් ඇතුළත් කළයුතු වේ. මෙම විධිවිධානවලට යටත් නොවන නාමයෝජනා ලැයිස්තු ප්‍රතික්ෂේප කෙරේ.

පංගු ක්‍රමය හඳුන්වා දීමට පෙර, 1991 දී ආර්ජන්ටිනාවේ ස්ත්‍රී නියෝජනයේ ප්‍රතිශතය 4.6% ක් විය. නමුත් පංගු ක්‍රමය හඳුන්වා දීමේ ප්‍රතිඵලයක් ලෙස 1993 මැතිවරණයේදී ආර්ජන්ටිනා ජාතික

ව්‍යවස්ථාදායකයේ ස්ත්‍රී නියෝජනය 21.3% දක්වා වර්ධනය විය. 2003 දී එය 30.7% දක්වා තවදුරටත් වර්ධනය විය.

ආර්ජන්ටිනා ස්ත්‍රී ව්‍යාපාරයේ නායිකාවෝ පංගු ක්‍රමය හා එයින් ලද ජයග්‍රහණ පිළිබඳව අනෙක් ලතින් අමෙරිකානු රටවල නායිකාවන්වද දැනුවත් කළහ. සමහර ලතින් අමෙරිකානු රටවල රාජ්‍ය ස්ත්‍රීවාදය (State Feminism)[8] ශක්තිමත්ව ව්‍යාප්ත වීම පංගු ක්‍රමය දිනාගැනීමට පහසුවක් විය. උදාහරණ ලෙස **පේරු** රාජ්‍යයේ fුජිමොරි ජනාධිපතිවරයා ස්ත්‍රීන් වෙනුවෙන් වෙනම ඔම්බුඩ්ස්මන්වරයෙකු (පාර්ලිමේන්තු කොමසාරිස් නැතිනම් දුක් ගන්නා රාළ) පත්කිරීම, පාර්ලිමේන්තු ස්ත්‍රී කොමිසමක් පිහිටුවීම, ගෘහස්ථ ප්‍රචණ්ඩත්වයට එරෙහි නීති සම්මත කිරීම හා පවුල් සැලසුම් සඳහා වන නීති සම්පාදනය කිරීම යනාදියේදී මූලිකත්වය ගෙන කටයුතු කළේය. ඔහුගේ සහයෝගය නිසා 1997 දී 30% පේරු හි පංගු ක්‍රම නීතිය මෙවැනි ව්‍යවස්ථාදායකය විසින් ඒකච්ඡන්දයෙන් සම්මත කරන ලදී.

පංගු ක්‍රමය හඳුන්වා දීමේ ප්‍රතිඵලයක් ලෙස පේරු ජාතික ව්‍යවස්ථාදායකයේ ස්ත්‍රී නියෝජනය 18% දක්වා 1998 දී වර්ධනය විය. නමුත් පේරු හි නීතියට අනුව විවෘත නාමයෝජනා ලැයිස්තු ක්‍රමය භාවිත කිරීම නිසා බොහොමයක් පක්ෂ ස්ත්‍රීන්ගේ නම්, ලැයිස්තුවේ අගට ඇතුළත් කරයි. එහෙයින් පුරුෂයින්ට සාපේක්ෂව ස්ත්‍රීන්ගේ ඡන්දය දිනාගැනීමේ සම්භාවිතාවය අඩුවේ. ආර්ජන්ටිනාවේදී ආවෘත ලැයිස්තු (Closed list) ක්‍රමය භාවිතා කිරීම නිසා අපේක්ෂිත ප්‍රතිඵල වැඩියෙන් ලබාගත හැකිවිය.

---

8 ස්ත්‍රීන් හා පුරුෂයන් අතර වන අසමානතා තුරන් කොට, ස්ත්‍රීන්ගේ ජීවිතවල වර්ධනයක් සඳහා රාජ්‍ය විසින් මූලිකත්වය ගනු ලැබීම රාජ්‍ය ස්ත්‍රීවාදය ලෙස සැලකේ. රාජ්‍ය විසින් එම අරමුණු ඉටුකර ගැනීමට අදාළ නීති, ප්‍රතිපත්ති හා සැලසුම් සම්පාදනය, විශේෂ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, අවශ්‍ය සම්පත් ලබාදීම හා එම කටයුතු සඳහා රාජ්‍ය යාන්ත්‍රණ පිහිටුවීම (කාන්තා අමාත්‍යංශය, ජාතික කාන්තා කවුන්සිලය) ආදිය කරගෙන යනු ලබයි.

fුජිමොරි ආණ්ඩුව අමාත්‍යංශ උපදේශක කමිටුවලටද ස්ත්‍රීවාදීන් කිහිපදෙනෙක් ඇතුළත් කළේය. සංඛ්‍යාත්මකව මෙන්ම ගුණාත්මකවද ස්ත්‍රීන්ගේ ජීවිතවල වර්ධනයක් කිරීම එම පියවරවලින් අපේක්ෂා කෙරිණි. එහෙත් fුජිමොරි ජනාධිපතිවරයාගේ අධිපතිවාදී පාලන රටාව තුළ මෙම නායිකාවන් හුදෙක් ඔහුගේ අනුගාමිකයින් බවට පත්වූ අවස්ථා බහුල විය. ස්ත්‍රීන් සඳහා වූ ජාතික සාක්ෂරතා වැඩසටහන වැනි ඉතා වැදගත් ව්‍යාපෘති කීපයක් ඇරඹීමට මෙම නායිකාවන් මුල්තැන ගත්තත්, අපේක්ෂිත ගුණාත්මක ප්‍රතිඵල ඒ අයුරින්ම ලබාගැනීමට අපහසු විය (Jones, 1996).

1996 දී **පැරගුවේ** ආවෘත නාමයෝජනා ලැයිස්තු ක්‍රමය මත 20% ක පංගුවක් ස්ත්‍රීන් සඳහා වෙන්කිරීමට අදාළ නීතියක් ස්ථාපිත කළේය. 1996 දී මෙක්සිකෝව පංගු ක්‍රම නීතිය (30%) ස්ථාපිත කළේය. නමුත් 2002 දී නාමයෝජනා ලැයිස්තුවල නම් වෙනස් කළ නොහැකි අයුරින් ස්ථාන ගත කිරීම හා නීතියට අනුකූල නොවන නාමයෝජනා ලැයිස්තු ප්‍රතික්ෂේප කිරීම පිළිබඳ නීති එයට එක්කරන ලදී. 1997 දී බොලීවියා 30% ක පංගුවක්ද (ආවෘත ලැයිස්තු ක්‍රමය), බ්‍රසීලය 30% ක් විවෘත ලැයිස්තු ක්‍රමය යටතේද, කොස්ටරිකා 40% ක් ආවෘත ලැයිස්තු ක්‍රමය යටතේද, ඩොමිනිකන් සමූහාණ්ඩුව 25% ක පංගුවක් ආවෘත ලැයිස්තුව යටතේද, ඉක්වදෝරය 33% ක් විවෘත ලැයිස්තු යටතේද, පැනමා හා පේරු රාජ්‍යය 30% ක පංගුවක් විවෘත ලැයිස්තු ක්‍රමය යටතේද, නීතියෙන් ස්ථාපිත කළේය. 1998 දී වෙනිසියුලාව 30% ක පංගුවක් ආවෘත ලැයිස්තු ක්‍රමය යටතේ හඳුන්වා දුනි.

සමහර ලතින් ඇමරිකානු රටවල, දේශපාලන පක්ෂ නාමයෝජනා ලැයිස්තුවලින් ස්ත්‍රීන් සඳහා ස්වේච්ඡාවෙන් පංගුවක් නියම කිරීමද ස්ත්‍රී නියෝජනය වර්ධනය කෙරෙහි බලපෑවේය. වාමාංශික පක්ෂ හෝ සමාජ ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂ මෙසේ පංගු ක්‍රමය හඳුන්වා දීමේ ලා මූලික විය. ප්‍රථමයෙන් එම පක්ෂ පංගු ක්‍රම හඳුන්වා දීම අනෙක් පක්ෂ වලට කරන ලද බලපෑමක්ද විය. දේශපාලන

පක්ෂ භාවිත කළ පංගු ක්‍රම විවිධ විය. මෙක්සිකෝ හි ප්‍රජාතන්ත්‍රවාදී විප්ලවීය පක්ෂය (Party of the Democratic Revolution), නිකරගුවාහි ජාතික විමුක්තිය සඳහා වූ සැන්ඩිනිස්ටා පෙරමුණ (Sandinista Front for National Liberation) සහ කොස්ටරිකා හි ජාතික විමුක්ති පක්ෂය (Party of National Liberation) ජාතික මැතිවරණවලදී නාම යෝජනාවලින් පංගුවක් ස්ත්‍රීන් සඳහා වෙන් කළේය. චිලී හි ප්‍රජාතන්ත්‍රවාදය සඳහා වූ පක්ෂය (Party for Democracy), සමාජවාදී පක්ෂය (Socialist Party) සහ බ්‍රසීලයේ කම්කරු පක්ෂය අභ්‍යන්තර පක්ෂ තනතුරු හා කමිටුවලට තෝරා ගැනීමේදී ස්ත්‍රීන්ට පංගුවක් නියම කළේය.

ලතින් අමෙරිකානු රටවල් විසින් භාවිත කරනු ලබන පංගු ක්‍රමවලින් ලබා ඇති ප්‍රතිඵල විවිධය. ස්ත්‍රී නියෝජනයේ සංඛ්‍යාත්මක වර්ධනය කොස්ටරිකා හි 38.6% (2010), ආර්ජන්ටිනාහි 37.4% (2011), ඉක්වදෝරය 32.3% (2009), මෙක්සිකෝ 26.2 (2009), බොලීවියා 25.4% (2009), පේරු 21.5% (2011), ඩොමිනිකන් සමූහාණ්ඩුව 20.8% (2008), වෙනිසියුලා 17.0% (2010), චිලී 14.2 (2009), පැරගුවේ 12.5% (2008), කොලොම්බියා 12.1% (2010), බ්‍රසීලය 8.6% (2010) හා පැනමා 8.5% (2009) ආදී වශයෙන් විවිධ වේ (www.ipu.org).

30% ක පංගුවක් ස්ත්‍රීන් සඳහා වෙන් කෙරුණද, ලතින් අමෙරිකානු රටවල් අතරින් කොස්ටරිකා, ආර්ජන්ටිනා හා ඉක්වදෝරයේ පමණක් පාර්ලිමේන්තු වල ස්ත්‍රී නියෝජනය 30% ඉක්මවා ඇත. එයට මූලික හේතුව වන්නේ, අනෙක් රටවල පංගු ක්‍රමය පිළිබඳ ව්‍යවස්ථා ක්‍රියාත්මක වුවද, ඒවායින් බහුතරයක එය සාර්ථක වීමට අත්‍යවශ්‍ය විශේෂ යාන්ත්‍රණ සම්බන්ධයෙන් අඩුපාඩු පැවතීමයි. මාලා හට්න් (Mala Htun) හා මාර්ක් ජෝන්ස් (Mark Jones) (2002) ට අනුව පංගු ක්‍රමවලින් වඩාත් හොඳ ප්‍රතිඵල ලබා ගැනීමට බලපාන ප්‍රධාන සාධක කීපයකි. ඒවා නම්,

i. ආවෘත ලැයිස්තු ක්‍රමය හෙවත් වැසුණු ලැයිස්තු ක්‍රමය
ආවෘත නාමයෝජනා ලැයිස්තුවට ඇතුළත් කළ නම් හා ඒවා ස්ථානගත කළ අනුපිළිවෙල මැතිවරණයෙන් පසු වෙනස් කළ නොහැකිවීම.

ii. ස්ත්‍රීන්ගේ නම්, නාමයෝජනා ලැයිස්තුවේ අගට හෝ හුදෙක් ලැයිස්තු පිරවීමේ අරමුණෙන් ඇතුළත් නොකර ස්ත්‍රී-පුරුෂ දෙපක්ෂයේම නම් ජයගැනීමේ සම්භාවිතාවය ඇති හා සමතුලිත අයුරින් පෙළ ගැස්වීම

iii. පංගු ක්‍රමය ක්‍රියාත්මක කිරීමේදී දේශපාලන පක්ෂ ස්ත්‍රී නියෝජනය වර්ධනය කිරීමට ඇති සැබෑ කැමැත්තෙන් හා කැපවීමෙන් කටයුතු කිරීම

බ්‍රසීලය, ඉක්වදෝරය හා පේරු වැනි රටවල විවෘත නාමයෝජනා ලැයිස්තු ක්‍රමය භාවිත කරන අතර, එහිදී ලැයිස්තුවට ඇතුළත් නම් හා ඒවා ස්ථානගත අනුපිළිවෙල මැතිවරණයෙන් පසුව පක්ෂ නායකයින්ට කැමති ආකාරයට වෙනස් කළ හැකිය. එහෙයින් ස්ත්‍රීන් සඳහා පංගුවක් වෙන්කර තිබුණද, ප්‍රායෝගික දේශපාලනයේදී මූලික හේතු 2 ක් නිසා ස්ත්‍රීන්ට අවාසි සිදුවේ. පළමුවැන්න නම්, විවෘත නාමයෝජනා ලැයිස්තුවක් තිබීමෙන් එක පක්ෂයේම අපේක්ෂකයින් අතර වැඩි ඡන්ද ලබාගැනීමට විශාල තරඟයක් ඇතිවේ. එහිදී පුරුෂයින්ට හිමි වැඩි සම්පත්, අත්දැකීම් හා ජාලගතවීමේ පහසුව ආදී දේ නිසා ස්ත්‍රීන්ට වඩා පුරුෂයින් වැඩි වාසිසහගත තත්වයකට පත්වේ. දෙවැනි කරුණ වන්නේ ඡන්දදායකයාට විවෘතව නැතිනම් ලැයිස්තුවේ අනුපිළිවෙල නොසලකා ඡන්දය දීමට හැකිවීම නිසා පුරුෂ අපේක්ෂකයින් වැඩි වාසිසහගත තත්වයකට පත්වේ. වැඩි සම්පත් ඇති, වැඩියෙන් අනුග්‍රහ දක්වන හා ප්‍රචාරක කටයුතු කරන පුරුෂයන්ට ඡන්දය දීමට ඡන්දදායකයා වැඩිපුර පෙළඹේ. එහිදී ස්ත්‍රීන් අපේක්ෂක ලැයිස්තුවේ පහළටම තල්ලුවේ.

නාමයෝජනා ලැයිස්තුවේ අපේක්ෂකයකුට ලබාදුන් ස්ථානය නැතිනම් අනුපිළිවෙල වෙනස් කළ හැකි වීම හා නොහැකිවීම යන සාධකයද පංගු ක්‍රමයක සාර්ථක හෝ අසාර්ථක භාවයට ඍජුව බලපාන සාධකයකි. උදාහරණ ලෙස ආර්ජන්ටිනාව, බොලීවියා, කොස්ටරිකා හා මෙක්සිකෝ වැනි රටවල ස්ත්‍රී නියෝජනය ප්‍රමාණාත්මකව වර්ධනය වීමට අපේක්ෂක ලැයිස්තුවේ නම් ස්ථානගත කළ අනුපිළිවෙල වෙනස් කළ නොහැකිවීම සඳහා පැනවූ නීතිය ඍජුව බලපා ඇත. ආර්ජන්ටිනාවේ මෙම නීතිය ඉතාම ඵලදායී ලෙස ක්‍රියාත්මක වේ. එරට නීතියට අනුව 30% ක් ස්ත්‍රීන් මැතිවරණ නාමයෝජනාවලට ඇතුළත් කළයුත්තේ, දිනීමේ සම්භාවිතාවය ඇති ආසන සඳහා ද අපේක්ෂකත්වය ලබා දීමෙනි. හුදෙක් ලැයිස්තුව පිරවීමට එහි අගට ස්ත්‍රීන්ගේ නම් ඇතුළත් කිරීම නීතියෙන් තහනම් වේ. එම නීතිය නොසලකා සම්පාදිත නාමයෝජනා ලැයිස්තු වුවහොත් ඒවා ප්‍රතික්ෂේප කෙරේ. එබඳු පක්ෂවලට එරෙහිව අපේක්ෂිකාවන් හා ස්ත්‍රී සංවිධාන අධිකරණයට පෙත්සම් ඉදිරිපත් කළ අවස්ථාද වේ (Franceschet, 2004). මෙක්සිකෝ හි 1996 සම්මත කරන ලද පංගු ක්‍රම නීතිය 2002 දී වෙනසකට ලක් කොට ආවෘත ලැයිස්තු ක්‍රමය ආරම්භ කෙරිනි. මිශ්‍ර නියෝජන ක්‍රමයක් භාවිත කරන මෙක්සිකෝ හි ජාතික ව්‍යවස්ථාදායකයට සමානුපාතික නියෝජන ක්‍රමයට අනුව (ආවෘත ලැයිස්තු) නියෝජිතයින් 200 ක් තෝරා ගැනේ. තවත් නියෝජිතයින් 300 ක් සරල බහුතර ක්‍රමයට අනුව තෝරා ගැනේ. සමානුපාතික ක්‍රමයට අනුව ඉදිරිපත් කරන අපේක්ෂක ලැයිස්තුවේ පුරුෂයින්ගේ නම් 3 කට එක් ස්ත්‍රියකගේ නමක් ඇතුළත් වියයුතුය. සරල බහුතර ක්‍රමයට අනුව තෝරන මැතිවරණයේදී ද නාමයෝජනා ලැයිස්තුවලින් 30% ක් ස්ත්‍රීන්ට ලබාදිය යුතුවේ (Franceschet and Macdonald, 2004).

පංගු ක්‍රමයෙන් අපේක්ෂිත ප්‍රතිඵල ලබාගැනීමට දේශපාලන පක්ෂ වල ඇති සැබෑ කැමැත්ත හා කැපවීමද එම නීතියේ ඵලදායීභාවයට ඍජුවම බලපායි. සමහර ලතින් අමෙරිකානු රටවල

පංගු ක්‍රම නීතිය ස්ථාපිත කළත්, එයට අනුව නාමයෝජනා ලැයිස්තු සම්පාදනය නොකරන පක්ෂවලට නීතිමය බලපෑමක් හෝ දඬුවමක් නියම කොට නොමැත. මෙහිදීත් ආර්ජන්ටිනාව හා කොස්ටරිකා ඉතාමත් හොඳ උදාහරණ ලෙස ගත හැකිය. මෙම රටවල් දෙකේම පංගු ක්‍රම නීතියට අනුකූලව ඉදිරිපත් නොකරන නාමයෝජනා ලැයිස්තු ප්‍රතික්ෂේප කෙරේ. විශේෂයෙන්ම ආර්ජන්ටිනා අධිකරණය මේ සම්බන්ධයෙන් දැඩි තීරණවලට එළඹ, නීතියට පටහැනි වූ එබඳු නාමයෝජනා ලැයිස්තු ප්‍රතික්ෂේප කිරීමට තීන්දු දීම පංගු ක්‍රමයෙන් යහපත් ප්‍රතිඵල උදාකර ගැනීමේ ලා බෙහෙවින් බලපා ඇත. පංගු ක්‍රමය සාර්ථක වීම සම්බන්ධයෙන් මෙම නීතිය ස්ත්‍රී නියෝජනය වර්ධනයේ ලා වඩාත්ම බලපෑම් සහගත හා ඵලදායී එකක් වූ බැව් ග්‍රේ ගේ අදහසයි (Gray, 2003).

මෙක්සිකෝව 1996 දී හඳුන්වා දුන් පංගු ක්‍රම නීතියට මෙබඳු නාමයෝජනා ලැයිස්තු ප්‍රතික්ෂේප කිරීමේ විධිවිධානයක් ඇතුළත් වී නොතිබිණි. නමුත්, පාර්ලිමේන්තු මන්ත්‍රීවරියන් කිහිපදෙනෙකුගේ මූලිකත්වයෙන් 2002 දී එය සංශෝධනය කෙරිණි. එහිදී, නාමයෝජනා ලැයිස්තුවේ නම් හා ඒවා ස්ථානගත කළ අනුපිළිවෙල වෙනස් කළ නොහැකිවීම හා පංගු ක්‍රම නීතියට අනුකූල නොවන නාමයෝජනා ලැයිස්තු ප්‍රතික්ෂේප කිරීමට ෆෙඩරල් මැතිවරණ ආයතනයට (Federal Electoral Institute) බලය දීම සම්බන්ධ නව විධිවිධාන පංගු ක්‍රම නීතියට එක් කළේය. පංගු ක්‍රම නීතියට අනුකූල නොවන නාමයෝජනා ලැයිස්තුවක් වුවහොත්, මෙම නව නීතියට අනුව, ප්‍රථමයෙන්ම ෆෙඩරල් මැතිවරණ ආයතනයට එය දෝෂ සහගත බැව් පෙන්වා ජනතාව දැනුවත් කිරීමේ බලය ඇත. ඉන්පසුව අදාළ පක්ෂය එය නිවැරදි නොකළහොත් දෙවනුව එම නාමයෝජනා ලැයිස්තුව ප්‍රතික්ෂේප කිරීමේ බලය අදාළ ආයතනයට හිමිවේ. මෙම සංශෝධනය නිසා මෙක්සිකෝ හි පංගු ක්‍රම නීතිය ශක්තිමත් විය (Franceschet, 2004).

ලතින් අමෙරිකානු රටවල සමහර දේශපාලන පක්ෂවල සිදුවෙමින් පවතින ප්‍රජාතන්ත්‍රීයකරණය හා බලය විමධ්‍යගත කිරීමේ ප්‍රවණතාවයද පංගු ක්‍රම නීතිය සාර්ථක වීමට බලපා තිබේ. උදාහරණ ලෙස බ්‍රසීලයේ දේශපාලන පක්ෂවල අඩු ප්‍රජාතන්ත්‍රවාදී ස්වභාවය දැක්විය හැකිය. එරට 30% ක පංගුවක් නාමයෝජනා ලැයිස්තුවලින් ස්ත්‍රීන් සඳහා ව්‍යවස්ථාපිතව වෙන්කර තිබුණද ජාතික ව්‍යවස්ථාදායකයේ ස්ත්‍රී නියෝජනය 9% (2011) පමණ වේ. එයට බලපෑ මූලික හේතු කීපයකි. ඒවා නම් විවෘත නාම යෝජනා ලැයිස්තු ක්‍රමය අනුගමනය කිරීම, නීතියට අනුකූල නොවන නාමයෝජනා ප්‍රතික්ෂේප කිරීමේ බලයක් මැතිවරණ නිලධාරීන්ට නොලැබීම හා දේශපාලන පක්ෂ සම්ප්‍රදායික පුරුෂ කේන්ද්‍රීය බල ව්‍යූහයක් මත කටයුතු කිරීමයි. ඒ නිසා බ්‍රසීලයේ දේශපාලන පක්ෂ සැබෑ ස්ත්‍රී-පුරුෂ සමානාත්මතාවය පිළිගැනීම වෙනුවට, හුදෙක් ස්ත්‍රීන්ගේ නම් කීපයක් නාමයෝජනා ලැයිස්තුවේ අගට උපහාසාත්මකව එක් කිරීම පමණක් ප්‍රායෝගිකව කරගෙන යයි.

සමහර ලතින් අමෙරිකානු රටවල ප්‍රමාණාත්මක ස්ත්‍රී නියෝජනය හරහා ගුණාත්මක නියෝජනයේ වර්ධනයක් සිදුවිය. ඒ සඳහා බලපාන ලද තවත් විශේෂ සාධකයක් වූයේ රාජ්‍ය ස්ත්‍රීවාදයයි. රාජ්‍ය විසින් ස්ත්‍රීන්ගේ තත්වය නංවාලීමේ අරමුණින් විශේෂිත යාන්ත්‍රණ පිහිටුවීම හා ස්ත්‍රීන්ට අදාළ නීති හා ප්‍රතිපත්ති සම්පාදනය, ක්‍රියාත්මක කිරීම හා නිරීක්ෂණය කිරීමේදී එම ආයතනවලින් ඉටුවූ මෙහෙය මෙහිදී වඩාත් වැදගත් වේ. ලතින් අමෙරිකානු රටවල් 17 ක පමණ එබඳු ජාතික යාන්ත්‍රණ පිහිටුවා ඇතත් ඒවායේ ඵලදායි බව විවිධය. ආර්ජන්ටිනාව, කොස්ටරිකා හා බොලීවියා යන රටවල ජාතික ස්ත්‍රී කවුන්සිලය හෝ ජාතික ස්ත්‍රී ආයතන පිහිටුවා ඇත්තේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධාන හෝ පාර්ලිමේන්තුවෙන් සම්මත කරගත් නීතියකට අනුවය. එහෙයින් එම රටවල ප්‍රමාණවත් සම්පත් හා නිලධාරීන් සහිතව, ස්ථාවර තත්වයකින් මේ ආයතන ක්‍රියාත්මක වේ. නමුත් අනෙක් බොහොමයක් ලතින් අමෙරිකානු රටවල (බ්‍රසීලය,

කොලොම්බියා, පේරු, උරුගුවේ හා වෙනිසියුලා) එම ආයතන පිහිටුවා ඇත්තේ ජනාධිපතිගේ ආඥාවක් මතය. එබඳු රටවල, ජනාධිපති වෙනස්වීමත් සමඟ බොහෝ විට එම ආයතනයද, එයට ලැබුණු සම්පත් ද වෙනස් වේ. එසේම ඒවාට කළහැකි බලපෑම ද මේ දෑ මත වෙනස් වේ. එක්කෝ එම ආයතන ජාත්‍යන්තර ප්‍රතිපාදන මත රඳා පවතී. එම ප්‍රතිපාදන අවසාන වීමත් සමඟ එම ආයතනවල ක්‍රියාකාරිත්වයද හුදෙක් නාමික තත්වයට පත්වේ. එම අත්දැකීම්වලින් පැහැදිලි වන්නේ පංගු ක්‍රම නීතියෙන් අපේක්ෂිත ප්‍රතිඵල දිනා ගැනීමට නම් රාජ්‍ය ආයතනවල උනන්දුව හා කැපවීම, විශේෂයෙන්ම අදාළ නීති සම්පාදනයට, ඒවා නිසිලෙස ක්‍රියාත්මක කරවීමට හා නිරීක්ෂණයට දක්වන රාජ්‍ය දායකත්වය අත්‍යවශ්‍ය බවයි. එයින් හැඟෙන්නේ, ස්ත්‍රී නියෝජනය වර්ධනය සඳහා රාජ්‍යයේ අව්‍යාජ දේශපාලන කැමැත්ත හා උනන්දුව අත්‍යවශ්‍ය සාධකයක් බවයි.

පංගු ක්‍රමය ව්‍යවස්ථානුකූලව ස්ථාපිත කිරීමෙන් පමණක් ධනාත්මක ප්‍රතිඵල ලබාගත නොහැක. ලතින් අමෙරිකානු අත්දැකීම්වලින් පැහැදිලි වන්නේ දේශපාලන නියෝජිතායතනවලට තෝරා ගන්නා ස්ත්‍රීන් හා අදාළ පරිපාලන නායකයින් සැබෑ ලෙසම ස්ත්‍රීන්ගේ අවශ්‍යතා නියෝජනය කළහොත් පමණක්, ස්ත්‍රී නියෝජනයේ ප්‍රමාණාත්මක වර්ධනය ගුණාත්මක වර්ධනයක් බවට පත් කරගත හැකි බවයි. එසේම ස්ත්‍රී ව්‍යාපාර ශක්තිමත් හා විධිමත් අයුරින් පංගු ක්‍රමය දිනා- ගැනීමට පමණක් නොව එය නිසිලෙස ක්‍රියාත්මක කරවා ගැනීමටත් ප්‍රමාණවත් බලපෑමක් කිරීම අත්‍යවශ්‍ය බැව් එම රටවල අත්දැකීම්වලින් පෙන්වා දෙයි. ස්ත්‍රී ව්‍යාපාර ඒ සඳහා උනන්දුවක් නොදක්වන හා කැපවීම් නොකරන අවස්ථාවලදී, පංගු ක්‍රම නීතිය හඳුන්වා දීමෙන් පමණක්, ස්ත්‍රී නියෝජනය වර්ධනය කරගත නොහැකි බැව් බොහොමයක් ලතින් අමෙරිකානු රටවල අත්දැකීම්වලින් ප්‍රකාශ වේ. (Vargas, 2002).

අප්‍රිකානු හා අරාබි රටවල අත්දැකීම්

පශ්චාත් යුද වාතාවරණයක් පවතින අප්‍රිකානු රටවල් කීපයකම ස්ත්‍රී නියෝජනය වර්ධනය සඳහා පංගු ක්‍රම නීති හඳුන්වා දී තිබේ. ඒ අතරින් රුවන්ඩා, දකුණු අප්‍රිකාව, උගන්ඩාව, සුඩානය, කෙන්යාව, ටැංසානියාව, ඉරාකය හා මොරොක්කෝ වැනි රටවල් ප්‍රමුඛ වේ. අන්තර් පාර්ලිමේන්තු සංගමයේ දත්ත එකතුවට අනුව 2012 වනවිට ලොව ස්ත්‍රී නියෝජනයේ ඉහළම ප්‍රතිශතය දිනාගෙන ඇත්තේ රුවන්ඩාවයි (56.3%). දකුණු අප්‍රිකාව 7 වැනි ස්ථානය දිනාගෙන ඇති අතර එරට ප්‍රතිශතය 42.3% කි. මොසැම්බික් ලොව 12 වැනි ස්ථානය දිනාගෙන ඇත. එරට ප්‍රතිශතය 39.2% කි. උගන්ඩාවේ ප්‍රතිශතය 35.0% ක් වන අතර ලොව 19 වැනි ස්ථානය හිමිකර ගෙන සිටී. ඉරාකයේ එම ප්‍රතිශතය 25.2% කි (www.ipu.org-2012). සුඩානයේ 24.6% කි. මොරොක්කෝව ද ලෝක පාර්ලිමේන්තු අතර ස්ත්‍රී නියෝජනය සම්බන්ධයෙන් 77 වැනි ස්ථානය දිනාගෙන ඇත. එරට ප්‍රතිශතය 17.0% කි. එය අරාබි රටවල සමස්ත ප්‍රතිශතය වූ 11.7% ට වඩා බෙහෙවින් වැඩි අගයක් ගැනීම විශේෂ කරුණකි. පංගු ක්‍රම නීතියෙන් අප්‍රිකානු රටවල් ලබා ඇති ප්‍රතිඵල හා අත්දැකීම් ද විවිධය.

සමහර අප්‍රිකානු රටවල විශේෂයෙන්ම යුදකාලීන වාතාවරණ තුළ ස්ත්‍රී ව්‍යාපාර ශක්තිමත් විය. ස්ත්‍රී දූෂණ, මිනිස් ඝාතන, දිළිඳු බව, විරැකියාව, සහ මන්ද පෝෂණය හා අඩු අධ්‍යාපන පහසුකම් වැනි දරුවන් මුහුණ දෙන ගැටළු ආදිය නිසා ඔවුහු පෙරට වඩා විධිමත්ව සංවිධානය වී තීරණ ගන්නන්ට බලපෑම් කිරීමට යුද සමයන් තුළදී පටන් ගත්හ. යුද ගැටුම් නිමාවත් සමඟ, මෙම රටවල් නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සම්පාදනය ආරම්භ කරද්දී, එක්සත් ජාතීන්ගේ සංවිධානය වැනි ජාත්‍යන්තර සංවිධාන හා බලවත් විදේශීය රටවල් වඩාත් ප්‍රජාතන්ත්‍රවාදී ව්‍යවස්ථා නිර්මාණය කිරීම සඳහා බලපෑම් කළහ. එසේම, සමහර ස්ත්‍රී සංවිධාන හා ක්‍රියාකාරීන් මැතිවරණ ක්‍රම විමර්ෂනය කොට, නව මැතිවරණ ක්‍රම හරහා ස්ත්‍රී නියෝජනය

වර්ධනයට අදාළ යෝජනාවලී සකසා ඉදිරිපත් කළහ. තවත් සමහර රටවල්, ස්ත්‍රී නියෝජනය වර්ධනයට ව්‍යවස්ථානුකූලව ඉඩප්‍රස්ථා ලබාදීමෙන්, එම රටවල ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන ක්‍රම පිළිබඳ යහපත් ප්‍රතිරූපයක් ජාත්‍යන්තරය තුළ නිර්මාණය වන නිසා පංගු ක්‍රම නීතිවලට මුල්තැන දුන්හ. එසේම, සමහර රටවල් ජාත්‍යන්තර ආධාර ලබා ගැනීමේ අරමුණින්ද ව්‍යවස්ථානුකූල පංගු ක්‍රම හඳුන්වා දුන්හ.

අප්‍රිකානු රටවල් අතරින් රුවන්ඩාව හා උගන්ඩාව වැනි රටවල් පංගු ක්‍රම නීති ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අන්තර්ගත කළ අතර, සුඩානය වැනි රටවල් මැතිවරණ නීති මගින් නාමයෝජනා ලැයිස්තු වලින් ස්ත්‍රීන් සඳහා පංගුවක් නියම කළේය. දේශපාලන පක්ෂ වල අභ්‍යන්තර නීති හා ප්‍රතිපත්ති සංශෝධනය කොට මැතිවරණ නාමයෝජනාවලින් ස්ත්‍රීන්ට පංගුවක් නියම කිරීම දකුණු අප්‍රිකාව හා මොසැම්බික් වැනි රාජ්‍ය විසින් අනුගමනය කරන ලදී.

ඊජිප්තුවේ අන්වර් සදාත් ආණ්ඩුව විසින් ජනාධිපති ආඥාවක් මගින් 1979 දී පාර්ලිමේන්තුවේ ආසන 30 ක් (335 මුලු ආසන) ස්ත්‍රීන් සඳහා වෙන් කරන ලදී. සදාත් සිය බිරිඳ සමඟ සුඩානයට ගිය අවස්ථාවේදී එරට පැවති පංගු ක්‍රම නීතිය පිළිබඳ දැනුවත් විය. පසුව ඒ පිළිබඳව උනන්දුවක් දක්වා ඊජිප්තුවටද එයට සමාන ක්‍රමයක් හඳුන්වා දුනි. 1987 එම නීතිය වෙනස් කොට දේශපාලන පක්ෂ ඉදිරිපත් කරන නාමයෝජනා ලැයිස්තුවලින් 10% ක ප්‍රතිශතයක් ස්ත්‍රීන් සඳහා වෙන්කිරීම ආරම්භ කළේය. ඒ සමගම ජනාධිපති විසින් ස්ත්‍රීන් 10 දෙනෙකු පාර්ලිමේන්තුවට පත් කිරීමද ආරම්භ කෙරිණි. නමුත් මෙම නීතියේ ප්‍රතිඵලයක් ලෙස ඊජිප්තුවේ ස්ත්‍රී නියෝජනය ප්‍රමාණාත්මකව හෝ ගුණාත්මකව සැලකිය යුතු ආකාරයෙන් වර්ධනය වීමක් සිදුනොවූ බැව් සමහර අධ්‍යයනවලින් පෙන්වා දී තිබේ (ABU-zayd, 1998).

මොරොක්කෝ පාර්ලිමේන්තුවේ ආසන 325 ට නියෝජිතයින් තෝරා ගන්නේ සරල බහුතර මැතිවරණ ක්‍රමයෙනි. එයින් 295 ක්

ජාතික මට්ටමේ ඡන්ද කොට්ඨාශ පදනමකින්ද, ඉතිරි 30 ස්ත්‍රීන් පමණක් ඇතුළත් ලැයිස්තුවලට අනුවද තෝරා ගැනේ. 2002 මහ මැතිවරණයේදී මෙම වෙන් කළ ආසන 30 ට අමතරව, පොදු ආසනවලින්ද ස්ත්‍රීන් 5 දෙනෙකු තේරී පත්විය. ඒ අනුව පාර්ලිමේන්තු නියෝජනය 10.8% ක් විය. 2011 නොවැම්බර් මැතිවරණයේදී එම සංඛ්‍යාව 67 (17.0%) දක්වා වර්ධනය විය.

2001 දී **ජෝර්දානයේ** මැතිවරණ නීති වෙනස්කොට පාර්ලිමේන්තුවේ පහළ මණ්ඩලයේ ආසන 110 න් 6 ක් ස්ත්‍රීන් සඳහා වෙන් කළේය. ස්ත්‍රීන්ට වෙන් කළ ආසනවලින් වැඩිම ඡන්ද ලබාගත් අපේක්ෂිකාව ජෝර්දාන රජු විසින් පාර්ලිමේන්තු නියෝජිතවරියක ලෙස පත්කරනු ලැබේ. මෙම නීතිය නිසා 2003 මැතිවරණයේදී ජෝර්දාන් පාර්ලිමේන්තුවට ස්ත්‍රීන් 6 දෙනෙකු (5.0%) තේරී පත්විය. 2010 නොවැම්බර් මැතිවරණයේදී එම සංඛ්‍යාව 13 (10.8%) දක්වා වර්ධනය විය (Norris, n.d).

රුවන්ඩා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 9(4) වගන්තියට අනුව තීරණ ගන්නා මට්ටමේ ආයතනවල අවම වශයෙන් 30% ක් වත් ස්ත්‍රීන් නියෝජනය වියයුතුය. ඒ අනුව පාර්ලිමේන්තුවේ පළමු මණ්ඩලයේ නියෝජිතයින් 80 දෙනාගෙන් 24 ක් හා දෙවැනි මණ්ඩලයේ 20 දෙනාගෙන් 6 දෙනෙකු ස්ත්‍රීන් වියයුතුය. පශ්චාත් ගැටුම් වාතාවරණය තුළ රුවන්ඩා ස්ත්‍රීහු නව ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සම්පාදනය සඳහා විවිධ අයුරින් බලපෑම් කළහ. ව්‍යවස්ථා සම්පාදනයෙන් පසුව පැවති ප්‍රථම මැතිවරණයේදී, ස්ත්‍රීන්ට වැඩි ඡන්ද දිනා ගැනීමේ අරමුණින් ඡන්දදායකයින් දැනුවත් කිරීමේ ව්‍යාපාර ස්ත්‍රී සංවිධාන හා රාජ්‍ය විසින් සංවිධානය කරන ලදී. රුවන්ඩා සාම ගිවිසුම් අත්සන් කරද්දී ද ස්ත්‍රීහු සෘජුව එම සාකච්ඡාවලට සහභාගී වී ඔවුන්ගේ අත්දැකීම් හා අවශ්‍යතා නියෝජනය කළහ. ප්‍රථම මැතිවරණයේදී මෙම ස්ත්‍රීහු, ස්ත්‍රියකට ඡන්දය දියයුත්තේ මන්ද යන්න පිළිබඳව ඡන්දදායකයින්ව දැනුවත් කිරීමට මූලිකත්වය ගත්හ. මීට අමතරව, එක්සත් ජාතීන්ගේ ස්ත්‍රී සංවර්ධන අරමුදල (UNIFEM)

රුවන්ඩාව යළි ගොඩනැගීමේ කටයුතු වලදී විශාල වශයෙන් සහයෝගය දක්වමින්, ප්‍රථම මැතිවරණයට ඉදිරිපත් වූ ස්ත්‍රීන්ට විවිධ අයුරින් ආධාර කළේය. මේවායේ ප්‍රතිඵලයක් ලෙස රුවන්ඩා ව්‍යවස්ථාදායකයේ පහළ මණ්ඩලයේ නියෝජිතයින් 80 න් 24 (30.0%) ක් හා දෙවැනි මණ්ඩලයේ නියෝජිතයින් 20 න් 6 ක් (30.0%) ස්ත්‍රීන් තේරී පත්විය. 2012 අන්තර් පාර්ලිමේන්තු සංගමයේ දත්ත එකතුවට අනුව පළමු මණ්ඩලයේ ස්ත්‍රීන් 45 (56.3%) ක් හා දෙවැනි මණ්ඩලයේ ස්ත්‍රීන් 10 (50.0%) ක් ස්ත්‍රීන් නියෝජනය වේ (http://www.ipu.org).

රුවන්ඩාවේ ස්ත්‍රී නියෝජනයේ ප්‍රමාණාත්මක පමණක් නොව ගුණාත්මක වර්ධනයක් ද සිදුවී ඇති බව විවිධ අධ්‍යයනවලින් පෙන්වා දී තිබේ. ස්ත්‍රීන් මුහුණ දෙන දිළිඳුකම හා විරැකියාව, දරුවන් මුහුණු දෙන මන්දපෝෂණය, අධ්‍යාපනය හා සෞඛ්‍ය පහසුකම් ප්‍රමාණවත් නොවීම ආදී ගැටළු විසඳා ගැනීමේදී රුවන්ඩා පාර්ලිමේන්තු නියෝජිතවරියන් මූලිකත්වය ගැනීම විශේෂත්වයකි. තීරණ ගන්නා මට්ටම්වල කටයුතුවලට මෙම නියෝජිතවරියන් සහභාගී වීමෙන් වැඩිම වාසි ලබන්නේ ස්ත්‍රීන් හා දරුවන් බැව්, එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මහ ලේකම්ව සිටි කොෆී අනන් විසින් වරක් ප්‍රකාශ කරනු ලැබ තිබීම එම විශේෂත්වය වඩාත් අවධාරනය කරයි. තවද, ස්ත්‍රීන්ගේ නායකත්ව වර්ධනය, බල ගැන්වීම හා ආත්ම විශ්වාසය වර්ධනය වීමත් පංගු ක්‍රමය නිසා ලද යහපත් ප්‍රතිඵල ලෙස ප්‍රකාශ කෙරේ. රුවන්ඩාවේ මෙම යහපත් ප්‍රතිඵල, දකුණු අප්‍රිකාව හා මොසැම්බික් වැනි රටවල ස්ත්‍රී නියෝජනය වර්ධනය සඳහා පංගු ක්‍රම හඳුන්වා දීමට බෙහෙවින් බලපෑම් කර තිබේ.

ඉරාකයේද පශ්චාත්-යුද කාලීන වාතාවරණය තුළ නව ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සම්පාදනයට ස්ත්‍රීහු ද බලපෑම් කළහ. එහිදී ව්‍යවස්ථානුකූලව ස්ත්‍රී නියෝජනය තහවුරු කළයුතු බවට ඉරාක ස්ත්‍රීන් මෙන්ම ජාත්‍යන්තර සංවිධානද ඉල්ලා සිටියහ. එහි ප්‍රතිඵලයක් ලෙස, නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ ස්ත්‍රී නියෝජනය 25%

කට වඩා අඩු නොවිය යුතුය යන විධිවිධානය ඉරාක නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 49 වැනි වගන්තියට අන්තර්ගත කෙරිණි. දැනට ඉරාක පාර්ලිමේන්තුවේ නියෝජිතයින් 325 දෙනා අතරින් 82 (25.2%) ක් ස්ත්‍රීන් වේ.

අප්‍රිකානු රටවල් අතරින් ස්ත්‍රී නියෝජනයේ රැඩිකල් වෙනසක් ප්‍රමාණාත්මකව මෙන්ම ගුණාත්මකවද සිදුවී ඇති රටක් ලෙස **දකුණු අප්‍රිකාව** සැලකිය හැකිය. 1996 ට පෙර එරට පැවති ඇපාර්තීඩ් ආණ්ඩුවේ ස්ත්‍රී නියෝජනය 2.8% ට සීමා විය. එහෙත් දකුණු අප්‍රිකාව, විශේෂයෙන්ම නෙල්සන් මැන්ඩෙලාගේ නායකත්වයෙන් 1990 මුල සිට යටත් විජිතවාදය හා ඇපාර්තීඩ් පාලනයට එරෙහිව අරගල කොට, 1994 දී ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුවක් ස්ථාපිත කිරීමත් සමඟ එම තත්වය වෙනස් විය. 2009 අප්‍රියෙල් මැතිවරණයේදී එරට ස්ත්‍රී නියෝජනයේ ප්‍රතිශතය 42.3% දක්වා වර්ධනය වෙන ආකාරයේ රැඩිකල් වෙනසක් සිදුවිය. එහි ප්‍රතිඵලයක් ලෙස දකුණු අප්‍රිකාව ස්ත්‍රී නියෝජනයේ ඉහළ අගයක් ගන්නා රටවල් අතරින් හත්වෙනි තැනට පත් වූ අතර, එයට බලපෑ සුවිශේෂී කරුණු 2 කි. එකක් නම්, අප්‍රිකානු ජාතික කොංග්‍රසය (African National Congress) තුළ ජාතික නිදහස පතා එරට ස්ත්‍රීන් ක්‍රියාශීලි භූමිකාවක් රඟපෑමයි. දෙවැන්න නම්, එහි නායක නෙල්සන් මැන්ඩෙලා ප්‍රමුඛ අප්‍රිකානු ජාතික කොංග්‍රසය විසින් ස්ත්‍රී නියෝජනය වර්ධනය සඳහා හඳුන්වා දෙන ලද සාධනීය ප්‍රතිපත්ති හා ඒවා ක්‍රියාත්මක කිරීම සඳහා පිහිටුවන ලද යාන්ත්‍රණයයි. දකුණු අප්‍රිකානු කොංග්‍රස් නායක නෙල්සන් මැන්ඩෙලා පුද්ගලිකවත්, ප්‍රථම නිදහස් ආණ්ඩුවේ ජනාධිපති ලෙසත්, එරට ස්ත්‍රීන්ගේ අයිතිවාසිකම් සුරැකීම සහ සියලුම තීරණ ගන්නා මට්ටම්වලදී ස්ත්‍රීන්ගේ සක්‍රීය සහභාගිත්වය වර්ධනය කිරීම සඳහා දැක්වූ දේශපාලන උනන්දුව හා කැපවීම, විශේෂයෙන්ම පශ්චාත් යුදකාලීන රාජ්‍යවල දේශපාලන නායකයින්ට ඉතා හොඳ ආදර්ශයකි.

1996 දකුණු අප්‍රිකානු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සම්පාදනයේදී, එරට ස්ත්‍රීන්, විශේෂයෙන්ම ස්ත්‍රීන්ගේ ජාතික සභාග ව්‍යාපාරය (Women's National Coalition Campaign) දැඩි ලෙස බලපෑම් කොට ස්ත්‍රීන්ගේ අයිතිවාසිකම් නව ව්‍යවස්ථාවට අන්තර් ගත කරවා ගැනීම සඳහා මූලිකත්වය ගත්තේය. 1994, දකුණු අප්‍රිකානු ජාතික කොංග්‍රසයේ මූලිකත්වයෙන් පිහිටු වූ ජාතික සමගි ආණ්ඩුව ස්ත්‍රීන්ගේ ජීවන තත්වය හා නායකත්වය වර්ධනය කිරීමට විවිධ පියවර ගත්තේය. දකුණු අප්‍රිකාව යළි ගොඩනැංවීම හා සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිවලදී පාලක අප්‍රිකානු කොංග්‍රසය නිරන්තරයෙන්ම පාර්ලිමේන්තු නියෝජිතවරියන්ගේ උපදෙස් ලබාගත් අතර, අදාළ කමිටුවලට ස්ත්‍රීන් තෝරා පත්කළේය. ස්ත්‍රීන් බලගැන්වීමේ ව්‍යාපෘතියක් වෙනමම ක්‍රියාත්මක කිරීම 1994 සිට ආරම්භ කළේය. 1995 දී ස්ත්‍රීන් බලගැන්වීම සඳහා වන ප්‍රතිපත්තියක් හඳුන්වා දී ආණ්ඩුවේ සියලුම අංශවල කටයුතුවලදී ස්ත්‍රී සහභාගීත්වය සහතික කළේය. 1995 දී දකුණු අප්‍රිකානු පාර්ලිමේන්තු මන්ත්‍රීවරියන්, එරට රාජ්‍ය නොවන සංවිධානද සමඟ එක්ව ස්ත්‍රීන් පිළිබඳ වාර්තාවක් සම්පාදනය කොට, බෙයිජිං ජාත්‍යන්තර ස්ත්‍රී සමුළුවේදී එය එක්සත් ජාතීන්ගේ සංවිධානයට ඉදිරිපත් කළේය. එහිදී හඳුනාගත් දිළිඳුකම, සම්පත් අසමාන ලෙස බෙදී යාම, ස්ත්‍රීන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය, අධ්‍යාපන හා සෞඛ්‍ය පහසුකම් ප්‍රමාණවත් නොවීම හා විරැකියාව වැනි ස්ත්‍රීන් මුහුණු දෙන ප්‍රධාන ප්‍රශ්න විසඳීම සඳහා දකුණු අප්‍රිකානු රජයේ පමණක් නොව ජාත්‍යන්තර සංවිධානවලද අවධානය දිනා ගත්තේය. බෙයිජිං සමුළුවෙන් පසුව දකුණු අප්‍රිකානු ස්ත්‍රීන්ගේ තත්වය වර්ධනය සඳහා වන වැඩ සැලැස්මක් නිර්මාණය කොට එය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය යාන්ත්‍රණයක් ස්ථාපිත කළේය. ස්ත්‍රීන්ට අදාල කටයුතු විමර්ශනය සඳහා උප-ජනාධිපති කාර්යාලයට සම්බන්ධව ජාතික ස්ත්‍රී කමිටුවක් පිහිටුවීය. එහි ශාඛා පළාත් මට්ටමින් පිහිටුවා, අදාළ කටයුතුවලදී උපදෙස් දීම හා නිරීක්ෂණයද විධිමත් අයුරින් ආරම්භ කළේය.

1997 දී පාර්ලිමේන්තු පණතක් මගින් ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය

සමානාත්මතාවය සඳහා වන ජාතික කොමිසම පිහිටුවීය. මානව අයිතිවාසිකම් කොමිසම හා ජාතික ප්‍රොක්ටර් කාර්යාලයද ස්ත්‍රීන්ගේ අයිතිවාසිකම් ආරක්ෂාව හා ප්‍රවර්ධනය සම්බන්ධයෙන් විශේෂ භූමිකාවක් රඟපෑමට මූලිකත්වය ගත්තේය. මේ අයුරින් ස්ත්‍රීන්ගේ ජීවිතවල ගුණාත්මක වෙනසක් කිරීමට ස්ත්‍රී ව්‍යාපාරයේ නායිකාවන් මෙන්ම පාර්ලිමේන්තු මන්ත්‍රීවරියන් මූලිකත්වය ගැනීම ළදරු ප්‍රජාතන්ත්‍රවාදී රටක් වූ දකුණු අප්‍රිකාව සම්බන්ධයෙන් සුවිශේෂය.

දකුණු අප්‍රිකානු ජාතික කොංග්‍රස් පක්ෂයේ අභ්‍යන්තර ප්‍රතිපත්ති සංශෝධනය කොට මැතිවරණ නාමයෝජනාවලින් 33.3% ක පංගුවක් ස්ත්‍රීන්ට වෙන්කිරීම නිසා, ප්‍රථම නිදහස් ආණ්ඩුවට තේරී පත්වූ නියෝජිතවරියන් මෙම වෙනස්කම් සඳහා ඉතා හොඳ පදනමක් සැපයීය. ප්‍රථම දකුණු අප්‍රිකානු පාර්ලිමේන්තුවට තේරී පත්වුනු ස්ත්‍රීන් 117 න් 89 ක්ම දකුණු අප්‍රිකානු ජාතික කොංග්‍රසයෙන් නියෝජනය වීම මෙම කරුණ සම්බන්ධයෙන් එම පක්ෂයේ කැපවීම මැනවින් විදහා දක්වයි. ජාතික මැතිවරණ සඳහා ස්වේච්ඡා පංගු ක්‍රමය හඳුන්වා දුන් දකුණු අප්‍රිකානු කොංග්‍රසය එහි ආණ්ඩු බලය පාවිච්චි කර මහනගර සභා පණත සම්මත කළේය. සියලුම පක්ෂ පළාත් පාලන මැතිවරණවලට ඉදිරිපත් කරන නාමයෝජනා ලැයිස්තුවලින් 50% ක් ස්ත්‍රීන් සඳහා වෙන්කළ යුතුය යන ව්‍යවස්ථාපිත පංගු ක්‍රමය එම පනත මගින් ස්ථාපිත කළේය (Myakayaka-Manozini, 1998).

එම පණතේ H(3) වගන්තියට අනුව ''සියලුම පක්ෂ ඉදිරිපත් කරන නාමයෝජනා ලැයිස්තුවලින් 50% ක් ස්ත්‍රීන් බව තහවුරු කළ යුතුය. ලැයිස්තුව පුරාම ස්ත්‍රීන් හා පුරුෂයන් සමතුලිතව ස්ථානගත කළයුතුය'' නමුත් මෙම නීතිය නොසලකා හරින පක්ෂවලට දියයුතු දඬුවම පිළිබඳ නීතියෙන් ප්‍රකාශ නොවේ. දකුණු අප්‍රිකාවේ ජාතික මට්ටමේ නියෝජනයට ව්‍යවස්ථානුකූල පංගුවක් නියම කර නැතත් පළාත් පාලන ආයතන සඳහා මේ අයුරින් පංගු ක්‍රම නීතිය හඳුන්වා දී තිබේ. එරට පළාත් පාලන මැතිවරණ වලදීද නියෝජිතයින්ගෙන්

අඩක් සරල බහුතර ක්‍රමය හා අනෙක් අඩ සමානුපාතික නියෝජන ක්‍රමයට අනුව තෝරා ගනී. දකුණු අප්‍රිකානු පළාත් පාලන ආයතනවල ස්ත්‍රී නියෝජනය 1995 දී 29.6%, 2000 - 40% හා 2006 - 43% දක්වා වර්ධනය වීමට පංගු ක්‍රමයත්, නියෝජන ක්‍රමයත්, දකුණු අප්‍රිකානු කොංග්‍රස් නායකත්වයේ උනන්දුව හා කැපවීමත්, එහි ප්‍රජාතන්ත්‍රවාදී ප්‍රතිපත්තිත් මූලික වශයෙන් බලපා ඇත.

නීත්‍යානුකූල පංගු ක්‍රමයක් ජාතික මට්ටමේදී භාවිතා නොවුනත්, දකුණු අප්‍රිකානු කොංග්‍රසය හඳුන්වා දුන් ස්වේච්ඡා පංගු ක්‍රමය නිසා, 1994 දී ජාතික ව්‍යවස්ථාදායකයේ ස්ත්‍රී නියෝජනය 27.75%, 1999 - 30%, 2004 - 32.75% හා 2009 දී 42.3% දක්වා රැඩිකල් අකාරයෙන් වර්ධනය විය. ප්‍රාන්ත ව්‍යවස්ථාදායකවල ස්ත්‍රී නියෝජනය ඒ හා සමානව වර්ධනය නොවුනත් පොදුවේ සමස්ත නියෝජනයේ වර්ධනයක් සිදුවෙමින් පවතී. එම ප්‍රතිශතය 1994 දී 27.1%, 1999 - 32.2% හා 2009 දී 41% ක් විය. කිසිදු ප්‍රාන්ත ව්‍යවස්ථාදායකයක 35% ට අඩු ස්ත්‍රී නියෝජනයක් නොමැත (Morna, Rama, Mtonga, 2009).

දකුණු අප්‍රිකානු කොංග්‍රසසේ බහුතර බලය ඇති ප්‍රාන්ත 4 ක (ගවුටෙන්ග් - Gauteng නැගෙනහිර කේප්, උතුරු කේප් හා වයඹ කේප්) අගමැති තනතුරුවලට 2009 දී ස්ත්‍රීන් පත් කළේය. එම ප්‍රතිපත්තිය අනුගමනය කරමින්, ප්‍රජාතන්ත්‍රවාදී පෙරමුණ ආණ්ඩු බලය දරන බටහිර කේප් ප්‍රාන්තය විසින්ද 2009 දී එහි අගමැති තනතුරට ස්ත්‍රියක් පත්කරන ලදී. අප්‍රිකානු ජාතික කොංග්‍රසය, 2009 පක්ෂ වාර්ෂික සමුළුවේදී ප්‍රතිඥාවක් දෙමින් 2010 වනවිට දකුණු අප්‍රිකානු ව්‍යවස්ථාදායකයේ ස්ත්‍රීන්ගේ නියෝජනය 50% දක්වා වර්ධනය කිරීමට පියවර ගන්නා බව ප්‍රකාශ කළේය. 2009 දී ව්‍යවස්ථාදායකය නියෝජනය කරන මුළු ස්ත්‍රීන් සංඛ්‍යාවෙන් 48.3% ක් අප්‍රිකානු කොංග්‍රසයේ නියෝජිතවරියන් වීම එහිදී සුවිශේෂී වේ. අනෙක් දකුණු අප්‍රිකානු පක්ෂ ජාතික මැතිවරණවලදී ස්වේච්ඡා පංගු ක්‍රම හඳුන්වා නොදුන්නද, ජාතික කොංග්‍රසයේ බලපෑම වෙනත්

ආකාරවලින් ඒවාට එල්ල විය. 2006 දී දකුණු අප්‍රිකානු ස්ත්‍රීන් 50:50 අයිතිවාසිකම් සඳහා උද්ඝෝෂණ ව්‍යාපාරය දියත් කළ අතර, ඉන්පසු මැතිවරණවලදී අනෙක් පක්ෂ විසින්ද 20-30% අතර ප්‍රමාණයකින් ස්ත්‍රීන්ට ලබාදෙන නාමයෝජනා වැඩිකරන ලදී. එසේම එම බලපෑම් නිසා අනෙක් පක්ෂ, අප්‍රිකානු කොංග්‍රසය අනුගමනය කරමින්, ස්ත්‍රී පක්ෂ කෝකස පිහිටුවූ අතර, පක්ෂ අභ්‍යන්තර තනතුරුවලින් 30% ක් පමණ ස්ත්‍රීන්ට ලබාදීමේ ප්‍රතිපත්ති ද හඳුන්වා දුනි. 2009 දී ජනතා කොංග්‍රස් පක්ෂය පක්ෂ තනතුරුවලින් 50% ක් ස්ත්‍රීන්ට ලබාදීම ද එම බලපෑම්වල ප්‍රතිඵලයක් ලෙස හඳුන්වා දිය හැකිය. තවද, දකුණු අප්‍රිකානු සංවර්ධන ප්‍රජාව පක්ෂය, 2015 දී ජාතික ව්‍යවස්ථාදායකයට සිය පක්ෂයෙන් නියෝජනය වන ස්ත්‍රීන්ගේ ප්‍රතිශතය 50% දක්වා වර්ධනය කරන බවට ප්‍රතිඥා දුනි.

2009 අප්‍රියෙල් මැතිවරණයේදී දකුණු අප්‍රිකානු පාර්ලිමේන්තුවේ පළමු මණ්ඩලයේ නියෝජනයට ස්ත්‍රීන් 169 (42.3%) ක් (මුලු නියෝජිතයින් 400) තේරී පත්විය. දෙවැනි මණ්ඩලයේ නියෝජිතයින් 53 දෙනාගෙන් 17 (32.10%) ක් ස්ත්‍රීහු වෙති (http://www.ipu.org). මෙම සංඛ්‍යාත්මක වර්ධනය හරහා ගුණාත්මක වර්ධනයක් ඇති කිරීමට දකුණු අප්‍රිකානු පාර්ලිමේන්තු මන්ත්‍රීවරියෝ බෙහෙවින් දායක වෙති. මුල් වසර පහ තුළ ස්ත්‍රීන් සඳහා වෛද්‍ය මධ්‍යස්ථාන 268 ක්, විශේෂයෙන්ම ග්‍රාමීය ප්‍රදේශවල ස්ථාපිත කිරීම, සෞඛ්‍ය මධ්‍යස්ථාන 2358 ක් ප්‍රතිසංස්කරණය කිරීම, ග්‍රාමීය පාසැල් 1497 ක් ප්‍රතිසංස්කරණය කිරීම, දිළිඳු දරුවන් මිලියන 5.5 ක් සඳහා පාසැල් දිවා ආහාර වේලක් සැපයීමේ ව්‍යාපෘති ආරම්භ කිරීම, වසර 1 ට වඩා වයසින් අඩු දකුණු අප්‍රිකානු දරුවන්ගෙන් 63.3% කට අදාළ ප්‍රතිශක්තිකරණ එන්නත් ලබාදීම, වසර 6 ට අඩු ළමුන් හා ගැබිණි මව්වරුන්ට නොමිලේ සෞඛ්‍ය සේවා ලබාදීමේ ව්‍යාපෘතියක් ඇරඹීම, මිලියන 2 ක පමණ ගම්වල පානීය ජල ව්‍යාපෘති ස්ථාපිත කිරීම, දිළිඳු පවුල් මිලියනයකට පමණ නිවාස තනාදීම, මිලියන 3.5 ක් පමණ වූ නාගරික ජනතාවට නගර සභා හරහා ජලය, විදුලිය හා කසළ එකතු

කිරීම වැනි පහසුකම් සලසා දීම සහ නිවාස 313,179 ට, ග්‍රාමීය පාසැල් 25,900 ක් හා සෞඛ්‍ය මධ්‍යස්ථාන 2000 කට විදුලිය ලබාදීම වැනි සේවා රාශියක් සැපයීමේදී මෙම නියෝජිතවරියෝ මූලිකත්වය ගත්හ. එසේම, ස්ත්‍රී අයිතිවාසිකම් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අන්තර්ගත කිරීම, ජාතික කාන්තා කොමිසම පිහිටුවීම, සීඩෝ සම්මුතිය අත්සන් කිරීම හා ලිංගික ප්‍රචණ්ඩත්වයට එරෙහි නීති සම්පාදනය වැනි කාර්යන්වලදීත් මෙම නියෝජිතවරියෝ විශේෂ දායකත්වයක් දැක්වූහ. එසේම ඔවුන්ගේ බලපෑමෙන් එම නීති හා ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමට අදාළ යාන්ත්‍රණ පිහිටුවීමට ආණ්ඩුවට බලපෑම් කිරීම, එම ආයතනවලට උපදෙස් දීම, අදාළ යෝජනා නිර්දේශ හා වාර්තා සපයමින් ආණ්ඩුවට සහයෝගය දැක්වීම සහ අදාළ ව්‍යාපෘති නිරීක්ෂණය හා ඇගයීම වැනි කටයුතුවලදීද මෙම නියෝජිතවරියන් සක්‍රීයව සහභාගි වීම දකුණු අප්‍රිකාව සම්බන්ධයෙන් සුවිශේෂී වේ (Myakayaka-Manzini, 1998).

නමුත් මෙම යහපත් ප්‍රතිඵල, පංගු ක්‍රම හඳුන්වා දුන් අප්‍රිකානු හා අරාබි රටවල් සියල්ලටම පොදු නොවේ. ඒවායේ සාර්ථකත්වයට බලපාන හේතු ගණනාවකි. පංගු ක්‍රමය හඳුන්වා දීමේදී මෙන්ම, ක්‍රියාත්මක කිරීමේදීත් ඒ සඳහා රාජ්‍යය, දේශපාලන පක්ෂ හා ස්ත්‍රී සංවිධාන සහ වෙනත් සිවිල් සංවිධානවලින්ද දැක්විය යුතු උනන්දුව හා කැපවීම එය සාර්ථක කර ගැනීමට අත්‍යවශ්‍යම කරුණකි. ජාත්‍යන්තර මෙන්ම දේශීය බලපෑම්ද නිසා සමහර රටවල පංගු ක්‍රම හඳුන්වා දුන්නත් දේශපාලන පක්ෂ එය නිසිලෙස ක්‍රියාත්මක කිරීමට උනන්දු නොවේ නම්, යහපත් ප්‍රතිඵල උදාකර ගත නොහැක. නීතියෙන් නියමිත නාමයෝජනා ප්‍රමාණය ස්ත්‍රීන්ට ලබා නොදෙන්නේ නම්, හෝ ජයගැනීමේ සම්භාවිතාවය අඩු ඡන්ද කොට්ඨාශ වලින් ස්ත්‍රීන්ට නාමයෝජනා ලබා දෙන්නේ නම් එයින් අපේක්ෂිත ප්‍රතිඵල දිනාගත නොහැකිය. එසේම, දේශපාලන පක්ෂවල නායකයින් ඥාති හිතවත් සබඳතා ඇති ස්ත්‍රීන්ට නාමයෝජනා ලබාදී ඔවුන් හුදෙක් පක්ෂයේ අවශ්‍යතාවය ඉටුකර ගැනීමට පමණක් යොදාගන්නේ නම්, එහිදීත් අපේක්ෂිත ප්‍රතිඵල දිනාගැනීම අසීරු වේ. දේශපාලන පක්ෂ

නිසිලෙස ස්ත්‍රීන්ට අදාළ ප්‍රමාණයෙන් නාමයෝජනා ලබා දෙන්නේද යන්න පිළිබඳව පරීක්ෂාකාරී වීමත්, එසේ සිදු නොවන අවස්ථාවල අදාළ බලධාරීන් ලවා එය ක්‍රියාත්මක කරවා ගැනීමට බලපෑම් කිරීමත් ස්ත්‍රී හා සිවිල් සංවිධාන මගින් ඉටුවිය යුතුය. මෙහිදී, අදාළ රාජ්‍යය ආයතන හෝ නිලධාරීන්, උදාහරණ වශයෙන් මැතිවරණ කොමිසම හෝ කොමසාරිස්වරයා සහ අධිකරණය වැනි ආයතන දේශපාලන පක්ෂ ලවා එම නීති ක්‍රියාත්මක කරවීම සඳහා අපක්ෂපාතී හා සාධාරණ අයුරින් බලපෑම් කළ යුතුය.

ස්ත්‍රීන් සඳහා ආසන වෙන් කිරීමේ නීතිය ක්‍රියාත්මක කිරීමේදී, මන්ත්‍රීවරියන් ඍජු ඡන්දයෙන් තෝරා ගත්තත්, වක්‍ර අයුරින් තෝරා පත් කළත්, රාජ්‍ය මෙන්ම දේශපාලන පක්ෂත් ස්ත්‍රීන්ගේ අවශ්‍යතා සැබෑ අයුරින් නියෝජනය කළහැකි පුද්ගලයින්ට අපේක්ෂකත්වය ලබා දීමට හෝ පත් කිරීමට වග බලා ගතයුතුය. ස්ත්‍රීන් වෙනුවෙන් හුදෙක්, පක්ෂයක හෝ ආණ්ඩුවේ නායකයකුගේ අනුගාමිකයින් පත්කිරීම වෙනුවට, පංගු ක්‍රමයෙන් අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීම සඳහා දායක විය හැකි අයෙකු පත් කළයුතුය. රාජ්‍ය මෙන්ම දේශපාලන පක්ෂද, දේශපාලනයට ආධුනිකයින් ලෙස පිවිසෙන ස්ත්‍රීන්ට දේශපාලන දැනුම, නායකත්ව පුහුණුව හා ප්‍රචාරක කටයුතුවලදී සහයෝගය ලබාදීම වැනි දෑ ප්‍රථම වතාවට පමණක් හෝ ලබාදීමට, විධිමත් වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කිරීමද අත්‍යවශ්‍ය වේ. මේ සඳහා ස්ත්‍රී හා සිවිල් සංවිධානවලටද දායකත්වය දැක්විය හැකිය. මැතිවරණයට ඉදිරිපත් කළහැකි අපේක්ෂිකාවන්ගේ නම් හා තොරතුරු එක්රැස්කොට අදාළ පක්ෂවලට ඉදිරිපත් කිරීම, ඔවුන්ට අවශ්‍ය දැනුම හා පුහුණුව ලබාදීම, ඒ ඒ පක්ෂවල ජ්‍යෙෂ්ඨ නායිකාවන් සමඟ සබඳතා ගොඩ නඟා ගැනීමට ඉඩප්‍රස්ථා නිර්මාණය කරදීම සහ ප්‍රචාරක කටයුතු වලදී සහයෝගය දැක්වීම ආදිය මගින් එසේ දායකත්වය දැක්විය හැකිය. පංගු ක්‍රම හඳුන්වා දීමේදී මෙන්ම ක්‍රියාත්මක කිරීමේදීත්, රාජ්‍ය, දේශපාලන පක්ෂ, සිවිල් සංවිධාන සහ දේශපාලන නියෝජනය කෙරේ උනන්දුව දක්වන ස්ත්‍රීන් පුද්ගලිකව මෙන්ම සාමූහිකවද එයින් අපේක්ෂිත ප්‍රතිඵල දිනා ගැනීමට දැඩි කැපවීමෙන් කටයුතු

නොකළහොත්, එය හුදෙක් තවත් නීතියක් පමණක් බවට පත්වේ. එහෙයින් පංගු ක්‍රමයෙන් අපේක්ෂිත ඵල නෙලා ගැනීම සඳහා ඒ සෑම අංශයකම සක්‍රීය දායකත්වය අත්‍යවශ්‍ය වේ.

පංගු ක්‍රම දිනා ගැනීම හා එයින් සාර්ථක ප්‍රතිඵල අත්පත් කරගැනීම සඳහා විවිධ රටවල් භාවිත කළ උපක්‍රම

සංවර්ධිත මෙන්ම සංවර්ධනය වන්නා වූ රටවල් රාශියකුත් විවිධ පංගු ක්‍රම හඳුන්වා දී ඇති අතර, ඒවායින් බොහොමයක් මේ වන විට අපේක්ෂිත ප්‍රතිඵල දිනාගෙන තිබේ. එම රටවල් පංගු ක්‍රම දිනා ගැනීම හා ඒවා සාර්ථකව ක්‍රියාත්මක කර ගැනීම සඳහා භාවිත කළ උපක්‍රම හඳුනා ගැනීම ශ්‍රී ලංකාව වැනි රටවලට ඉතා ප්‍රයෝජනවත් වේ. පසුගිය පරිච්ඡේදවලදී සාකච්ඡාවට බඳුන් කරන ලද රටවල් මේ සඳහා භාවිත කළ උපක්‍රම අතරින් වඩාත් ඵලදායි උපක්‍රම කීපයක් හඳුනා ගත හැකිය. ඒවා නම්

i. ජාත්‍යන්තර සංවිධාන හා බලවත් රටවල්වලින් සහයෝගය ලබාගැනීම සහ ඔවුන් ලවා දේශීය ආණ්ඩු වලට බලපෑම් කරවීම
ii. ජාත්‍යන්තර/කලාපීය ස්ත්‍රීවාදී හා ස්ත්‍රී ව්‍යාපාර සමඟ ජාතික ව්‍යාපාර ජාලගත වීම, අත්දැකීම් ලබාගැනීම, ආණ්ඩුවලට දේශපාලන පක්ෂවලට බලපෑම් කිරීම, ස්ත්‍රී නියෝජනය පිළිබඳ ප්‍රජාව දැනුවත් කිරීම සහ ස්ත්‍රීන්ගේ හැකියා වර්ධනයට සහයෝගය දැක්වීම
iii. රාජ්‍ය ස්ත්‍රීවාදය නැතිනම් ස්ත්‍රීන්ගේ තත්වය නඟා සිටුවීම සම්බන්ධ සංවේදී, තීරණ ගන්නා මට්ටමේ රාජ්‍ය පාර්ශවකරුවන් හා ස්ත්‍රීවාදී අදහස් අගයන පරිපාලන නිලධාරින්ගේ සහයෝගය ලබා ගැනීම
iv. දේශපාලන පක්ෂවල කැපවීම, උනන්දුව හා සහයෝගය ලබා ගැනීම සහ එම ගැටළුව පිළිබඳ සංවේදී නායකයින් සමඟ එක්ව කටයුතු කිරීම
v. ස්ත්‍රීන්ගේ දේශපාලන නියෝජනය සඳහා ආධාර කළහැකි විශේෂ ආයතන පිහිටුවා ගැනීම

ජාත්‍යන්තර බලපෑම්

දැනට ලොව රටවල් 90 කට වැඩි සංඛ්‍යාවක පංගු ක්‍රම හඳුන්වා දීමටත්, රටවල් 25 කට වැඩි සංඛ්‍යාවක ඒ පිළිබඳ සාකච්ඡා හා යෝජනා ආරම්භ කිරීමටත් ජාත්‍යන්තර සංවිධාන හා බලවත් රටවලින් ලද බලපෑම සුළුකොට තැකිය නොහැකිය. විශේෂයෙන්ම, එක්සත් ජාතීන්ගේ සංවිධානය, තීරණ ගැනීමේදී ස්ත්‍රී-පුරුෂ සමාන නියෝජනය පිළිබඳව 1975 පමණ සිට ජාත්‍යන්තර ස්ත්‍රී සමුළු හරහා අවධාරණය කිරීම බොහෝ රටවල පංගු ක්‍රම කතිකාවතකට මඟ පෑදුවේය. 1995 බෙයිජිං ක්‍රියාකාරී වැඩ සැලැස්මෙන්, ස්ත්‍රීන්ට ද පුරුෂයන්ට සමාන අයුරින් තීරණ ගන්නා මට්ටම්වලදී සහභාගි වීමට අවශ්‍ය නායකත්වය හා ධාරිතා වර්ධනය කිරීමේ අවශ්‍යතාවය පිළිබඳ අවධාරණය කිරීමෙන් එම ජාත්‍යන්තර බලපෑම තවත් තීව්‍ර විය (Krook, 2004). ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය පංගු ක්‍රම පිළිබඳව ලෝක අත්දැකීම් පිළිබඳ අධ්‍යයනයක යෙදෙන මෝනා ලීනා ක්රූක් (Mona Lena Krook) පවසන්නේ ''ලොව පංගු ක්‍රම ව්‍යාප්ත වීමට ජාතික ස්ත්‍රී ව්‍යාපාර, කලාපීය හෝ ජාතීන් අතර වන ස්ත්‍රී ව්‍යාපාර හා ජාත්‍යන්තර සංවිධාන විශාල වශයෙන් බලපෑම් කළ බවයි'' (Krook, 2004:3). ක්රූක්ට අනුව ජාත්‍යන්තර සංවිධාන ඍජුවම දේශීය ආණ්ඩුවලට බලපෑම් කළ අවස්ථා තිබේ. තවත් විටෙක ජාත්‍යන්තර සංවිධාන, කලාපීය හා ජාතීන් අතර ස්ත්‍රී සංවිධාන සහ දේශීය ස්ත්‍රී සංවිධාන සමඟ තොරතුරු හුවමාරු කරගැනීම, ජාලගත වීම, සම්මන්ත්‍රණ, සාකච්ඡා හා වැඩමුළු පැවැත්වීම, අධ්‍යයන සමීක්ෂණ කිරීම, පුද්ගලික හා විද්වත් මට්ටමින් අත්දැකීම් හුවමාරු කර ගැනීම සහ රාජ්‍ය හා සිවිල් සංවිධාන පෙළඹවීම් හෝ උනන්දු කිරීම් මගින්ද පංගු ක්‍රම දිනාගෙන තිබේ. තවත් අවස්ථාවල දේශීය ස්ත්‍රී සංවිධාන, සමාජ ක්‍රියාකාරීන් හා විද්වතුන් පංගු ක්‍රම පිළිබඳ සාකච්ඡා ආරම්භ කර, අදාළ යෝජනා ආදිය ඉදිරිපත් කිරීමෙන් පසුව ජාත්‍යන්තර සංවිධාන හෝ විදේශීය රටවල් විසින් එම දේශීය සංවිධාන වලට සම්පත්, දැනුම, යෝජනාවලී සැකසීම, පුහුණුව ලබාදීම හා අදාළ තොරතුරු හා සිදුවීම් ආදිය පිළිබඳ දත්ත ලබාදීම හරහා ආධාර කළ අවස්ථාද තිබේ.

පශ්චාත්-යුද වාතාවරණයක් පවතින රටවල් රාශියක් ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා හඳුන්වා දීමේදී, ඒවාට පංගු ක්‍රම පිළිබඳ විධිවිධාන අන්තර්ගත කිරීම සඳහා ගැටුම් පවතින අවස්ථාවල එම රටවලට සහයෝගය දැක්වූ රටවල් හෝ ජාත්‍යන්තර සංවිධානවල ඍජු මැදිහත්වීම දැඩි වශයෙන් බලපා තිබේ (Krook, 2003). එබඳු විදේශ රටවල් හෝ ජාත්‍යන්තර සංවිධාන, සමහර අවස්ථාවල දේශීය විමුක්ති ව්‍යාපාර හෝ ස්ත්‍රී ව්‍යාපාරවලට බලපෑම් කොට පංගු ක්‍රම ඉල්ලා සිටින ලෙස දැනුවත් කළ අවස්ථාද තිබේ. එසේත් නැතිනම්, ජාත්‍යන්තර සංවිධාන බාහිර පොළඹවන්නන් ලෙස, දේශීය සංවිධාන ඒ සඳහා උනන්දු කොට, පංගු ක්‍රම දිනා ගැනීම සඳහා භාවිත කළ යුතු උපක්‍රම හඳුන්වා දී, සම්පත් සපයා දී, විවිධ අයුරින් වක්‍රව බලපෑම් කළ අවස්ථාද තිබේ (Maley, 2004).

පශ්චාත් යුදකාලීන වාතාවරණ තුළ පංගු ක්‍රම හඳුන්වා දුන් සමහර රටවලට එබඳු ජාත්‍යන්තර බලපෑම් නොතිබුනු අවස්ථාද වේ. උදාහරණ ලෙස දකුණු අප්‍රිකාව, මොසැම්බික් හා උගන්ඩාව වැනි රාජ්‍ය දැක්විය හැකිය (Tripp, 2000; Hassim, 2002). නමුත් 2000 දී එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් 1325 යෝජනාවලිය ප්‍රකාශයට පත්කිරීමත් සමග විශේෂයෙන්ම පශ්චාත්-යුදකාලීන වාතාවරණයන් පවතින රටවල තීරණ ගන්නා මට්ටම් වලදී ස්ත්‍රී නියෝජනය වැඩිකිරීම සඳහා පංගු ක්‍රම වැනි උපක්‍රම භාවිතා කරන ලෙසට ජාත්‍යන්තර සංවිධානවලින් එල්ල වන ඍජු බලපෑම් වැඩිවෙමින් පවතී.

කොසොවෝ හා ඇෆ්ගනිස්තානය මේ සඳහා ඉතා හොඳ උදාහරණ වේ. 1999 දී කොසොවෝ හි යුද්ධය අවසාන වීමත් සමග, එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩලයේ මූලිකත්වයෙන් එරට භාරකාර පරිපාලන කොමිසමක් පිහිටුවීය. ප්‍රජාතන්ත්‍රවාදය ස්ථාපිත කිරීම හා මානව අයිතිවාසිකම් ප්‍රවර්ධනය කිරීම එහි මූලික අරමුණු විය. මෙම කොමිසම මෙහෙයවීමේදී යුරෝපා ආරක්ෂාව හා සහයෝගිතාවය පිළිබඳ සංවිධානය ප්‍රධාන භූමිකාවක් රඟ පෑවේය. කොසොවෝහි ස්ත්‍රීන්ට ඡන්දදායකයින් ලෙස ලියාපදිංචි වීමට හා අපේක්ෂිකාවන් ලෙස මැතිවරණයට ඉදිරිපත් වීමට ඇති බාධා මෙම භාරකාර පරිපාලන

කොමිසම විසින් හඳුනා ගන්නා ලදී. 2000 ඔක්තෝබර් මසදී, සියලුම පළාත් හා ජාතික මැතිවරණවල නාමයෝජනාවලින් 30% ක ප්‍රතිශතයක් ස්ත්‍රීන් සඳහා වෙන්කළ යුතු බවට මෙම කොමිසම නීතියක් මගින් දන්වා සිටියේය. එම නීතිය හඳුන්වා දීමට පෙර කොසොවෝ සහ යුරෝපාවේ ස්ත්‍රී සංවිධාන හා ක්‍රියාකාරිනියන් සමඟ දීර්ඝ වශයෙන් මෙම කොමිසම සාකච්ඡා කළේය. ඒ සඳහා යුරෝපා සංගමයද විවිධ අයුරින් සහයෝගය දැක්වීය (Lyth, 2001).

මෙම නීතියට එරෙහිව ජාත්‍යන්තර මෙන්ම ජාතික වශයෙන්ද යම් යම් විරෝධතා එල්ල විය. එබඳු නීතියකට කොසොවෝ සමාජය තවමත් සුදුසු නැතිබව හා මැතිවරණයට ඉදිරිපත් වීමට සුදුසු ස්ත්‍රීන් සොයාගත නොහැකි බව එම විරෝධය දැක්වූවන්ගේ අදහස විය. නමුත් කොසොවෝහි රාජ්‍ය නොවන සංවිධාන හා ස්ත්‍රී සංවිධානත්, ආරක්ෂාව හා සහයෝගිතාවය සඳහා වූ යුරෝපා සංවිධානයත්, එයට එරෙහිව ඉදිරිපත් වූ විරෝධතා මැඬගෙන පංගු ක්‍රමය සාර්ථකව ක්‍රියාත්මක කිරීම සඳහා උනන්දුවෙන් කටයුතු කළහ. එහි ප්‍රතිඵලයක් ලෙස, ප්‍රථම මැතිවරණයට තරඟ කළ සියලුම පක්ෂවලින් 30% ක අපේක්ෂිකාවන් ප්‍රමාණයක් මැතිවරණයට ඉදිරිපත් කිරීමට හැකිවිය. නමුත් 2000 පළාත් මැතිවරණයේදී සමහර අපේක්ෂිකාවන්ට පක්ෂ විසින් අසමාන ලෙස සලකනු ලැබීමේ හේතුව මත අපේක්ෂිකාවන් කිහිපදෙනෙක් අපේක්ෂකත්වයෙන් ඉල්ලා අස්වූහ (Nordlund, 2003). එබඳු බාධක මධ්‍යයේ වුවත් 2015 වන විට කොසොවෝහි පාර්ලිමේන්තුවේ ස්ත්‍රී නියෝජනය 33.3% දක්වා වර්ධනය වී තිබීම ජයග්‍රහණයකි. 2011 දී කොසොවෝහි ප්‍රථමවරට කාන්තාවක් ජනාධිපති තනතුරට තේරී පත්විය.

2001 දී ඇෆ්ගනිස්ථාන් යුද්ධය අවසානවීමත් සමඟ කොසොවෝ ට සමාන අයුරින් එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් විශේෂ පරිපාලන කොමිසමක් එරටෙහිද ස්ථාපිත කරනු ලැබීය. තලිබාන් පාලන කාලය තුළදී ඇෆ්ගනිස්තාන් ස්ත්‍රීන්ගේ මානව

අයිතිවාසිකම් උල්ලංඝනය වීම් පිළිබඳ 2001 පීටර්ස්බර්ග් සුමුළුවේදී විශේෂයෙන් සාකච්ඡා කෙරිණි. එහි ප්‍රතිඵලයක් ලෙස, භාරකාර ආණ්ඩුවේ ඇමති තනතුරු 2 ක් ස්ත්‍රීන්ට ප්‍රදානය කිරීමටත්, නව ආණ්ඩුවේ ස්ත්‍රී නියෝජනය වැඩිකිරීමටත් තීරණය කෙරිණි. එක්සත් ජාතීන්ගේ සංවිධානය හා භාරකාර පරිපාලන කොමිසමේ බලවත් ඉල්ලීම මත එරට පාර්ලිමේන්තුව නැතිනම් ලෝයා ජිර්ගා කොමිසමටද (Loya Jirga Commission) ස්ත්‍රීන් තිදෙනෙකු පත් කළේය. මේ සියල්ලේම ප්‍රතිඵලයක් ලෙස, සෑම ප්‍රාන්තයකින්ම අවම වශයෙන් එක් නියෝජිතවරියක්වත් ලෝයා ජිර්ගා කොමිසමට තෝරා එවිය යුතුය යන විධිවිධානය 2004 නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අන්තර්ගත කෙරිණි. ඒ අනුව පාර්ලිමේන්තුවේ පහළ මණ්ඩල නියෝජනයෙන් 25% ක් ස්ත්‍රීන්ට වෙන්විය. තවද, ජනාධිපතිවරයා විසින් දෙවැනි මණ්ඩලයට පත් කරනු ලබන නියෝජිතයින්ගෙන් අඩක් ස්ත්‍රීන් වියයුතු බවටද නීතියෙන් නියම විය. මෙම පංගු ක්‍රම නීතියටද සමහර ඇෆ්ගනිස්තාන ස්ත්‍රී සංවිධාන පවා විරෝධතාවය පළ කළහ. පංගු ක්‍රමය ප්‍රායෝගික නොවන, භයානක පියවරක් ලෙස ඔවුහු හඳුන්වා දුන්හ (Kaufman, 2003). එහෙත් සිරගතව සිටි ස්ත්‍රීන් හා සමහර ස්ත්‍රී සංවිධාන පංගු ක්‍රමය සාර්ථක කර ගැනීමට කැපවීමෙන් කටයුතු කළහ.

පංගු ක්‍රම දිනා ගැනීමේදී ලතින් ඇමරිකානු රටවලට එක්සත් ජාතීන්ගේ සංවිධානය හා අන්තර්-පාර්ලිමේන්තු සංගමය විවිධ අයුරින් සහයෝගය දැක්වූහ. එසේම ස්පාඤ්ඤ සමාජවාදී පක්ෂය කොස්ටරිකාහි ස්ත්‍රී-පුරුෂ සමානාත්මතා පණත සම්මත කර ගැනීමට 1991 දී සහයෝගය දැක්වීමෙන්, ස්පාඤ්ඤ භාෂාව කථාකරන ලතින් අමරිකානු රටවලට විශේෂ බලපෑමක් එල්ල විය. ආර්ජන්ටිනාව, බෙයිජිං ජාත්‍යන්තර ස්ත්‍රී සමුළුවේ බලපෑම හා විදේශ රටවල අත්දැකීම් ලබාගෙන, 1995 දී පංගු ක්‍රමය හඳුන්වාදීම නිසා අසල්වැසි ලතින් අමරිකානු රටවලට ඍජු බලපෑමක් එල්ල විය. ආර්ජන්ටිනා ස්ත්‍රීන් අසල්වැසි රටවල ස්ත්‍රී සංවිධාන හා නායිකාවන් සමඟ තොරතුරු

හුවමාරු කරගෙන ඔවුන්ව රජයෙන් පංගු ක්‍රම ඉල්ලා සිටීම සඳහා පෙළඹවීම නිසා 1996-2000 අතර කාලයේදී ලතින් අමරිකානු රටවල් 14 ක් පංගු ක්‍රම හඳුන්වා දුනි (Htun, 2002).

ඊජිප්තුවේ අන්වර් සදාත් සුඩානයේ පංගු ක්‍රමය පිළිබඳ දැනුවත් වී එයට සමාන ක්‍රමයක් සිය රටටද හඳුන්වා දුනි. තායිවාන ස්ත්‍රීවාදිනියකු වූ පෙන්ග් වන්-රූ (Peng Wan-Ru) ජාත්‍යන්තර සමුළුවකදී "Critical Mass" න්‍යාය පිළිබඳව අමරිකානු ස්ත්‍රීවාදිනියක වූ ජෝ ෆ්‍රිඩ්මන් (Jo Freedman) ගෙන් කරුණු ඉගෙන ගෙන පංගු ක්‍රමයක් ඉල්ලීම සඳහා තායිවාන ස්ත්‍රී ව්‍යාපාර පෙළඹවීය. එහි ප්‍රතිඵලයක් ලෙස, ස්ත්‍රීන් සඳහා 10% ක ප්‍රතිශතයකින් ආසන වෙන්කරවා ගැනීමට හා දේශපාලන පක්ෂ නාමයෝජනාවලින් 25% ක් ස්වේච්ඡාවෙන් ස්ත්‍රීන් සඳහා වෙන් කරවා ගැනීමට තායිවාන ස්ත්‍රීන්ට හැකිවිය (Huang, 2002).

දේශීය විමුක්ති ව්‍යාපාර හෝ ප්‍රජාතන්ත්‍රවාදී ව්‍යාපාර ස්ත්‍රී නියෝජනය සඳහා නව ආණ්ඩු පෙළඹ වූ අවස්ථාද වේ. රුවන්ඩාව එයට හොඳ නිදසුනකි. 1994 රුවන්ඩා සමූල ඝාතනයෙන් පසුව රුවන්ඩා දේශප්‍රේමී පෙරමුණ (Rwandan Patriotic Front) බලයට පත්විය. මෙම පක්ෂයේ නායකයින් උගන්ඩාවේ සැගවී සිටි කාලයේදී ලද අත්දැකීම් තුළින්, රුවන්ඩාවේත් ස්ත්‍රීන් සඳහා ආසන වෙන්කිරීමට 2003 නව ව්‍යවස්ථාවෙන් විධිවිධාන හඳුන්වා දුනි. මේ සඳහා දකුණු අප්‍රිකානු අත්දැකීම්ද රුවන්ඩා පාලක පෙරමුණට බලපෑවේය. රුවන්ඩා නීතියට අනුව ඡන්දදායකයාට ඡන්ද 3 ක් හිමිවේ. එයින් එකක් පොදු අපේක්ෂකයකු, තවෙකක් ස්ත්‍රියක හා අනෙක තරුණ අපේක්ෂකයකු සඳහා භාවිතා කළ යුතුය. තවද, ඡන්දයෙන් තෝරාගත් නියෝජිතවරියන්ගෙන් සමන්විත ස්ත්‍රීන් සඳහා වූ වෙනමම කවුන්සිලයක් ස්ථාපිත කෙරිණි. එම ස්ත්‍රී කවුන්සිල පොදු කවුන්සිල (ස්ත්‍රී-පුරුෂ දෙපක්ෂයම නියෝජනය වන) හා සම්බන්ධ වී තීරණ ගැනීමේදී ස්ත්‍රීන්ගේ ආශාවන් හා අපේක්ෂාවන් නියෝජනය

කරන ආයතන ලෙස ක්‍රියාත්මක වේ. පංගු ක්‍රම න්‍යාය පිළිබඳව රුවන්ඩා පාලක පෙරමුණ විදෙස් අත්දැකීම්වලින් පාඩම් උගත්තද, එය ක්‍රියාත්මක කිරීමේදී රුවන්ඩාවටම ආවේණික වූ ප්‍රතිපත්ති අනුගමනය කරයි. ස්ත්‍රීන්ගේ කවුන්සිලවලට නියෝජිතයින් තේරීමේදී ස්ත්‍රීන් සඳහාම වෙන් වූ මැතිවරණයක් පැවැත්වීම එබඳු ප්‍රතිපත්තියකි (Powley, 2003).

ස්ත්‍රී ව්‍යාපාර හා ස්ත්‍රීවාදී ව්‍යාපාර

ස්කැන්ඩිනේවියානු රටවල් ඇතුළු සංවර්ධිත මෙන්ම සංවර්ධනය වන්නා වූ රටවල් රැසකදීත් පංගු ක්‍රමය දිනා ගැනීමට දේශීය ස්ත්‍රීවාදී හා ස්ත්‍රී ව්‍යාපාර විශාල වශයෙන් දායකත්වය දැක්වූ අවස්ථා දැකගත හැකිය. 1970 ගණන්වල සිට ස්ත්‍රී-පුරුෂ සමානාත්මතාවය සඳහා වූ ප්‍රතිපත්ති කාර්මීකරණය වූ රටවල් විසින් හඳුන්වා දීම අරඹනු ලැබීය. ඒ සමගම ස්කැන්ඩිනේවියානු රටවලත්, ප්‍රංශය, ජර්මනිය හා බ්‍රිතාන්‍ය වැනි රටවලත්, ස්ත්‍රී ව්‍යාපාර විසින් ස්ත්‍රීන්ගේ දේශපාලන නියෝජනය වර්ධනය කිරීම සඳහා වූ ඉල්ලීම් ඉදිරිපත් කරනු ලැබීය (Sainsbury, 1993). ස්ත්‍රී නියෝජනය හා පංගු ක්‍රම පිළිබඳ ප්‍රාදේශීය මට්ටමේ දී ස්ත්‍රීන්ව දැනුවත් කිරීම, පක්ෂ කටයුතු සඳහා ස්ත්‍රීන්ව උනන්දු කිරීම, ස්ත්‍රී සංවිධානවල ක්‍රියාකාරිනියන් දේශපාලන පක්ෂ තුළට පිවිස විවිධ බලපෑම් කිරීම, පක්ෂ තනතුරු ලබාගෙන ඒවා හරහා පක්ෂ ප්‍රතිපත්ති හා නීති වෙනස් කිරීමට නායකයින් පෙළඹවීම හා ස්ත්‍රීවාදී ව්‍යාපාරවල නායිකාවන් දේශපාලන පක්ෂ සමග සමීප සබඳතා ගොඩනගා ගෙන කේවල් කිරීම හා තර්ජනය කිරීම වැනි විවිධ උපක්‍රම මෙම ස්ත්‍රී ව්‍යාපාර විසින් භාවිත කරන ලදී (Lovenduski and Norris, 1993).

උදාහරණ ලෙස ඕස්ට්‍රේලියාවේ රාජ්‍ය නොවන ස්ත්‍රී සංවිධාන ''දේශපාලනය සඳහා වූ ස්ත්‍රීන්ගේ සභාගය'' (Women into Politics Coalition) 1992 දී පිහිටුවා, පාර්ලිමේන්තු ස්ත්‍රී නියෝජනය වර්ධනය සඳහා විවිධ අයුරින් බලපෑම් කළේය. 1993 දී ඕස්ට්‍රේලියාව හා

නවසීලන්තයේ සහභාගිත්වයෙන් පැවැත්වූ ස්ත්‍රීන්ගේ තත්වය පිළිබඳ අමාත්‍ය සමුළුවේදී ස්ත්‍රී නියෝජනය සම්බන්ධයෙන් වූ වාර්තා හා අධ්‍යයන ඉදිරිපත් කොට, මෙම ස්ත්‍රී සභාගය ආණ්ඩුවට බලපෑම් කළේය. ස්ත්‍රීවාදී කාටූන් නිර්මාණකරුවන් ලවා කාටූන් හා චිත්‍ර නිර්මාණය කරවා ඒ මගින් සමාජ අවධානය දිනා ගත්තේය. ස්ත්‍රීන්ට ඡන්ද බලය ලැබී සියවසක් ගතවීම නිමිත්තෙන් සම්මන්ත්‍රණ, වැඩමුළු හා සාකච්ඡා සිය ගණනක් සංවිධානය කොට, ස්ත්‍රී නියෝජනය පිළිබඳ ගැටලුව හා එය විසඳීමේ අවශ්‍යතාවය ඉස්මතු කර දැක්වීය. ඒ සමගම එම ක්‍රියාකාරකම් හරහා ආණ්ඩුව හා පක්ෂවලට බලපෑම් කරමින්, ස්ත්‍රීන් සඳහා පංගුවක් ඉල්ලා සිටියේය. ඕස්ට්‍රේලියානු කම්කරු පක්ෂයට හිතවත් ස්ත්‍රීන් කණ්ඩායමක් ඕස්ට්‍රේලියානු ස්ත්‍රී පක්ෂය පිහිටුවා මැතිවරණවලදී සහයෝගය දක්වන බවට කේවල් කරමින් හා ප්‍රමාණවත් නාමයෝජනා සංඛ්‍යාවක් ස්ත්‍රීන්ට ලබා නොදුනහොත් තනිවම මැතිවරණයට ඉදිරිපත් වෙන බවට තර්ජනය කරමින් බලපෑම් කළහ.

ස්ත්‍රීන්ගේ මැතිවරණ උද්දේශණය යන ව්‍යාපාරය ද (Women's Electoral Lobby), 1970 ගණන්වල සිට දේශපාලන පක්ෂවලට විශාල වශයෙන් බලපෑම් කළේය. ඕස්ට්‍රේලියානු ස්ත්‍රීන් සම්බන්ධවන ප්‍රශ්න මැතිවරණ ප්‍රතිපත්ති හා න්‍යාය පත්‍රවලට එකතු කිරීම හා මැතිවරණයෙන් පසුව, ආණ්ඩු බලය ලබාගත් පක්ෂ ලවා ඒවා ක්‍රියාත්මක කරවීම සම්බන්ධයෙන් මෙම ව්‍යාපාරය විශාල භූමිකාවක් රඟ පෑවේය. ස්ත්‍රීන්ට සම්බන්ධ ප්‍රතිපත්ති සම්පාදනයේදී මූලිකත්වය ගත් පාර්ලිමේන්තු නියෝජිතවරියන් හෝ නියෝජිතවරුන් අතරින් වඩාත් සක්‍රීය අයුරින් කටයුතු කළ පුද්ගලයින් තෝරා අර්නි (Ernie) සම්මාන ප්‍රදානය කිරීමද, ඕස්ට්‍රේලියානු ස්ත්‍රී සංවිධාන විසින් භාවිතා කරන ලද තවත් සාර්ථක උපක්‍රමයකි (Sawer and Simms, 1993). එමගින්, ස්ත්‍රීන්ට සම්බන්ධ ප්‍රශ්න විසඳීමට පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ වැඩි සහායක් දිනා ගැනීමට හැකිවිය.

බ්‍රිතාන්‍ය කම්කරු පක්ෂයට බලපෑම් කළ වික්ටෝරියානු කම්කරු ස්ත්‍රීන්ගේ ජාලය (Victorian Labour Women's Network) හා ස්ත්‍රී ප්‍රතිපත්ති කමිටුව (Women's Policy Committee) වැනි සංවිධානත් පක්ෂය තුළ ස්ත්‍රී නියෝජනය වර්ධනයට සාර්ථකව බලපෑම් කළේය. පක්ෂ අභ්‍යන්තර තනතුරු හා තීරණ ගන්නා කමිටුවල පුරුෂයන් හෝ ස්ත්‍රීන් 40% නොඉක්මවිය යුතුය යන ප්‍රතිපත්තිය හඳුන්වා දීමට මෙම සංවිධාන දැඩිව බලපෑම් කළේය (Norris and Lovenduski, 1995).

ස්ත්‍රී ව්‍යාපාර හා ස්ත්‍රීවාදී ව්‍යාපාර එක්ව ස්ත්‍රීන්ගේ දේශපාලන නියෝජනය වර්ධනය සඳහා සාර්ථකව කටයුතු කළ අවස්ථාවකට හොඳම උදාහරණයක් ලෙස ප්‍රංශයේ සමානාත්මතා ව්‍යාපාරය (Parity Movement) හැඳින්විය හැකිය. පීතෘමූලික රාජ්‍යයට එරෙහි ස්ත්‍රීවාදීන්, ස්ත්‍රීවාදීන්ට එරෙහි නැතිනම් ස්ත්‍රීවාදී අදහස් අගය නොකරන ස්ත්‍රීන් හා පොදු ස්ත්‍රීන් සභාගයක් ගොඩනගා ගෙන ''ස්ත්‍රී නියෝජනය අවම වීම සියලුම ස්ත්‍රීන්ට බලපාන පොදු කරුණකි'' යන තේමාව යටතේ එක්සත්ව කටයුතු කළහ. ස්ටෙට්සන් හා මෂූර්ට (Stetson and Mazur, 2002:11) අනුව ''1990 අවසාන භාගයේදී, ස්ත්‍රීන්ගේ මූලිකත්වයෙන් ගොඩනැගූ ප්‍රංශ සමානාත්මතා ව්‍යාපාරය, දේශපාලන නියෝජිත ආයතනවල ස්ත්‍රී නියෝජනය වර්ධනය කිරීම සඳහා දැඩි කැපවීමෙන් ක්‍රියා කළේය. එහි ක්‍රියාකාරිත්වයෙන් ප්‍රකාශ වන්නේ ස්ත්‍රීවාදීන් හා ස්ත්‍රීවාදීන් නොවන ස්ත්‍රීන් යන බෙදුම විශ්ලේෂණාත්මක වශයෙන් අර්ථ විරහිත බෙදීමක් බවය''. මෙම ව්‍යාපාරයට දක්ෂිණාංශික සහ වාමාංශික අදහස් අගයන ස්ත්‍රීහු මෙන්ම, මධ්‍යස්ථ මතධාරීන්ද එක්වූහ. එයට සමාන අයුරින් චිලී හි වාමාංශික හා දක්ෂිණාංශික ස්ත්‍රීහු එක් වී ස්ත්‍රීවාදී සංවිධාන හා ස්ත්‍රී සංවිධානවල එකතුවෙන් සභාගයක් ගොඩනගා ගෙන දේශපාලන පක්ෂවල නාමයෝජනාවලින් ස්ත්‍රීන්ට පංගුවක් වෙන්කරවා ගැනීමට බලපෑම් කළහ (Baldex, 2002).

බෙක්විත් (Beckwith, 2001:372) ට අනුව ''සියලුම ස්ත්‍රී සංවිධාන ස්ත්‍රීවාදී සංවිධාන නොවේ. එසේම, සියලුම ස්ත්‍රී දේශපාලන

ක්‍රියාකාරකම්ද ස්ත්‍රීවාදී නොවේ. පොදුවේ ස්ත්‍රීන් මුහුණ දෙන ගැටලුවක් වූ අඩු දේශපාලන නියෝජනය යන ගැටලුව විසඳා ගැනීමට ස්ත්‍රීන් පොදුවේ ස්ත්‍රී ව්‍යාපාරයක් ලෙස එකමුතු වීම ඒ සඳහා භාවිත කළ හැකි සාර්ථක උපක්‍රමයකි''.

ස්ත්‍රී ව්‍යාපාර හා ස්ත්‍රීවාදී ව්‍යාපාර බොහොමයක් ස්ත්‍රීන්ගේ ප්‍රශ්න විසඳීම සඳහා විවිධ අයුරින් රාජ්‍යයට බලපෑම් කළ අවස්ථා ඇත. විශේෂයෙන්ම එක් පාලන සමයකින් නව පාලන සමයකට අවතීර්ණ වන අවස්ථාවල, නව නීති හෝ නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවලට ස්ත්‍රීන්ගේ නියෝජනය සම්බන්ධ විධිවිධාන අන්තර්ගත කිරීමේදී, සමහර දේශීය ස්ත්‍රී ව්‍යාපාර සාර්ථකව බලපෑම් කර තිබේ. ඉරාක ස්ත්‍රී ව්‍යාපාරය එයට හොඳම උදාහරණයකි. ඉරාක ස්ත්‍රීන් පංගු ක්‍රමයක් ඉල්ලා සිටි අවස්ථාවේදී ඉරාක පාලනයට සම්බන්ධ අමරිකාව ප්‍රමුඛ බලවත් රටවල් හා ජාත්‍යන්තර සංවිධාන එයට විරෝධය ප්‍රකාශ කළහ. නමුත්, දේශීය ස්ත්‍රී සංවිධානවල දැඩි බලපෑම නිසා පංගු ක්‍රමයක් දිනා ගැනීමට ඔවුහු සමත් වූහ. 2003 ඔක්තෝබර් මසදී, ඉරාක ස්ත්‍රීහු සිය ඉල්ලීම් ලැයිස්තුවක් එරට අමරිකානු පරිපාලනයේ ප්‍රධානී පෝල් බ්‍රෙමර් (Paul Bremer) ට ඉදිරිපත් කළහ. ජාතික හා පළාත් මැතිවරණවලදී ස්ත්‍රීන් සඳහා 30% ක ප්‍රතිශතයක් වෙන් කරන ලෙස ඉල්ලා සිටීම මෙයට අන්තර්ගත විය. එම නීතිය නව ඉරාක ව්‍යවස්ථාවට ඇතුළත් කරන ලෙස ග්‍රාමීය හා නාගරික ස්ත්‍රීන්, භාරකාර ආණ්ඩුවේ නායිකාවන් හා කැබිනට් මන්ත්‍රීවරියන්ද ඉල්ලා සිටියහ. නමුත් අමරිකාවේ මූලිකත්වයෙන් පිහිටවූ පාලනාධිකාරය එයට තරයේ විරුද්ධ විය. එහෙත් ස්ත්‍රීන්ගේ උද්ඝෝෂණ හා අරගලය නොනවත්වාම කරගෙන ගිය අතර, 2004 මාර්තු සම්පාදිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට 25% පංගුවක් අන්තර්ගත කෙරිණි (Banerjee, 2004).

ස්ත්‍රී නියෝජනය වර්ධනය කිරීමේ ලා මොරොක්කෝහි ස්ත්‍රීන්ගේ ප්‍රජාතන්ත්‍රවාදී සංගමය (Democratic Association of Moroccan Women) රඟපෑ ක්‍රියාකලාපයද ප්‍රශංසනීයවේ. මැතිවරණ

නීති සංශෝධනයට මොරොක්කෝ ආණ්ඩුව 2000 මුල වසරවලදී සූදානම් වනවිට, මෙම සංගමය එරට රාජ්‍ය නොවන ස්ත්‍රී සංවිධාන හා සිවිල් සංවිධාන සමඟ එක් වී දේශපාලන පක්ෂවලට සම්බන්ධ ස්ත්‍රී කෝකස හරහා ආණ්ඩුවට දැඩිව බලපෑම් කළේය. ස්ත්‍රීන්ගේ දේශපාලන නියෝජනයට අදාළ වැඩමුළු ගණනාවක් මෙම සංවිධානය විසින් පවත්වනු ලැබූ අතර, ඒවායේදී ස්ත්‍රී හිතවාදී ප්‍රතිපත්ති හා පංගු ක්‍රමයක් පිළිබඳ යෝජනාවලීන් ද සම්පාදනය කළේය. එම යෝජනාවලට පංගු ක්‍රමය පමණක් නොව, සමානුපාතික නියෝජන ක්‍රමය, ස්ත්‍රීන්ට මැතිවරණය සඳහා ආධාර ලබාදීම, ඡන්දයෙන් තේරුන නියෝජිතයින් එක් තනතුරකට පමණක් සීමා කිරීම හා ස්ත්‍රී නියෝජනය සම්බන්ධ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේදී ඒවා නිසිලෙස නිරීක්ෂණය කිරීමට ජාතික සමානාත්මතා නිරීක්ෂණ කමිටුවක් පත්කිරීම සම්බන්ධ යෝජනා ද ඇතුළත් විය. මෙම යෝජනාවලිය එරට අගමැති, පක්ෂ නායකයින්, සිවිල් සංවිධාන, විද්වතුන්, වෘත්තිකයින් හා වෘත්තීය සමිති ආදියට ද ඉදිරිපත් කළේය. එබඳු සංවිධානවල තීරණ ගන්නා මට්ටම්වලදීද ස්ත්‍රීන්ට ප්‍රතිශතයක් වෙන් කරදෙන ලෙස ස්ත්‍රීන්ගේ ප්‍රජාතන්ත්‍රවාදී සංගමය ඉල්ලා සිටියේය. එසේම මැතිවරණවලදී ප්‍රචාරක කටයුතු සඳහා ස්ත්‍රීන්ට ආධාර කරන ලෙසත්, ඔවුන් පොදු කටයුතුවලට සහභාගි වීමේදී ගෘහස්ථ ක්ෂේත්‍රයේ වගකීම් අවම කිරීම සඳහා ළමා රැකවරණ මධ්‍යස්ථාන පිහිටුවන ලෙසත් දරුවන්ට වෙනත් පහසුකම් සපයා දෙන ලෙසත්, මැතිවරණ අපේක්ෂිකාවන්ට අදාළ පුහුණුව ලබාදෙන ලෙසත්, මැතිවරණවලට ඉදිරිපත් වීමට ස්ත්‍රීන්ව උනන්දු කරවන ලෙසත් මෙම සංගමය සමාජ සංවිධානවලින් ඉල්ලා සිටියේය.

එයට අමතරව ස්ත්‍රීන්ගේ ප්‍රජාතන්ත්‍රවාදී සංගමය විසින් මෙම ප්‍රශ්නය පිළිබඳව ජනතාව දැනුවත් කිරීම සඳහා ජාතික මට්ටමේ සම්මන්ත්‍රණ, ප්‍රසිද්ධ දේශන, පුවත්පත් ලිපි හා දැන්වීම්, රූපවාහිනී හා ගුවන් විදුලි වැඩසටහන් සංවිධානය කළේය. තවද, ස්ත්‍රී නියෝජනය සම්බන්ධයෙන් සම්පාදිත යෝජනාවලිය පිළිබඳ විශේෂ සාකච්ඡාවක්

පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සමග පවත්වා ඔවුන් දැනුවත් කළේය.

මෙම ක්‍රියාකාරකම් වල ප්‍රතිඵලයක් ලෙස අදාළ යෝජනාවලිය ආණ්ඩුවේ ප්‍රතිපත්ති සම්පාදනය පිළිබඳ න්‍යාය පත්‍රයට ඇතුළත් කෙරිණි. ස්ත්‍රීන් 30 ක් දෙනෙකුගෙන් සමන්විත ජාතික ලැයිස්තුවක් සකසා ඔවුන් සඳහා මොරොක්කෝ පාර්ලිමේන්තුවේ ආසන 30 ක් වෙන් කෙරිණි. දේශපාලන පක්ෂද ඔවුන්ගේ නාමයෝජනා ලැයිස්තුවලට අවම වශයෙන් ස්ත්‍රීන් 4 දෙනෙකුවත් ඇතුළත් කිරීමට එකඟ වූහ. ඒ සියල්ලේම ප්‍රතිඵලයක් ලෙස 2002 සැප්තැම්බර් පැවති මැතිවරණයෙන් ස්ත්‍රීන් 35 දෙනෙක් පාර්ලිමේන්තුවට තේරී පත්විය. එයට පෙර පැවති පාර්ලිමේන්තුවේ ස්ත්‍රී නියෝජනය දෙදෙනෙකුට සීමා වී තිබුණි (Zineb, 2002). පාර්ලිමේන්තු ස්ත්‍රී නියෝජනය සම්බන්ධයෙන් ලොව රටවල් අතුරින් 77 වැනි ස්ථානය දැනට මොරොක්කෝව දිනාගෙන ඇත. 2011 නොවැම්බර් මැතිවරණ ප්‍රතිඵලවලට අනුව පාර්ලිමේන්තුවේ නියෝජිතයින් 395 ක් අතුරින් ස්ත්‍රීන් 67 දෙනෙක් (17.0%) නියෝජනය වේ (http://www.ipu.org).

සංවර්ධනය වන්නා වූ රටවල ස්ත්‍රී ව්‍යාපාර හා ස්ත්‍රීවාදී ව්‍යාපාරත් පංගු ක්‍රම නීති දිනා ගැනීමේලා බෙහෙවින් දායක වූ අවස්ථා ඇත. එහිදී ඉන්දියානු ස්ත්‍රී ව්‍යාපාරය සුවිශේෂී වේ. ස්ත්‍රීන්ගේ තත්වය පිළිබඳ පරීක්ෂා කොට අදාළ නිර්දේශ සැපයීමට ඉන්දියාව පත්කළ කොමිසමේ වාර්තාව 1976 ප්‍රකාශයට පත්වීමත් සමග ඉන්දියානු ස්ත්‍රී ව්‍යාපාරය වඩාත් සක්‍රීය විය. එම වාර්තාවෙන් ග්‍රාමීය මට්ටමේ ස්ත්‍රී දේශපාලන නියෝජනය වර්ධනය කිරීම අත්‍යවශ්‍ය බව අවධාරණය කෙරුණ අතර, ඒ සඳහා සාධනීය ප්‍රතිපත්ති හඳුන්වා දියයුතු බැව් නිර්දේශ කළේය. මේ සම්බන්ධයෙන් අවධානය යොමුකළ ඉන්දියානු ස්ත්‍රී සංවිධාන බොහොමයක් ග්‍රාම පංචායත් පළාත් පාලන ආයතනවල ආසනවලින් 30% ක් ස්ත්‍රීන් සඳහා වෙන්කරන ලෙස රජයෙන් ඉල්ලා සිටියේය. ස්ත්‍රීන්ට දේශපාලන නියෝජිත ආයතනවලට තේරී පත්වීමට ඇති බාධක මෙම ස්ත්‍රී සංවිධාන

විසින් අවධාරණය කරනු ලැබූහ. නීතියක් මගින් යම් අනුපාතයක් නියම කොට නියෝජිත ආයතනවලට ස්ත්‍රීන්ව ඇතුළත් කළහොත්, ඔවුන්ගේ ප්‍රශ්න විසඳා ගැනීම සඳහා බලපෑම් කණ්ඩායමක් ලෙස කටයුතු කිරීමට ඔවුනට ඉඩක් ලැබෙන බවද එම සංවිධාන පෙන්වා දුන්හ. තවද, ස්ත්‍රීන්ගේ නියෝජනය සංඛ්‍යාත්මකව වර්ධනය කිරීමෙන් ස්ත්‍රීන් බල ගැන්වීම පමණක් නොව, නීති හා ප්‍රතිපත්ති සම්පාදනයේදී ඔවුන්ගේ අවශ්‍යතා නිසි ලෙස නියෝජනය වන බව ද, එම ස්ත්‍රී සංවිධාන මගින් අවධාරණය කළහ.

ඉන්දියානු දේශපාලනයේ පීතෘමූලික ස්වභාවය වෙනස් කිරීමට හා ස්ත්‍රීන්ව දේශපාලනයෙන් ඉවත්කිරීමට එරෙහිව නැඟී සිටි, විශේෂයෙන්ම ජාතික මට්ටමේ ස්ත්‍රී සංවිධාන රජයටත්, දේශපාලන පක්ෂ නායකත්වයටත් නොකඩවා බලපෑම් කළේය. මෙනන් ට අනුව 1970 ගණන් වල සිට වඩාත් සක්‍රීය වූ ඉන්දියානු ස්ත්‍රී ව්‍යාපාරය, එරට ජාතික රාජ්‍යයේ වර්ධනයට හා රාජ්‍යයට නීත්‍යානුකූල පිළිගැනීමක් ලබාගැනීම සඳහා සැලකිය යුතු බලපෑමක් එල්ල කළේය (Menon, 2002).

එපමණක් නොව, ඉන්දියානු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට 73 හා 74 සංශෝධන ඉදිරිපත් කිරීමේදී පළාත් පාලන ආයතනවල ආසනවලින් 33.3% ක පංගුවක් ස්ත්‍රීන් සඳහා වෙන්කරවා ගැනීමට විශේෂයෙන්ම ජාතික මට්ටමේ ස්ත්‍රී සංවිධාන දැඩිව බලපෑම් කළේය. එයින් පසුව, ප්‍රාන්ත හා ජාතික මට්ටමේ නියෝජිත ආයතනවල ස්ත්‍රීන්ගේ නියෝජනය වර්ධනය කිරීමට එම සංවිධාන බලපෑම් කිරීම ආරම්භ කළ අතර තවමත් එම සටන අතහැර නැත.

ඉන්දියාවේ ජාතික මට්ටමේ ස්ත්‍රී සංවිධාන සම්මන්ත්‍රණ, පක්ෂ නායකයින් හා සාකච්ඡා, වැඩමුළු, අධ්‍යයන වාර්තා ඉදිරිපත් කිරීම්, උද්ඝෝෂණ හා රැළි සංවිධානය කිරීම් සහ පෝස්ටර්, ඡායාරූප හා කාටූන් ප්‍රදර්ශන ආදිය මගින් ස්ත්‍රී නියෝජනයේ අවශ්‍යතාවය පිළිබඳ

ජනතාවත්, දේශපාලන පක්ෂත්, තීරණ ගන්නා මට්ටමේ පුද්ගලයින් වත් දැනුවත් කළේය. කොංග්‍රස් පක්ෂය හා වෙනත් ප්‍රධාන පක්ෂවල නායකයින් සමඟ, ස්ත්‍රී සංවිධානවල ක්‍රියාකාරිනියන් අවිධිමත් සබඳතා ගොඩනගා ගෙන ඒ හරහා පක්ෂ නායකත්වයට බලපෑම් කිරීම, පංගු ක්‍රමය දිනා ගැනීමේදී, ඔවුන් භාවිත කළ උපක්‍රමවලින් වඩාත් සාර්ථක උපක්‍රමයක් විය.

ජාතික මෙන්ම ප්‍රාදේශීය මට්ටමේ ස්ත්‍රී හා සිවිල් සංවිධානත් ස්ත්‍රී නියෝජනයේ අවශ්‍යතාවය පිළිබඳව, විශේෂයෙන්ම ස්ත්‍රීන්ව දැනුවත් කිරිම, අදාළ වැඩමුළු පවත්වා දේශපාලනය පිළිබඳ උනන්දුව දක්වන ගැමි ස්ත්‍රීන්ට පුහුණුවක් ලබාදීම, පුහුණු මොඩියුල හා අදාළ පොත් සම්පාදනය කිරීම, මැතිවරණවලට ඉදිරිපත් වීමට ස්ත්‍රීන්ව උනන්දු කරවීම හා ඔවුන්ට අවශ්‍ය සහයෝගය ලබාදීම වැනි ක්‍රියාකාරකම් මගින් ස්ත්‍රී නියෝජනය වර්ධනය කිරීමට දායකත්වය දැක්වූහ (Raman, 1999).

පකිස්තානය 2000 දී බලය විමධ්‍යගත කිරීම සඳහා සැලැස්මක් සම්පාදනය කරන අවස්ථාවේදී එරට ස්ත්‍රී සංවිධානද 33% ක ස්ත්‍රී නියෝජනයක් ලබාගැනීම සඳහා එවකට පැවති හමුදා ආණ්ඩුවට බලපෑම් කළේය. ස්ත්‍රී නියෝජනය වර්ධනය සම්බන්ධයෙන් සංවේදී මන්ත්‍රීවරියන් ප්‍රථමයෙන් දැනුවත් කොට, ඔවුන් හරහා පර්වේස් මුෂාරෆ්ගේ හමුදා ආණ්ඩුවේ තීරණ ගන්නන්ට මෙම සංවිධාන බලපෑම් කළේය. එමගින් එම ආණ්ඩුවේ ප්‍රජාතන්ත්‍රීයකරණ ක්‍රියාවලිය සම්බන්ධ වැඩපිළිවෙලට පංගු ක්‍රම යෝජනාව ඇතුළත් කළේය. පකිස්තාන ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ ලෝකය තුළ යහපත් ප්‍රතිරූපයක් වර්ධනය කිරීම සඳහා ස්ත්‍රී නියෝජනයේ ඇති ඍජු සබඳතාවය මෙම ස්ත්‍රී සංවිධාන විසින් පෙන්වා දෙනු ලැබූහ. පකිස්තානයේ බලය විමධ්‍යගත කිරීමේ වැඩපිළිවෙල තුළට පංගු ක්‍රම විධිවිධාන අන්තර්ගත කරවා ගැනීමට ස්ත්‍රී සංවිධාන දැඩිව බලපෑම් කළහ. බලය ප්‍රාදේශීය ක්ෂේත්‍රවලට බෙදා හැරීමේදී, ස්ත්‍රීන් එහි කොටස්කරුවන් වියයුතු

බවද, එයින් පුරුෂයන් සතුව පැවති දේශපාලන බලය අඩු නොවන බවද මෙම ස්ත්‍රී සංවිධාන අවධාරණය කළහ. බලය විමධ්‍යගත කිරීමට මෙන්ම ප්‍රජාතන්ත්‍රවාදය සාර්ථක කරගැනීමට ද ස්ත්‍රී නියෝජනය අනිවාර්ය සාධකයක් බැව් මෙම සංවිධාන පෙන්වා දුන්හ.

පළාත් පාලන මැතිවරණවලට ඉදිරිපත්වීමට අපේක්ෂා කරන ස්ත්‍රීන්ට අදාළ පුහුණුව ලබාදීම, ඔවුන් උනන්දු කරවීම හා විශේෂයෙන්ම ස්ත්‍රී ඡන්දදායකයින්ව දැනුවත් කොට ස්ත්‍රියක් සඳහා ඡන්දය පාවිච්චි කරන ලෙස ඉල්ලා සිටීම වැනි ක්‍රියාකාරකම්ද මෙම ස්ත්‍රී සංවිධාන විසින් සංවිධානය කරනු ලැබූහ. මේ අයුරින් පංගු ක්‍රමය හඳුන්වා දීමෙන් ස්ත්‍රී නියෝජනය වර්ධනයට නීතිමය සහයෝගයක් ලබාදී ඇතත්, සමාජ හා සංස්කෘතික බාධක ජයගෙන අපේක්ෂා කළ අයුරින් ගුණාත්මක වර්ධනයක් දිනා ගැනීමට තවමත් පකිස්තාන ස්ත්‍රීන් සමත් වී නැත. ස්ත්‍රී දේශපාලන නියෝජනයේ වැදගත්කම සම්බන්ධයෙන් තවදුරටත් ජනතාව දැනුවත් කිරීම, දේශපාලනය කෙරෙහි උනන්දුවක් දක්වන ස්ත්‍රීන්ට විධිමත් පුහුණුවක් ලබාදීම, ස්ත්‍රීන් මුහුණු පාන ගැටළු සම්බන්ධයෙන් අධ්‍යයනය කොට අදාළ වාර්තා හා නිර්දේශ ප්‍රකාශයට පත් කිරීම සහ ස්ත්‍රීන්ට මැතිවරණ කටයුතු සඳහා මූල්‍යාධාර ලබාදීමේ වැඩපිළිවෙලක් සම්පාදනය කිරීම වැනි දෑ සඳහා පකිස්තාන ස්ත්‍රී සංවිධාන තවදුරටත් වැඩි උනන්දුවකින් කටයුතු කළහොත්, පකිස්තාන ස්ත්‍රී නියෝජනයේ ප්‍රමාණාත්මක මෙන්ම ගුණාත්මක වර්ධනයටද මඟපාදා ගතහැකි බව රේයස් පෙන්වා දෙයි (Reyes, 2002).

1980 දශකයේ මැද භාගයේ සිට බංග්ලාදේශ ස්ත්‍රී සංවිධානද, විවිධ උපක්‍රම භාවිතා කරමින් පංගු ක්‍රමයක් සඳහා බලපෑම් කළේය. බංග්ලාදේශ සමාජ ක්‍රියාකාරිනියන් හා විද්වතුන් විසින් ස්ත්‍රී දේශපාලන නියෝජනය සම්බන්ධයෙන් සම්මන්ත්‍රණ හා වැඩමුළු පැවැත්වීම මුල් කාලයේදී කරනු ලැබීය. ජාතික මට්ටමේ ස්ත්‍රී සංවිධාන කීපයක් එක්වී බංග්ලාදේශ පරිපාලන ඒකක 64 ට අඩුම වශයෙන් එක් ස්ත්‍රියක් බැගින් හෝ සෘජු ඡන්දයෙන් තෝරා ගෙන පාර්ලිමේන්තුව

නියෝජනය කළයුතු බැව් අවධාරණය කළහ. තවත් ස්ත්‍රී සංවිධාන කීපයක් දේශපාලන පක්ෂවලට බලපෑම් කරමින්, නාමයෝජනාවලින් අවම වශයෙන් 20% ක්වත් ස්ත්‍රීන්ට ලබාදෙන ලෙස ඉල්ලූහ. එහෙත්, ඔවුන්ගේ යෝජනාව පරිදි 1990 බංග්ලාදේශ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට පංගු ක්‍රමය පිළිබඳ විධිවිධාන අන්තර්ගත කරවා ගැනීමට ස්ත්‍රී සංවිධාන සමත් නොවුනි. නමුත් ස්ත්‍රී සංවිධාන සිය අරගලය නොනවත්වාම 2000 දශකය දක්වා කරගෙන ගියේය. 2001 දී බංග්ලාදේශ පාර්ලිමේන්තුව විසුරුවා හැරීමට ප්‍රථමයෙන් ජාතික මට්ටමේ ස්ත්‍රී සංවිධාන 20 ක් මහිලා පර්ෂද් සංවිධානයේ මූලිකත්වයෙන් එක් වී ආණ්ඩුවට හා දේශපාලන පක්ෂවලට නැවතත් ඔවුන්ගේ යෝජනා ඉදිරිපත් කළහ. තවද, උද්ඝෝෂණ, රැළි, මිනිස් දම්වැල් සංවිධානය කිරීම, ප්‍රසිද්ධ දේශන හා සාකච්ඡා පැවැත්වීම ආදිය මගින් මේ පිළිබඳව ජනතාව තුළ උනන්දුවක් නිර්මාණය කිරීමටද මෙම සංවිධාන කටයුතු කළහ. එහෙත්, පරිපාලන ඒකක 64 ට වක්‍ර ඡන්දයෙන් ස්ත්‍රීන් තෝරා ගැනීම සඳහා වූ විධිවිධාන එම අවස්ථාවේදීත් සංශෝධනය කරවා ගැනිමට මෙම ස්ත්‍රී සංවිධාන සමත් නොවූහ. ස්ත්‍රී සංවිධාන ඉදිරිපත් කළ ඉල්ලීම් මාලාවට, ස්ත්‍රී දේශපාලන නියෝජනයට අදාළ ඉල්ලීම් හැර වෙනත් ඉල්ලීම්ද අන්තර්ගත කිරීම නිසා, අපේක්ෂිත අයුරින් පංගු ක්‍රම යෝජනාව අවධාරණයට ලක්නොවීය. අනික් අතින් මේ සම්බන්ධයෙන් ආණ්ඩුව, දේශපාලන පක්ෂ හා ස්ත්‍රී සංවිධාන යම් ආකාර සම්මුතියකට ගෙන ඒම සඳහා යෝග්‍ය අතරමැදි භූමිකාවක් රඟපෑමට සුදුසු උපක්‍රමශීලි අයෙකුද ඉදිරිපත් නොවීය. තවද, ස්ත්‍රීන් සඳහා වෙන්කළ යුතු ආසන සංඛ්‍යාව සම්බන්ධයෙන් ස්ත්‍රී සංවිධාන අතරමත් පැහැදිලි එකඟතාවයක් ද නොවීය. මෙම දුර්වලතා හේතුවෙන් බංග්ලාදේශ ස්ත්‍රී ව්‍යාපාරයේ ප්‍රයත්නය අපේක්ෂා කළ අයුරින් සාර්ථක නොවීය. නමුත්, මෙම බලපෑම්වල ප්‍රතිඵලයක් ලෙස, බංග්ලාදේශ යූනියන් කවුන්සිලවලින් ස්ත්‍රීන්ට වෙන්කළ 33.3% සඳහා ඍජු ඡන්දයෙන් නියෝජිතවරියන් තෝරා ගැනීමට 1993 දී තීරණය කෙරිණි. එසේම, පළාත් පාලන ආයතනවල ආසනවලින් 25% ක් ස්ත්‍රීන් සඳහා වෙන්කොට එම නියෝජිතවරියන් ඍජු ඡන්දයෙන්

තෝරා ගැනීමටද තීරණය කෙරිණි. පළාත් පාලන මැතිවරණවලට ඉදිරිපත් වන ස්ත්‍රීන්ට නායකත්ව පුහුණුව ලබාදීම, ප්‍රචාරක කටයුතුවලදී ආධාර කිරීම හා ඡන්දදායකයින්ට ස්ත්‍රී නියෝජනයේ වැදගත්කම අවබෝධ කරදීම සඳහා වැඩසටහන් සංවිධානය කිරීම ආදිය මගින් පළාත් මට්ටමේදීවත් ස්ත්‍රී නියෝජනය වර්ධනය කර ගැනීමට ජාතික මෙන්ම ප්‍රාදේශීය ස්ත්‍රී සංවිධානත් උත්සාහ කළහ. නමුත් බංග්ලාදේශ ස්ත්‍රී ව්‍යාපාරය රාජ්‍යයට බලපෑම් කිරීමේ සක්‍රීය උපක්‍රම භාවිතය, ස්ත්‍රී සංවිධාන, දේශපාලන නායිකාවන් හා වෙනත් සිවිල් සංවිධාන සමග ජාල ගතවීම හා දේශපාලන පක්ෂ සමග සබඳතා ගොඩනැගීම ආදියේදී විධිමත් හා උපක්‍රමශිලී අයුරින් කටයුතු කිරීමට සමත් නොවීය. එම ක්‍රියාමාර්ගවල විවිධ දුර්වලතා ඉස්මතු වූ නිසා අපේක්ෂිත ප්‍රතිඵල දිනා ගැනීමට බංග්ලාදේශ ස්ත්‍රීන් තවමත් සමත් වී නොමැත (Chowdhary, 2002).

නේපාලය ප්‍රජාතන්ත්‍රවාදී ප්‍රවාහයට පිවිසීමත් සමඟ 2007 ව්‍යවස්ථා කවුන්සිලයට ප්‍රමාණවත් ස්ත්‍රීන් සංඛ්‍යාවක් අන්තර්ගත කරන ලෙස නේපාල ස්ත්‍රී සංවිධාන ඉල්ලා සිටියේය. එසේම, 2008 නව ව්‍යවස්ථාවෙන් මිශ්‍ර නියෝජන ක්‍රමයක් හා ස්ත්‍රී නියෝජනය සඳහා 30%ක ප්‍රතිශතයක් හඳුන්වා දෙන ලෙසද මාඕවාදී ස්ත්‍රීන් මෙන්ම, අනෙකුත් ස්ත්‍රී සංවිධානද බලපෑම් කළහ. තවමත් නිසිලෙස ක්‍රියාත්මක වී නැතත් මෙම බලපෑම්වල ප්‍රතිඵලයක් ලෙස පංගු ක්‍රම පිළිබඳ නීතිය නේපාලයේ භාරකාර ආණ්ඩුව විසින් ස්ථාපිත කරනු ලැබ ඇත.

රාජ්‍ය ස්ත්‍රීවාදය හා ස්ත්‍රීවාදි අදහස් අගයන පරිපාලන නිලධාරි සභාය

පංගු ක්‍රම හඳුන්වා දීමේදී හා ක්‍රියාත්මක කිරීමේදී රාජ්‍ය ස්ත්‍රීවාදය ද විශේෂ සාධකයක් ලෙස බලපෑම් කළ අවස්ථා තිබේ. ලතින් අමරිකානු රටවල රාජ්‍ය ස්ත්‍රීවාදය විසින් ස්ත්‍රීන්ගේ තත්වය නගා සිටුවීම හා ස්ත්‍රී නියෝජනය වර්ධනය සඳහා විවිධ ප්‍රතිපත්ති

සම්පාදනයට මූලිකත්වය ගනු ලැබිනි. මෙම රටවල් විසින් 1980 ගණන්වලදී ස්ත්‍රීන් සම්බන්ධ නීති හා ප්‍රතිපත්ති සම්පාදනය, ක්‍රියාත්මක කිරීම හා නිරීක්ෂණය සඳහා වෙනමම රාජ්‍ය ආයතන පිහිටුවන ලදී. ජාතික ස්ත්‍රී කවුන්සිලය (ආර්ජන්ටිනාව, ඉක්වදෝරය, වෙනිසියුලා, හොන්ඩුරාස්, මෙක්සිකෝ, නිකරගුවා, කොස්ටරිකා) වනිතා කටයුතු අමාත්‍යංශය හෝ ජනාධිපති ලේකම්වරු (බොලිවියා, ගෞතමාලා, පැනමා, පැරගුවේ) සහ ස්ත්‍රී සංවර්ධනය හා සේවා සැපයීම සම්බන්ධ ජාතික ආයතන හෝ ස්ත්‍රී අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ ආයතන (චිලී, එල් සැල්වදෝර්, පේරු) ආදී විවිධ නම්වලින් මෙම ආයතන පිහිටවනු ලැබිය. ස්ත්‍රීන්ට පොදු ප්‍රශ්න විසඳීම සම්බන්ධයෙන් කටයුතු කිරීම ඒ ආයතනවල මූලික අරමුණ වූ අතර ස්ත්‍රී නියෝජනය වර්ධනයේ ලා ඒවා විශේෂ ක්‍රියාකලාපයක් රඟපෑහ. මේ සෑම රටකම පාහේ පංගු ක්‍රම පිළිබඳ නීති සම්පාදනයේදී මෙම රාජ්‍ය ආයතන ස්ත්‍රී සංවිධාන සමඟ සාකච්ඡා පවත්වා, අධ්‍යයන වාර්තා නිරීක්ෂණය කොට, නීති හා ප්‍රතිපත්ති සම්පාදනයට අදාළ දැනුම ඇති ස්ත්‍රීන් බඳවාගෙන විවිධ අයුරින් සහයෝගය දැක්වීය. පාර්ලිමේන්තු ස්ත්‍රී කොමිසම, ස්ත්‍රී අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා වූ පාර්ලිමේන්තු කොමසාරිස් (ඔම්බුඩ්ස්මන්) හා ස්ත්‍රී අමාත්‍යංශ උපදේශක කමිටු ආදිය ස්ථාපිත කිරීම මගින්ද බොහොමයක් ලතින් අමරිකානු රටවල රාජ්‍යයන් මේ සම්බන්ධයෙන් සහාය දැක්වූහ (Franceschet, 2004).

නමුත් අදාළ නීති ක්‍රියාත්මක කිරීමේදී සියලුම ලතින් අමරිකානු රටවල් සමාන අයුරින් සාර්ථක ප්‍රතිඵල දිනාගෙන නැත. එයට බලපෑ විවිධ හේතු අතර, මෙම රාජ්‍ය ස්ත්‍රී ආයතනවල දුර්වලතා ද මූලික හේතුවක් වී තිබේ. ආර්ජන්ටිනා හා කොස්ටරිකා වැනි රටවල කාර්යක්ෂම නිලධාරීන් සහිතව, රජයේ අයවැයෙන් නිශ්චිත සම්පත් ප්‍රමාණයක් වැයකොට, මෙම ආයතනවලට සාර්ථකව කටයුතු කිරීමට අවශ්‍ය බලය හා ඉඩප්‍රස්ථා සලසා දී තිබුණි. නමුත්, චිලී හා පේරු වැනි රටවලදී මෙම ආයතන වලට පක්ෂ දේශපාලනයේ දැඩි බැඳීමෙන් තොරව කටයුතු කිරීමට ඉඩක් නොලැබුණි. බ්‍රසීලය

වැනි රටවල හුදෙක් විදේශ ව්‍යාපෘති යටතේ මෙම ස්ත්‍රී ආයතන ආරම්භ කළ අතර, ජාත්‍යන්තර ප්‍රතිපාදන අවසන් වීමත් සමග ඒවායේ ක්‍රියාකාරිත්වයද අකර්මන්‍ය විය. නමුත් විධිමත් ලෙස නිසි අරමුණක් හා දැක්මක් සහිතව කටයුතු කළ ආර්ජන්ටිනා හා කොස්ටරිකා හි රාජ්‍ය ආයතන ස්ත්‍රී නියෝජනය වර්ධනයට විශාල දායකත්වයක් දැක්වීය. මේ සෑම රටකම පාහේ ශක්තිමත් ස්ත්‍රී ව්‍යාපාර නොතිබීමේ හිදැස යම් තරමකින් හෝ පිරවීමට මෙම රාජ්‍ය ස්ත්‍රී ආයතන වලට හැකිවිය (Htun and Jones, 2002). විශේෂයෙන්ම පංගු ක්‍රම නීති හඳුන්වා දීමේදී මෙම රටවලත්, ඉන්දියාව, පකිස්තානය, ඕස්ට්‍රේලියාව, දකුණු අප්‍රිකාව හා රුවන්ඩාව වැනි රටවලත් රාජ්‍යයේ දේශපාලන කැමැත්ත හා කැපවීම විශේෂ සාධකයක් ලෙස බලපෑම් කර තිබේ.

එසේම ආර්ජන්ටිනාව වැනි රටවල පංගු ක්‍රම නීතියට අනුව දේශපාලන පක්ෂ නාමයෝජනා ඉදිරිපත් නොකළ අවස්ථාවල ජාතික මැතිවරණ කොමිසම මෙන්ම අධිකරණයත් අපක්ෂපාතීව හා සාධාරණව එම නාමයෝජනා ලැයිස්තු ප්‍රතික්ෂේප කිරීමට තීරණය කළහ. එබඳු නීති උල්ලංඝනය කළ අවස්ථාවලදී ස්ත්‍රී සංවිධාන හෝ සිවිල් සංවිධාන ඒ පිළිබඳ අවදියෙන් සිට පෙත්සම් මගින් අදාළ ආයතනවලට කරුණු ඉදිරිපත් කිරීමද, එම රටවල පංගු ක්‍රම සාර්ථකව ක්‍රියාත්මක කිරීමට බලපෑවේය. එසේම ඒ සම්බන්ධයෙන් අදාළ රාජ්‍ය ආයතන එළඹෙන අපක්ෂපාතී තීරණ ද එපමණටම වැදගත් විය (Gray, 2003).

ස්ත්‍රී නියෝජනයේ ගුණාත්මක වර්ධනය සම්බන්ධයෙන් ස්කැන්ඩිනේවියානු රටවල ස්ත්‍රී පාර්ලිමේන්තු කාරක සභා, යුරෝපා සංගම් පාර්ලිමේන්තුවේ ස්ත්‍රී කාරක සභාව, අයර්ලන්තය, ස්පාඤ්ඤය හා යුරෝපා පාර්ලිමේන්තුවේ ස්ත්‍රී අයිතිවාසිකම් පිළිබඳ කමිටු, බෙල්ජියම හා ලක්සම්බර්ග් පාර්ලිමේන්තුවල ස්ත්‍රී-පුරුෂ සමානාත්මතාවය හා සමාන ඉඩප්‍රස්ථා පිළිබඳ කමිටු වැනි රාජ්‍ය ආයතනද විශාල දායකත්වයක් දක්වා තිබේ. නව නියෝජන ක්‍රම

හඳුන්වා දී, දේශපාලන පක්ෂවලට පංගු ක්‍රම හඳුන්වා දෙන ලෙස බලපෑම් කිරීම, පාර්ලිමේන්තු හා වෙනත් නියෝජිත ආයතනවල ස්ත්‍රී හිතකාමී පරිසරයක් නිර්මාණය කිරීමට අදාළ ප්‍රතිපත්ති හඳුන්වා දීම, එම ආයතනවල න්‍යාය පත්‍ර හා කාල සටහන් පවුල්-හිතකාමී (family-friendly) අයුරින් වෙනස් කිරීම සහ ඒවා තුළ ස්ත්‍රීන්ට අදාළ පහසුකම් සපයා දීම වැනි කාර්යන්වලදී, විශේෂයෙන්ම මෙම රාජ්‍ය ආයතන කැපවීමෙන් කටයුතු කර තිබේ. බෙල්ජියම් සෙනෙට් සභාව ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය හිතකාමී (gender-friendly) සැසිවාර කාල සටහන් පිළියෙල කිරීම හා ස්වීඩනයේ පාර්ලිමේන්තු කාරක සභා වලට මන්ත්‍රීවරියන් අනිවාර්යෙන්ම ඇතුළත් කොට නීති හා ප්‍රතිපත්ති සම්පාදනයේදී ස්ත්‍රීන් හා පුරුෂයින්ට ඒවා බලපාන ආකාරය නිසි පරීක්ෂාවට ලක්කිරීම මේ සඳහා වන හොඳ උදාහරණ වේ. ස්කොට්ලන්ත පාර්ලිමේන්තුවට හඳුන්වා දුන් පවුල් හිතකාමී කාල සටහන් හා ස්ත්‍රී-හිතකාමී ආසන සැකැස්මද, ස්ත්‍රී-පුරුෂ සමාන ඉඩප්‍රස්ථා කමිටුවද, එරට පාර්ලිමේන්තු නියෝජිතවරියන්ට සාර්ථකව කටයුතු කිරීමට මඟපාදා දුනි (Sawer, 2000). තවද ස්කැන්ඩිනේවියානු රටවල හා ජර්මන් පාර්ලිමේන්තුවල ළමා සුරැකුම් මධ්‍යස්ථාන පිහිටුවීමද පාර්ලිමේන්තු නියෝජිතවරියන්ගේ දායකත්වයේ ගුණාත්මක වර්ධනයක් සඳහා බලපා ඇත.

පාර්ලිමේන්තුව වඩාත් ස්ත්‍රී-හිතකාමී ආයතනයක් බවට පරිවර්තනය කිරීමෙන් එම ගුණාත්මක වර්ධනය දිනාගත් රටවල් අතරින් ඕස්ට්‍රේලියාවද ප්‍රමුඛ වේ. එරට ෆෙඩරල් පාර්ලිමේන්තු කමිටු, ස්ත්‍රීන් සම්බන්ධ කරුණු විමසීම සඳහා ප්‍රාදේශීය මධ්‍යස්ථානවලට ගොස්, ජනතාව සමඟ සාකච්ඡා පවත්වා තොරතුරු එක්රැස්කර, එම අවශ්‍යතා මත ප්‍රතිපත්ති සම්පාදනය කරයි. මෙම සාකච්ඡාවලදී විශේෂයෙන්ම ඉංග්‍රීසි භාෂාව කථා නොකරන, ප්‍රධාන නගරවල ඇති රාජ්‍ය ආයතනවලට යාමේ පහසුකම් හෝ ඉඩප්‍රස්ථා අඩු ස්ත්‍රීන් කෙරේ වැඩි අවධානයක් යොමු කරයි. ඕස්ට්‍රේලියාවේ පරිපාලන ක්ෂේත්‍රයේ ඉහළ තනතුරුවලට ස්ත්‍රීවාදී අදහස් අගයන

''ෆිමොක්‍රැට්ස්'' (femocrats) නමින් හඳුන්වන නිලධාරිනියන් පත් කිරීමද ස්ත්‍රී නියෝජනයේ ගුණාත්මක වර්ධනය සඳහා ඍජුව බලපෑ තවත් උපක්‍රමයකි. නීති සම්පාදන ආයතන විසින් ගනු ලබන තීරණ නිසිලෙස ක්‍රියාත්මක කිරීම, නිරීක්ෂණය හා ඇගයීමේ වගකීම මෙම පරිපාලන නිලධාරිනියන්ට පැවරේ. එසේම, ස්ත්‍රීන් සම්බන්ධ නීති හා ප්‍රතිපත්ති සැකසීමේදී, මොවුන් අදාළ ආයතනවලට නිවැරදි තොරතුරු හා උපදෙස් ලබා දෙයි (Sawer and Jupp, 1996). මේ අයුරින් ස්ත්‍රීන්ගේ දේශපාලන නියෝජනයේ ප්‍රමාණාත්මක මෙන්ම ගුණාත්මක වර්ධනය දිනා ගැනීමේ අරමුණින්, විවිධ ආකාරයේ රාජ්‍ය ආයතන පිහිටුවා, විවිධ උපක්‍රම භාවිතා කරමින් රටවල් රාශියක රාජ්‍යයන් සිය දායකත්වය දක්වා ඇත. එම රටවල් බොහොමයක් අපේක්ෂිත ප්‍රතිඵල යම් ප්‍රමාණයකින් හෝ දිනාගෙන තිබීම තුළින් ගම්‍ය වන්නේ පංගු ක්‍රම නීති හෝ ස්වේච්ඡා ප්‍රතිපත්ති සාර්ථකව ක්‍රියාත්මක කිරීමට නම් අනිවාර්යයෙන්ම ඒ සඳහා රාජ්‍යයේ සැබෑ දේශපාලන කැමැත්ත, උනන්දුව හා කැපවීම ද අත්‍යවශ්‍ය බවයි.

දේශපාලන පක්ෂව උනන්දුව හා කැපවීම

ස්ත්‍රී දේශපාලන නියෝජනයේ වර්ධනයට බලපාන තවත් ප්‍රධාන සාධකයක් වන්නේ දේශපාලන පක්ෂ ඒ සඳහා දක්වන අව්‍යාජ උනන්දුව හා කැපවීමයි. අභ්‍යන්තර ප්‍රජාතන්ත්‍රවාදී ව්‍යුහයන් සහිත දේශපාලන පක්ෂ, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා විධිවිධාන හෝ වෙනත් අදාළ සාමාන්‍ය නීති හෝ මැතිවරණ නීති නොමැති තත්වයන් තුළදී පවා ස්වේච්ඡාවෙන් පංගු ක්‍රම සඳහා වන ප්‍රතිපත්ති හඳුන්වා දී ස්ත්‍රීන්ගේ දේශපාලන නියෝජනය වර්ධනයට සැබෑ ලෙසම කැපවීමෙන් කටයුතු කර තිබේ. ඒ සඳහා හොඳ උදාහරණ විශේෂයෙන්ම ස්කැන්ඩිනේවියානු රටවලින් ගෙනහැර දැක්විය හැකිය. කිසිඳු ස්කැන්ඩිනේවියානු රටක ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් හෝ වෙනත් නීතියකින් පංගු ක්‍රම හඳුන්වා දී නැත. නමුත් සෑම රටකම පාහේ ස්ත්‍රීන් සඳහා මැතිවරණ නාමයෝජනා ලැයිස්තුවලින් කිසියම් ප්‍රතිශතයක් වෙන් කිරීමට

මුලින්ම තීරණය කරන ලද්දේ දේශපාලන පක්ෂ විසිනි.

ලොවෙන්ඩස්කි හා නොරිස්ගේ (Lovenduski and Norris, 1993) අධ්‍යයනවලට අනුව පළමු ලොව, සංවර්ධිත ප්‍රජාතන්ත්‍රවාදී රටවල ස්ත්‍රී දේශපාලන නියෝජනය වර්ධනයේ ලා බලපෑ මූලිකම බාධකය වූයේ එම රටවල ප්‍රධාන පක්ෂයි. මෙම තත්වය, එම රටවල ස්ත්‍රී ව්‍යාපාර විසින් 1960 ගණන් වනවිටත් අවබෝධ කරගෙන තිබිණි. එහෙයින් ඔවුහු විවිධ සාකච්ඡා, සම්මන්ත්‍රණ, සහ අධ්‍යයන වාර්තා ඉදිරිපත් කිරීම ආදිය මගින් මෙම ප්‍රශ්නය විසඳීමට 1960 ගණන්වල සිටම පක්ෂවලට බලපෑම් කළහ. ස්කැන්ඩිනේවියානු රටවල් කිහිපයකත්, ඕස්ට්‍රේලියාවේත් ස්ත්‍රී දේශපාලන පක්ෂ පිහිටුවා ස්වාධීනව මැතිවරණවලට ඉදිරිපත් වන බව ප්‍රකාශ කරමින්, ප්‍රධාන පක්ෂ සමග මෙම ස්ත්‍රීහු කේවල් කළහ. නැතිනම් ප්‍රධාන පක්ෂ වලට තර්ජනය කළහ. මෙම ක්‍රියාකාරකම් වල ප්‍රතිඵලයක් ලෙස නෝර්වේ, ස්වීඩන්, නෙදර්ලන්තය හා අයර්ලන්තය වැනි රටවල බොහොමයක් දේශපාලන පක්ෂත්, බ්‍රිතාන්‍ය හා ඕස්ට්‍රේලියානු කම්කරු පක්ෂත්, ලතින් අමරිකානු රටවල විශේෂයෙන්ම සමාජවාදී පක්ෂත් ඒවායේ අභ්‍යන්තර ප්‍රතිපත්ති වෙනස් කොට, ස්වේච්ඡා පංගු ක්‍රම හඳුන්වා දී තිබේ. එහෙයින් එම රටවල ස්ත්‍රී නියෝජනය වර්ධනය සම්බන්ධයෙන් මෙම පක්ෂ අනුගමනය කළ ප්‍රතිපත්ති ඒ සඳහා වූ සාර්ථක උපක්‍රම ලෙස පෙන්වා දිය හැකිය.

නෝර්වේ හි කම්කරු පක්ෂය 1983 මහ මැතිවරණයේදී නාමයෝජනාවලින් 40% ක් ස්ත්‍රීන්ට වෙන් කරමින්, ස්වේච්ඡා පංගු ක්‍රමය හඳුන්වා දීමේ ප්‍රමුඛයා විය. ඉන්පසු නෝර්වේ සමාජවාදී පක්ෂය, දක්ෂිණාංශික පක්ෂය හා ක්‍රිස්තියානි ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයද එම ප්‍රතිපත්ති අනුගමනය කළහ. ඩෙන්මාර්ක් හි සමාජ ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයද ඒ හා සමව යමින්, 1984 දී නාමයෝජනා වලින් 50% ක ප්‍රතිශතයක් ස්ත්‍රීන් සඳහා වෙන් කළේය. 1994 දී ස්වීඩන් හි සමාජ ප්‍රජාත්නත්‍රවාදී පක්ෂය "zipper" ක්‍රමය නැතිනම් "zebra" ක්‍රමය

හඳුන්වා දෙමින්, නාමයෝජනා ලැයිස්තුවල පළමු වැන්නා පුරුෂයෙක් හා දෙවැන්නා ස්ත්‍රියක් වියයුතුය යන ප්‍රතිපත්තිය හඳුන්වා දුනි. 1994 මහ මැතිවරණයේදී ස්වීඩන්හි ග්‍රීන් පක්ෂය හා ක්‍රිස්තියානි ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයත් යුරෝපා සංගමයේ මැතිවරණ ඇතුළු අනෙකුත් සියලුම මැතිවරණ වලට පංගු ක්‍රම ප්‍රතිපත්තිය හඳුන්වා දුනි.

බටහිර යුරෝපයේ බොහොමයක් රටවල ප්‍රධාන පක්ෂ, විශේෂයෙන්ම සමාජවාදී හෝ සමාජ ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂ ස්වේච්ඡා පංගු ක්‍රම හඳුන්වා දීමෙන්, ස්ත්‍රී නියෝජනය වර්ධනයට දායක වූහ. ජර්මනියද එයට හොඳ උදාහරණයකි. එරට ප්‍රධාන පක්ෂ පහෙන් තුනක් විසින්ම පක්ෂ ප්‍රතිපත්ති වලට අනුව නාමයෝජනා වලින් 40-50% අතර ප්‍රතිශතයක් ස්ත්‍රීන් සඳහා වෙන්කරනු ලැබ තිබේ. 1980 ග්‍රීන් පක්ෂය “zipper” ක්‍රමය හඳුන්වා දුනි. 1988 දී ජර්මන් සමාජ ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂය නාමයෝජනාවලින් අවම වශයෙන් 1/3 ක් ස්ත්‍රීන් වියයුතුය යන ප්‍රතිපත්තිය හඳුන්වා දුනි. 1994 සිට එම පක්ෂයේ සියලුම තනතුරුවලින් 40% ක් ස්ත්‍රීන් සඳහා වෙන් කළේය. 1998 දී සියලුම මැතිවරණ නාමයෝජනා ලැයිස්තුවලින් 40% ක් ස්ත්‍රීන් සඳහා වෙන් කළේය. ජර්මන් ක්‍රිස්තියානි ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂය, 1996 දී සියලුම පක්ෂ තනතුරුවලින් හා නාමයෝජනාවලින් 30% ක් ස්ත්‍රීන් සඳහා වෙන් කළේය. බටහිර හා නැගෙනහිර ජර්මනිය ඒකාබද්ධ වීමෙන් පසුව පැරණි නැගෙනහිර ජර්මන් කොමියුනිස්ට් පක්ෂය (Partei des Demokratischen Sozialismus - PDS) නව “zipper” ක්‍රමය හඳුන්වා දී, නාමයෝජනාවලින් 50% ක පංගුවක් ස්ත්‍රීන් සඳහා වෙන් කළේය. ස්කැන්ඩිනේවියානු රටවලත්, ජර්මනියේත් සමාජවාදී විඥාන මත පදනම් වූ පක්ෂ පංගු ක්‍රම හඳුන්වා දීමට වැඩි උනන්දුවක් දැක්වුවද, සම්ප්‍රදායික දක්ෂිණාංශික පක්ෂ බොහොමයක් තවමත් ස්වේච්ඡා පංගු ක්‍රම ප්‍රතික්ෂේප කරයි.

බ්‍රිතාන්‍ය කම්කරු පක්ෂය, 1980 අගදී සියලුම පක්ෂ තනතුරු වලින් 25% ක් ස්ත්‍රීන් සඳහා වෙන් කිරීමට තීරණය කළේය. එයින්

පසුව සෑම පාර්ලිමේන්තු මැතිවරණ නාමයෝජනා ලැයිස්තුවකටම අවම වශයෙන් එක් ස්ත්‍රියකගේ නමක් ඇතුළත් කිරීමට එකඟ විය. 1993 දී විශ්‍රාම යන මන්ත්‍රීවරුන්ගේ ආසනවලට, කලින් කෙටි ලැයිස්තු ගතකර තිබූ ස්ත්‍රීන්ගේ නම් ලැයිස්තුවකින් නමක් ඉදිරිපත් කිරීමට තීරණය කෙරිණි. 1997 දක්වා මෙම ක්‍රමය සාර්ථකව ක්‍රියාත්මක වුවත්, 1997 දී, පුරවැසි සමානාත්මතාවය සඳහා ස්ථාපිත කර තිබූ නීතිමය විධිවිධානයක් නිසා එම ප්‍රතිපත්තිය අධිකරණය හමුවේ අභියෝගයට ලක් කෙරිණි. එහිදී එය අවලංගු කෙරිණි. එසේ වුවත්, 2000 දශකයේදී කම්කරු පක්ෂ ස්ත්‍රී නියෝජනය බ්‍රිතාන්‍යයේ අනෙක් පක්ෂවලට සාපේක්ෂව වර්ධනය වීමට, එම ප්‍රතිපත්ති හඳුන්වා දීමෙන් පක්ෂය තුළත්, එයින් පිටතත් සිදුවූ ආකල්පමය වෙනස බලපෑම් කර තිබේ.

ප්‍රථම ස්කොට්ලන්ත පාර්ලිමේන්තු මැතිවරණය, වේල්ස් ඇසෙම්බ්ලි මැතිවරණය හා ලන්ඩන් ඇසෙම්බ්ලි මැතිවරණයට කම්කරු පක්ෂය “twinned” ක්‍රමය නැතිනම් ''නිවුන් ක්‍රමය'' හඳුන්වා දුනි. එයට අනුව ඡන්දදායකයාට ඡන්ද 2 ක් හිමිවේ. එක් ඡන්දයක් ස්ත්‍රියක හා අනෙක පුරුෂයකු සඳහා භාවිතා කළහැකිය. මේ ප්‍රතිපත්තිය නිසා බ්‍රිතාන්‍ය කම්කරු පක්ෂ ස්ත්‍රී නියෝජනය රැඩිකල් ආකාරයෙන් වර්ධනය විය.

ඕස්ට්‍රේලියානු කම්කරු පක්ෂයද මේ සඳහා හොඳ නිදසුනකි. 1994 දී, කම්කරු පක්ෂය විසින් 2002 වනවිට එරට පාර්ලිමේන්තු ස්ත්‍රී නියෝජනය 35% වියයුතුය යන ඉලක්කය සනිටුහන් කරගන්නා ලදී. කම්කරු පක්ෂයෙන් තේරී පත්වූ ප්‍රාන්ත අගමැතිනියකව සිටි කාමන් ලෝරන්ස් (Carmen Lawrence) විසින් සාධාරණත්වය පිළිබඳ තර්කය ඉදිරිපත් කරමින්, පක්ෂය තුළ මේ පිළිබඳව දැනුවත්බව හා පෙළඹවීමක් ඇති කරන ලදී. කම්කරු පක්ෂ නායකත්වය පක්ෂයේ ස්ත්‍රී-පුරුෂ දෙපක්‍ෂයේම හැකියාවන් රටේ සංවර්ධනය සඳහා භාවිත කළයුතුය යන උපයෝගිතා තර්කය භාවිත කරමින්, පක්‍ෂයේ ස්ත්‍රීන්ගේ ඉල්ලීමට සහාය දැක්වීය. තවද, කම්කරු පක්ෂයේ ක්වීන්ස්ලන්ත ශාඛාව ඕස්ට්‍රේලියානු ස්ත්‍රී පක්ෂය පිහිටුවා, විශේෂයන්ම ස්ත්‍රී

ඡන්දදායකයින්ගේ ආකර්ෂණය දිනා ගති. මෙම ස්ත්‍රී පක්ෂය දිනාගත් නියෝජිතවරියන්ගේ සහයෝගය කම්කරු පක්ෂයට ලබාදීමෙන් පක්ෂ නායකත්වයට බලපෑම් කිරීම ඔවුන් අනුගමනය කළ විශේෂ උපක්‍රමයක් විය.

මෙම පරිසරය තුළ, ඕස්ට්‍රේලියානු කම්කරු පක්ෂය පංගු ක්‍රමය හඳුන්වා දීමට එරෙහිව දක්ෂිණාංශික පක්ෂවලින් මෙන්ම පක්ෂ අභ්‍යන්තරයෙන්ද විරෝධතා පැන නැගුණි. නමුත් පක්ෂයේ ඉලක්කය දිනාගැනීමට පක්ෂ නායකයින් දැක්වූ කැපවීම හා පක්ෂයේ ස්ත්‍රීන් විසින් ඒ සඳහා කරන ලද පෙළඹවීම සුවිශේෂිය. පංගු ක්‍රමය සාර්ථක කරගැනීම සඳහා කම්කරු පක්ෂයේ ප්‍රාන්ත අගමැතිනියන්ව සිටි නායිකාවන් දෙදෙනෙක්ගේ මූලිකත්වයෙන් අමරිකානු එමිලි ලැයිස්තුවට (EMILY's List) සමාන අයුරින් ඕස්ට්‍රේලියානු එමිලි ලැයිස්තුව ආරම්භ කෙරිණි. ප්‍රජාතන්ත්‍රවාදී ස්ත්‍රීන් ඡන්දයට ඉදිරිපත් වනවිට ඔවුන්ට ආධාර කිරීමටත්, ස්ත්‍රීවාදී අදහස් අගයන නියෝජිතවරියන් පාර්ලිමේන්තුවට ඇතුළත් කරවා, ඔවුන් හරහා ස්ත්‍රීන්ගේ තත්වය නගා සිටුවීමට අදාළ නීති හා ප්‍රතිපත්ති සම්පාදනය කරවා ගැනීමටත්, දේශපාලනය පිළිබඳ උනන්දුවක් ඇති ස්ත්‍රීන් මැතිවරණ නාමයෝජනා සඳහා නිර්දේශ කිරීමටත්, මෙම එමිලි ආයතනය ක්‍රියා කළේය. ෆෙඩරල් පාර්ලිමේන්තුවේ කම්කරු පක්ෂ ස්ත්‍රී කමිටුව සමඟ සතියකට වරක් මෙම එමිලි ආයතනයේ නායිකාවන් සාකච්ඡා පවත්වා ස්ත්‍රීන්ට අදාළ නීති හා ප්‍රතිපත්ති නිසිලෙස ක්‍රියාත්මක වේදැයි සොයා බලා අදාළ වාර්තා ඉදිරිපත් කළේය. තවද, ෆිමොක්‍රැට්ස් නමින් හඳුන්වන ස්ත්‍රීවාදී අදහස් අගයන, පරිපාලන නිලධාරින් ලවා ඒවා විධිමත් නිරීක්ෂණයකට හා ඇගයීමකට ලක් කළේය. පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍ර, සැසිවාර කාලසටහන්, ආසන පැනවීම හා එහි පහසුකම් සැලසීමේදී ස්ත්‍රී-පුරුෂ සමාජභාවයට සංවේදී අයුරින් අදාළ ප්‍රතිපත්ති සම්පාදනයටත්, සම්පත් ලබා ගැනීමටත් කම්කරු පක්‍ෂ මන්ත්‍රීවරියන් පමණක් නොව, මන්ත්‍රීවරුන්ද මෙහෙයවීමේදී එමිලි ආයතනය විශාල දායකත්වයක් දැක්වීය (Sawer, 2000).

සමහර සංවර්ධනය වන්නා වූ රටවල, විශේෂයෙන්ම වාමාංශික අදහස් අගයන දේශපාලන පක්ෂ පංගු ක්‍රමය හඳුන්වා දීමේදී මූලිකත්වය ගත් අවස්ථා ඇත. බටහිර යුරෝපයේ සමාජවාදී පක්ෂවල අත්දැකීම් පාඩම් ලෙස ගෙන ලතින් අමරිකානු රටවල සමාජවාදී පක්ෂ බොහොමයක් ද පංගු ක්‍රම හඳුන්වා දීමේ ලා මූලිකත්වය ගත්හ. උදාහරණ වශයෙන් මෙක්සිකෝ හි ප්‍රජාතන්ත්‍රවාදී, විප්ලවීය පක්ෂය (Party of the Democratic Revolution), නිකරගුවා හි ජාතික විමුක්තිය සඳහා වූ සැන්ඩිනිස්ටා පෙරමුණ (Nicaragua's Sandinista Front for National Liberation) සහ කොස්ටරිකා හි ජාතික විමුක්ති පක්ෂය (Party of National Liberation) ජාතික මැතිවරණ වල නාමයෝජනාවලින් ස්ත්‍රීන් සඳහා පංගුවක් ස්වේච්ඡාවෙන් නියම කිරීමේදී ප්‍රමුඛත්වය ගත්හ. එම පක්ෂ අනුගමනය කරමින් චිලී හි ප්‍රජාතන්ත්‍රවාදය සඳහා වූ පක්ෂය (Chile's Party for Democracy), සමාජවාදී පක්ෂය (Socialist Party) සහ බ්‍රසීලයේ කම්කරු පක්ෂයත් (Worker's Party) පක්ෂ අභ්‍යන්තර තනතුරු සඳහා වන ඡන්ද වලදී ස්ත්‍රීන් වෙනුවෙන් ප්‍රතිශතයක් වෙන් කළේය. එයින් පසු චිලී හි මධ්‍යස්ථ මතධාරී පක්ෂය ද එම ප්‍රතිපත්තිය අනුගමනය කළේය.

මෙම රටවල ඉහත සඳහන් කළ පක්ෂ, එම දේශපාලන ක්‍රම ප්‍රජාතන්ත්‍රීයකරණය වීමත් සමඟම පක්ෂ ව්‍යූහය ද යම් ආකාර ප්‍රජාතන්ත්‍රීයකරණයට ලක් කිරීම, 1990 ගණන්වල ප්‍රකාශයට පත් වූ නව ප්‍රවණතාවයක් විය. එතෙක් මැතිවරණවලට අපේක්ෂකයින් තේරීමේදී පක්ෂ නායකයින්ට තිබූ ආධිපත්‍ය ඒ නිසා යම් ආකාර අභියෝග යකට ලක් විය (Franceschet, 2004). බොහොමයක් ලතින් අමරිකානු රටවල් නීත්‍යානුකූලව හඳුන්වා දුන් පංගු ක්‍රම යම් තරමකින් හෝ සාර්ථක වීමට මේ අයුරින් දේශපාලන පක්ෂවලින් ලැබුන සහයෝගය බෙහෙවින් බලපා ඇත.

1970 මැද ගණන්වල සිට ඉන්දියානු ස්ත්‍රී ව්‍යාපාරය විසින් අවස්ථා කීපයකදී පංගු ක්‍රමය පිළිබඳ යෝජනාව ඉදිරිපත් කරනු

ලැබුවද, පාලක කොංග්‍රස් පක්ෂ නායිකා ඉන්දිරා ගාන්ධි ඒ සඳහා සහයෝගය පළ කළේ නැත. නමුත් 1993 දී පංචායති පළාත් පාලන ආයතනවල ආසනවලින් 33% ක් ස්ත්‍රීන් සඳහා වෙන්කිරීමේ යෝජනාව ඉදිරිපත් වූ විට එවකට කොංග්‍රස් පක්ෂ නායක රජීව් ගාන්ධි එම ප්‍රතිපත්තිය පිළිගෙන ඒ සඳහා විශේෂ උනන්දුවකින් කටයුතු කළේය. ජාතික මට්ටමේ පමණක් නොව ප්‍රාන්ත මට්ටමේ කොංග්‍රස් පක්ෂ නායකයින්ද, රජීව් ගාන්ධිට මෙම පණත සම්මත කර ගැනීමේදී සහයෝගය දැක්වීය (Singh, 2005).

මේ අනුව ලොව විවිධ පක්ෂවල අත්දැකීම් ඇසුරින් ප්‍රකාශ වන්නේ පක්ෂ ව්‍යුහය, අභ්‍යන්තර ප්‍රජාතන්ත්‍රවාදය, නායකත්වයේ නම්‍යශීලි බව, පක්ෂ විඥානය හා ප්‍රතිපත්ති සහ පක්ෂ සාමාජිකාවන්ගේ ක්‍රියාකාරකම් ආදිය ස්ත්‍රී නියෝජනය වර්ධනයෙහි ලා ඍජුවම බලපෑම් කරන බවයි. බොහෝ රටවල වාමාංශික හෝ සමාජ ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂ ස්ත්‍රී නියෝජනය වර්ධනය සඳහා තිබූ ප්‍රතිපත්ති හඳුන්වා දුන්විට, දක්ෂිණාංශික හෝ මධ්‍යස්ථ මතධාරී පක්ෂද ඔවුන්ගේ ජනප්‍රියත්වය ගිලිහී යාමේ බිය හා තර්ජනය හමුවේ, එබඳු ප්‍රතිපත්ති හඳුන්වා දී තිබේ. ජර්මන් ග්‍රීන් පක්ෂය වැනි කුඩා පක්ෂ පංගු ක්‍රම හඳුන්වා දුන්විට ප්‍රධාන පක්ෂ ද එබඳු තර්ජන හමුවේ ඒ හා සමාන ප්‍රතිපත්ති හඳුන්වා දීමට පෙළඹුන අවස්ථා තිබේ. පංගු ක්‍රමය දිනා ගැනීමට මෙන්ම, එයින් සාර්ථක ප්‍රතිඵල අත්පත් කර ගැනීමටත් පක්ෂවල සහයෝගය අත්‍යවශ්‍ය බැව් නොරිස් හා ලොවෙන්ඩස්කි විසින් (Norris and Lovenduski, 1995:195) ඔවුන්ගේ අධ්‍යයන ඇසුරින් මෙසේ ප්‍රකාශ කරනු ලැබ ඇත. ''සාධනීය ප්‍රතිපත්ති හඳුන්වා දීමෙන්, ස්ත්‍රීන්ට කිසියම් ප්‍රතිශතයක් නාමයෝජනාවලින් වෙන් කිරීමෙන්, ස්ත්‍රීන් පුහුණු කිරීම සඳහා විශේෂ යාන්ත්‍රණ ස්ථාපිත කිරීමෙන් හා ඔවුන්ට මූල්‍යමය හා වෙනත් ආධාර සපයා දීමෙන් දේශපාලන පක්ෂ ස්ත්‍රීන්ට සහයෝගය දක්වන්නේ නම් ස්ත්‍රී නියෝජනය වර්ධනය කර ගැනීම පහසු වේ''. ඉහත සඳහන් කළ දේශපාලන පක්ෂවල ක්‍රියාකාරකම් වලින් පැහැදිලි වන්නේ ඒවා, නොරිස් හා ලොවෙන්ඩස්කිගේ ප්‍රකාශය සනාථ කර ඇති බවයි.

විශේෂිත ආයතන පිහිටුවීම

පංගු ක්‍රම නිත්‍යානුකූලව හෝ පක්‍ෂ ප්‍රතිපත්ති මගින් දිනා ගැනීමෙන් පමණක් ස්ත්‍රී නියෝජනය වර්ධනය කිරීමේ අරමුණු ඉටුකර ගත නොහැකිය. එය සාර්ථකව ක්‍රියාත්මක කිරීම සඳහා ඉහත සඳහන් කළ අයුරින් රාජ්‍ය, දේශපාලන පක්ෂ, ස්ත්‍රී සංවිධාන හා සිවිල් සංවිධාන ද කැපවීමෙන් කටයුතු කළයුතුය. පංගු ක්‍රම මගින් ස්ත්‍රීන්ට නාමයෝජනා ලබා දීම සඳහා ඔවුන් එයට ඉදිරිපත් වීම අත්‍යවශ්‍ය වේ. එහෙයින් දේශපාලන ක්‍ෂේත්‍රයට ආධුනික ස්ත්‍රීන්ව ඒ සඳහා පෙළඹවීම මෙන්ම ඔවුන්ට සහයෝගය ලබාදීම සඳහාත් **විශේෂිත ආයතන** පිහිටුවීමද, ස්ත්‍රී නියෝජනය වර්ධනය කෙරේ ඍජුව බලපායි. උදාහරණ වශයෙන් අමරිකානු හා ඕස්ට්‍රේලියානු එමිලි ලැයිස්තු අමරිකාවේ විෂ් (WISH List) ලැයිස්තුව, එංගලන්තයේ වික්ටෝරියානු කම්කරු පක්‍ෂ ස්ත්‍රීන්ගේ ජාලය, ස්වීඩන් ලිබරල් පක්ෂයේ සමාන ඉඩප්‍රස්ථා කමිටුව වැනි ආයතන රාශියක් නම් කළ හැකිය. මෙම ආයතනවලින් එමිලි හා විෂ් ලැයිස්තුවල මූලික අරමුණ වන්නේ ස්ත්‍රී දේශපාලන නියෝජනය වර්ධනය සඳහා වූ විවිධ ක්‍රියාකාරකම්වලදී මූලිකත්වය ගැනීමයි. දේශපාලනයට උනන්දුවක් දක්වන ස්ත්‍රීන්ගේ ජීවදත්ත එකතු කිරීම, ඔවුන්ගේ නම් ලැයිස්තු සකසා මැතිවරණ නාමයෝජනා සඳහා දේශපාලන පක්ෂවලට ඉදිරිපත් කිරීම, විශේෂයෙන්ම ආධුනික ඡන්ද අපේක්ෂිකාවන්ට පුහුණුව හා අදාළ අනුග්‍රහ සැපයීම, මැතිවරණය දිනාගත් මන්ත්‍රීවරියන් සමග එම ආයතන ගිවිස ගත් පරිදි ස්ත්‍රීන්ගේ තත්වය වර්ධනය කිරීමට අදාළ නීති හා ප්‍රතිපත්ති සම්පාදනයට ඔවුන්ව පෙළඹවීම, ඒවාට අදාළ තොරතුරු සපයා දී එම පණත් ව්‍යාපෘති සහ සැලසුම් සම්පාදනයට සහාය දැක්වීම ආදිය මෙම ආයතන මගින් ඉටුකරයි. එසේම අදාළ නීති හා ප්‍රතිපත්ති නිසිලෙස ක්‍රියාත්මක කරවීමට පරිපාලනය පෙළඹවීමත්, ඒවා නිරීක්ෂණය, ඇගයීම හා ඒවාට අදාළ නිර්දේශ ඉදිරිපත් කිරීමත් ඒ සම්බන්ධ අධ්‍යයන වාර්තා සැපයීම ආදියත් මෙම ආයතන මගින් සිදුකරයි. ස්ත්‍රීන් සඳහා පංගුවක් දිනා ගැනීමෙන් පමණක් සැබෑ නියෝජනයක් සිදුවේයයි අපේක්ෂා

කළ නොහැකිය. සැබෑ ගුණාත්මක නියෝජනයක් දිනා ගැනීමට නම්, මෙබඳු විශේෂිත ආයතන පිහිටුවා දේශපාලන පක්ෂ සමඟ සෘජු හෝ වක්‍ර සබඳතා ගොඩනඟාගෙන, ඉහත සඳහන් ආකාරයෙන් සක්‍රීය දායකත්වයක් දැක්වීම අත්‍යවශ්‍යය.

5

ශ්‍රී ලංකාව සඳහා පංගු ක්‍රමයක අවශ්‍යතාවය

ශ්‍රී ලාංකික ස්ත්‍රීන් 1931 දී ඡන්දය දීමේ හා නියෝජනයේ අයිතිය දිනා ගත්ත ද, වසර 80 ක දිගු කලකින් පසුවත් ස්ත්‍රී නියෝජනය 6% දක්වාවත් වර්ධනය වී නොමැත. අවස්ථා ගණනාවකදී ස්ත්‍රී සංවිධාන, සිවිල් සංවිධාන හා මෙම ගැටළුව පිළිබඳව උනන්දුව දක්වන විද්වතුන් ශ්‍රී ලාංකික රාජ්‍යය හා දේශපාලන පක්ෂවලට විවිධ අයුරින් බලපෑම් කර මෙම ගැටළුව විසඳන ලෙස ඉල්ලා ඇත. එසේම, විවිධ ව්‍යාපෘති යටතේ ප්‍රජා නායිකාවන් සඳහා දේශපාලන නායකත්ව පුහුණු පාඨමාලාද පවත්වා ඇත. ස්වාධීන ස්ත්‍රී කණ්ඩායම් ලෙස පළාත් හා ප්‍රාදේශීය මැතිවරණ කීපයකට ඉදිරිපත් වීමට මෙම සංවිධාන ප්‍රජා නායිකාවන්ට සහයෝගය ද දී ඇත. විවිධ ක්‍රියාකාරකම් මගින් ප්‍රජාව දැනුවත් කිරීමට ද කටයුතු කර ඇත. එහෙත් පසුගිය දශක 3 ක පමණ කාලයක අත්දැකීම්වලින් පැහැදිලි වන්නේ එම ප්‍රයත්නයන් කිසිවක් මෙම ගැටළුව විසඳීමට ප්‍රමාණවත් වී නොමැති බවය. එයට මූලික හේතුව වන්නේ සිවිල් සංවිධාන දරන මෙම උත්සාහයන්ට ශ්‍රී ලාංකික රාජ්‍ය සහ දේශපාලන පක්ෂවලින් නිසි ප්‍රතිචාර නොලැබීමයි. එසේත් නැතිනම් ස්ත්‍රී නියෝජනය වර්ධනය සම්බන්ධයෙන් මෙතෙක් බලය දැරූ කිසිදු ලාංකික ආණ්ඩුවක් හෝ දේශපාලන පක්ෂයක් උනන්දුවක් නොදැක්වීමයි.

2007-2011 කාලය තුළදී සාමය සහ යහපාලනය සඳහා වූ කාන්තාවෝ සංවිධානය විසින් මධ්‍යම පළාත තුළ දියත් කරන ලද ව්‍යාපෘතියක් හා ඒ සම්බන්ධයෙන් ඉදිරිපත් කරන ලද අධ්‍යයන වාර්තාවකට අනුව (Liyanage and Rajendran, 2012) ස්ත්‍රී නියෝජනය වර්ධනය සඳහා පංගු ක්‍රමයක අවශ්‍යතාවය ප්‍රාදේශීය

මට්ටමේ දේශපාලන නායකත්වය මෙන්ම, බහුතර ප්‍රජාව විසින්ද අවධාරණය කරනු ලැබ තිබේ. එසේම පංගු ක්‍රම පිළිබඳ ජනතාවගේ දැනුවත්භාවයද සාපේක්ෂව වර්ධනය වී ඇති බැව් එම අධ්‍යයනයෙන් ප්‍රකාශ වේ. ස්කැන්ඩිනේවියානු රටවල සමානුපාතික නියෝජන ක්‍රම ස්ත්‍රී නියෝජනය වර්ධනයට ධනාත්මකව බලපෑම් කළද, ශ්‍රී ලංකාවේ දැනට ක්‍රියාත්මක වන සමානුපාතික නියෝජන ක්‍රමය හා විවෘත ලැයිස්තු ක්‍රමය, පාරම්පරිකව වෙනසකට ලක්වූ ස්ත්‍රීන් වැනි කණ්ඩායමකට, නියෝජනයේදී වාසි අත්කරදෙන ක්‍රමයක් ලෙස සැලකිය නොහැකිය. ශ්‍රී ලංකාවේ මැතිවරණ නීති හෝ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය නොකර, මෙම ගැටළුව විසඳීම සඳහා පහසුවෙන්ම භාවිත කළ හැක්කේ පක්ෂ මගින් හඳුන්වා දෙන ස්වේච්ඡා පංගු ක්‍රමයයි. නමුත් ශ්‍රී ලංකාවේ දේශපාලන පක්ෂ විසින් නාමයෝජනා ලැයිස්තුවලින් යම් ප්‍රතිශතයක් ස්වේච්ඡාවෙන් ස්ත්‍රීන් සඳහා වෙන් කළද, එයින් ධනාත්මක ප්‍රතිඵලයක් කෙටිකාලීනව උදාවේයයි සිතීම උගහටය. පක්ෂ නායකත්වයේ සමීප සබඳතා ඇති අපේක්ෂකයින් විවෘත ලැයිස්තු ක්‍රමය යටතේ ලැයිස්තුවේ වාසිසහගත අයුරින් ස්ථානගත කිරීමෙන් ස්ත්‍රීන්ට අවාසියක් සිදුවේ. එසේම, ස්ත්‍රියක් ප්‍රමාණවත් ඡන්ද සංඛ්‍යාවක් දිනා ගත්තත්, පක්ෂ නායකත්වයට එය වෙනස් කිරීමේ හැකියාව ඇත. ශ්‍රී ලංකාවේ අතීත අත්දැකීම් කීපයකට අනුව එබඳු අවස්ථාවලදීත් වැඩි අවාසිසහගත තත්වයකට ස්ත්‍රීන් පත්වේ. අනෙක් අතට එක් ඡන්ද කොට්ඨාශයකට අපේක්ෂකයින් කීපදෙනෙක් නම් කිරිමෙන් පක්ෂය තුළම මනාප දිනා ගැනීමට අරගලයක් කළයුතුවේ. එහිදී ස්ත්‍රීන්ට සාපේක්ෂව වැඩි අත්දැකීම්, සංවිධාන ශක්තිය හා වැඩි සම්පත් ඇති බොහෝ පිරිමි අපේක්ෂකයින් නිරායාසයෙන්ම වාසි සහගත තත්වයකට පත්වේ. අනෙක් අතින්, මැතිවරණ නීති මගින් නියම නොකර ස්වේච්ඡාවෙන් පංගු ක්‍රම හඳුන්වා දුන්නත් ශ්‍රී ලාංකික පක්ෂ එම ප්‍රතිපත්තිවලට අනුකූලව ක්‍රියා කරයිද යන්න සැක සහිතය. ශ්‍රී ලාංකික පක්ෂ අභ්‍යන්තර ප්‍රජාතන්ත්‍රවාදය රහිත තත්වයකින් ක්‍රියාත්මක වන නිසා එබඳු විධිවිධානවලට අනුකූලව නාමයෝජනා ලබාදීමේ සම්ප්‍රදායක් ස්වේච්ඡාවෙන් ආරම්භ කරාවිද යන්න අපේක්ෂා

කිරීමද අසීරුය. ස්කැන්ඩිනේවියානු රටවල බොහොමයක් පක්ෂ ස්ත්‍රී ව්‍යාපාරයේ හඬට කන් දී zipper ක්‍රමය වැනි සමතුලිත නාමයෝජනා ලැයිස්තු ක්‍රමයක් හඳුන්වා දී, ස්ත්‍රී-පුරුෂ දෙපක්ෂයටම නියෝජනයේදී සමාන ඉඩ ප්‍රස්ථා ලබාදීමට තරම් ප්‍රජාතන්ත්‍රවාදය අගයන තත්වයක පසුවුවත්, සංවර්ධනය වන්නා වූ රටක් ලෙස ශ්‍රී ලංකාවේ තවමත් ක්‍රියාත්මක වන පවුල් මූලික හා පීතෘමූලික දේශපාලන පක්ෂවලින් එබඳු ප්‍රගතිශීලි ප්‍රතිපත්තියක් ස්වේච්ඡාවෙන් හඳුන්වා දේවි යයි අපේක්ෂා කිරීම අසීරුය.

නමුත් බොහෝ රටවල ස්ත්‍රී ව්‍යාපාර දශක දෙක තුනක් තිස්සේ දේශපාලන පක්ෂවලට බාහිර මෙන්ම අභ්‍යන්තර වශයෙන්ද බලපෑම් කොට ස්වෙච්ඡා පංගු ක්‍රම දිනාගත් බැව් අතීත අත්දැකීම්වලින් ප්‍රකාශ වේ. එහෙයින් අදට වඩා ශක්තිමත්ව, විධිමත්ව හා එක්සත්ව ශ්‍රී ලංකාවේ ස්ත්‍රීවාදී, ස්ත්‍රී හා සිවිල් සංවිධාන දේශපාලන පක්ෂවලට බලපෑම් කොට ස්ත්‍රී නියෝජනයේ වැදගත්කම තවදුරටත් අවධාරණය කිරීම මගින් පක්ෂවලට යම් බලපෑමක් කළ හැකිවේ. ලංකාවේ පවතින සමානුපාතික නියෝජන ක්‍රමයේ දුර්වලතා නිසා අපේක්ෂිත ප්‍රතිඵල අත්කර ගැනීම අසීරු වුවත්, අවම වශයෙන් පක්ෂවල ස්ත්‍රී සාමාජිකත්වයට සරිලන ප්‍රමාණයක ප්‍රතිශතයක් නාමයෝජනා ලැයිස්තුවලින් ස්ත්‍රීන්ට වෙන්කරන ලෙස පක්ෂ නායකත්වයට බලපෑම් කිරීම අත්‍යවශ්‍ය වේ. අවම වශයෙන් 20% ක ප්‍රතිශතයක් හෝ ස්ත්‍රීන් පළමුව දිනා ගතහොත් මැතිවරණ තරගයට ප්‍රවේශවීම හා එම අත්දැකීම් ලබා ගැනීමේ වාසිය ඔවුන්ට යම් තරමකින්වත් හිමිවේ. එසේම ඒ හරහා ස්ත්‍රී නියෝජනය පිළිබඳව පවතින ඍණාත්මක ආකල්ප යම්තරමකින් හෝ වෙනසකට ලක්වීමට මඟ පෑදේ.

නමුත් ශ්‍රී ලංකාවේ පවතින දේශපාලන ක්‍රමය හා දේශපාලන සංස්කෘතියට අනුව ස්ත්‍රී නියෝජනයේ ප්‍රමාණාත්මක හා ගුණාත්මක වර්ධනයක් කෙටි කාලයකින් දිනා ගැනීමට නම් ස්වේච්ඡා පංගු ක්‍රමයක් හඳුන්වා දීම පමණක් ප්‍රමාණවත් නොවේ. ඒ සඳහා

අනිවාර්යයෙන්ම මැතිවරණ නීති, පළාත් පාලන අණපනත් හෝ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කොට නියෝජිත ආයතනවල ආසන වලින් යම් ප්‍රතිශතයක් ස්ත්‍රීන් සඳහා නිත්‍යානුකූලව වෙන්කර දීමක් හෝ නාමයෝජනා ලැයිස්තුවලින් කිසියම් ප්‍රතිශතයක් නීතියෙන් වෙන්කර දීමක්, අනිවාර්යයෙන්ම සිදුකල යුතුය. ශ්‍රී ලාංකික දේශපාලන අත්දැකීම්වලට අනුවත්, ස්ත්‍රී නියෝජනය සම්බන්ධයෙන් කරන ලද අධ්‍යයන නිර්දේශවලට අනුවත් ශ්‍රී ලංකාවට මේ සම්බන්ධයෙන් වඩාත් ඵලදායී වන නිර්දේශ කීපයක් යෝජනා කළ හැකිය.

i. සමානුපාතික නියෝජන ක්‍රමය සහ සරල බහුතර ක්‍රමයේ මිශ්‍රණයෙන් සම්පාදිත නියෝජන ක්‍රමයක් සහ ආවෘත නැතිනම් වැසුණු නාමයෝජනා ලැයිස්තු ක්‍රමය හඳුන්වා දීම.
ii. සියලුම මැතිවරණවලදී, සියලුම දේශපාලන පක්ෂ ඉදිරිපත් කරන නාමයෝජනා ලැයිස්තුවලින් 33% ක් ස්ත්‍රීන්ට වෙන්කර දීම මැතිවරණ නීති මගින් ස්ථාපිත කිරීම.
iii. ජාතික, පළාත් හා ප්‍රාදේශීය මට්ටමේ සියලුම නියෝජිත ආයතනවල ආසනවලින් 1/3 ක් ස්ත්‍රීන් සඳහා වෙන් කිරීම. ජාතික හා පළාත් සභා නියෝජනයේ වෙනසක් සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සහ පළාත් පාලන ආයතන සඳහා පළාත් පාලන නීති සංශෝධනයක් මගින් මෙය හඳුන්වා දිය හැකිය.
iv. සියලුම පක්ෂවල අභ්‍යන්තර ප්‍රතිපත්ති සංශෝධනයක් මගින්, පක්ෂයේ තීරණ ගන්නා මට්ටමේ තනතුරුවලින්, වැදගත් කමිටු වල සාමාජිකත්වයෙන් හා මැතිවරණ නාමයෝජනාවලින් 33% ක ප්‍රතිශතයක් ස්ත්‍රීන් සඳහා වෙන්කිරීම.
v. ස්ත්‍රී නියෝජනයේ වර්ධනය අරමුණු කරගත් දේශපාලන පුහුණු ඇකඩමි හා එමිලි ලැයිස්තු වැනි විශේෂ ආයතන පිහිටුවීම (සටහනː 4 බලන්න).

i. මිශ්‍ර නියෝජන ක්‍රමය හා ආවෘත ලැයිස්තු ක්‍රමය

ස්ත්‍රී නියෝජනය වර්ධනයට මෙන්ම දැනට වඩා ප්‍රජාතන්ත්‍රවාදී හා සාධාරණ නියෝජන ක්‍රමයක් සඳහා ශ්‍රී ලංකාවේ පවතින සමානුපාතික නියෝජන ක්‍රමය, විශේෂයෙන්ම විවෘත ලැයිස්තු ක්‍රමය හා මනාප ඡන්ද ක්‍රමය අනිවාර්යයෙන්ම සංශෝධනයට ලක්කළ යුතුය. ශ්‍රී ලංකාවටත්, නේපාලයේ 2008 භාරකාර ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් හෝ දකුණු අප්‍රිකාවේ 1996 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් හඳුන්වා දී ඇති පරිදි මිශ්‍ර නියෝජන ක්‍රමයක් හඳුන්වා දීම වඩාත් යෝග්‍යය. පාර්ලිමේන්තුව හා වෙනත් නියෝජිත ආයතනවල ආසනවලින් අඩක් හෝ කිසියම් නිශ්චිත ප්‍රමාණයක් සමානුපාතික නියෝජන ක්‍රමය යටතේද, ඉතිරි ආසන සරල බහුතර නියෝජන ක්‍රමය යටතේද, තෝරා ගැනීමෙන් වඩා තුලිත නියෝජනයක් අපේක්ෂා කළ හැකිය. මෙම සමානුපාතික නියෝජන ක්‍රමය යටතේ, පළාත් හෝ දිස්ත්‍රික්ක වශයෙන් බෙදුන, සාපේක්ෂව විශාල භූගෝලීය කලාප, බහු මන්ත්‍රී ඡන්ද කොට්ඨාශ ලෙස සැලකිය හැකිය. මෙහිදී මැතිවරණ නාමයෝජනා ඉදිරිපත් කිරීම පුද්ගලික අපේක්ෂකයින්ට කළ නොහැකි වන අතර, පක්ෂවලට පමණක් සිය නාමයෝජනා ලැයිස්තු ඉදිරිපත් කළ හැකිවේ. එසේම මෙය ආවෘත නැතිනම් වැසුනු ලැයිස්තුවක් වියයුතුය. එයින් 1/3 ක් ස්ත්‍රීන්ට වෙන්කරන නියමය මත, නාම යෝජනා ලැයිස්තුවේ 1, 2 ස්ථානවල පුරුෂයන් දෙදෙනෙකුගේ නම් අන්තර්ගත වූයේ නම් තෙවැන්න ස්ත්‍රියක, නැවත සයවැන්නා සහ නව වැන්නා ස්ත්‍රියක වශයෙන් අපේක්ෂකයින්ගේ නම් අනුපිළිවෙලින් ස්ථානගත කළයුතුය. මෙම අනුපිළිවෙල මැතිවරණයෙන් පසුව වෙනස් කිරීම නීතියෙන් තහනම් කළ යුතුය. එසේම, එම අනුපිළිවෙල නොසලකා සම්පාදනය කරන නාමයෝජනා ලැයිස්තු ප්‍රතික්ෂේප කිරීමේ බලය හෝ ප්‍රථමවරට ඒවා නිවැරදි කිරීමට උපදෙස් දීමේ හා එසේ නිවැරදි නොකළේ නම්, දෙවනුව එම ලැයිස්තුව ප්‍රතික්ෂේප කිරීමේ බලය ස්වාධීන මැතිවරණ කොමිසමට පැවරිය යුතුය. සමානුපාතික ක්‍රමයට අනුව ඡන්දදායකයාට ඡන්දය භාවිත කළහැක්කේ තමා කැමති පක්ෂයටය. දේශපාලන පක්ෂ ලැබූ මුළු ඡන්ද සංඛ්‍යාව අනුව ආසන ගණන බෙදී යයි. එවිට ආවෘත

ලැයිස්තු ක්‍රමය මත නියෝජිතයින් තෝරා ගන්නේ මැතිවරණයට ඉදිරිපත් කළ නාමයෝජනා ලැයිස්තුවේ අනුපිළිවෙලට අනුවය. විවෘත ලැයිස්තු ක්‍රමයේදී මෙන් අපේක්ෂකයින්ට වැඩි මනාප සංඛ්‍යාවක් ලබාදී නියෝජිතයින්ව තේරීමේ අනුපිළිවෙලට බලපෑම් කිරීමට, ආවෘත ලැයිස්තු ක්‍රමයේදී ඡන්දදායකයාට හැකියාවක් නැත. එම අනුපිළිවෙල වෙනස්කිරීම පක්ෂ නායකත්වයටද නීතියෙන් තහනම් වේ. එවිට යම් පක්ෂයකට ආසන 6 ක් හිමිවුවහොත්, අනිවාර්යෙන්ම නාමයෝජනා ලැයිස්තුවේ මුලින් නම් සඳහන් 6 දෙනා තේරී පත්වේ. එහිදී එම 6 දෙනා අතරින් දෙදෙනෙකු ස්ත්‍රීන් වියයුතු වීමේ විධිවිධානය සහතික වශයෙන් ක්‍රියාත්මක කිරීමට දේශපාලන පක්ෂ නීතියෙන් බැඳී සිටී.

සරල බහුතර ක්‍රමය යටතේ මැතිවරණ පවත්වන ආසන සඳහා, පක්ෂ මගින් පමණක් අපේක්ෂක ලැයිස්තු ඉදිරිපත් කිරීම අනිවාර්ය නොවේ. පුද්ගලික අපේක්ෂකයින්ටද නාමයෝජනා ඉදිරිපත් කළ හැකිය. සෑම ඡන්දදායකයකුටම එක් ඡන්දයක් මැතිවරණයේදී හිමිවන අතර, යම් ආසනයක ඡන්දවලින් වැඩිම ප්‍රමාණය දිනාගත් අපේක්ෂකයා තේරී පත්වේ. මෙම තරගයේදී ස්ත්‍රීන් වාසිසහගත තත්වයකට පත්වීමේ සම්භාවිතාවය අඩුය. එහෙත් දේශපාලන පක්ෂ ඉදිරිපත් කරන නාමයෝජනාවලින් 1/3 ක් ස්ත්‍රීන් සඳහා වෙන්කොට ජයගැනීමේ සම්භාවිතාවය වැඩි ආසනවලින් ස්ත්‍රීන්ටද අපේක්ෂකත්වය ලබාදීම මගින් ස්ත්‍රී නියෝජනය වර්ධනයට මඟ පාදා ගත හැකිය. හුදෙක් නාමයෝජනාවලින් 1/3 ක් වෙන්කිරීමේ නියමය සපුරාලීමට පමණක්, පරාජය වීමේ සම්භාවිතාවය වැඩි ආසනවල අපේක්ෂකත්වය ස්ත්‍රීන්ට ලබාදීමෙන් අපේක්ෂිත ප්‍රතිඵල දිනාගත නොහැකිය. තවද, සරල බහුතර ක්‍රමයෙන් නියෝජිතයින් තෝරන ආසනවලින් 1/3 ක් ස්ත්‍රීන් සඳහා ව්‍යවස්ථාපිතව වෙන් කිරීමද ශ්‍රී ලංකාවට යෝග්‍ය උපක්‍රමයකි. එවිට ඉන්දියානු පළාත් පාලන ආයතනවල මෙන් එක් එක් මැතිවරණවලදී එසේ ස්ත්‍රීන් සඳහා වෙන් කරන ආසන නැවත නැවත මාරු කරමින් නියෝජිතවරියන් තෝරා ගැනීමට ඉඩ ලැබේ. උදාහරණ ලෙස යම් දිස්ත්‍රික්කයක ආසන 12 ක් වේ නම් එයින් 4

ක් ස්ත්‍රී ආසන ලෙස වෙන්කර ස්ත්‍රී නාමයෝජනා ලැයිස්තු පමණක් මැතිවරණයට ඉදිරිපත් කළ යුතුය. එවිට එම ආසන 4 ට තෝරා ගන්නේ නියෝජිතවරියන් පමණි. ඉතිරි ආසන 8 පොදු ආසන වේ. ඊලඟ මැතිවරණයේදී වෙනත් ආසන 4 ක් ස්ත්‍රී ආසන ලෙස නම් කළ හැකිය. එවිට කලින් මැතිවරණයේදී ස්ත්‍රීන්ට වෙන්කළ ආසන පොදු ආසන ලෙස සැලකිය හැකිය. එසේ ස්ත්‍රී ආසන මාරු කිරීම වඩාත් ප්‍රජාතන්ත්‍රවාදී වන අතර, සෑම ආසනයකටම ස්ත්‍රීන් නියෝජනය කිරීමේ ඉඩප්‍රස්ථාව එමගින් ලැබේ.

එසේම මැතිවරණ නීති සංශෝධනය මගින් ජාතික ලැයිස්තුවෙන් 1/3 ක්ද ස්ත්‍රීන් සඳහා වෙන් කළ හැකිය. එහිදීත්, ලැයිස්තුවේ අගට ස්ත්‍රීන්ගේ නම් ඇතුළත් නොකොට, පුරුෂයන් දෙදෙනෙකුගේ නම් වලට පසුව ස්ත්‍රියකගේ නමක් හා නැවත පුරුෂයන් දෙදෙනෙකුගේ නම් යන අනුපිළිවෙලට නම් ඇතුළත් කිරීමෙන් ස්ත්‍රීන් අවාසිසහගත තත්වයට පත්වීම මඟ හැරේ. උදාහරණ ලෙස යම් දේශපාලන පක්ෂයක් ලැබූ මුළු ඡන්ද සංඛ්‍යාව අනුව ජාතික ලැයිස්තුවෙන් මන්ත්‍රීවරු නව දෙනෙක් තෝරා ගන්නේ නම්, මැතිවරණයට ඉදිරිපත් කළ අනුපිළිවෙලට අනුව පළමු නම් සඳහන් නවදෙනා නියෝජිතයින් ලෙස තෝරා ගතයුතුවේ. එවිට ජාතික ලැයිස්තුවේ 3, 6 හා 9 යන ස්ථානවල සිටින ස්ත්‍රීන් තිදෙනා ද අනිවාර්යෙන්ම තෝරා ගැනේ. එම තත්වය යටතේ ජාතික ලැයිස්තුවෙන් තෝරා ගත් නවදෙනා අතරින් 1/3 ක නියෝජනයක් ස්ත්‍රීන්ට හිමිවේ.

ii. මැතිවරණ නාමයෝජනාවලින් 1/3 ක් ස්ත්‍රීන් සඳහා නීත්‍යානුකූලව වෙන්කිරීම

මැතිවරණ නීති සංශෝධනයකින් (ජාතික මට්ටමේ මැතිවරණ සඳහා) හෝ පළාත් පාලන ආයතනවල විශේෂ පණතක් සම්මත කිරීම මගින්, නාමයෝජනාවලින් 1/3ක් ස්ත්‍රීන්ට වෙන්කිරීමේ විධිවිධානය හඳුන්වා දියහැකිය. මෙහිදී ස්ත්‍රී-පුරුෂ දෙපක්ෂයම සමාන අයුරින් මැතිවරණ තරඟයට ඉදිරිපත් වියයුතු වන අතර, වැඩි ඡන්ද දිනාගත්

අපේක්ෂකයින් හෝ අපේක්ෂිකාවන් තේරී පත්වේ. ස්ත්‍රීන්ව වක්‍ර ක්‍රමයකින් තෝරා ගැනීම (උදාඃ ව්‍යවස්ථාදායකයට ඡන්දයෙන් තේරුනු නියෝජිතයින් විසින් තෝරාගනු ලැබීම) හෝ රාජ්‍ය නායකයෙකු විසින් තෝරා ගනු ලැබීම (උදාඃ ජනාධිපති හෝ අගමැති විසින් පත්කරනු ලැබීම) යන ක්‍රම දෙකේදීම ස්ත්‍රීන්ට අසමාන ලෙස සලකයි හෝ විශේෂ වරප්‍රසාද ලබාදෙයි යන ආකල්පය ජනිතවෙන අවස්ථා බහුලය. එසේම පත්කරන ලද මන්ත්‍රීවරියන්ට, ඡන්දයෙන් තේරුණු නියෝජිතයින්ට සමාන අයුරින් වගකීම්, ඉඩප්‍රස්ථා හා පිළිගැනීම් නොලැබේය යන චෝදනාවද මෙහිදී නැගේ. එම දුර්වලතා දෙකම මඟ හැර, ස්ත්‍රී-පුරුෂ දෙපක්ෂයටම සමාන අයුරින් මැතිවරණ තරග යට ඉදිරිපත් වීමේ හැකියාව මෙම ක්‍රමය මගින් ලැබේ.

සියලුම මැතිවරණවලදී, සියලුම පක්ෂ හෝ ස්වාධීන කණ්ඩායම් ඉදිරිපත් කරන අපේක්ෂක ලැයිස්තුවෙන් 1/3 ක් ස්ත්‍රීන් සඳහා වෙන් කිරීමේදීත්, ස්ත්‍රී-පුරුෂ නම් ස්ථානගත කිරීමේ අනුපිළිවෙල සාධාරණ අයුරින් කළයුතුය. සරල බහුතර ඡන්ද ක්‍රමය භාවිත කරන මැතිවරණ කොට්ඨාශවලදී ජයගැනීමේ සම්භාවිතාවය ඇති ආසනවලට ස්ත්‍රී-පුරුෂ දෙපක්ෂයෙන්ම අපේක්ෂකයන්ට ඉදිරිපත් වීමේ වරම හිමිකළ යුතුය. සමානුපාතික නියෝජන ක්‍රමයේදී, හුදෙක් නාමයෝජනා ලැයිස්තුව පිරවීමට එහි අගට එක්කරන ''ඩමි'' (පඹයා) සඳහා ස්ත්‍රීන්ගේ නම් භාවිත කිරීම තහනම් කළයුතු වේ. මෙම නීතියේදීත් නාමයෝජනා ලැයිස්තුවේ තුන්වැන්නා, 6 වැන්නා ආදී වශයෙන් පුරුෂයන් දෙදෙනෙකුගේ නම්වලට පසුව ස්ත්‍රියකගේ නමක් ඇතුළත් කිරීමෙන් වැඩි සාධාරණයක් ඉටුවේ. මෙම නීතියද නිසිලෙස ක්‍රියාත්මක වීමට නම්, එය නොසලකා හැර සම්පාදනය කරන නාමයෝජනා ලැයිස්තු අදාළ පක්ෂ ලවා නිවැරදි කරවීමේ හෝ ප්‍රතික්ෂේප කිරීමේ බලය අපක්ෂපාතී මැතිවරණ කොමිසමකට පැවරිය යුතුවේ.

